# මූලික බයිබල් සමීක්ෂණය

# දෙවන කොටස

# නව ගිවිසුම

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම්, මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදි මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන්, ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කිපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


අත්පොත භාවිත කරන ආකාරය . . . . . . I
කණ්ඩායම් අධ්‍යයනයන් සඳහා යෝජනා . . . . . II
පාඨමාලාව හැඳින්වීම . . . . . . . . 1
පාඨමාලාවේ අරමුණු . . . . . . . . 2


## අලුත් ගිවිසුම


ශුභාරංචි සඳහා හැඳින්වීම . . . . . . . 3
1. මතෙව් . . . . . . . . . 4
2. මාක් . . . . . . . . . 16
3. ලූක් . . . . . . . . . 22
4. යොහන් . . . . . . . . . 30

ඓතිහාසික පොතට හැඳින්වීම . . . . . . 41
5. ක්‍රියා . . . . . . . . . 42

හසුන් සඳහා හැඳින්වීම . . . . . . . 56
6. රෝම . . . . . . . . . 58
7. 1 හා 2 කොරින්ති . . . . . . . . 71
8. ගලාති . . . . . . . . . 90
9. එපිස . . . . . . . . . 98
10. පිලිප්පි . . . . . . . . . 108
11. කොලොස්සි . . . . . . . . 114
12. 1 හා 2 තෙසලෝනික . . . . . . . 123
13. 1 හා 2 තිමෝති . . . . . . . . 133
14. තීතස් . . . . . . . . 148
15. පිලෙමොන් . . . . . . . . 154
16. හෙබ්‍රෙව් . . . . . . . . 158
17. යාකොබ් . . . . . . . . 166
18. 1 හා 2 පේතෘස් . . . . . . . . 174
19. 1,2 හා 3 යොහන් . . . . . . . 184
20. යූද් . . . . . . . . 193

දිවැස්වැකි පොත සඳහා හැඳින්වීම . . . . . . 199
21. එළිදරව් . . . . . . . . 200

ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු . . . . . . 208

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ.

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය**: පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං පරීක්ෂණය:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙල තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කීපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-පරීක්ෂණවලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයන් ඇත්නම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා:** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-පරීක්ෂණ:** ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය:** ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය : නියෝජනය කිරීම**
**පාඨමාලාව : මූලික බයිබල් සමීක්ෂණය**

# හැඳින්වීම

යේසුස්වහන්සේගේ මෙලොව සේවයේදී පැරණි ගිවිසුම වෙත කරන ලද බොහෝ සඳහන් කිරීම් මගින් පෙන්නුම් කෙරෙන්නේ උන්වහන්සේ ශුද්ධ ලියවිල්ලේ අන්තර්ගතයේ ඇති දැනුම වෙත තබන ලද වැදගත්කම වේ. යේසුස්වහන්සේ තමා පුහුණු කළ අයට දේව වචනයේ වැදගත්කම බොහෝ සේ අවධාරණය කළ නිසා, හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය මෙම *"මූලික බයිබල් සමීක්ෂණය"* පාඨමාලාව ඉදිරිපත් කර ඇත්තේ, දෙවියන්වහන්සේගේ පණිවුඩය ජාතීන් වෙත ගෙන යෑම සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන් පුහුණු කිරීමේ සිය වැඩ සටහනේ කොටසක් ලෙසය.

"*මූලික බයිබල් සමීක්ෂණයේ*" පළමුවන වෙළුම, බයිබලය හඳුන්වාදෙන අතර එහි පරිවර්තන හා විවිධ අනුවාද සාකච්ඡා කරයි. එය බයිබලීය ඉතිහාසය, භූගෝලය හා බයිබල් යුගයේ ජීවිතය පිළිබඳ සමස්ත විග්‍රහයක් ඉදිරිපත් කරයි. එමෙන්ම එය සැකිල්ලක් සකසන ආකාරය උගන්වන අතර පැරණි ගිවිසුමේ සෑම පොතකටම සැකිල්ලක් ඉදිරිපත් කරයි.

මෙම අත්පොත, දෙවන වෙළුම, නව ගිවිසුමේ සෑම පොතකම සැකිල්ලක් ඇතිව අධ්‍යයනය ඉදිරියට ගෙන යයි. සෑම බයිබල් පොතක් පිළිබඳවම සපයා ඇති තොරතුරුවල කර්තෘ, පොත ලියා ඇත්තේ කාටද යන වග, පොතේ පරමාර්ථය, ප්‍රධාන පදය, ප්‍රධාන චරිතවල ලයිස්තුවක්, හා අන්තර්ගතයේ සංක්ෂිප්තයක් අන්තර්ගතය.

එමෙන්ම සෑම පොතක් සඳහාම ජීවිතයේ හා සේවයේ මූලධර්මයක් ද සඳහන් කර ඇත. මෙම මූලධර්ම කිතුනු පරිණතභාවයට හා සේවයට වැදගත් මූලික සත්‍යයන් වන අතර ඔබ ඒවා ඔබගේ ජීවිතයට සම්බන්ධ කරගැනීමට උත්සාහ කළ යුතුය.*"මූලික බයිබල් සමීක්ෂණයේ"* වෙළුම් දෙකෙහිම, උපකාරී වගු සටහන්, සිතියම් හා සංක්ෂිප්ත කරන ලද වැදගත් කරුණු අන්තර්ගත වේ.

*"මූලික බයිබල් සමීක්ෂණය"* බයිබලය අධ්‍යයනය කිරීමට විවිධ ක්‍රම උගන්වන *"නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම"* යෙහි සහායක පාඨමාලාවකි. මෙම පාඨමාලා දෙකම සැලසුම් කර ඇත්තේ දේව වචනය පෞද්ගලිකව අධ්‍යයනය කිරීම පෝෂණය කිරීමට වේ.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට

- නව ගිවිසුමේ පොත්වල සැකිල්ලක් නිර්මාණය කිරිමට හා විස්තර කිරීමට
- නව ගිවිසුමේ සෑම පොතක් සඳහාම පහත දැක්වෙන දේ සඳහන් කිරීමට
    - කර්තෘ
    - පොත ලියන ලද්දේ කවුරුන්ටද යන්න
    - එය ලියන ලද්දේ කවදාද යන්න
    - පොතේ පරමාර්ථය
    - ප්‍රධාන පදය
    - ජීවතයේ හා සේවයේ මූලධර්මය
- මෙම පාඨමාලාව අවසන් කිරීමෙන් පසු දේව වචනය වඩාත් විස්තරාත්මකව අධ්‍යයනය කිරීමට හැකිවනු ඇත.

# ශුභාරංචි සඳහා හැඳින්වීම

නව ගිවිසුමේ පළමු පොත් හතර ශුභාරංචි පොත් වේ. මෙම පොත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත. ජීවිතය, සේවය, ඉගැන්වීම්, මරණය හා උත්ථානය ගැන වාර්තා කරයි. එක් එක් පොතේ පිවිසුම එකිනෙකට වෙනස්ය.

**මතෙව්** : යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රජ කෙනෙකු ලෙස අවධාරණය කරන අතර විශේෂයෙන්ම යුදෙව්වන් වෙත ලියා ඇත. පොත ආරම්භ වන්නේ රාජකීය පෙළපතෙන් වන අතර අවසන් වන්නේ රජතුමා සිය ගෝලයන්ට ධර්මදූත සේවාව පැවරීමෙනි.

**මාක්** : යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ සේවකයා ලෙස අවධාරණය කරන අතර රෝමවරුන් වෙත ලියා ඇත. යේසුස්වහන්සේ සේවකයෙකු ලෙස දක්වා ඇති බැවින් පෙළපතක් සඳහන් කර නැත, මන්ද සේවකයෙකුගේ පෙළපත ගැන කිසිවෙකු උනන්දුවක් නොදක්වන බැවිනි. පොත අවසන් කරන්නේ ස්වාමින්වහන්සේ "ඔවුන් සමග වැඩකරමින්", සිය ගෝලයන් සමග සේවකයෙකු ලෙස වෙහෙස වනු දැක්වීමෙනි.

**ලූක්** : යේසුස් ක්‍රිස්තුස්වහන්සේ "මනුෂ්‍ය පුත්‍රයා" ලෙස පරිපූර්ණ මනුෂ්‍යයා හා අසම්පූර්ණ මිනිසුන්ගේ ගැළවුම්කරුවාණන් ලෙස හඳුන්වා දෙයි. ලූක් 3, යේසුස්වහන්සේගේ මනුෂ්‍ය පෙළපත, ආදම් දක්වා පෙන්නුම් කරයි. ලූක් අවසන් කරන්නේ මේ පරිපූර්ණ මනුෂ්‍යයා, යේසුස්වහන්සේ, ස්වර්ගයෙහි සිය පියාණන් වෙතට නැවත ඔසවා ගැනීම වාර්තා කරමිනි.

**යොහන්** : යේසුස්වහන්සේ "දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්" ලෙස, උන්වහන්සේගේ තනතුර අවධාරණය කරයි. මෙම පොත ආරම්භ කරන්නේ වාක්‍යයාණන් වන යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේ ලෙස එළිදරව් කිරීමෙනි. යොහන් ශුභාරංචියේ අවසාන පදයෙන් දැක්වෙන්නේ යේසුස්වහන්සේ මෙලොව කළ සේවය ලියැවෙන පොත්වලට මුළු ලෝකය වුවද ඉඩ මදි බවය. උන්වහන්සේ, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවට මෙයද සාක්ෂියකි.

# යුදෙව් කණ්ඩායම්

නව ගිවිසුම් යුගයේ යුදෙව්වෝ විවිධ කණ්ඩායම්වලට අයත් වූහ. පහත දැක්වෙන කණ්ඩායම් ශුභාරංචි පොත්වල සඳහන් වේ.

**පරිසිවරු** : ඔවුන්ගේ ආගම කේන්ද්‍රීය වූයේ, ඔවුන් අර්ථ නිරූපණය කළ, විස්තීරණය කළ, අනුගමනය කළ හා බල කළ ව්‍යවස්ථාවට කීකරුවීම මත වේ. ඔවුන් අනුගමනය කළේ ලිඛිත ව්‍යවස්ථාව පමණක් නොව, පරම්පරාවෙන් පරම්රාවට දෙන ලද වාචික සම්ප්‍රදායන් ද වේ. ඔව්හු යුදෙව්වන්ගේ විශාලතම හා බොහෝ සේ බලපෑම් කළ හැකි කණ්ඩායමක් වූ අතර මරණයෙන් පසු නැවත නැගිටීම විශ්වාස කළහ.

**සද්දුසිවරු** : පාලනය කළ කණ්ඩායම මොවුහු වූහ. මොවුහු නැවත නැගිටීම විශ්වාස නොකළහ. ඔවුන් විශ්වාස කළේ ව්‍යවස්ථාවේ ලියන ලද ඉගැන්වීම් පමණක් වූ අතර වාචිකව බාර දෙන ලද ඒවා පිළිගත්තේ නැත. ක්‍රිස්තුස්වහන්සේගේ කාලයේ ඉශ්‍රායෙලය පාලනය කළ රෝමවරුන්ට ඔව්හු දේශපාලනිකව පක්ෂපාතී වූහ.

**එස්සීනයෝ** : මොව්හු දැඩි ලෙස නීතිය අනුගමනය කළ අය වූ අතර මෙසියස්වහන්සේ ලා දෙදෙනෙකු බලාපොරොත්තු වූහ. ඔව්හු වෙන් වී ජීවත් වූ ප්‍රජාවන්ට අයත් වූහ.

**සිලට්වරු** : මොව්හු දේශාභිමාන්නයෙන් උමතුවූවෝ වූ අතර රෝම පාලනයෙන් මිදීම ලැබීමට ප්‍රචණ්ඩත්වය අනුමත කළ අය වූහ.

# පළමුවන පරිච්ඡේදය

## මතෙව්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- මතෙව් පොතෙහි කර්තෘ නම් කිරීමට
- මතෙව් පොත ලියා ඇත්තේ කා වෙතද යන්න හඳුනාගැනීමට
- මතෙව් පොතෙහි පරමාර්ථය සඳහන් කිරීමට
- මතෙව් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මතෙව් පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ** : මතෙව්

**කවුරුන් වෙතද:** යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ, හා දාවිත්ගේ පුත්‍රයාණන් ලෙස, හඳුන්වාදුන් යුදෙව්වන් වෙත ඔහුගේ පළමු බලාපොරොත්තුව වුවද, සියලුම ඇදහිලිවතුන් වෙතට වේ.

**පරමාර්ථය :** යේසුස්වහන්සේගේ සේවය, යුදෙව්වන්ගේ රජු ලෙස, උන්වහන්සේගේ භූමිකාව අවධාරණය කරමින්, හඳුන්වා දීම වේ.

**ප්‍රධාන පද :** 28:19-20

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට දුන් අවසාන ආඥාව වූයේ සියලුම ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යන ලෙසය.

**ප්‍රධාන චරිත :** යේසුස්වහන්සේ, ගෝලයන් දොළොස් දෙනා

### සැකිල්ල

**පළමුවන කොටස : රජතුමාගේ පෙළපත 1:1-17**

I. හැඳින්වීම : 1:1
II. පෙළපතෙහි සඳහන් අය : 1:2-16
III. පෙළපතෙහි සැලැස්ම : 1:17

## දෙවන කොටස : රජතුමාගේ උපත 1:18-2:23

I. සංකල්පය : 1:18-23
II. උපත : 1:24-25
III. උපත හා සම්බන්ධ සිද්ධීන් : 2:1-23
   A. ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීම හා හෙරෝද්ගේ කුමන්ත්‍රණය : 2:1-12
   B. මිසරයට පලා යෑම : 2:13-15
   C. හොරොද්ගේ පළිගැනීම : 2:16-18
   D. නාසරෙත් වෙත ආපසු පැමිණීම : 2:19-23

## තෙවන කොටස : සූදානම්වීම 3:1-4:11

I. රජතුමාගේ පැමිණීම සඳහා සූදානම : 3:1-17
   A. යොහන් බව්තිස්තගේ සේවය හා පණිවුඩය : 3:1-12
   B. රජතුමා බව්තිස්ම කිරීම : 3:13-17
II. රජතුමාගේ සූදානම : 4:1-11
   A. උන්වහන්සේගේ මනුෂ්‍යත්වයට සාතන් පහර දීම : 4:1-4
   B. උන්වහන්සේගේ දිව්‍යත්වයට සාතන් පහර දීම : 4:5-7
   C. උන්වහන්සේගේ ස්වාමිත්වයට සාතන් පහර දීම : 4:8-11

## සතරවන කොටස : රජතුමාගේ ගලිලයේ සේවය 4:12-13:58

I. පසුතැවිලිවීමට කැඳවීම : 4:12-17
II. ගෝලත්වය සඳහා ධීවරයන් සතර දෙනා කැඳවනු ලබයි : 4:18-22
III. ආරම්භයේදීම සාර්ථකත්වය හා කීර්තිය : 4:23-25
IV. දේව රාජ්‍යයේ පුරවැසියන් සඳහා චර්යාවේ මූලධර්මය : 5:1-7:28
   A. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ චරිතය විස්තර කෙරෙන ආකල්ප : 5:1-12
   B. දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ සාක්ෂිය : ආලෝකය හා ලුණු : 5:13-16
   C. ව්‍යවස්ථාව හා දිවැසිවරුන් සම්බන්ධ දේවරාජ්‍යයේ මූලධර්ම : 5:17-48
      1. පොදු වශයෙන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව : 15:17-20
      2. අලුත් ව්‍යවස්ථාව : 15:21-48
         a. මිනී මැරීම : 15:21-26
         b. කාමමිථ්‍යාචාරය : 15:27-30
         c. දික්කසාදය : 15:31-32
         d. දිවිරීම : 15:33-37
         e. අන් අයට සැලකීම : 15:38-48
   D. දේව රාජ්‍යයේ නමස්කාරයේ ආකල්ප තුනක් : 6:1-18
      1. දීම : බාහිර දෑක්ම : 6:1-4
      2. යාච්ඤාව : ඉහළට දෑක්ම : 6:5-15
      3. නිරාහාරව සිටීම : අභ්‍යන්තර දෑක්ම : 6:16-18
   E. දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ප්‍රමුඛතා : 6:19-33
      1. වටිනාකම් හා සම්බන්ධව : 6:19-21
      2. සේවය හා සම්බන්ධව : 6:22-24
      3. ද්‍රව්‍යමය අවශ්‍යතා හා සම්බන්ධව : 6:25-34
      4. නිවැරදි ප්‍රමුඛතාව : දේව රාජ්‍යය : 6:33

F. දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ නිවැරදි හැසිරීම : 7:1-29
1. විනිශ්චය කිරීම : 7:1-15
2. පූජනීය දේ ගැන සැලකිලිමත් වීම : 7:6
3. යාච්ඤාව : 7:7-12
a. යාච්ඤා වර්ග තුනකි. ඉල්ලීම, සෙවීම, තට්ටු කිරීම : 7:7-8
b. ස්වභාවික පියවරුන් හා ස්වර්ගීය පියාණන්ගේ ප්‍රතිචාරයන් සංසන්දනය කිරීම : 7:9-11
G. දේව රාජ්‍යයේ පුරවැසියන්ට විශේෂ අවවාද : 7:13-29
1. දොරටු දෙක : 7:13-14
2. ව්‍යාජ දිවැසිවරු : 7:15-20
3. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු බවට සාධකය : උන්වහන්සේගේ කැමැත්ත කිරීම : 7:21-23
4. නුවණ ඇති හා නුවණ නැති අය සංසන්දනය කිරීම : 7:24-27
H. යේසුස්වහන්සේගේ ධර්මය ගැන විස්මිත වීම : 7:28-29

V. රජතුමාගේ අධිකාරී බලය : 8:1-9:38
A. රෝග කෙරෙහි අධිකාරී බලය : 8:1-17
1. කුෂ්ඨ රෝගියා සුව කිරීම : 8:1-4
2. ශතාධිපතියාගේ දාසයා සුව කිරීම : 8:5-13
3. පේතෘස්ගේ භාර්යාවගේ මව සුව කිරීම : 8:14-15
4. සියලු ආකාර රෝග සුව කිරීම : 8:16-17
B. සිය ගෝලයන් කෙරෙහි අධිකාරී බලය : 8:18-22
C. ස්වභාවික කාරණා කෙරෙහි අධිකාරී බලය : 8:23-27
D. යක්ෂයන් කෙරෙහි අධිකාරී බලය : 8:28-34
E. පාපය කෙරෙහි අධිකාරී බලය : 9:1-8
F. මනුෂ්‍යයන් කෙරෙහි අධිකාරී බලය : 9:9-17
1. මතෙව්ගේ කැඳවීම : 9:9
2. පව්කරුවන් සමග ආහාර ගැනීම : 9:10-13
3. අභියෝගයකට පිළිතුරු දීම : 9:14-17
G. මරණය කෙරෙහි අධිකාරී බලය : මූලාදෑනියාගේ දුව : 9:18-19, 23-26
H. ශාරීරික තත්වයන් කෙරෙහි අධිකාරී බලය : 9:20-38
1. මහලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රිය : 9:20-22
2. අන්ධභාවය : 9:27-31
3. බිහිරිකම හා යක්ෂාවේශ වීම : 9:32-34
4. යේසුස්වහන්සේගේ කාරුණිකභාවය : 9:35-38

VI. රජතුමා විසින් බලය පැවරීම : 10:1-42
A. ධර්මදූතයන් දොළොස් දෙනා හා ඔවුන්ගේ අධිකාරී බලය : 10:1-4
B. ගමන සඳහා උපදෙස් : 10:5-42
1. යා යුත්තේ කොතැනකටද 10:5-6
2. මෙහෙය : 10:7-8
3. ද්‍රව්‍යමය දේ පිළිබඳ උපදෙස් : 10:9-15
4. ආත්මික උපදෙස් : 10:16-42

VII. දේව රාජ්‍යය කෙරෙහි ආකල්ප : 11:1-30
1. තේරුම් නොගත් රාජ්‍යය : 11:1-11
2. නොනිසි ලෙස ලබා ගත් රාජ්‍යය : 11:12-19
3. ප්‍රතික්ෂේප කරන ලද රාජ්‍යය : 11:20-24
4. පිළිගන්නා ලද රාජ්‍යය : 11:25-30

VIII. පරිසිවරුන් සමග මතභේද : 12:1-14
A. සබත් දවසේ අස්වැන්න නෙළීම : 12:1-8
B. සබත් දවසේ සුව කිරීම : 12:9-13
C. ඒවායේ ප්‍රතිඵල : 12:14-21

IX. සමාව දිය නොහැකි පාපය : 12:22-37

X. පරිසිවරුන්ගේ ඉල්ලීම්වලට ක්‍රිස්තුස්වහන්සේගේ පිළිතුර : 12:38-45

XI. දේව රාජ්‍යයේ ශාරීරික දේට වඩා ආත්මික සබඳතාවලට ප්‍රමුඛත්වය : 12:46-50

XII. දේව රාජ්‍යය පිළිබඳ උපමා: 13:1-53
A. වපුරන්නා පිළිබඳ උපමාව : 13:1-9
B. උපමාවලින් කතා කිරීමට හේතුව : 13:10-17
C. වපුරන්නා පිළිබඳ උපමාවේ අර්ථ නිරූපණය : 13:18-23
D. කිරිඳි පිළිබඳ උපමාව : 13:24-30
E. අබ ඇටය පිළිබඳ උපමාව : 13:31-32
F. මුහුන් පිළිබඳ උපමාව : 13:33
G. උපමා පිළිබඳ සාරාංශය : 13:34-35
H. කිරිඳි පිළිබඳ උපමාවේ අර්ථ නිරූපණය : 13:36-43
I. කෙතක සඟවා තිබූ නිධානය පිළිබඳ උපමාව : 13:44
J. අගනා මුතු ඇටය පිළිබඳ උපමාව : 13:45-46
K. දැල පිළිබඳ උපමාව : 13:47-50
L. උපමා පිළිබඳ අවසාන ප්‍රකාශන : 13:51-52

XIII. රජතුමාව, ඔහුගේම නගරයෙහි පිළිගත් ආකාරය : 13:53-58

**පස්වන කොටස : ගලීලය අසල පෙදෙස්වල සේවය 14:1-18:35**

I. යොහන් බව්තිස්තගේ මරණය : 14:1-12

II. යේසුස්වහන්සේ මුහුදෙන් එගොඩ පෙදෙසට යෑම : 14:13-15:20
A. පන්දහසකට කන්න දීම : 14:13-21
B. රොටී හා මසුන් සොයා යෑම : 14:22-23
C. මුහුද මත ඇවිදීම : 14:24-33
D. ගෙනසෙරෙත්හි සේවය : 14:34-36
E. පරිසිවරුන් හා ලියන්නන් සමග විවාදය : 15:1-20

III. යේසුස්වහන්සේ තිර් හා සිදොන් පෙදෙස්වලට යෑම 15:21-28
   A. තිර් හා සිදොන්හි ස්ත්‍රීන් : 15:21-28

IV. යේසුස්වහන්සේ දෙකපොලිසය පෙනෙන තෙක් මානයට යෑම : 15:29-38
   A. ගලීලයේ මුහුද අසල සුව කිරීමේ සේවය : 15:29-38
   B. හාර දහසකට කන්න දීම : 15:32-38

V. මගදන් දේශයෙහි සේවය : 15:39-16:4

VI. පරිසිවරුන් හා සද්දුසිවරුන් පිළිබඳව ගෝලයන්ට අනතුරු ඇඟවීම : 16:5-12
   A. ලකුණක් සෙවීම : 16:1-4
   B. ඔවුන්ගේ ධර්මය ගැන අනතුරු ඇඟවීම : 16:5-12

VII. යේසුස්වහන්සේ පිලිප්පි කායිසාරියට යෑම : 16:13-17:21
   A. ගෝලයන්ව පරීක්ෂා කිරීම : 16:13-20
   B. සිය මරණය, නැවත නැගිටීම හා ආපසු පැමිණීම ගැන කීම : 16:21-28
   C. අන්වෙසක් වීම : 17:1-13
   D. අපස්මාර රෝගියෙකු සුව කිරීම : 17:14-20

VIII. කෙටි කාලයකට ගලීලයට යෑම : 17:22-18:35
   A. සිය මරණය හා නැවත නැගිටීම මතක් කිරීම : 17:22-23
   B. දේව මාලිගා බද්ද ගෙවීම : 17:24-27
   C. උතුම්කම ගැන පාඩමක් : 18:1-6
   D. අපරාධ පිළිබඳ අනතුරු ඇඟවීම : 18:7-9
   E. නැතිවූ බැටළුවා පිළිබඳ උපමාව : 18:10-14
   F. දේව රාජ්‍යයේ පුරවැසියන් අතර ආරවුල් විසඳීම : 18:15-35
      1. ආරවුල් විසඳන්නේ කෙසේද : 18:15-17
      2. දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ වරප්‍රසාද හා වගකීම් : 18:18-20
      3. කමාව පිළිබඳ ගැටලුවක් : 18:21-22
      4. රජතුමා හා ඔහුගේ ණයකාරයන් : 18:23-35

## හයවන කොටස : පෙරියාවෙහි රජතුමාගේ සේවය : 19:1-20:34

I. යුදයේ ජනකාය සුව කිරීම : 19:1-2

II. දික්කසාදය පිළිබඳ ප්‍රශ්නය : 19:3-12

III. යේසුස්වහන්සේ විසින් ළදරුවන්ට ආශිර්වාද කිරීම : 19:13-15

IV. පොහොසත් තරුණයා සමග සම්මුඛ සාකච්ජාව : 19:16-22

V. පොහොසත්කමෙහි උපද්‍රව : 19:23-30

VI. ගෙදර ස්වාමියා පිළිබඳ උපමාව : 20:1-16

VII. පැමිණීමට නියමිත යේසුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම : 20:17-19

VIII. මවකගේ ආත්මාර්ථකාමී අයැදුම : 20:20-28

IX. යෙරිකෝව අසල අන්ධයන් දෙදෙනෙකු සුව කිරීම : 20:29-34

**සත්වන කොටස : රජතුමාගේ අවසාන සතිය : 21:1-27:31**

I. රාජ තේජසින් යෙරුසලමට පිවිසීම : 21:1-11

II. දේවමාලිගාව පවිත්‍ර කිරීම : 21:12-17

III. අත්තික්කා ගසට සාප කිරීම : 21:18-22

IV. යේසුස්වහන්සේගේ අධිකාරී බලය අභියෝගයට ලක් කිරීම : 21:23-32

V. නපුරු ගොවියන් පිළිබඳ උපමාව : 21:33-46

VI. සරණ මංගල්‍යය පිළිබඳ උපමාව : 22:1-14

VII. යේසුස්වහන්සේට අවමන් කිරීමේ උත්සාහය : 22:15-45
A. සීසර්ට බදුගෙවීම පිළිබඳ ප්‍රශ්නය : 22:15-22
B. නැවත නැගිටීම පිළිබඳ ප්‍රශ්නය : 22:23-33
C. ශ්‍රේෂ්ඨතම ආඥාව පිළිබඳ ප්‍රශ්නය : 22:34-40
D. යේසුස්වහන්සේ විසින් අසන ලද ප්‍රශ්න : 22:41-46

VIII. ලියන්නන් හා පරිසිවරුන් පිළිබඳ සාකච්ඡාව : 23:1-39
A. ඔව්හු ආගමික අධිකාරිත්වය පිළිබඳව ව්‍යාජ ලෙස හැසිරෙති : 23:1-3
B. ඔව්හු ඉසිලිය නොහැකි බර පටවති : 23:4
C. ඔව්හු ප්‍රශංසාවට ගිජු වෙති : 23:-5-7
D. උන්වහන්සේගේ ගෝලයන්ට උපදෙස් : 23:8-12
E. ලියන්නන්ට හා පරිසිවරුන්ට විපාක : 23:13-36
F. යෙරුසලම ගැන අදෝනා : 23:37-39

IX. දේව රාජ්‍යයේ අනාගතය : 24:1-25:46
A. දේව මාලිගාවෙහි විනාශය : 24:1-2
B. අවසානය පිළිබඳ ලකුණු : 24:3-14
C. පීඩා සමය : 24:15-22
D. යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම : 24:23-31
E. අත්තික්කා ගස පිළිබඳ උපමාව : 24:32-35
F. ස්වාමින්වහන්සේගේ දවස : 24:36-41
G. අවදිව සිටීමට ආඥාව : 24:42-51
H. අවසාන කාලය පිළිබඳ උපමා : 25:1-46
1. කන්‍යාවන් දස දෙනා : 25:1-13
2. තලෙන්ත : 25:14-30
3. බැටළුවන් සහ එළුවන් : 25:31-46

X. කුරුසිපත් කිරීමට පෙර සිද්ධීන් : 26:1-27:31

A. පැමිණීමට නියමිත මරණය ගැන දැන්වීම : 26:1-2

B. යේසුස්වහන්සේ මැරීමට කුමන්ත්‍රණය : 26:3-5

C. භූමදානය සඳහා ආලේප කරනු ලැබීම : 26:6-13

D. යේසුස්වහන්සේ පාවා දීමට යුදස් එකඟවීම : 26:14-16

E. අවසාන රාත්‍රී භෝජනය : 26:17-29

1. පාස්කු මංගල්‍යය සඳහා සූදානම් වීම : 26:17-19

2. අවසාන රාත්‍රී භෝජනය : 26:20-29

3. යේසුස්වහන්සේගේ අනතුරු ඇඟවීම හා පේතෘස්ගේ පාරට්ටුව : 26:30-35

F. ගෙත්සෙමන : 26:36-46

G. පාවාදීම හා අත්අඩංගුවට ගැනීම : 26:47-56

H. යේසුස්වහන්සේගේ නඩු විභාග : 26:57-27:26

**අටවන කොටස : රජතුමාගේ මරණය හා ජයග්‍රහණය : 27:27-28:20**

I. කුරුසිපත් කිරීම හා භූමදානය : 27:27-66

A. සෙබළුන්ගේ නිග්‍රහ : 27:27-31

B. කල්වරියේ මාර්ගය හා මරණය : 27:32-54

C. විශ්වාසවන්ත ස්ත්‍රීන්, භූමදානය හා සොහොන මුර කිරීම : 27:55-66

II. නැවත නැගිටීම 28:1-15

III. ශ්‍රේෂ්ඨ පැවරුම 28:16-20

## ස්වයං පරීක්ෂණය

1. මතෙව් පොතේ කර්තෘ කවුරුන්ද?

_______________________________________________

2. මතෙව් පොතෙහි පරමාර්ථය ලියන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

3. මතෙව් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

_______________________________________________

_______________________________________________

4. මතෙව් පොතෙහි ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

5. මතෙව් පොතෙහි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

_______________________________________________

_______________________________________________

_______________________________________________

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. සිද්ධීන් දහයක් සහිත කණ්ඩායම් තුනක් ලෙස මතෙව් පොත දැකිය හැකිය. කන්ද උඩ දේශනාවෙහි ප්‍රතිපත්ති 10 ක් අන්තර්ගත වේ. (5-6 පරිච්ඡේද) ඊළඟ පරිච්ඡේද (8-10) හාස්කම් 10 ක් වාර්තා කරයි. ඊළඟ පරිච්ඡේදවල (11-18) සෙනඟ විසින් යේසුස්වහන්සේ වෙත ඉදිරිපත් කළ නියෝජ්‍ය ප්‍රතික්‍රියා 10 ක් වාර්තා වේ. මේ රටාව ඇසුරෙන් මතෙව් පොත අධ්‍යයනය කරන්න.

2. මතෙව්ගේ ජීවිතය අධ්‍යයනය කරන්න. ඔහු සුංගම් අයකරන්නෙකි. (මතෙව් 5:3) ඔහු යේසුස්වහන්සේගේ ශ්‍රාවකයෙක් විය. (මතෙ. 9:9) පසුව ඔහු ප්‍රේරිතවරයෙකු ලෙස පත්කෙරිනි. (මතෙව් 10:3) ඔහු මෙම පොත ලියූ අතර එය ඔහුගේ නම දරයි.

3. මතෙව් 4 හි සඳහන් යේසුස්වහන්සේගේ පරීක්ෂාවන් අධ්‍යයනය කරන්න. පරීක්ෂාවන් පිළිබඳ කතාව අවබෝධ කරගැනීමට උපකාරී වීමට පහත දැක්වෙන චාට් සටහන භාවිත කරන්න.

**ක්‍රිස්තුස්වහන්සේගේ පරීක්ෂාවන්**

| පරීක්ෂාව | පරීක්ෂාවේ ක්ෂේත්‍රය | නම් යන ඒවා | ක්‍රිස්තුස්වහන්සේ ශුද්ධලියවිල්ලෙන් දුන් පිළිතුරු |
|---|---|---|---|
| ගල් | ශාරීරික (කුසගින්න) | ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් | ද්වි. 8:3 |
| දේවමාලිගාවේ මුදුන | ආත්මික | ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් | ගීතා. 91:11-12, ද්වි. 6:16 |
| ලෝකයේ සියලු රාජ්‍යයන් | ද්‍රව්‍යමය | ඔබ මට නමස්කාර කරන්නෙහි නම් | ද්වි. 6:13 |

4. මතෙව් පරිච්ඡේද 1 හා 2 හි පැරණි ගිවිසුමේ ශුද්ධ ලියවිලි පාඨ බොහොමයක් උපුටා දක්වා ඇත. මේවා සංසන්දනය කරන්න.

| | |
|---|---|
| මතෙව් 1:23 | යෙසායා 7:14 |
| මතෙව් 2:2 | යෙරමියා 23:5, සෙකරියා 9:9 |
| මතෙව් 2:6 | මීකා 5:2 |
| මතෙව් 2:15 | හොසියා 11:1, නික්මයාම 4:22 |
| මතෙව් 2:18 | යෙරමියා 31:15 |
| මතෙව් 2:23 | යෙසායා 11:1 |

5. මතෙව් 10 වන පරිච්ඡේදයෙන් ඔබට හැකිතරම් ශ්‍රාවකත්වය පිළිබඳ ගතිලක්ෂණ සොයා ලයිස්තුගත කරන්න.

6. මතෙව් 20:17-28 අධ්‍යයනය කරන්න. ලෞකික නායකයන් හා යේසුස්වහන්සේ විසින් විස්තර කර ඇති නායකයන් අතර වෙනස්කම් සඳහන් කරන්න.

7. මතෙව් 23 කියවා කිතුනු නායකයන් සඳහා අවම වශයෙන් ආඥා 10 ක් ලියන්න.

8. මතෙව් 21:1-17 හා සම්බන්ධ පහත දැක්වෙන පැරණි ගිවිසුම් යොමු කිරීම් අධ්‍යයනය කරන්න. සෙකරියා 9:9, 2 රාජවලිය 9:13, නික්මයාම 30:13, ගිතාවලිය 118:26, ලෙවිකථාව 1:14, යෙසායා 56:7, යෙරමියා 7:11, ගිතාවලිය 8:2

9. මතෙව් හි සඳහන් මෙම ප්‍රධාන වචන අධ්‍යයනය කරන්න. දේව රාජ්‍යය, ස්වර්ගය ස්වර්ගයේ රාජ්‍යය,

10. යේසුස්වහන්සේගේ යාච්ඤාවන් අධ්‍යනය කරන්න.

| | |
|---|---|
| - උන්වහන්සේගේ බව්තිස්තමයේදී | ලූක් 3:21 |
| - හුදකලා ස්ථානකයකදී | මාක් 1:35 |
| - පාළුකරයේදී | ලූක් 5:16 |
| - ශ්‍රාවකයන් තෝරා ගැනිමට පෙර මුළු රාත්‍රියෙහිම | ලූක් 6:12 |
| - මා වෙතට එන්න යන ආරාධනාවට පෙර | මතෙ. 11:25-27 |
| - 5000 කට කන්ට දීමේදී | යොහන් 6:11 |
| - 5000 ට කන්ට දුන් පසු | මතෙව් 14:23 |
| - උන්වහන්සේව ස්වාමින්වහන්සේගේ යාච්ඤාව දුන්විට | ලූක් 11:1-4 |
| - පිලිප්පි කායිසාරියේදී | ලූක් 9:18 |
| - උන්වහන්සේ අන්වෙසක් වීමට පෙර | ලූක් 9:28-29 |
| - කුඩා ළමයින් වෙනුවෙන් | මතෙව්. 19:13 |
| - ලාසරස් මරණයෙන් නැගුටුවීමට පෙර | යොහ. 11:41-42 |
| - දේවමාලිගාවේදී | යොහ. 12:27-28 |
| - රාත්‍රි භෝජනයේදී | මතෙව් 26:26-27 |
| - පේතෘස් වෙනුවෙන් | ලූක් 22:32 |
| - ශ්‍රාවකයන් හා අනාගත අනුගාමිකයන් වෙනුවෙන් | යොහන් 17 |
| - ගෙත්සෙමනේදී | මතෙ. 26:36, 39, 42, 44 |
| - කුරුසියේදී | ලූක් 23:24 |
| - එම්මාවුස්හි දී | ලූක් 24:30 |

11. යේසුස්වහන්සේගේ හාස්කම් අධ්‍යයනය කරන්න.

| | මතෙව් | මාක් | ලූක් | යොහන් |
|---|---|---|---|---|
| කුෂ්ඨ රෝගියා | 8:2-3 | 1:40-42 | 5:12-13 | |
| ශතාධිපතියාගේ සේවකයා | 8:5-13 | | 7:1-10 | |
| පේතෘස්ගේ බිරිඳගේ මව | 8:14-15 | 1:30-31 | | 4:38-39 |
| ගදරීනයන් දෙදෙනා | 8:28-34 | 5:1-15 | 8:27-35 | |
| අංශභාග රෝගියා | 9:2-7 | 2:3-12 | 5:18-25 | |
| මහලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රිය | 9:20-22 | 5:25-29 | 8:43-48 | |
| අන්ධයෝ දෙදෙනා | 9:27-31 | | | |
| යක්ෂාවේශ ගොළුවා | 9:32-33 | | | |
| වියළි අත | 12:10-13 | 3:1-5 | 6:6-10 | |
| අන්ධ ගොළුවා | 12:22 | | 11:14 | |
| කානානිය ස්ත්‍රියගේ දුව | 15:21-28 | 7:24-30 | | |
| අපස්මාර රෝගිවූ ළමයා | 17:14-18 | 9:17-29 | 9:38-43 | |
| අන්ධ මිනිසුන් | 20:29-34 | 10:46-52 | 18:35-43 | |
| ගොළු බිහිරි මිනිසා | | 7:31-37 | | |
| සිනගෝගයේ අශුද්ධාත්මයක් ආත්මයක් ආවේශවූ මිනිසා | | 1:23-26 | 4:33-35 | |
| බෙත්සයිදාවේ අන්ධයා | | 8:22-26 | | |
| කුඳු වූ ස්ත්‍රිය | | | 13:11-13 | |
| දිය උදර රෝගියා | | | 14:1-4 | |
| කුෂ්ඨ රෝගීන් දසදෙනා | | | 17:11-19 | |
| කන කපන ලද මිනිසා | | | 22:50-51 | |
| නිලධාරියාගේ පුතා | | | | 4:46-54 |
| බෙතෙස්දාවේ රෝගියා | | | | 5:1-9 |
| අන්ධව ඉපදුණු මිනිසා | | | | 9:1-7 |
| කුණාටුව සන්සිඳවීම | 8:23-27 | 4:37-41 | 8:22-25 | |
| මුහුද පිට පයින් යෑම | 14:25 | 6:48-51 | | |
| පන්දහසකට කන්ට දීම | 14:15-21 | 6:35-44 | 9:12-17 | 6:5-13 |
| හාර දහසකට කන්ට දීම | 15:32-38 | 8:1-9 | | |
| මත්ස්‍යයාගේ කටේ කාසිය | 17:24-27 | | | |
| වියළි ගිය අත්තික්කා ගස | 21:18-22 | 11:12-26 | | |
| මාළු ඇල්ලීමක් | | | 5:1-11 | |
| ජලය, මුද්‍රිකපානය කිරීම | | | | 2:1-11 |
| තවත් මාළු ඇල්ලීමක් | | | 21:1-11 | |
| යායිරස්ගේ දුව | 9:18-25 | 5:22-42 | 8:41-56 | |
| වැන්දඹුවගේ පුතා | | | 7:11-15 | |
| ලාසරස් | | | | 11:1-44 |

12. උපමා අධ්‍යයනය කිරීම

| | මතෙව් | මාක් | ලූක් |
|---|---|---|---|
| බඳුනක් යට පහන | 5:14-15 | 4:21-22 | 8:16, 11:33 |
| පර්වතය මත ගෙය | 7:24-27 | | 8:47-49 |
| අලුත් වස්ත්‍රය | 9:16 | 2:21 | 5:36 |
| අලුත් මුද්‍රික පානය | 9:17 | 2:22 | 5:37-38 |
| වපුරන්නා හා පස | 13:3-8 | 4:3-8 | 8:5-8 |
| අබ ඇටය | 13:31-32 | 4:30-32 | 13:18-19 |
| කිරිඳි | 13:24-30 | | |
| මුහුන් | 13:33 | | 13:20-21 |
| සැඟවූ වස්තුව | 13:44 | | |
| මුතු | 13:45-46 | | |
| දැල | 13:47-48 | | |
| නැතිවූ බැටළුවා | 18:12-13 | | 15:4-6 |
| ණයකරුවන් දෙදෙනා | 18:23-24 | | |
| මිදිවත්තේ වැඩකාරයෝ | 20:1-16 | | |
| පුතුන් දෙදෙනා | 21:28-31 | | |
| දුෂ්ට කුලී නිවැසියෝ | 21:33-41 | 12:1-9 | 20:9-16 |
| සරණ මංගල්‍යය | 22:2-14 | | |
| අත්තික්කා ගස | 24:32-33 | 13:28-29 | 21:29-32 |
| කන්‍යාවන් දසදෙනා | 25:1-13 | | |
| තලෙන්ත/පවුම් | 25:14-30 | | 19:12-27 |
| බැටළුවන් හා එළුවන් | 25:31-36 | | |
| බීජ වැපිරීමේ කාලය | | 4:26-29 | |
| ණය හිමියා හා ණයකාරයෝ | | | 7:41-43 |
| යහපත් සමාරියයා | | | 10:30-37 |
| අවශ්‍යතා ඇති මිත්‍රයා | | | 11:5-8 |
| පොහොසත් මෝඩයා | | | 12:16-21 |
| සූදානම්ව සිටින සේවකයෝ | | | 12:35-40 |
| විශ්වාසවන්ත ගබඩාකාරයා | | | 12:42-48 |
| ඵල නැති දිඹුල් ගස | | | 13:6-9 |
| සම්භාවනීය ආසන | | | 14:7-14 |
| මහා මංගල්‍යය | | | 14:16-24 |
| වියදම ගණන් බැලීම | | | 14:28-33 |
| නැතිවූ කාසිය | | | 15:8-10 |
| අකිකරු පුත්‍රයා | | | 15:11-32 |
| අධර්මිෂ්ඨ ගබඩාකාරයා | | | 16:1-8 |
| පොහොසත් මිනිසා හා ලාසරුස් | | | 16:19-31 |
| ස්වාමියා හා සේවකයා | | | 17:7-10 |
| උත්සාහවන්ත වැන්දඹුව | | | 18:2-5 |
| පරිසියා හා ආදායම් අයකරන්නා | | | 18:10-14 |

# දෙවන පරිච්ඡේදය

## මාක්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- මාක් පොතේ කර්තෘ නම් කිරීමට
- මාක් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- මාක් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- මාක් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මාක් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** මාක්

**කවුරුන් වෙතද :** සියලුම ඇදහිලිවතුන්ට වුවද පළමුවෙන් අදහස් කළේ ඔහු යේසුස්වහන්සේ සේවකයෙකු ලෙස හඳුන්වාදුන් රෝමවරුන්ට වේ.

**පරමාර්ථය :** යේසුස්වහන්සේගේ සේවය, උන්වහන්සේගේ භූමිකාව සේවකයෙකු හා මනුෂ්‍ය පුත්‍රයා ලෙස අවධාරණය කරමින්, හඳුන්වා දීම වේ.

**ප්‍රධාන පදය :** 10:45

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** අප සෙවිය යුත්තේ සේවය කිරීමට මිස සේවය ලැබීමට නොවේ.
**ප්‍රධාන චරිත :** යේසුස්වහන්සේ, ශ්‍රාවකයන් දොළොස් දෙනා.

### සැකිල්ල

I. සුදානම්වීමේ කාල පරිච්ඡේදය : 1:1-13

A. ශුභාරංචියේ ආරම්භය : 1:1-3
B. යොහන් බව්තිස්තගේ සේවය : 1:4-8
C. යේසුස්වහන්සේගේ බව්තිස්මය : 1:9-11
D. යේසුස්වහන්සේ පරීක්ෂා කරනු ලැබීම : 1:12-13

II. ගලිලයේ සේවය : 1:14-6:30

A. යේසුස්වහන්සේගේ සේවයේ ආරම්භය : 1:14-15
B. මසුන් අල්ලන්නන් සතර දෙනෙකු කැඳවීම : 1:16-20

C. යක්ෂාවේශවූවෙකු සුවකිරීම : 1:21-28
D. පේතෘස්ගේ බිරිඳගේ මව සුව කිරීම : 1:29-31
E. ජනප්‍රියතාව වර්ධනය වීම : 1:32-34
F. නිශ්ශබ්ද කාලය : 1:35-37
G. ගලීලයට ගිය පළමු ගමන : 1:38-39
H. කුෂ්ඨරෝගියෙකු සුවකිරීම : 1:40-45
I. අංශභාග රෝගියෙකු සුවකිරීම : 2:1-12
J. මතෙව් කැඳවීම : 2:13-14
K. උත්සවයක්, විවේචනය හා පිළිතුර : 2:15-22
L. සබත පිළිබඳ මතභේදය : 2:23-3:6
M. මුහුද ළඟ සේවය : 3:7-12
N. ගෝලයන් දොළොස්දෙනා පත් කිරීම : 3:13-19
O. යේසුස්වහන්සේගේ උද්යෝගය : 3:20-21
P. කමාව දිය නොහැකි පාපය : 3:22-30
Q. යේසුස්වහන්සේ සමග සැබෑ සබඳතාව : 3:31-35
R. උපමා මාලාවක් : 4:1-34
    1. පස පිළිබඳ උපමාව (වපුරන්නා ගැන උපමාව) : 4:1-20
    2. පහන පිළිබඳ උපමාව : 4:21-25
    3. කෙමෙන් වර්ධනය පිළිබඳ උපමාව : 4:26-29
    4. අබ ඇටය පිළිබඳ උපමාව : 4:30-34
S. මුහුදෙහි කුණාටුව : 4:35-41
T. යක්ෂාවේශවූවෙකු සුව කිරීම : 5:1-20
U. යායිරස්ගේ දුව හා මහලේ රෝගය ඇතිව සිටි ස්ත්‍රිය : 5:21-43
V. නාසරෙත්හි දී ප්‍රතික්ෂේප කිරීම : 6:1-6
W. ගෝලයන් දොළොස්දෙනාගේ මෙහෙය : 6:7-13
X. යොහන් බව්තිස්තගේ මරණය : 6:14-29
Y. ගෝලයන් දොළොස්දෙනාගේ වාර්තා : 6:30

III. වෙන්වී සිටීමේ කාල පරිච්ඡේදය : 6:31-9:50

A. 5000 කට කන්ට දීම : 6:31--46
B. මුහුද පිට පයින් යෑම : 6:47-52
C. ගෙනසෙරෙත්හි සේවය : 6:53-56
D. පරිසිවරුන්ට තරවටු කිරීම : 7:1-23
E. සිරෝපිනීසි ජාතික ස්ත්‍රිය : 7:24-30
F. ගොළු බිහිරෙකුට සුව කිරීම : 7:31-37
G. 4000 කට කන්ට දීම : 8:1-9
H. ලකුණක් ඉල්ලීම : 8:10-13
I. මුහුන් පිළිබඳ අනතුරු ඇඟවීම : 8:14-21
J. අන්ධයෙකු සුව කිරීම : 8:22-26
K. පිලිප්පි කායිසාරියේ පරීක්ෂණය හා පාඩම : 8:27-9:1
L. යේසුස්වහන්සේ අන්වෙසක් වීම : 9:2-10
M. එලියා පිළිබඳ ගැටලුව : 9:11-13
N. මිමැස්මොර රෝගී ළමයා සුව කිරීම : 9:14-29
O. ගලීලයේ අවසාන ඉගැන්වීම : 9:30-50

IV. පෙරියාවේ හා යුදයේ සේවය : 10:1-52

A. දික්කසාදය පිළිබඳ පාඩමක් : 10:1-12
B. ළමයින්ට ආශිර්වාද කිරීම : 10:13-16
C. පොහොසත් තරුණයා : 10:17-22
D. පොහොසත්කමේ උපද්‍රව පිළිබඳ අනතුරු ඇඟවීම : 10:23-37
E. ප්‍රතිලාභ පිළිබඳ සාකච්ඡාව : 10:28-31
F. යේසුස්වහන්සේගේ මරණය ගැන කලින් කීම : 10:32-34
G. ප්‍රමුඛත්වය ඉල්ලීමක් : 10:35-45
H. බර්තිමේයුස් සුව කිරීම : 10:46-52

V. අවසාන සතියේ සිද්ධීන් : 11:1-15:47

A. යේසුස්වහන්සේ රජකෙනෙකු සේ යෙරුසලමට ඇතුල් වීම : 11:1-11
B. ඵල නැති අත්තික්කා ගසට ශාප කිරීම : 11:12-14
C. දේවමාලිගාව පවිත්‍ර කිරීම : 11:15-19
D. ඇදහිල්ල පිළිබඳ පාඩමක් : 11:20-26
E. ක්‍රිස්තුස්වහන්සේගේ අධිකාරී බලය ගැන අභියෝග කිරීම : 11:27-33
F. වැව්ලිකරු පිළිබඳ උපමාව : 12:1-12
G. අයබදු දීම පිළිබඳ ප්‍රශ්නයක් : 12:13-17
H. නැවත නැගිටීම පිළිබඳ ප්‍රශ්නයක් : 12:18-27
I. ශ්‍රේෂ්ඨතම ආඥාව පිළිබඳ ප්‍රශ්නයක් : 12:28-34
J. ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ප්‍රශ්නයක් : 12:35-37
K. ලියන්නන්ට විරුද්ධව අනතුරු ඇඟවීමක් : 12:38-40
L. වැන්දඹුවකගේ කුඩා දීමනාව : 12:41-44
M. අනාගතය සඳහා ඇදහිල්ල : 13:1-37
N. සන්හෙඩ්‍රින්හි කුමන්ත්‍රණය : 14:1-2
O. බෙතානියේ රාත්‍රි භෝජනය : 14:3-9
P. යුදස්ගේ කුමන්ත්‍රණය : 14:10-11
Q. පාස්කු මංගල්‍යය : 14:12-21
R. අන්තිම රාත්‍රි භෝජනය : 14:22-26
S. පේතෲස්ගේ අපලාපය ගැන කලින් කීම : 14:27-31
T. ගෙත්සෙමනේ යාච්ඤාව : 14:32-42
U. පාවාදීම හා අත්අඩංගුවට ගැනීම : 14:43-52
V. යුදෙව් නඩු විභාගය : 14:53-65
W. යේසුස්වහන්සේ නාඳුනන බව පේතෲස් කීම : 14:66-72
X. රෝමවරුන්ගේ නඩු විභාගය : 15:1-21
Y. යේසුස්වහන්සේ කුරුසිපත් කිරීම : 15:22-41
Z. යේසුස්වහන්සේ භූමදාන කිරීම : 15:42-47

VI. යේසුස්වහන්සේගේ නැවත නැගිටීම : 16:1-8

A. පළමුව සොහොනේදී : 16:1-3
B. හිස්වූ සොහොන : 16:4-6
C. නැවත නැගිටීමේ පණිවුඩය දේශනා කිරීමට පැවරීම : 16:7-8

VII. යේසුස්වහන්සේ දර්ශනය වීම : 16:9-14

A. පළමුව මග්දලායේ මරියාට : 16:9-11
B. ශ්‍රාවකයන් දෙදෙනාට : 16:12-13
C. ගෝලයන් එකොළොස්දෙනාට : 16:14

VIII. ශ්‍රේෂ්ඨ පැවරීම : 16:15-18

IX. යේසුස්වහන්සේ ස්වර්ගයට නැගීම : 16:19

**X.** පැවරුම ඉටු කිරීම : 16:20

## ස්වයං පරීක්ෂණය

1. මාක් පොතේ කර්තෘ කවුරුන්ද?

2. මාක් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. මාක් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. මාක් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. මාක් පොතේ ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මාක් පොතේ ප්‍රධාන වචන අධ්‍යයනය කරන්න : වහාම, නොපමාව, ක්ෂණිකව

2. මෙම පොතේ කර්තෘ වන මාක්ගේ ජීවිතය අධ්‍යයනය කරන්න. මෙම පොත ඇත්තේද ඔහුගේ නමින්මය. ක්‍රියා 12:12, 25; 13:5,13; 15:37,39; කොලොස්සි 4:10, පිලෙමොන් 23-24 හා 1 පේතෘස් 5:13 බලන්න, ශුභාරංචිවලද මාක් ගැන සඳහන් වේ (මතෙව්, මාක්, ලූක් හා යොහන්) මන්ද ඔහු යේසුස්වහන්සේගේ ගෝලයන් දොළොස් දෙනොගෙන් එක් කෙනෙකු වූ බැවිනි.

3. යේසුස්වහන්සේ නැවත නැගිටුණු පසු, කිප වතාවක්ම, තමා සැබවින්ම මරණයෙන් නැවත නැගිටුණු බව සනාථ කරමින්, දර්ශනය විය. උන්වහන්සේ පහත දැක්වෙන අයට දර්ශනය වූ සේක.

| | |
|---|---|
| - මග්දලායේ මරියාට | මාක් 16:9-10 |
| - අනෙකුත් ස්ත්‍රීන්ට | මතෙ. 28:9-10 |
| - එම්මාවුස් බලා යද්දී ගෝලයන් දෙදෙනෙකුට | මාක් 16:12-13, ලූක් 24:13-32 |
| - පේතෘස්ට | ලූක් 24:34 |
| - තෝමස් නොමැතිව අනෙකුත් ගෝලයන්ට | මාක් 16:14, ලූක් 24:36, යොහන් 29:19 |
| - තෝමස් සමග ගෝලයන්ට | යොහන් 20:26-31 |
| - ගලිලයේ මුහුද අසල ගෝලයන් සත් දෙනෙකුට | යොහන් 21 |
| - ගලිලයේදී ගෝලයන්ට | මතෙව් 28:16-20 |
| - යාකොබ්ට | 1 කොරින්ති 15:7 |
| - ස්වර්ගාරෝහණ කන්දේ උන්වහන්සේ සමග සිටි අයට | මාක් 16:19, ලූක් 24:44, ක්‍රියා 1:3 |
| - පාවුල්ට | 1 කොරින්ති 15:5-8 |

4. යේසුස්වහන්සේ සිය සතුරන්ගේ බොරු චෝදනා බොහොමයකට මුහුණ දුන් සේක. මාක් 2:1-3:6 අධ්‍යයනය කර පහත දැක්වෙන සටහන පුරවන්න.

| | 2:1-12 | 2:13-17 | 2:18-22 | 2:23-28 | 3:1-6 |
|---|---|---|---|---|---|
| අවස්ථාව | | | | | |
| චෝදනා කරුවෝ | | | | | |
| චෝදනාව | | | | | |
| කතා කළේ කාටද | | | | | |
| යේසුස්වහන්සේගේ පිළිතුරු | | | | | |
| ප්‍රතිඵල | | | | | |

# තෙවන පරිච්ඡේදය

## ලූක්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ලූක් පොතේ කර්තෘ නම් කිරීමට
- ලූක් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- ලූක් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ලූක් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ලූක් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මයන් සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** ලූක්

**කවුරුන් වෙතද :** සියලුම ඇදහිලිවතුන් වෙත වුවද පළමුවෙන් අදහස් කළේ, ඔහු යේසුස්වහන්සේ පරිපූර්ණ මනුෂ්‍යයා ලෙස ඉදිරිපත් කළ ග්‍රීක්වරුන්ට වේ. එමෙන්ම ඔහු එක් විශේෂිත ඇදහිලිවන්තයෙකුව ද අමතයි, ඒ තියෝපිලස් වේ.

**පරමාර්ථය :** මෙහි පරමාර්ථය වන්නේ යේසුස්වහන්සේගේ සේවය පිළිබඳ වාර්තාවේ විධිමත් විස්තරයක් සැපයීම වේ. (ලූක් 1:1-4)

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** අපගේ මෙහෙය යේසුස්වහන්සේගේ මෙහෙයට සර්වසම වේ. එනම් ශුභ ආරංචිය විනාශවන සෙනඟ වෙත ගෙන යෑමය.

**ප්‍රධාන චරිත :** යේසුස්වහන්සේ, ගෝලයන් දොළොස් දෙනා

### සැකිල්ල

**පළමුවන කොටස : සුදානම 1:1-2:52**

I. හැඳින්වීම:
   A. තියෝපිලස්ට කෙටි ලිපියක් 1:1-4
   B. සෙකරියස්ගේ දර්ශනය : 1:5-25
   C. මරියතුමියගේ දර්ශනය : 1:26-38
   D. මරියතුමිය එලිසබෙත් බැහැ දැකීම : 1:39-56
   E. යොහන් බව්තිස්තගේ උපත : 1:57-80

II. යේසුස්වහන්සේගේ උපත හා ළමා කාලය:
   A. යේසුස්වහන්සේගේ උපත : 2:1-7

B. එඬේරුන්ගේ බැහැ දැකීම : 2:8-20
C. යේසුස්වහන්සේගේ චර්මඡේදනය හා නම් කිරීම : 2:21
D. යේසුස්වහන්සේව කැප කිරීම : 2:22-40
E. යේසුස්වහන්සේ දේවමාලිගාවට යෑම : 2:41-52

**දෙවන කොටස : ක්‍රිස්තුස්වහන්සේගේ සේවයේ ආරම්භය 3:1-4:3**

I. යොහන් බව්තිස්තගේ මෙහෙය : 3:1-20

II. යේසුස්වහන්සේගේ බව්තිස්මය : 3:21-22

III. යේසුස්වහන්සේගේ පෙළපත : 3:23-38

IV. යේසුස්වහන්සේ පරීක්ෂා කරනු ලැබීම : 4:1-13

**තෙවන කොටස : යේසුස්වහන්සේ ගලීලයේදී 4:14-9:62**

I. නාසරෙත්හි දී යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම : 4:14-30

II. කපර්ණවුමෙහි සිනගෝගයේදී යක්ෂාවේශවූ මිනිසා සුව කිරීම : 4:31-37

III. පේත්‍රුස්ගේ භාර්යාවගේ මව සුව කිරීම : 4:38-39

IV. තවදුරටත් භාස්කම් කිරීම හා දේශනා කිරීම : 4:40-44

V. විස්මිත මසුන් ඇල්ලීමක් හා සීමොන් පේත්‍රුස්, යාකොබ් හා යොහන් කැඳවීම : 5:1-11

VI. කුෂ්ඨ රෝගියෙකු සුව කිරීම : 5:12-16

VII. අංශභාග මිනිසාට කමාව දීම හා සුව කිරීම : 5:17-26

VIII. මතෙව් කැඳවීම : 5:27-28

IX. සුංගම් අයකරන්නන් සමග භෝජන සංග්‍රහයකට සහභාගිවීම : 5:29-32

X. නිරාහාරව සිටීම පිළිබඳ ප්‍රකාශනයක් : 5:33-39

XI. සබත් දවසේ ධාන්‍ය කරල් කැඩීම හා කෑම : 6:1-5

XII. වියළි අතක් සුව කිරීම : 6:6-11

XIII. ගෝලයන් දොළොස්දෙනා තෝරාගැනීම : 6:12-16

XIV. කන්ද උඩ දේශනාව : 6:17-49

XV. ශතාධිපතියාගේ සේවකයා සුව කිරීම : 7:1-10

XVI. වැන්දඹුවකගේ පුතෙකු මරණයෙන් නැගුටුවීම : 7:11-17

XVII. යොහන් බව්තිස්ත පිළිබඳ ප්‍රශ්නය : 7:18-35

XVIII. පාපී ස්ත්‍රියකට කමාව දීම හා ඈ උන්වහන්සේගේ පාද ආලේප කිරීම : 7:36-50

XIX. සමහර ස්ත්‍රීන්ගේ සහය ඇතිව දේශනා කිරීම : 8:1-3

XX. බීජ හා පස පිළිබඳ උපමාව : 8:4-15

XXI. පහන පිළිබඳ උපමාව : 8:16-18

XXII. සැබෑ ආත්මික සබඳතාව : 8:19-21

XXIII. කුණාටුව නිශ්චල කිරීම : 8:22-25

XXIV. යක්ෂාවේශවූවෙකු සුව කිරීම : 8:26-40

XXV. මහලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රියක සුව කිරීම හා යායිරස්ගේ දුව මළවුන්ගෙන් නැගිටවීම : 8:40-56

XXVI. ගෝලයන් දොළොස්දෙනාගේ සේවාව : 9:1-6

XXVII. යොහන් බව්තිස්තගේ මරණය : 9:7-9

XXVIII. 5000 කට කන්ට දීම : 9:10-17

XXIX. පේතෘස්ගේ මහා ප්‍රකාශය : 9:18-21

XXX. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය ගැන කලින් කීම : 9:22

XXXI. ගෝලත්වය සඳහා කැඳවීම : 9:23-27

XXXII. අන්වෙසක් වීම : 9:28-36

XXXIII. මීමැස්මොර රෝගී දරුවා සුව කිරීම : 9:37-45

XXXIV. උතුම්කම ගැන පාඩමක් : 9:46-48

XXXV. ඉවසීම ගැන අදහසක් : 9:49-50

**සතරවන කොටස : යේසුස්වහන්සේ යෙරුසලම බලා පිටත්වීම 10:1-19:48**

I. යෙරුසලමට යෑමේ අධිෂ්ඨානය හා සමාරිය ගමකින් විරෝධය : 9:51-56

II. ගෝලත්වය පිළිබඳ අදහස් : 9:57-62

III. සැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය : 10:1-24

IV. යහපත් සමාරියයා ගැන උපමා කතාව : 10:25-37

V. මරියා හා මාර්තා සමග රාත්‍රී භෝජනය : 10:38-42

VI. යාච්ඤාව පිළිබඳ ඉගැන්වීම : 11:1-13

VII. සාතනික බලය පිළිබඳ චෝදනාවට පිළිතුරු දීම : 11:14-26

VIII. දේව වචනය පිළිපැදීමේ වැදගත්කම : 11:27-28

IX. ලකුණක් සෙවීම : 11:29-36

X. පරිසිවරුන් හා සද්දුසිවරුන් අනාවරණය කිරීම : 11:37-54

XI. අනතුරු ඇඟවීම් 12:1-59
  A. කුහකකමට විරුද්ධව : 12:1-12
  B. තණ්හාවට විරුද්ධව : 12:13-21
  C. කනස්සල්ලට විරුද්ධව : 12:22-34
  D. ස්වාමියා එනතෙක් බලා සිටින සේවකයන් ගැන : 12:35-48
  E. ක්‍රිස්තුස්වහන්සේගේ සේවය අවබෝධ කරගැනීම පිළිබඳව : 12:49-59

XII. පසුතැවිලිවීමට කැඳවීම 13:1-9

XIII. දුර්වලතා ආත්මයකින් සිටි ස්ත්‍රිය සුව කිරීම : 13:10-17

XIV. උපමා : 13:18-30
  A. අබ ඇටය : 13:18-19
  B. මුහුන් : 13:20-21
  C. පටු දොරටුව : 13:22-30

XV. හෙරොද්ගෙන් හා හෙරොද්ට පණිවුඩයක් : 13:31-33

XVI. යෙරුසලම ගැන ශෝකවීම : 13:34-35

XVII. දියඋදර රෝගියෙකු සුව කිරීම : 14:1-6

XVIII. උපමා :
  A. සරණ මංගල්‍ය උත්සවය : 14:7-14
  B. මහා මංගල භෝජනය : 14:15-24
  C. ඉදිකරන්නා 14:25-30
  D. යුද්ධයට යන රජතුමා : 14:31-35
  E. නැතිවූ බැටළුවා : 15:1-7
  F. නැතිවූ කාසිය : 15:8-10
  G. අකීකරු පුත්‍රයා : 15:11-32
  H. අයුක්ති සහගත ගබඩාකාරයා හා පරිසිවරුන් පිළිබඳ විවේචන තවදුරටත්:16:1-18
  I. පොහොසතා හා ලාසරුස් : 16:19-31

XIX. අපරාධ : 17:1-4

XX. ඇදහිල්ල වැඩි කිරීම : 17:5-10

XXI. කුෂ්ඨරෝගීන් සුව කිරීම : 17:11-19

XXII. දේව රාජ්‍යයේ අනාගතය : 17:20-37

XXIII. වැන්දඹුව හා අසාධාරණ විනිශ්වයකරු : 18:1-8

XXIV. පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව : 18:9-14

XXV. කුඩා දරුවන් පිළිගැනීම : 18:15-17

XXVI. පොහොසත් තරුණයා : 18:18-30

XXVII. යේසුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම ගැන කලින් කීම : 18:31-34

XXVIII. යෙරිකෝව අසල අන්ධයෙකු සුව කිරීම : 18:35-43

XXIX. සාකෙවුස්ගේ හැරීම : 19:1-10

XXX. පවුම් පිළිබඳ උපමාව : 19:11-27

**පස්වන කොටස: යේසුස්වහන්සේ යෙරුසලමේදී 19:28-24:53**

I. යේසුස්වහන්සේගේ මරණයට පෙර සිදුවීම් : 19:28-23:25
- A. ජයාන්විතව ඇතුළු වීම : 19:28-48
- B. දේවමාලිගාවේ මතභේද : 20:1-47
  1. අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්නය : 20:1-8
  2. නපුරු ගොවීන් පිළිබඳ උපමාව : 20:9-18
  3. සීසර්ට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය : 20:19-26
  4. නැවත නැගිටීම පිළිබඳ ප්‍රශ්නය : 20:27-40
  5. ප්‍රශ්නයක් හා අනතුරු ඇඟවීමක් : 20:41-47
- C. දේවමාලිගාවේ ඉගැන්වීම් : 21:1-38
  1. වැන්දඹුවගේ පඬුර : 21:1-4
  2. අනාගතය : 21:5-28
  3. අවදිව සිටීමට අවවාද : 21:29-38
- D. පාස්කු මංගල්‍යය හා අවසාන රාත්‍රිය : 22:1-71
  1. යේසුස්වහන්සේට විරුද්ධව කුමන්ත්‍රණය : 22:1-6
  2. පාස්කු මංගල්‍යය සඳහා සූදානම් වීම : 22:7-13
  3. අන්තිම රාත්‍රී භෝජනය : 22:14-23
  4. සැබෑ ශ්‍රේෂ්ඨත්වය : 22:24-30
  5. පේතෘස්ට අවවාද කිරීම : 22:31-34
  6. ගෝලයන්ට අවවාද කිරීම : 22:35-38
  7. ගෙත්සෙමන උයනෙහි යාච්ඤාව : 22:39-46
  8. යේසුස්වහන්සේ අල්ලා ගනු ලැබීම : 24:47-53
  9. පේතෘස්ගේ අපලාපය : 22:54-62

10. යේසුස්වහන්සේගේ නඩු විභාගය : 22:63-71
    a. හේවායින්ගේ නිගා කිරීම : 22:63-65
    b. යුදෙව් මන්ත්‍රණ සභාව මගින් වරදකරු කිරීම : 22:66-71
    c. හෙරොද් ඉදිරිපිට නඩු ඇසීම : 23:1-12
    d. පිලාත් ඉදිරිපිට නඩු ඇසීම : 23:13-25

II. යේසුස්වහන්සේගේ මරණය : 23:26-56

A. කුරුසිපත් කිරීම : 23:26-49

1. ගොල්ගොතාවට යන අතරතුර : 23:26-31
2. කුරුසපත් කිරීම හා යේසුස්වහන්සේට සරදම් කිරීම : 23:32-38
3. පසුතැවිලිවන වරදකරු : 23:39-43
4. යේසුස්වහන්සේගේ මරණය : 23:44-49
5. යේසුස්වහන්සේගේ භූමදානය : 23:50-56

III. යේසුස්වහන්සේගේ නැවත නැගිටීම : 24:1-12

IV. නැවත නැගිටීමෙන් පසු මෙහෙය : 24:13-49

A. එම්මාවුස් ගමන : 24:13-35
B. යෙරුසලමේදී දර්ශනය වීම : 24:36-49
C. අවසාන ආඥාව : 24:44-49
D. යේසුස්වහන්සේගේ ස්වර්ගාරෝහණය : 24:50-53

## ස්වයං පරීක්ෂණය

1. ලූක් පොතේ කතුවරයා කවුරුන්ද?

2. ලූක් පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. ලූක් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. ලූක් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. ලූක් පොතේ ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම පොතේ කර්තෘ වන ලූක් ක්‍රියා පොතද ලියුවේය. ඔබ ක්‍රියා පොත පසුව අධ්‍යයනය කරනු ඇත.

2. මෙම පොතේ කර්තෘ වන ලූක්ගේ ජීවිතය අධ්‍යයනය කරන්න. පොතේ නමද ඔහුගේ නමම වේ. ඔහුගේ කතාව ශුභාරංචි හතරේ හා ක්‍රියා පොතේ සඳහන් වේ.

3. යේසුස්වහන්සේගේ ගෝලයන් පිළිබඳ පහත සටහන අධ්‍යයනය කරන්න.

| නම | මුල් රැකියාව | සේවය කළ ක්ෂේත්‍රය |
|---|---|---|
| පේතෘස් | මාළු අල්ලන්නෙකි | සභාවේ පළමු නායකයා |
| සෙබදිගේ පුත්‍රවූ යාකොබ් | මාළු අල්ලන්නෙකි | යුදය |
| යොහන් | මාළු අල්ලන්නෙකි | යෙරුසලම, එපීසය, පත්මොස්ට පිටුවහල් කෙරිනි. |
| අන්ද්‍රෘ | මාළු අල්ලන්නෙකි | ස්කිතිය, ග්‍රීසිය, ආසියාව |
| පිලිප් | නොදනී | පිරිගිය |
| බර්තොලාමෙව් | නොදනී | ආර්මේනියාව (දැන් තුර්කිය හා ඉරාකය) |
| තෝමස් | නොදනී | පාර්තියා, පර්සියාව, ඉන්දියාව, |
| මතෙව් | සුංගම් අයකරන්නෙකි | ඉතියෝපියාව |
| යාකොබ් | නොදනී | පලස්තීනය, මිසරය |
| තද්දියුස් | නොදනී | අසිරියාව, පර්සියාව |
| සීලට්වරයෙකු වූ සිමොන් | නොදනී | නොදනී |
| යූදස් | නොදනී | නැත |

# සතරවන පරිච්ඡේදය

## යොහන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- යොහන් පොතේ කර්තෘ නම් කිරීමට
- යොහන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- යොහන් පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- යොහන් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යොහන් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ** : යොහන්

**කවුරුන් වෙතද:** යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ලෙස යොහන් පෙන්නුම් කරන සියලුම ඇදහිලිවතුන්ට වේ.

**පරමාර්ථය** : යේසුස්වහන්සේ වනාහි මෙසියස්වහන්සේ, දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව ඒත්තු ගන්වා, මනුෂ්‍යයන් සදාතන ජීවනය වෙත ගෙන යෑම

**ප්‍රධාන පදය** : යොහන් 20:31

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය** : යේසුස්වහන්සේ, ක්‍රිස්තුස්වහන්සේය' ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය, ගැළවීමට හා සදාතන ජීවනය වෙතට ගෙන යන්නාවූ ප්‍රභවය වේ'

**ප්‍රධාන චරිත** : යේසුස්වහන්සේ, යොහන් බව්තිස්ත, ගෝලයන් දොළොස් දෙනා

### සැකිල්ල

**පළමුවන කොටස : 1:1-51**

**I.** ක්‍රිස්තුස් යේසුස්වහන්සේ හඳුන්වාදීම. 1:1-18
- A. යේසුස්වහන්සේ, වාක්‍යාණෝ 1:1-3
  1. පටන්ගැන්මෙහිදී 1:1
  2. දෙවියන්වහන්සේ හා සමග 1:1
  3. දෙවියන්වහන්සේව සිටි සේක. 1:1
  4. මැවීමේ වචනය. 1:2-3
- B. යේසුස්වහන්සේ ජීවනය හා ආලෝකය වූ සේක. 1:4-13
  1. මනුෂ්‍යයන්ගේ ජීවනය හා ආලෝකයය. 1:4

2. අන්ධකාරයේ බැබළුණු ආලෝකය. 1:5
3. යොහන් බව්තිස්ත විසින් සාක්ෂි දෙන ලද ආලෝකය. 1:6-8
4. මනුෂ්‍යයාගේ සත්‍ය වූ ආලෝකය. 1:9
5. සමහරු උන්වහන්සේ පිළිනොගත්හ. 1:10-11
6. අනෙක් අය උන්වහන්සේ පිළිගත්හ. 1:12-13

C. මාංසවත් වූ යේසුස්වහන්සේ 1:14-18
1. දෙවියන්වහන්සේගෙන් උපන්නෝය. 1:14
2. වාක්‍යාණෝ මාංසවත්වී අප අතර වාසය කළ සේක. 1:14
3. මාංසවත්වූ වාක්‍යාණන් ගැන යොහන් බව්තිස්ත සාක්ෂි දුන්නේය. 1:15

D. දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ පූර්ණකම වූ යේසුස්වහන්සේ. 1:16-18

**II.** යොහන් බව්තිස්තගේ සාක්ෂිය : 1:19-34

A. මෙසියස්වහන්සේ වන යේසුස්වහන්සේට : 1:19-28
1. ප්‍රශ්න කිරීම : 1:19-22
2. පිළිතුර: 1:23
3. ප්‍රශ්න අසන්නෝ: 1:24
4. තවත් ප්‍රශ්න කිරීම: 1:25
5. පිළිතුර: 1:26-27
6. දෙබස සිදුවූ ස්ථානය: 1:28

B. බැටළු පැටියාණන් හා පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ: 1:29-36
1. බව්තිස්මය : 1:29-34
2. ප්‍රකාශය : 1:35-36

**III.** පළමු ගෝලයන් : 1:35-51

A. අන්ද්‍රෑ : 1:34-40
B. සීමොන් : 1:40-42
C. පිලිප් : 1:43-44
D. නතානියෙල් : 1:45-51

**දෙවන කොටස: ප්‍රසිද්ධ සේවය 2:1-12:50**

I. ජලය, මුද්‍රිකපානය බවට හැරවීම : 2:1-10

A. පසුබිම : 2:1
B. සහභාගිකයෝ : 2:2
C. ගැටලුව : 2:3-5
D. විස්මයජනක විසඳුම : 2:6-11

II. දේව මාලිගාව කෙරෙහි අධිකාරී බලය : 2:12-25

A. යෙරුසලමට සංක්‍රමණය වීම : 2:12-13
B. දේවමාලිගාව පවිත්‍ර කිරීම : 2:14-22
1. පවිත්‍ර කිරීම : 2:14-16
2. ගෝලයන්ට මතක් වීම : 2:17
3. අනාවැකිය : 2:18-21
4. ගෝලයන්ට මතක් වීම : 2:22

C. පවිත්‍ර කිරීම සඳහා ප්‍රතිචාරය : 2:23-25

III. නිකදෙමුස් සමග සංවාදය : 3:1-21

A. පසුබිම : 3:1-2
B. ප්‍රකාශය : 3:2
C. ප්‍රතිචාරය : 3:3
D. පළමු ප්‍රශ්නය : 3:4
E. ප්‍රතිචාරය : 3:5-8
F. දෙවන ප්‍රශ්නය : 3:9
G. ප්‍රතිචාරය : 3:10-21

IV. යොහන් බව්තිස්ත විසින් යේසුස්වහන්සේ පරීක්ෂා කර බැලීම : 3:22-36

A. පසුබිම : 3:22-24
B. ප්‍රශ්නය : 3:25-26
C. පිළිතුර : 3:27-36

V. සමාරියයන් අතර මෙහෙවර : 4:1-42

A. සමාරියේ පසුබිම : 4:1-6
B. ස්ත්‍රියකට සාක්ෂි දැරීම : 4:7-26
C. ගෝලයන්ගේ විස්මය : 4:27
D. සමාරියේ ස්ත්‍රියගේ සාක්ෂිය : 4:28-30
E. ගෝලයන් සඳහා දර්ශනයක් : 4:31-38
F. සමාරියේ මෙහෙවරේ ප්‍රතිඵල : 4:39-42

VI. ගලිලයේදී භාස්කමක් : 4:43-54

A. ගලිලයට සංක්‍රමණය වීම : 4:43-45
B. නිලධාරියෙකුගේ පුත්‍රයෙකු සුව කිරීම : 4:46-54

VII. සබත් දවසේ රෝගී බවින් සුවයට : 5:1-47

A. සබත් දවසේ සුව කිරීම : 5:1-9
B. යුදෙව්වන් හා සුව කරනු ලැබූ මිනිසා : 5:10-13
C. යේසුස්වහන්සේ හා සුව කරනු ලැබූ මිනිසා : 5:14
D. යුදෙව්වන් හා සුවකරනු ලැබූ මිනිසා : 5:15-18
E. සුව කිරීමෙන් පසු දේශනාවක් : 5:19-47
  1. දෙවියන්වහන්සේ හා සම තත්වයක් තමාට ඇති බව යේසුස්වහන්සේ පවසයි : 5:19-29
    a. ක්‍රියාවන් තුළින් : 5:19-21
    b. නැවත නැගුටුවීම : 5:21
    c. විනිශ්චය : 5:22-29
    d. ගෞරවයෙන් : 5:23
  2. යේසුස්වහන්සේගේ දිව්‍යමය බවට සාක්ෂි දැක්වීම : 5:30-40
    a. තමන්වහන්සේටම සාක්ෂිය : 5:30-32
    b. යොහන් බව්තිස්ත : 5:33-35
    c. යේසුස්වහන්සේගේ ක්‍රියා : 5:36
    d. පියාණන්වහන්සේ : 5:37-38
    e. ශුද්ධ ලියවිල්ල : 5:39
  3. අවිස්වාසය හෙළා දැකීම : 5:40-47

VIII. ජීවනයේ රොටි වූ ක්‍රිස්තුස්වහන්සේ : 6:1-15

A. පසුබිම : 6:1-4

B. ගැටලුව : 6:5-7

C. පන්දහසකට කන්ට දීම : 6:8-13

D. බලාපොරොත්තු කඩ වූ ප්‍රතිඵල : 6:14-15

IX. කුණාටුවක් මධ්‍යයේ බිය ඇදහිල්ල දක්වා වෙනස් වීම : 6:16-21

X. 5000 කට කන්ට දීමෙන් සිදු වූ දේ : 6:22-71

A. පන්දහස නැවත රැස්වීම : 6:22-24

B. ජීවනදායක රොටිය පිළිබඳ සංවාදය : 6:25-71

1. මෝසෙස්ගේ රොටි හා යේසුස්වහන්සේගේ රොටි සැසඳීම : 6:25-34
2. සදාතන ජීවනය පෝෂණය කරන රොටි : 6:35-40
3. ස්වර්ගයෙන් දෙන ජීවනදායක රොටිය : 6:41-51
4. ක්‍රිස්තුස්වහන්සේගේ මරණයේ රොටිය : 6:52-59

C. සංවාදයේ ප්‍රතිඵල : 6:60-71

1. බොහෝ අය ආපසු හැරුණෝය : 6:60-66
2. දොළොස් දෙනෙක් ඉතිරි වූහ 6:67-71

XI. යේසුස්වහන්සේ යෙරුසලමේ මංගල්‍යයට යෑම: 7:1-53

A. යෙරුසලමට යෑම : 7:1-10

B. යේසුස්වහන්සේ යෙරුසලමේදී :මතභේදයට තුඩුදෙන තැනැත්තෙක් : 7:11-13

C. යේසුස්වහන්සේගේ විවේචකයන්ගේ නොගැළපෙන භාවය :7:14-24

D. යේසුස්වහන්සේ: අනුමාන සිතුවිලි ඇති කරන පුද්ගලයා :7:25-36

E. යේසුස්වහන්සේගේ ප්‍රකාශය :7:37-39

F. බෙදුනු සමූහය :7:40-44

G. බෙදුනු මන්ත්‍රණ සභාව: 7:45-53

XII. දේවමාලිගාවේ ඉගැන්වීම: 8:1-59

A. කාමමිථ්‍යාචාරයේ හැසුරුණු ස්ත්‍රිය : 8:1-8:11

B. යේසුස්වහන්සේ ලෝකයේ ආලෝකයය : 8:12-20

C. කුරුසිය පිළිබඳ පෙර දැක්මක් හා සමූහයේ ප්‍රතිචාරය : 8:21-30

D. යුදෙව්වන් හා ගෝලත්වය : 8:31-59

1. සත්‍යයේ දැනුම තුළින් නිදහස : 8:31-36
2. ආබ්‍රහම්ගේ පුත්‍රයෝ : 8:37-40
3. සාතන්ගේ පුත්‍රයෝ : 8:41-47
4. යක්ෂයෙකු ආවේශ වී ඇතිබවට චෝදනා : 8:48-52

E. ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම්: යේසුස්වහන්සේට එදිරිව ආබ්‍රහම් 8:52-59

XIII. යේසුස්වහන්සේ අන්ධයෙකු සුව කරයි. 9:1-41

A. උපන්දා සිට අන්ධ වූ මිනිසෙකු සුවය ලබයි. 9:1-7

B. අන්ධ මිනිසාගේ අසල්වාසීන්ගේ ප්‍රතිචාරය 9:8-12

C. පරිසිවරුන්ගේ ප්‍රතිචාරය 9:13-34

1. අන්ධ මිනිසා සමග සම්මුඛ සාකච්ජාවක් 9:13-17
2. ඔහුගේ දෙමව්පියන් සමග සම්මුඛ සාකච්ජාවක් 9:18-23
3. අන්ධ මිනිසා සමග තවත් සම්මුඛ සාකච්ජාවක් 9:24-34

D. සමාප්තිය: යේසුස්වහන්සේ, අන්ධ මිනිසා හා පරිසිවරු: 9:35-41

XIV. එඬේරත්වය පිළිබඳ සංවාදයක් 10:1-42
A. බැටළුවන්ගේ සැබෑ එඬේරා 10:1-6
B. බැටළුවන්ට දොරටුව 10:7-10
C. බැටළු රැළෙහි යහපත් එඬේරා 10:11-18

XV. යේසුස්වහන්සේ කෙරෙහි විරෝධතාවන් පැන නැගීම : 10:19-42
A. යක්ෂාවේශ වීම පිළිබඳව බෙදීම: 10:19-21
B. පැහැදිලි ලෙස කතා කිරීමට බල කිරීම :10:22-24
C. යේසුස්වහන්සේගේ ප්‍රතිචාරය :10:25-30
D. දේවාපහාස කිරීම සඳහා මරණීය දඬුවම දීම වැළකේ : 10:31-39
E. යොර්දාන් ගඟෙන් එගොඩ ආරක්ෂාව ලැබීම: 10:40-42

XVI. මරණය ජීවනයට හැරේ: 11:1-44
A. පසුබිම :11:1-6
B. සැලැස්ම :11:7-16
C. පැමිණීමට නියමිත සිද්ධින්වල වැදගත්කම පිළිබඳ සංවාදය :11:17-27
D. මරණයේ බලාපොරොත්තු රහිත බව :11:28-39
E. ලාසරස් මරණයෙන් නැගුටුවීම :11:40-44
F. හාස්කමේ ප්‍රතිඵල :11:45-12:11
1. අදහාගත් සමහරුන්ගේ ප්‍රතිචාරය :11:45
2. මන්ත්‍රණ සභාවේ ප්‍රතිචාරය :11:46-53
3. යේසුස්වහන්සේගේ ආරක්ෂාව පිළිබඳ කාරණා :11:54-57
4. මරණය සඳහා ආලේප කරනු ලැබීම : 12:1-8
5. විවිධ ප්‍රතිචාර: 12:9-11

XVII. යේසුස් රජතුමා: 12:12-50
A. රජතුමාගේ ජනප්‍රියතාව වැඩිවීම: 12:12-19
B. ග්‍රීක්වරුන් රජතුමා බැහැ දැකීම: 12:20-22
C. රජතුමාගේ මරණය: 12:23-50
1. රජතුමාගේ මරණය ගැන අනාවැකිය: 12:23-27
2. පියාණන්වහන්සේගෙන් රජතුමාට සහතිකය: 12:28-30
3. රජතුමා විසින් සාක්ෂි දැරීම: 12:30-36
4. රජතුමා කෙරෙහි අවිශ්වාසය: 12:37-43
5. රජතුමා කෙරෙහි විශ්වාසය: 12:44-50

**තෙවන කොටස : පෞද්ගලික මෙහෙය 13:1-17:26**

I. අන්තිම රාත්‍රි භෝජනය: 13:1-38
A. ආදර්ශ පාඩමක්: පාද සේදීම: 13:1-11
1. අවස්ථාව: 13:1-3
2. ක්‍රියාව: 13:4-5
3. ක්‍රියාවේ අර්ථ නිරූපණය: 13:6-17
B. යුදස් අනාවරණය කිරීම: 13:18-30
C. යේසුස්වහන්සේගේ වෙන්වීම කලින් කීම: 13:31-35

D. පේතෘස්ගේ අපලාපය කලින් කීම: 13:36-38

II. සුදානම හා සැනසිල්ල පිළිබඳ පණිවුඩයක්: 14:1-27

A. සුදානම :14:1-4

B. මාර්ගය: 14:5-15

C. සැනසිලිදායකයාණෝ: 14:16-21,26

D. තමන්වහන්සේම පිළිබඳව විද්‍යමානවීම :14:22-31

III. යේසුස්වහන්සේ සමග ඉතා වැදගත් සම්බන්ධය: 15:1-27

A. මිදිවැල සමග පැවතීම: 15:1-8

B. ප්‍රේමයෙන් පැවතීම: 15:9-17

C. ලෝකයාගෙන් වෙන්වීම: 15:18-25

D. සැනසිලිදායකයාණන් සමග පැවතීම: 15:26-27

IV. අනාගතයේ පෙර දැක්මක්: 16:1-33

A. පැමිණිමට නියමිත පීඩාවන් ගැන අනාවැකි: 16:1-6

B. පැමිණිමට නියමිත සැනසිලිදායකයාණෝ: 16:7-16

C. ක්‍රිස්තුස්වහන්සේ ආපසු ස්වර්ගයට යන බවට අනාවැකිය: 16:16

D. වික්ෂිප්ත වූ ගෝලයෝ :16:17-19

E. දුක ප්‍රීතියට හැරවීම :16:20-30

F. අනාගතය සඳහා ඇදහිල්ල: 16:31-33

V. යේසුස්වහන්සේගේ යාච්ඥාව: 17:1-26

A. තමන්වහන්සේ උදෙසා: 17:1-8

B. උන්වහන්සේගේ වර්තමාන ගෝලයන්ට: 17:9-19

C. උන්වහන්සේගේ අනාගත අනුගාමිකයන්ට: 17:20-26

**සතරවන කොටස: අවසාන දවස් 18:1-19:42**

I. අල්ලා ගැනීම: 18:1-14

A. උයනෙහි රැස්වීම: 18:1

B. යුදස්ගේ පාවාදීම: 18:2-3

C. යේසුස්වහන්සේ විරෝධතාවක් නොදැක්වීම: 18:4-9

D. යේසුස්වහන්සේ විසින් ප්‍රචණ්ඩත්වය ඉවත් කිරීම: 18:10-11

E. අන්නස් වෙතට ගෙන යෑම: 18:12-14

II. පේතෘස්ගේ අපලාපය: 18:15-18

III. අන්නස් ඉදිරියේ නඩු විභාගය: 18:19-24

A. විත්තිය වෙනුවෙන් සාක්ෂිය: 18:19-21

B. අන්නස්ගේ විනිශ්චය :18:22-24

IV. පේතෘස්ගේ දෙවන අපලාපය: 18:25-26

V. පේතෘස්ගේ තෙවන අපලාපය: 18:26-27

VI. පිලාත් ඉදිරියේ නඩු විභාගය: 18:28-19:16

A. ප්‍රසිද්ධ නඩු විභාගය: 18:28-32

B. පුද්ගලික නඩු විභාගය: 18:33-38

C. බරබ්බස්: 18:38-40

D. රෝමවරුන් නිග්‍රහ කිරීම: 19:1-3

E. මරණය බල කිරීම: 19:4-8

F. සමාව දීම ප්‍රතික්ෂේප කිරීම: 19:9-16

VII. යේසුස්වහන්සේගේ මරණය: 19:17-30

A. කුරුසිපත් කිරීම: 19:17-18

B. මරණ දැන්වීමේ මාතෘකාව: 19:19-22

C. නොසැලකිලිමත් බව පෙන්වීම: 19:23-24

D. මරණයෙන් දුකට පත්වීම: 19:25-27

E. යේසුස්වහන්සේගේ මරණය: 19:28-30

VIII. භූමදානය :19:31-42

A. ශරීරය පරීක්ෂා කර බැලීම: 19:31-37

B. භූමදානය: 19:38-42

### පස්වන කොටස: නැවත නැගිටීම හා දර්ශනය වීම 20:1-21:23

I. යේසුස්වහන්සේ නැවත නැගිටීම: 20:1-31

A. විවෘත සොහොන පිළිබඳ සාක්ෂි: 20:1-10

B. පණිවුඩකරුවන් දෙදෙනෙකුගේ සාක්ෂිය :20:11-13

C. නැගිටුනු ස්වාමින්වහන්සේගේ සාක්ෂිය: 20:14-29

1. මග්දලායේ මරියාට: 20:14-18
2. තෝමස් නොමැතිව අනෙක් ගෝලයන්ට: 20:19-25
3. තෝමස්ට හා ගෝලයන්ට: 20:26-29

D. සමාප්තික සාරාංශය: 20:30-31

II. මුහුද ළඟ රැස්වීම: 21:1-23

A. අසාර්ථක මසුන් ඇල්ලීමේ රාත්‍රියක්: 21:1-3

B. දක්ෂ මසුන් අල්ලන්නෙකුගේ (යේසුස්වහන්සේ) විසඳුමක්: 21:4-6

C. යේසුස්වහන්සේ සමග උදෑසන ආහාරය: 21:7-14

D. පේතෘස් නැවත පත් කරනු ලැබීම: 21:15-19

E. පුරාවෘත්තයක ආරම්භය: ශ්‍රාවක යොහන් නොමැරෙන්නේය යන්න වේ: 21:20-23

### සමාප්තිය 21:24-25

I. සාක්ෂි දෙන හා මෙය ලියන ගෝලයා යොහන් වේ: 21:24

II. යොහන් විසින් වාර්තා නොකරන ලද තව බොහෝ සිද්ධීන් තිබේ: 21:25

## ස්වයං පරීක්ෂණය

1. යොහන් පොතේ කතුවරයා කවුරුන්ද?

2. යොහන් පොත සඳහා පරමාර්ථය ලියන්න.

3. යොහන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. යොහන් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. යොහන් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යේසුස්වහන්සේ යොහන් පොතේ, තමන්වහන්සේ පිළිබඳව ප්‍රකාශ බොහොමයක් කර ඇත. මේ සෑම ප්‍රකාශයකම "මම . . . වෙමි" යන අදහස ඇත. පහත දැක්වෙන යොමුකිරීම් අධ්‍යයනය කරන්න.

- මම . . . වෙමි (මෙසියස්වහන්සේ) 4:26, 8:24,28, 13:19, 18:5,6,8
- ජීවනදායක කෑම නම් මමය 6:35, 41, 48, 51
- ලෝකයේ ආලෝකය මමය 8:12
- දොරටුව මමය 10:7, 9
- මම යහපත් එඬේරා වෙමි 10:11,14
- නැවත නැගිටීමද ජීවනයද මමය 11:25
- මාර්ගයද, සත්‍යද, ජීවනයද මම වෙමි 14:6
- මම සැබෑවූ මිදිවැලය 15:1,5
- ආබ්‍රහම් උපදින්ටත් පෙර මම විමි 8:58

2. දෙවියන්වහන්සේ සමග ඇති යේසුස්වහන්සේගේ සබඳතාව අධ්‍යයනය කරන්න.

- වැඩ කිරීමේදී 5:19
- ගෞරවයේදී 5:23
- දැනගැනීමේදී 5:20
- පුනරුත්පාදනයේදී 5:24-25
- නැවත නැගිටීමේදී 5:28-29
- ස්වයං-පැවැත්මේදී: 5:26

3. යේසුස්වහන්සේ, තනි පුද්ගලයන් සමග හෝ කුඩා කණ්ඩායම් සමග හෝ පෞද්ගලික සම්මුඛ සාකච්ජා පැවැත්වූ අවස්ථාවන් අටක් ගැන යොහන් පවසයි.

- පේතෘස් හා නතානියෙල් 1:35-51
- නිකොදේමුස් 3:1-21
- සිකාර් හි ස්ත්‍රිය 4:6-26
- අන්ධව ඉපදුනු මිනිසා 10:35-51
- මාර්තා හා මරියා 11:1-57
- ප්‍රේරිතයෝ 13:1-16:33
- මග්දලායේ මරියා 20:1-18
- පේතෘස් 21:15-23

4. යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ ලෙස ප්‍රකාශ කළ සාක්ෂිකරුවෝ සත් දෙනෙක් යොහන් පොතේ සිටිති.

- යොහන් බව්තිස්ත 1:34
- තෝමස් 20:28
- නතානියෙල් 1:49
- යොහන් 20:31
- පේතෘස් 6:69
- යේසුස්වහන්සේම 10:36
- මාර්තා 11:27

5. යොහන් බව්තිස්තගේ ජීවිතය අධ්‍යයනය කරන්න.

- ඔහුගේ තනතුර යොහන් 1:6-8
- ඔහුගේ ඇඳුම් හා ආහාර මතෙව් 3:4
- ඔහුගේ පණිවුඩය මතෙව් 3:2-10
- ලූක් 3:3-6,13-14, යොහන් 1:29
- අනාවැකි කියන ලද්දේ යෙසා 40:3-5, මලාකි 3:1

- ඔහුගේ සාක්ෂිය යොහ. 1:20,23,27, 3:29-30
- ඔහුගේ අනාවැකි යොහ. 3:34-35, ලූක් 3:16
- යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ බවට
  නැවත ප්‍රකාශ කිරීම මතෙ. 11:2-6
- යේසුස්වහන්සේ විසින් මතෙ. 11:7-11
  යොහන්ට ප්‍රශංසා කිරීම

6. මෙම ශුභාරංචිය ලියූ ශ්‍රාවක යොහන්, යොහන් 1, 2 හා 3 පොත්ද එළිදරව් පොතද ලියුවේය. ඔබ මේවා පාඨමාලාවේ ඉදිරියේදී අධ්‍යයනය කරනු ඇත.

7. යොහන් විසින් ශුද්ධාත්මයාණන්වහන්සේ සඳහා භාවිත කළ නම් අධ්‍යයනය කරන්න.
   - සදාකල්ම සිටින 14:16-17
   - ගුරුවරයාණෝ 14:25-26
   - සාක්ෂිකරුවාණෝ 15:26
   - අගවා දෙන තැනැන්වහන්සේ 16:7-11
   - මගපෙන්වන තැනැන්වහන්සේ 16:13-15

8. යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ලෙසත් (උන්වහන්සේගේ දිව්‍යමය ස්වභාවය) මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙසත් (උන්වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවය) යොහන් ඉදිරිපත් කරයි. පහත දැක්වෙන පද අධ්‍යයනය කරන්න.

   දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ : 1:34,49, 3:18, 5:25, 10:36, 11:4,27, 19:7, 20:31

   මනුෂ්‍ය පුත්‍රයාණෝ : 1:51, 3:13-14, 5:27, 6:27,53,62, 8:28, 9:35, 12:23-24

9. යේසුස්වහන්සේගේ දේවත්වය අවධාරණය කිරීම සඳහා යොහන්, "දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්" යන්නට අමතරව තවත් යොමුවන් බොහොමයක් භාවිත කර ඇත. යේසුස්වහන්සේගේ දේවත්වය අවම වශයෙන් එක් වරක්වත් සෑම පරිච්ඡේදයකම සඳහන් වේ. 1:49, 2:11, 3:16, 4:26, 5:25, 6:33, 7:29, 8:58, 9:37, 10:30, 11:27, 12:32, 13:13, 14:11, 15:1, 16:28, 17:1, 18:11, 19:7, 20:28, 21:14.

10. මෙම පොතේ කර්තෘ වන යොහන්ගේ ජීවිතය අධ්‍යයනය කරන්න.
    - ඔහුගේ පවුල: යොහ. 21:2, 19:25, මතෙ. 27:56, මාක් 15:40
    - ඔහුගේ රැකියාව : මාක් 1:19-20
    - මුල් සභාවේ ඔහුගේ නායකත්වය : ක්‍රියා 4:1-22, 8:14-15, ගලාති 2:9
    - ඔහුගේ පිටුව යෑම : 1:1,4,9

11. යේසුස්වහන්සේට විරුද්ධව පැන නැගි විවිධාකාර විරෝධතා අධ්‍යයනය කරන්න. පහත දැක්වෙන සටහන පුරවන්න.

| යොමුව | විරෝධතාවේ ප්‍රභවය | විරෝධතාවේ ආකාරය | විරෝධතාවට හේතු |
|---|---|---|---|
| 5:16 | | | |
| 18 | | | |
| 43 | | | |
| 6:41 | | | |
| 52 | | | |
| 61,66 | | | |
| 70 | | | |
| 7:1 | | | |
| 5 | | | |
| 11 | | | |
| 12 | | | |
| 20 | | | |
| 27,30 | | | |
| 32 | | | |
| 41,44 | | | |
| 45 | | | |
| 47 | | | |
| 8:6 | | | |
| 13 | | | |
| 48,53,59 | | | |
| 9:16 | | | |
| 22 | | | |
| 24 | | | |
| 10:19 | | | |
| 24,31 | | | |
| 39 | | | |
| 11:46 | | | |
| 53 | | | |
| 56-67 | | | |
| 12:4 | | | |
| 10 | | | |
| 19 | | | |

# ඓතිහාසික පොතට හැඳින්වීම

නව ගිවිසුමේ ඇති එකම ඓතිහාසික පොත ක්‍රියාපොත වේ. එහි වාර්තා වන්නේ යේසුස්වහන්සේ නැවත ස්වර්ගයට ගිය පසු හා පෙන්තකොස්ත දිනයෙන් පසු සිද්ධීන් වේ. එහි පළමු සභාවේ උපත හා ඓතිහාසික වාර්තාව ද අන්තර්ගතය.

# පස්වන පරිච්ඡේදය

## ක්‍රියා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- ක්‍රියා පොතේ කර්තෘ නම් කිරීමට
- ක්‍රියා පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- ක්‍රියා පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- ක්‍රියා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ක්‍රියා පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ:** ලූක්

**කවුරුන් වෙතද :** මෙම පොත විශේෂයෙන්ම තියෝපිලස් වෙත යයි සඳහන් වුවද සියලුම ඇදහිලිවතුන් වෙත ලියන ලද්දකි.

**පරමාර්ථය :** මෙම පොත සැලකිලිමත් වන්නේ යේසුස්වහන්සේ සිය ස්වර්ගාරෝහණයෙන් පසු තම ආත්මික ශරීරය, එනම් සභාව තුළින් තවදුරටත් කළාවූද ඉගැන්වූවාවූද දේ පිළිබඳව වේ. (ක්‍රියා 1:1-2)

**ප්‍රධාන පදය :** ක්‍රියා 1:8

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** ශුද්ධාත්මයාණන්වහන්සේගේ සැබෑ සාක්ෂිය වන්නේ යොමු කළ බලය වේ. එම බලය ලෝකය මුළුල්ලේම ශුභාරංචිය පැතිරවීම සඳහා සාක්ෂිකාරයන් වීම සඳහා වේ.

**ප්‍රධාන චරිත :** යොහන්, පේතෘස්, පාවුල්, සීලස්, බාර්ණබස්, යොහන්මාක්, පිලිප්, ස්තේපන්, අනනියස් හා සප්පිරා, දොර්කස්, කොරනේලියස්, පිලික්ස්, අග්‍රිපා

### සැකිල්ල

(සටහන : මෙම සැකිල්ල, යෙරුසලමේ සිට යුදයෙහි, සමාරියෙහි හා පොළොවේ සීමාන්තය දක්වා ශුභාරංචිය පැතිරවීමට ස්වාමින්වහන්සේ ක්‍රියා 1:8 මගින් දෙන ලද ආඥාව අනුව වේ)

## හැඳින්වීම
## ක්‍රියා 1:1-11

I. හැඳින්වීම 1:1-2
   A. තියෝපිලස්ට 1:1
   B. යේසුස්වහන්සේ උන්වහන්සේගේ ඔසවා ගැනීමෙන් පසු සිය ආත්මික ශරීරය වූ සභාව තුළින් කළ හා ඉගැන්වූ දේ පිළිබඳවය. 1:1-2

II. නැවත නැගිටීමෙන් පසු යේසුස්වහන්සේගේ සේවය 1:3
   A. කාල සීමාව දවස් හතළිසකි 1:3
   B. එහි පරමාර්ථය නොවරදින සුලු ඔප්පු කිරීමකි 1:3
   C. එහි පණිවුඩය දේව රාජ්‍යයය 1:3

III. සිය ගෝලයන් සමග යේසුස්වහන්සේගේ අවසාන හමුව 1:4-8
   A. ගෝලයන්ට දුන් ආඥාව 1:4-5
   B. ගෝලයන්ගේ ප්‍රශ්නය 1:6
   C. ගෝලයන්ට අනතුරු ඇඟවීමක් 1:7
   D. ගෝලයන්ට දුන් පැවරුම 1:8

IV. යේසුස්වහන්සේ ස්වර්ගාරෝහණය වීම 1:9-11
   A. ස්වර්ගාරෝහණයේ විස්තරය 1:9
   B. උන්වහන්සේගේ දෙවන පැමිණීම ප්‍රකාශ කිරීමක් 1:10-11

## පළමු වන කොටස:
## යෙරුසලමේ සාක්ෂිකරුවන් තැනීම
## ක්‍රියා 1:12-2:7

I. සාක්ෂිකරුවන් තැනීම 1:12-2:4

   A. ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් යෙරුසලමේ නැවතී සිටීම 1:12-26
      1. ගෝලයන් එක් රැස්වීම 1:12-15
         a. ඔවුන් රැස්වන ස්ථානය 1:12-13
         b. ඔවුන්ගේ නම් හා සංඛ්‍යාව 1:13-15
         c. ඔවුන්ගේ පරමාර්ථය 1:14
      2. ගෝලයන්ට දෙන ලද අවවාද 1:15-22
         a. කථිකයා: පේතෘස් 1:15
         b. පණිවුඩය 1:16-22
            (1) පසුබිම 1:16-20
            (2) උපදෙස් 1:21-22
      3. ගෝලයන්ගේ ප්‍රතිචාරය 1:23-26
         a. නම් ඉදිරිපත් කිරීම 1:23
         b. යාච්ඤාව 1:24-25
         c. තෝරාගැනීම 1:26

B. ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය 2:1-4
   1. අවස්ථාව 2:1
   2. සෙනඟ 2:1
   3. ස්ථානය 2:1
   4. සිද්ධිය 2:2-4
      a. සුළඟ 2:2
      b. ගිනි දලු වැනි දිව් 2:3
      c. අන්‍ය භාෂාවලින් කතා කිරීම 2:4

**දෙවන කොටසඃසාක්ෂිය යෙරුසලමෙහි ක්‍රියා කිරීම**
**ක්‍රියා 2:5-7**

**I.** පළමු සාක්ෂිය 2:4-40
A. සාක්ෂිය දෙන ලද ආකාරය 2:4-6
B. සාක්ෂියට දැක්වූ ප්‍රතිචාරය 2:7-13
C. පේතෘස්ගේ දේශනාව 2:14-36
   1. කාලය පිළිබඳ අනාවැකිය 2:17
   2. ආත්මය පිළිබඳ අනාවැකිය 2:17-18
   3. සිදුවීම පිළිබඳ අනාවැකිය 2:19-20
   4. ගැළවීම පිළිබඳ අනාවැකිය 2:21
   5. යේසුස්වහන්සේගේ ක්‍රියා 2:22-36
      a. දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේ අනුමත කරන ලදී 2:22
      b. යේසුස්වහන්සේ කුරුසියෙහි ඇණ ගසන ලදී 2:23
      c. යේසුස්වහන්සේ මරණයෙන් නැගිටුණු සේක 2:24-32
      d. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණතට උසස් කෙරිණි 2:33-35
      e. දැන් යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේද ක්‍රිස්තුස්වහන්සේද වන සේක. 2:36
D. පණිවුඩයට දැක්වූ ප්‍රතිචාරය 2:37-40
   1. ඒත්තුගැනීම 2:37
   2. විමසීම 2:37
   3. උපදෙස් 2:38
   4. පොරොන්දු 2:38-39
   5. අවවාද කිරීම 2:40

**II.** පළමු ප්‍රාදේශිය සභාව 2:41-47
A. පළමු සභාවේ සාමාජිකත්වය 2:41
   1. ඔවුන්ගේ අනන්‍යතාව : වචනය ලද අය වෙති
   2. ඔවුන්ගේ සංඛ්‍යාව: 3000
B. පළමු සභාවේ ආත්මික ක්‍රියාමාර්ග 2:42
   1. ප්‍රේරිතවරුන්ගේ ධර්මය
   2. ශුද්ධවන්තයන්ගේ සහභාගිත්වය
   3. රොටි කැඩීම
   4. යාච්ඤාව
C. පළමු සභාවේ ජීවන රටාව : 2:44-46
   1. ස්වේච්ඡාවෙන් පොදුවේ භුක්ති විඳීම : 2:44-45

2. දිනපතා නමස්කාරය හා සාක්ෂිය : 2:46
3. නිවෙස්වල සහභාගිකත්වය : 2:46
4. එක්සත්කම 2:46

D. ප්‍රාදේශිය සභාවේ සාක්ෂිය : 2:46-47
1. සාක්ෂියේ ස්වභාවය : 2:46-47
2. සාක්ෂියේ ප්‍රතිඵල : 2:47

**III.** පළමු භාස්කම : 3:1-26

A. භාස්කම විස්තර කිරීම : 3:1-11
1. පසුබිම : 3:1
2. මනුෂ්‍යයා හා ඔහුගේ අවශ්‍යතාව : 3:2-3
3. පණිවුඩය : 3:4-6
4. භාස්කම : 3:7-8
5. සමූහයේ ප්‍රතිචාරය : 3:9-11

B. භාස්කම පහදා දීම : 3:12-18
1. එම මිනිසා සුවය ලැබුවේ ප්‍රේරිතවරුන්ගේ බලයෙන් නොවේ : 3:12
2. එම මනුෂ්‍යයා සුව කරනු ලැබුවේ දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේ මහිමයට පත්කිරීම පිණිසය : 3:13-15
3. එම මනුෂ්‍යයා සුවකරනු ලැබුවේ යේසුස්වහන්සේගේ නාමය කෙරෙහි ඇදහිල්ල කරණකොටගෙනය : 3:16
4. එම මනුෂ්‍යයා සුවකරනු ලැබුවේ අනාවැකිය සම්පූර්ණ කරන ලද බව පෙන්වීමටය : 3:17-18

C. පේතෘස්ගේ පණිවුඩය : 3:19-26
1. පේතෘස් විසින් ලෙන ලද පොරොන්දුව : 3:19-21
   a. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලයට දුන් අභියෝගය : 3:19
   b. දෙවියන්වහන්සේ දුන් පොරොන්දුව : 3:19-21
2. දිවැසිවරුන්ගේ අනාවැකිය : 3:22-26
   a. මෝසෙස්ගේ හා දිවැසිවරුන්ගේ අනාවැකිය : 3:22-24
   b. ගිවිසුමේ පොරොන්දුව : 3:25
   c. මෙසියස්වහන්සේගේ සැලැස්ම : 3:26

**IV.** පළමු විරෝධය : 4:1-31

A. අත් අඩංගුවට ගැනීම : 4:1-4
1. විරෝධතාවේ මූලය : 4:1
2. විරෝධතාවට හේතුව : 4:2
3. විරෝධතාව දැක්වූ ආකාරය : 4:3

B. නඩු විභාගය : 4:5-14
1. උසාවිය : 4:5-6
2. උසාවියෙන් අසන ලද ප්‍රශ්න : 4:7
3. පේතෘස්ගේ ප්‍රකාශය : 4:8-12
   a. ඔහුගේ පිළිතුරේ ප්‍රභවය : 4:8
   b. ඔහුගේ පිළිතුර : 4:9-10
   c. යේසුස්වහන්සේ පිළිබඳ ඔහුගේ සාක්ෂිය : 4:10-12
   d. ගැළවීම පිළිබඳ ඔහුගේ ප්‍රකාශය : 4:12
4. උසාවිය විසින් සලකා බලන ලද සාක්ෂි : 4:13-14
   a. සාක්ෂිකරුවන්ගේ චරිතය : 4:13
   b. සුවය ලැබූ තැනැත්තාගේ සාක්ෂිය : 4:14

5. තීරණය : 4:15-22
    a. අදහස් විමසීම : 4:15-17
    b. තීරණය : 4:17-18
    c. පේතෘස්ගේ හා යොහන්ගේ ප්‍රතිචාරය : 4:19-20
    d. නිදහස් කිරීම : 4:21-22
6. ප්‍රතිචාරය : 4:21-31
    a. සභාවේ යාච්ඤාව : 4:23-30
    b. සභාවේ ක්‍රියාකාරකම් : 4:31

**V.** පාපය සඳහා පළමු හික්මවීම : 4:32-5:16

A. සභාවේ සංවිධානය : 4:32-37
1. එහි සහභාගිකත්වය : 4:32
2. එහි සාක්ෂිය : 4:33
3. එහි ආර්ථිකය : 4:32-37

B. සහභාගිකත්වයට බාධා පැමිණවූ පළමු පාපය : 5:1-10
1. පළමු පාපය : 5:1-2
2. පාපය අනාවරණය වීම : 5:3-4
3. පාපය හික්මවීම : 5:5-10

C. හික්මවීමේ ප්‍රතිඵල : සහභාගිකත්වයේ ඵලදායි සාක්ෂි : 5:11-16
1. සාමාජිකයන්ගේ ගෞරවාන්විත ආකල්පය : 5:11
2. එක්සත්කම : 5:12
3. අරුම පුදුම ලකුණු : 5:12,15-16
4. ප්‍රජාවේ ප්‍රතිචාරය : 5:12-14

**VI.** පළමු පීඩා කිරීම : 5:17-43

A. විරෝධතාවේ ප්‍රභවය : 5:17

B. විරෝධතාකරුවන්ගේ ක්‍රියාව : 5:18

C. දෙවියන්වහන්සේ විසින් මුදාගැනීම : 5:19-26
1. උන්වහන්සේගේ ක්‍රියාව : 5:19
2. උන්වහන්සේගේ නියෝගය : 5:20
3. උන්වහන්සේගේ නියෝගයට ප්‍රතිචාරය : 5:21
4. උන්වහන්සේගේ ක්‍රියාව සොයා ගැනීම : 5:21-23
5. උන්වහන්සේගේ ක්‍රියාවේ ප්‍රතිඵලය : 5:24-26

D. නඩු විභාගය : 5:27-40
1. මන්ත්‍රණ සභාවේ දෝෂාරෝපණය : 5:27-28
2. පේතෘස් නිදහසට කරුණු දැක්වීම : 5:29-32
3. මන්ත්‍රණ සභාව මගින් විමර්ශනය කිරීම : 5:33-39
4. මන්ත්‍රණ සභාවේ තීරණයේ අසාධාරණකම : 5:40

E. පීඩා කිරීමට දැක්වූ ප්‍රතිචාරය : 5:41-42
1. ප්‍රීතිවීම : 5:41
2. එක්සත්බව: දිනපතා මුණගැසීම : 5:42
3. සාක්ෂිදැරීම : ඉගැන්වීම හා දේශනා කිරීම : 5:42

**VII.** පළමු සංවිධානය : 6:1-7

A. සංවිධානයේ අවශ්‍යතාව : 6:1

B. සංවිධානයක් යෝජනා කිරීම : 6:2-4
1. යෝජනාවේ ප්‍රභවය : 6:2

2. යෝජනාවට හේතුව : 6:2
3. යෝජනාව : 6:3
4. යෝජනාවේ වාසිය : 6:4

C. සංවිධානය පිහිටුවීම : 6:5-6
1. භාවිත කළ ක්‍රමය : 6:5-6
2. තෝරාගත් අය : 6:5
3. ඔවුන්ගේ හස්තාලේපණය : 6:6

D. සංවිධානයේ ප්‍රතිඵල : 6:7
1. දෙවියන්වහන්සේගේ වචනය පැතිරීම : 6:7
2. ගෝලයන්ගේ ගණන වැඩිවීම : 6:7
3. ඇදහිල්ලට කීකරු වීම : 6:7

**VIII.** පළමු ප්‍රාණ පරිත්‍යාගියා : 6:8-8:1

A. ස්තේපන් පිළිබඳ විස්තරය : 6:3-15
1. සත්දෙනාගෙන් කෙනෙකි. : 6:3,5
2. ශුද්ධාත්මයෙන් පූර්ණ වූවෙකි : 6:5
3. යහපත් කීර්ති නාමයක් තිබූවෙකි : 6:3
4. ඇදහිල්ලෙන් පිරි මනුෂ්‍යයෙකි : 6:5
5. ප්‍රඥාවන්තයෙකි : 6:3,10
6. විශේෂ බලය ඇති කෙනෙකි : 6:8
7. ඵලදායි සාක්ෂිකරුවෙකි : 6:9-10

B. ස්තේපන්ට හිංසා කිරීම : 6:11-15

C. ස්තේපන්ගේ පණිවුඩය. 7:1-53
1. ආබ්‍රහම් 7:1-8
2. පිතෘවරු 7:9-16
3. මෝසෙස් 7:17-43
   a. මිසරයේදී 7:17-28
   b. පාළුකරයේදී 7:29-43
4. මණ්ඩපය : 7:44-50
   a. මෝසෙස්ගේ : 7:44
   b. යෝෂුවාගේ : 7:45
   c. දාවිත්ගේ : 7:45-46
   d. සාලමොන්ගේ : 7:47-50
   e. දෙවියන්වහන්සේගේ : 7:48-50
5. දිවැසිවරු : 7:51-53

D. ස්තේපන්ගේ සාක්ෂිය : 7:54-8:1
1. මන්ත්‍රණ සභාවේ ආකල්පය : 7:54
2. ස්තේපන්ගේ ප්‍රකාශය : 7:55-56
3. මන්ත්‍රණ සභාවේ ක්‍රියාව :7:57-59
4. ස්තේපන්ගේ මරණය : 7:59-8:1

**තෙවන කොටස : යුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම**
**ක්‍රියා 8-12**

I. සංක්‍රාන්තිය: ස්තේපන්ගේ මරණයේ ප්‍රතිඵල : 8:1-4

A. පීඩා කිරීම : 8:1,3

B. ස්තේපන්ගේ භූමදානය : 8:2

C. සභාවේ සාක්ෂිය පැතිරීම : 8:4

II. පිලිප්ගේ සාක්ෂිය : 8:5-40

A. සමාරියේ සේවය : 8:5-25

1. පිලිප්ගේ සාක්ෂිය : 8:5-13
   a. පිලිප්ගේ වැඩ කටයුතු : 8:5-7,12
   b. සමාරිතයන්ගේ ප්‍රතිචාරය : 8:6-12
   c. මායාකාර සීමොන් : 8:9-13
2. පේතෘස්ගේ හා යොහන්ගේ වැඩ කටයුතු : 8:14-17
   a. පේතෘස්ගේ හා යොහන්ගේ පැමිණීම : 8:14
   b. ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීම : 8:15-17
   c. සීමොන්ගේ ප්‍රතිචාරය : 8:18-19
   d. සීමොන්ට අනතුරු ඇඟවීම : 8:20-24

B. ඉතියෝපියයාට කළ සේවය : 8:26-40

1. සූදානම : 8:26-28
2. සාක්ෂිය : 8:29-35
3. ප්‍රතිචාරය : 8:36-38

C. අසෝතස් බලා යෑම :8:39-40

III. සාවුල්ගේ සාක්ෂිය : 9:1-31

A. සාවුල්ගේ හැරීම : 9:1-9

1. ඔහුගේ පරමාර්ථය : 9:1-2
2. ඔහුගේ දර්ශනය : 9:3-9
3. ඔහුට ඇසුණු හඬ : 9:4-7
4. අන්ධභාවය : 9:8-9

B. අනනියස් මගින් සාවුල් හස්තාලේපණය කිරීම : 9:10-19

1. කැඳවීම : 9:10-16
2. අත් තැබීම : 9:17-19

C. සාවුල්ගේ මෙහෙය : 9:20-31

1. සාවුල් දමස්කයේදී : 9:20-25
   a. ඔහුගේ සාක්ෂිය : 9:20-22
   b. ප්‍රතිචාරය : 9:21-23
   c. ඔහු පලා යෑම : 9:23-25
2. සාවුල් යෙරුසලමේදී : 9:26-30
   a. ඔහු පිළිගැනීම : 9:26-28
   b. ඔහුගේ වැඩ කටයුතු : 9:28-29
   c. ඔහු පිටත්ව යෑම : 9:29-30

D. වෙනස්වීම. සභාවේ ඉතිරි අය : 9:31

IV. පේතෘස්ගේ සාක්ෂිය : 9:32-12:35

A. ලිද්දායෙහි දී : 9:32-35

1. ඇදහිලිවන්තයෝ : 9:32
2. රෝගී මිනිසා : 9:33
3. රෝගී මිනිසා සුව කිරීම : 9:34
4. ප්‍රතිචාරය : 9:35

B. යොප්පාවෙහිදී : 9:36-43

1. දොර්කස්ගේ මරණය : 9:36-37

2. පේතෘස්ගේ කැඳවීම : 9:38-39
3. පේතෘස්ගේ මෙහෙය : 9:40-41
4. මෙහෙය සඳහා ප්‍රතිචාරය : 9:42-43

C. කායිසාරියාවේදී : 10:1-48

1. කොර්නේලියස්ගේ දර්ශනය :10:1-8
    - a. කොර්නේලියස් නම්වූ මිනිසා : 10:1-2
    - b. කොර්නේලියස් දුටු දර්ශනය : 10:3-6
    - c. කොර්නේලියස්ගේ ප්‍රතිචාරය : 10:7-8
2. පේතෘස්ගේ දර්ශනය : 10:9-22
    - a. දර්ශනය : 10:9-12
    - b. හඬ : 10:13-16
3. පණිවුඩකාරයන්ගේ පැමිණීම : 10:17-22
4. කොර්නේලියස්ගේ නිවෙසට යෑම : 10:23-48
    - a. ගමන : 10:23
    - b. පිළිගැනීම : 10:24-27
    - c. පැහැදිලි කිරීම : 10:27-28
    - d. ප්‍රශ්නය : 10:29
    - e. පිළිතුර : 10:30-33
    - f. අවසන් නොකළ දේශනාව : 10:34-43
        - (1) දෙවියන්වහන්සේ මිනිසුන්ගේ තරාතිරම් නොබලන සේක : 10:34-35
        - (2) ශුභාරංචිය පැතිරීම : 10:36-37
        - (3) ශුභාරංචි පණිවුඩය : 10:38-43
    - g. කොර්නේලියස්ගේ ප්‍රතිචාරය : 10:44-48

D. යෙරුසලමේදී : 11:1-12:25

1. විජාතීන්ගේ හැරීම පිළිබඳ ගැටලුව : 11:1-18
    - a. ගැටලුව : 11:1-3
    - b. විජාතීන් අතර දෙවියන්වහන්සේගේ කාර්යයන් ගැන පැහැදිලි කිරීම : 11:4-17
        - (1) දර්ශනය : 11:4-10
        - (2) අමුත්තෝ : 11:11
        - (3) ගිය ගමන : 11:12-16
    - c. තීරණය : 11:18

V. සිරියාවේ අන්තියෝකියේ සභාව : 11:19-30

A. අන්තියෝකියේ ශුභාරංචිය පැතිරීම : 11:19-21
B. බාර්ණබස්ගේ පැමිණීම : 11:22-24
C. සාවුල් පාලක-ගුරුවරයෙකු ලෙස තෝරාගැනීම : 11:25-26
D. අගබස් විසින් විස්තර එළිදරව් කිරීම : 11:27-30

VI. හෙරොද් විසින් මෙහෙයවන ලද පීඩාවන් : 12:1-25

A. ජාකොබ් ඝාතනය කිරීම : 12:1-2
B. පේතෘස් අත් අඩංගුවට ගැනීම : 12:3-4
C. පේතෘස් සිරගෙයින් ගැළවී යෑම : 12:5-19
D. හෙරෝද්ගේ මරණය : 12:20-23

VII. දේව වචනය ප්‍රකාශ කිරීම : 12:24-25

## සතරවන කොටස : පොළොවේ සීමාන්තය දක්වා සාක්ෂිකරුවන් වීම
## ක්‍රියා 13-28

I. පළමු මිෂනාරි ගමන :13:1-14:28
   A. සේවය සඳහා කැඳවීම : 13:1-3
   B. සයිප්‍රසයේ පාපස්හි සේවය : 13:4-12
   C. පිසිදියේ අන්තියෝකියේ සේවය : 13:13-50
      1. පිසිදියාවට යෑම : 13:13-16
      2. පණිවුඩය : 13:17-37
         a. නික්මයාමේ මිදීම : 13:17
         b. පාළුකරයේ ගමන : 13:18
         c. කානාන් දේශය අල්ලාගැනීම : 13:19
         d. සාවුල්ගේ හා දාවිත්ගේ පාලනය : 13:20-23
         e. යොහන් බව්තිස්තගේ සේවය : 13:24-25
         f. යේසුස්වහන්සේගේ කුරුසපත්වීම හා නැවත නැගිටීම : 13:26-37
         g. ආරාධනය : 13:38-41
      3. ප්‍රතිචාරය : 13:42-50
   D. ඉකෝනියෙහි සේවය : 13:51-14:5
   E. ලුස්ත්‍රාවේ සේවය : 14:6-25
   F. සිරියාවේ සේවය : 14:26-28

II. යෙරුසලමෙහි මන්ත්‍රණ සභාව : 15:1-35
   A. ගැටලුව : 15:1-3
   B. සැසි වාරයන්: 15:4-21
      1. පළමු ප්‍රසිද්ධ සැසිය : 15:4-5
      2. ප්‍රේරිතයන්ගේද සහ මූලිකයන්ගේද පෞද්ගලික සැසිය : 15:6
      3. දෙවන ප්‍රසිද්ධ සැසිය : 15:7-21
         a. පේතෘස්ගේ වාර්තාව : 15:7-11
         b. පාවුල්ගේ හා බාර්ණබස්ගේ වාර්තාව : 15:12
         c. යාකොබ්ගේ වාර්තාව : 15:13-21
   C. තීරණය : 15:19-21
   D. හසුන් : 15:22-35

III. දෙවැනි මිෂනාරි ගමන : 15:36-18:22
   A. විවාදය : 15:36-41
   B. ලුස්ත්‍රාවේ ධර්මදූත සේවය : 16:1-5
   C. ත්‍රෝවසයේ ධර්මදූත සේවය : 16:6-10
   D. පිලිප්පියේ ධර්මදූත සේවය : 16:11-40
   E. තෙසලෝනිකයේ ධර්මදූත සේවය : 17:1-9
   F. බෙරියාවේ ධර්මදූත සේවය : 17:10-14
   G. ඇතන්ස්හි ධර්මදූත සේවය : 17:15-34
   H. කොරින්තියේ ධර්මදූත සේවය : 18:1-8
   I. එපීසයේ ධර්මදූත සේවය : 18:19-21
   J. යෙරුසලම හා අන්තියෝකිය : 18:22

IV. තෙවන ධර්මදූත ගමන : 18:23-21:14

A. සුළු ආසියාව : 18:23

B. එපීසයේ සේවය : 18:24-19:41

1. අපොල්ලස් : 18:24-28
2. යොහන්ගේ ගෝලයෝ : 19:1-7
3. තුරානස්ගේ ශිල්පශාලාව : 19:8-12
4. ස්කේවාගේ පුත්‍රයෝ : 19:13-17
5. දෙවියන්වහන්සේ වෙත හැරුණ අයගේ කැපවීම : 19:18-20
6. තීරණය : 19:21
7. අර්තේමිස් (ඩයනා) ගේ රැකවල්හු : 19:23-41

C. මසිදෝනියේ හා ග්‍රීසියේ සේවය : 20:1-5

D. ත්‍රෝවසයේ සේවය : 20:6-12

E. මිලේතසයේ සේවය : 20:13-38

1. ගමන : 20:13-16
2. එපීසයේ සභාමූලිකයන් හමුවීම : 20:17-35
    a. ඔහුගේ සේවය සමාලෝචනය කිරීම : 20:17-21
    b. අනාගතයට මුහුණ දීම : 20:22-24
    c. පාවුලුගේ හෘදය සාක්ෂිය : 20:25-27
    d. අනතුරු ඇඟවීම : 20:28-31
    e. දෙවියන්වහන්සේට පැවරීම : 20:32
    f. වෙහෙස වී වැඩ කිරීමේ පාවුලුතුමාගේ ආදර්ශය : 20:33-35
3. සමුගැනීම : 20:36-38

F. තිර්හි සේවය : 21:1-6

G. තොලිමසයෙහි සේවය : 21:7

H. කායිසාරියේ සේවය : 21:8-14

V. යෙරුසලමට ගිය අවසාන ගමන හා රෝමයට ගිය ගමන : 21:15-28:31

A. යෙරුසලම : 21:15-23:32

1. යෙරුසලමට පැමිණීම : 21:15-17
2. පාවුලුට විරුද්ධ කට කතා : 21:18-30
    a. ඔහු මෝසෙස්ගේ ව්‍යවස්ථාව නින්දාවට පත්කර ඇත : 21:18-26
    b. ඔහු දේවමාලිගාව කෙලෙසා ඇත : 21:27-30
3. පාවුලුගේ ප්‍රතිචාරය : 21:23-26
4. පාවුලු බේරාගැනීම : 2:30-32
5. පාවුලුගේ පිළිතුරු : 21:33-23:10
    a. යුදෙව් සෙනඟ : 22:1-23
    b. රෝම ශතාධිපතියා : 22:24-26
    c. සේනාධිපතියා : 22:26-30
    d. යුදෙව් මන්ත්‍රණ සභාව : 23:1-10
        (1) පාවුලුගේ පාපොච්චාරණය : 23:1
        (2) උත්තම පූජකයා හමුවීම : 23:2-5
        (3) බෙදුනු විනිශ්චය ශාලාවක් : 23:6-10
6. පාවුලුට එළිදරව් වීමක් : 23:11
7. පාවුලුට විරුද්ධව පළිගැනීම : 23:12-15
8. පාවුලු බේරාගැනීම : 23:16-32

a. කුමන්ත්‍රණය එළිදරව් කිරීම : 23:16-22
b. ලිපිය : 23:25-30
c. බේරී යාම : 23:32

B. කායිසාරිය : 23:33-26:32
1. ෆීලික්ස් ඉදිරියේ : 23:33-24:27
    a. තෙර්තුලස්ගේ චෝදනා : 24:1-9
    b. පාවුලුගේ පිළිතුර : 24:10-21
    c. ෆීලික්ස්ගේ ප්‍රතිචාරය : 24:22-27
2. ෆෙස්තුස් ඉදිරියේ : 25:1-12
3. ෆෙස්තුස් හා අග්‍රිපා ඉදිරියේ : 25: 13-27
4. අග්‍රිපා ඉදිරියේ : 26:1-32
    a. පාවුලුතුමා තමා වෙනුවෙන් කතා කරයි : 26:1-23
    b. ගැළවුම්කරුට ආරාධනාවක් : 26:24-29
    c. විනිශ්චය : 26:30-32

C. රෝමයට යද්දී : 27:17-28:31
1. කුණාටුව : 27:1-44
2. සර්පයා : 28:1-6
3. සුවකිරීම : 28:7-10
4. ගමන තවදුරටත් : 28:11-15

D. රෝමය : 28:16-31
1. යුදෙව්වන් සමග රැස්වීම : 28:16-29
2. සේවය : 28:30-31

## ස්වයං පරීක්ෂණය

1. ක්‍රියා පොතේ කර්තෘ කවුරුන්ද?

2. ක්‍රියා පොත සඳහා පරමාර්ථය ලියන්න.

3. ක්‍රියා පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. ක්‍රියා පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. ක්‍රියා පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ක්‍රියා පොතේ සඳහන් සියලුම භාස්කම් අධ්‍යයනය කිරීම සඳහා සටහනක් සකස් කරන්න.

   භාස්කමේ වර්ගය, භාවිත කළ ක්‍රමය, අවස්ථාව, සහභාගිවූවෝ, ප්‍රතිඵල ලෙස සකස් කරන්න.

2. ක්‍රියා පොතේ සඳහන් දේශනා අධ්‍යයනය කරන්න. ඔබගේ අධ්‍යයනය වාර්තා කිරීමට සටහනක් නිර්මාණය කරන්න.

   යොමුව, කථිකයා, ප්‍රේක්ෂකයන්, පණිවුඩයේ සාරාංශය

3. ක්‍රියා පොතේ සඳහන් සියලුම යාච්ඤා අධ්‍යයනය කරන්න. ඔබගේ අධ්‍යයනය සංවිධානය කිරීම සඳහා සටහනක් භාවිත කරන්න.

   යොමුව, අවස්ථාව, යාච්ඤා කළේ කවුරුන්ද, යාච්ඤාවේ සාරාංශය, යාච්ඤාවේ ප්‍රතිඵල

4. පහත දැක්වෙන කටු සටහන භාවිතයෙන් ප්‍රේරිතවූ පාවුලුගේ ජිවිතය අධ්‍යයනය කරන්න.

   - පාවුලුගේ මුල් ජිවිතය. ක්‍රියා 22:3
   - පාවුලු කිතුදහමට පීඩා කිරීම. ක්‍රියා 8:1-4, 9:1-2
   - පාවුලුගේ හැරීම. ක්‍රියා 9:3-21
   - පාවුලුගේ සේවයේ මුල් කාලය. ක්‍රියා 9:22-31, 11:22-30
   - පළමු මිෂනාරි ගමන. ක්‍රියා 13:1 - 14:28
   - යෙරුසලමේ මන්ත්‍රණ සභාව. ක්‍රියා 15:1-35
   - දෙවන මිෂනාරි ගමන. ක්‍රියා 15:36-18:22
   - තෙවන මිෂනාරි ගමන. ක්‍රියා 18:23-21:27
   - පාවුලු යෙරුසලමට යයි, අත් අඩංගුවට ගනී, කායිසාරියට යවයි, සීසර්ගේ විනිශ්චය ඉල්ලා සිටී. ක්‍රියා 21:17-26:32
   - රෝමයට මුහුදෙන් ගිය ගමන. ක්‍රියා 27:1-44
   - පාවුලුගේ පළමු රෝම සිරගතවීම (අවුරුදු දෙකක්) ක්‍රියා 28:1-31
   - පාවුලුගේ අවසාන ගමන්. රෝම 15:28
   - පාවුලුගේ දෙවන රෝම සිරගතවීම හා දිවි පිදීම. 2 තිමෝති 4:6

5. ලූක් ශුභාරංචියේ ලූක් ලියා ඇත්තේ යේසුස්වහන්සේ මාංශික, ශරීරයෙන් සිටියදී කිරීමට ආරම්භ කළ සියලු දේ හා ඉගැන්වූ දේ පිළිබඳවය. ක්‍රියා පොතේ ලූක් වාර්තා කරන්නේ යේසුස්වහන්සේ සිය ආත්මික ශරීරයෙන්, සභාව තුළින්, තවදුරටත් කළ හා ඉගැන්වූ දේ ගැන වේ.

6. ක්‍රියා පොතේ පහත දැක්වෙන පරිච්ඡේදවල සඳහන් පේතෘස් හා පාවුලුගේ සේවාවන් අතර සමානකම් අධ්‍යයනය කරන්න.

| **පේතෘස්** | **පාවුලු** |
|---|---|
| පළමු දේශනාව: 2 | පළමු දේශනාව: 13 |
| කොරෙකු සුවපත් කිරීම: 3 | කොරෙකු සුවපත් කිරීම: 14 |
| මායාකාර සීමොන්: 8 | මායාකාර එලිමස්: 13 |
| සෙවනැල්ලේ බලපෑම: 5 | ලේන්සුවේ බලපෑම : 19 |
| අත් තැබීම: 8 | අත් තැබීම : 19 |
| පේතෘස්ට නමස්කාර කිරීම: 10 | පාවුල්ට නමස්කාර කිරීම 14 |
| තබීතා නැගුටුවීම : 9 | යුතිකස් නැගුටුවීම : 20 |
| පේතෘස් සිරභාරයට ගැනීම: 12 | පාවුල් සිරභාරයට ගැනීම : 28 |

7. පළමු සභාවේ ජීවිත රටාව වූයේ:
   - ප්‍රකාශ කිරීම. 2:4
   - ඒත්තුගැනීම. 2:7
   - හැරීම. 2:37
   - නිතරම 2:42
   - නොකඩවා පැවැත්වන. 2:46
   - සහභාගිත්වයේ යෙදීම. 2:46
   - බෝවීම. 2:47

8. ක්‍රියා පොතේ අන්තර්ගතය මතක තබාගැනීමට පහත දැක්වෙන සාරාංශය උපකාරී වනු ඇත.

| | |
|---|---|
| - පුද්ගලයා | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ |
| - බලය | ශුද්ධාත්මයාණෝ |
| - දේශනාකරුවෝ | පේතෘස්, පාවුලු, ස්තේපන්, පිලිප් |
| - ස්ථාන | යෙරුසලම, යුදය, සමාරිය, පොළොවේ සීමාන්තය |
| - වැඩසටහන | ශුභාරංචි පණිවුඩය පැතිරවීම |

9. ක්‍රියා 2 හි, දිවැසිවර යෝවෙල් කී අනාවැකිය ගැන පේතෘස් සඳහන් කරයි. ඔබට මෙම අනාවැකිය යෝවෙල් 2:28-32 හි කියවිය හැකිය.

# හසුන් සඳහා හැඳින්වීම

නව ගිවිසුමේ ඊළඟ කොටස හසුන් වේ. ඒවා යැවුම් පත්‍ර ලෙසද හැඳින්වේ. ඒවායේ පහත දැක්වෙන පොත් අඩංගු වේ.

**රෝම** : ඇදහිල්ලෙන් පමණක් ගැළවීම ලැබෙන බව අවධාරණය කෙරෙන ලෙසට ශුභාරංචිය ඉදිරිපත් කර ඇත.

1 **කොරින්ති** : ප්‍රාදේශිය සභාවේ කිතුනු චර්යාවේ වැරදි නිවැරදි කිරීම සඳහා ලියන ලද්දකි.

2 **කොරින්ති** : ශුභාරංචියේ, ගබඩාකාරකමේ හා පාවුලුතුමාගේ අපෝස්තලික ආධිපත්‍යයේ සැබෑ සේවය ගැන කතා කරයි.

**ගලාති** : ව්‍යවස්ථාව හා ඇදහිල්ල මිශ්‍ර කිරීමේ වරද ගැන කතා කරයි. මෙහි තේමාව වන්නේ දේව සබඳතාව ඇතිකර ගත හැකි වන්නේ ඇදහිල්ලෙන් පමණක්ය යන්නය.

**එපීස** : යේසුස්වහන්සේ සමග ස්වර්ගීය තත්වයක සිටින ඇදහිලිවතුන් සියලූ දෙනාවම, සභාවේ සාමාජිකයන් ලෙසට දිරිගන්වයි.

**පිලිප්පි** : කිතුනු අත්දැකිමේ ප්‍රීතිය අවධාරණය කරයි.

**කොලොස්සි** : "ඥානවාදයේ" වැරදි ගැන සඳහන් වේ. එය යේසුස්වහන්සේ සැබවින්ම දේව පුත්‍රයා හා මනුෂ්‍ය පුත්‍රයා බව ප්‍රතික්ෂේප කරන ව්‍යාජ ඉගැන්වීමකි. යේසුස්වහන්සේ සභාවේ ප්‍රධානියා බවද මෙම පොත අවධාරණය කරයි.

1 **තෙසලෝනික** : කිතුනු පැවැත්ම ගැන අනුශාසනා කෙරෙන අතර යේසුස්වහන්සේගේ නැවත පැමිණීම අවධාරණය කරයි.

2 **තෙසලෝනික** : ස්වාමින්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ උපදෙස් තවදුරටත් සඳහන් වන අතර ඒ පිළිබඳ දැනුම එදිනෙදා ජීවිතයට බලපෑ යුතු අයුරු දැක්වේ.

1 **තිමෝති** : නිවැරදි ධර්මය, ක්‍රමවත් සභා පාලනය, හා ඉදිරි වසරවල් සඳහා සභාවට මගපෙන්වීමේ ප්‍රතිපත්ති අවධාරණය කරයි.

2 **තිමෝති** : යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ සේවකකම විස්තර කරයි. භක්තිය හැරයාම (ආත්මික පිරිහීම) ගැන අනතුරු අඟවයි. මෙය දැනටමත් ආරම්භ වී ඇති අතර සියලූ වැරදිවලට ප්‍රතිකාරය ලෙසට දේව වචනය ඉදිරිපත් කරයි.

**තීතස්** : මෙය පාවුලුතුමා විසින් තීතස් නම් තරුණ සේවකයෙකුට ලියන ලද ලිපියකි. එහි ක්‍රීතය නමැති දූපතේ දෙවියන්වහන්සේට සේවය කළේය. දේව ධර්මයද භක්තිමත් ජීවිතයක්ද අවධාරණය කර ඇත.

**පිලෙමොන්** : ධනවත් කොලොස්සි කිතුනුවෙකුගේ පලාගිය වහල් දාසයෙකු වෙනුවෙන් පාවුලුතුමාගේ මැදිහත්වීම මෙහි සඳහන් වේ. එය කලක් පාපයට වහල්ව සිටි ඇදහිලිවතුන් වෙනුවෙන් යේසුස්වහන්සේගේ මැදිහත්වීම පෙන්නුම් කරයි.

**හෙබ්‍රෙව්** : යුදාගමට වඩා කිතුදහම උත්තරීතර බව පැහැදිලි කෙරේ. යේසුස්වහන්සේ ශ්‍රේෂ්ඨතම උත්තම පූජකයා බව හා දෙවියන්වහන්සේ හා පව්කාර මිනිසා අතර මැදිහත්කරු බව පෙන්වයි.

**යාකොබ්** : ගැළවීම ලැබෙන්නේ ඇදහිල්ලෙන් පමණක් වුවද සැබෑ ඇදහිල්ලට සාක්ෂිය වන්නේ ක්‍රියාවන් බව උගන්වයි.

1 **පේතෘස්** :විශේෂයෙන්ම නොඇදහිලිවතුන් තුළින් බාහිරින් පැමිණෙන ආත්මික ප්‍රහාරවලින් දුක්විඳින ඇදහිලිවතුන්ට ලියන ලද, සහනය ගෙන දෙන හා දිරිමත් කරන ලිපියකි.

2 **පේතෘස්** : ඇතුළතින් පැමිණෙන ආත්මික ප්‍රහාර පිළිබඳ අනතුරු ඇඟවීමකි. නිදසුනක් ලෙස, දැනටමත් සභාව තුළ උසස් තත්වයක් ලැබී තිබෙන ව්‍යාජ ගුරුවරුන්.

1 **යොහන්** : ක්‍රිස්තුස්වහන්සේ දේවපුත්‍රයා හා මනුෂ්‍ය පුත්‍රයා යන්න ප්‍රතික්ෂේප කරන ඥානවාදයට විරුද්ධව ලියන ලද්දකි. ඇදහිලිවතුන් අතර ප්‍රේමය හා සහභාගිත්වය අවධාරණය කරන අතර සැබෑ ඇදහිලිවතුන්ට සදාතන ජීවිතය සහතික කරයි.

2 **යොහන්** : දේව ධර්මයේ වැරදි සමග එකඟතාවකට ඒම පිළිබඳව අනතුරු අඟවන අතර සත්‍යය, ප්‍රේමයෙන් ආරක්ෂා කළ යුතු බව අවධාරණය කරයි.

3 **යොහන්** : සැබෑ ඇදහිලිවතුන් සමග සහභාගිත්වය ප්‍රතික්ෂේප කිරීමේ පාපය ගැන අනතුරු අඟවයි.

**යූද්** : භක්තිය හැර යාම හා ව්‍යාජ ධර්මය ගැන තවත් අනතුරු ඇඟවීමකි. මෙහි තේමාව 2 පේතෘස් තේමාවට සමානය.

## හසුන් කණ්ඩායම්

මේවා

**ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ පොත්** : 1 හා 2 තෙසලෝනික

**ශුභාරංචිය අවධාරණය කරන පොත්** : රෝම, ගලාති, 1 හා 2 කොරින්ති

**පාවුලුතුමා සිරගතව සිටිද්දී ලියන ලද පොත්** : එපීස, කොලොස්සි, පිලිප්පි හා පිලෙමොන්

**එඬේර ලිපි** : මෙම පොත් අවධාරණය කරන්නේ සභා නායකත්වයේ හා සංවිධානයේ ප්‍රායෝගික කරුණු පිළිබඳව වේ. 1 හා 2 තිමෝති, තීතස්

**පොදු හසුන්** : ඉතිරි හසුන්

## භක්තිය හැරයාම

"භක්තිය හැරයාම" යන පදය, ඔබ හසුන් සමීක්ෂණය කරන විට නිතර හමුවන්නකි. මෙම වචනයෙන් අදහස් වන්නේ "ඇදහිල්ල අත්හැරයාම" වේ. හසුන් බොහොමයක ලේඛකයෝ සභාවේ භක්තිය හැරයාම පිළිබඳව සඳහන් කරයි.

# හයවන පරිච්ඡේදය

## රෝම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- රෝම පොතේ කර්තෘ නම් කිරීමට
- රෝම පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- රෝම පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- රෝම පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- රෝම පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** රෝමයේ ඇදහිලිවතුන්ට

**පරමාර්ථය :** ශුභාරංචියේ අදහස, ව්‍යවස්ථාව, අනාවැකි හා මිනිසා ඇදහිල්ල මගින් දේව සබඳතාවට පැමිණවීමේ විශ්වීය අවශ්‍යතාව යන්නට අදාළව ඉදිරිපත් කිරීම

**ප්‍රධාන පද :** 1:16-17.

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය:** ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වේ.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, ආදම්, ආබ්‍රහම්, ඊසාක් (16 පරි. නාම ලේඛණය බලන්න)

### සැකිල්ල

I. හැඳින්වීම : 1:1-7
   A. පණිවුඩකරු : පාවුලුතුමා 1:1-6
      1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයා
      2. ප්‍රේරිතයෙකු ලෙස කැඳවීම
      3. දෙවියන්වහන්සේගේ ශුභාරංචිය සඳහා වෙන් කිරීම
   B. පාඨකයෝ : 1:7
      1. රෝමයේ සිටින ඇදහිලිවන්තයෝ
      2. දෙවියන්වහන්සේට ප්‍රිය වූ අය
      3. ශුද්ධවන්තයන් වීමට කැඳවන ලද්දෝ
   C. ශුභ පැතීම : දෙවියන්වහන්සේගෙන්ද යේසුස්වහන්සේගෙන්ද අනුග්‍රහය හා සමාදානය : 1:7

II. රෝමවරුන් සමග පාවුලුතුමාගේ සබඳතාව : 1:8-16
   A. ඔවුන් සඳහා පාවුලුගේ තුති පිදීම : 1:8

B. ඔවුන් වෙනුවෙන් පාවුලුගේ යාච්ඤාව : 1:9-10
C. ඔවුන් දැකගැනීමට ඇති ආශාව : 1:11-16
1. ආශාව : 1:11
2. ආශාවේ පරමාර්ථය : 1:11-12
3. එය ඉටු කිරීමට ඇති බාධා : 1:13
4. මේ ආශාව ඇතිවීමේ පෙලඹවීම : 1:14-16
a. ඵල දැරීමට ඇති ආශාව : 1:14
b. සියලුම විජාතීන්ට ණයගැති බවට ඇති හැඟීම : 1:14
c. රෝමයේ දේශනා කිරීමට ඇති ඔහුගේ කැමැත්ත : 1:15
d. ශුභාරංචි පණිවුඩය කෙරෙහි ඇති ඔහුගේ විශ්වාසය : 1:16

III. පොතේ තේමාව සඳහන් කිරීම : ප්‍රබල ශුභාරංචිය දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම හෙළි කරයි : 1:16-17

## පළමු කොටස : ධර්මය පිළිබඳව
## ශුභාරංචියෙන් හෙළි කර ඇති පරිදි දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම
## 1:18-8:39

**I.** විශ්වීය පාපය නිසා ධර්මිෂ්ඨකමේ අවශ්‍යතාව : 1:18-3:20
A. විජාතික ලෝකය හෙළා දැකීම : 1:18-32
1. පාපයට විරුද්ධව දෙවියන්වහන්සේගේ උදහස : 1:18
2. දෙවියන්වහන්සේගේ උදහසට හේතු : 1:19-23
a. දෙවියන්වහන්සේ පිළිබඳ ඔවුන්ගේ දැනුම ඔවුන්ට සමාවට කරුණක් සඳහා ඉඩ නොදෙයි : 1:19-20
b. ඔවුන්ගේ දෙවියන්වහන්සේ පිළිබඳ දැනුමේ දූෂිත බව ඔවුන්ගේ වරදකාරී බව සනාථ කරයි : 1:21-23
3. දෙවියන්වහන්සේගේ උදහස : 1:24-32
a. ඔවුන් අපවිත්‍රකමට පාවා දී ඇත : 1:24-25
b. ඔවුන් දූෂිත තෘෂ්ණාවලට පාවා දී ඇත : 1:26-27
c. ඔවුන් දුරාචාරී චේතනාවන්ට පාවා දී ඇත : 1:28-32
(1) ඔවුන්ගේ තෝරාගැනීමේ ප්‍රතිඵල : 1:28
(2) ඔවුන්ගේ තත්වයේ විස්තරය : 1:28-32
B. යුදෙව්වා හෙළා දැකීම : 2:1-3:8
1. දේව විනිශ්චයේ මූලධර්මය : 2:1-16
a. සත්‍යයට අනුකූලව දේව විනිශ්චය : 2:1-5
1. අන්‍යයන් විනිශ්චය කරන්නාගේ වරදකාරී බව : 2:1
2. විනිශ්චය කිරීමේ මූලධර්මය : 2:2
3. වරදකරුවන් වෙත ඉල්ලීමක් : 2:3-5
b. ක්‍රියා අනුව දෙවියන්වහන්සේගේ විනිශ්චය : 2:6-15
1. විනිශ්චය කිරීමේ මූලධර්මය : 2:6
2. විනිශ්චයේ පන්ති දෙක : 2:7-12
3. විනිශ්චයට පරීක්ෂණය ලෙස ආලෝකයට කීකරුවීම : 2:13-15
c. පාවුලුතුමාගේ ශුභාරංචියට අදාළ විනිශ්චය : 2:16
2. යුදෙව්වන්ගේ සදාචාරාත්මක අසමත්වීම : 2:17-29
a. යුදෙව්වන්ගේ අයිතීන් : 2:17-20
b. යුදෙව්වන්ගේ අයිතීන් පිළිබඳ ඉල්ලීම් බිඳීම : 2:21-24

c. වගකීම්වලට අනුකූලව ජීවත්වීමට නොහැකිවීම : 2:25-29
(1) චර්මඡේදනය පිළිබඳව : 2:25
(2) කීකරුකම පිළිබඳව : 2:26-27
(3) යුදෙව්වෙකු පිළිබඳව සැබෑ හා ව්‍යාජ දැක්මක් : 2:28-29
3. යුදෙව්වන්ගේ විරෝධතාවයන් : 3:1-8
a. යුදෙව්වන්ගේ ප්‍රශ්නය : 3:1-4
(1) ප්‍රශ්නය : 3:1
(2) පිළිතුර : 3:2-4
(3) විරෝධතාව : 3:5
(4) විරෝධතාව ප්‍රතික්ෂේප කිරීම : 3:6-8
C. මුළු ලෝකයම හෙළා දැකීම : 3:9-20
1. සියලු දෙනාම පව් කර ඇති බවට චෝදනාව : 3:9
2. ශුද්ධ ලියවිල්ලෙන් විශ්වීය පාපය ඔප්පු කිරීම : 3:10-18
a. පාපයේ ලක්ෂණ : 3:10-12
b. පාපයේ ව්‍යවහාරය : 3:13-17
(1) කතාවේදී : 3:13-14
(2) හැසිරීමේදී : 3:15-17
c. පාපය හේතුව : 3:18
3. ව්‍යවස්ථාව ඇති යුදෙව්වාට අදාළ කිරීම : 3:19-20

**II.** දේව සබඳතාව ඇති කිරීමේදී දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම : 3:21-5:21
A. ඇදහිල්ල මගින් දේව-සබඳතාව ඇති කිරීම : 3:21-26
1. එය දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම විද්‍යමාන කිරීම වේ : 3:21
2. ඇදහිල්ලෙන් දේව-සබඳතාව ඇති කිරීම : 3:21-26
a. පරණ ගිවිසුම කෙරෙහි ඇති එහි සබඳතාව : 3:21
b. ඇදහිල්ල තුළින් ලබාගත හැකි වීම : 3:22-23
c. ක්‍රිස්තුස්වහන්සේගේ ගැළවීමේදී එහි පදනම : 3:24-25
d. දෙවියන්වහන්සේගේ සාධාරණකම ප්‍රදර්ශනය කිරීම : 3:25-26
B. දේව සබඳතාව පිළිබඳ ධර්මයේ සාරාංශය : 3:27-31
1. පෞද්ගලික කුසලතා බැහැර කිරීම : 3:27-28
2. දෙවියන්වහන්සේගේ ගතිලක්ෂණ ඉදිරිපත් කිරීම : 3:29-30
3. ව්‍යවස්ථාව තහවුරු කිරීම : 3:31
C. ඇදහිල්ල මගින් දේව සබඳතාවට පැමිණවීම ශුද්ධ ලියවිල්ලෙන් ඔප්පු කිරීම : 4:1-25
1. ආබ්‍රහම්ගේ දේව-සබඳතාව : 4:1-12
a. ආබ්‍රහම්ගේ අත්දැකීම පිළිබඳ ප්‍රශ්නය : 4:1
b. ඔහුගේ දේව සබඳතාවේ මාර්ගය : 4:2-3
c. දේව සබඳතාවේ මාර්ග දෙක සංසන්දනය කිරීම : 4:4-5
d. දාවිත්ගේ සාක්ෂියෙන් තහවුරු වීම : 4:6-8
2. චර්මඡේදනය නොමැතිව ඇදහිල්ලෙන් දේව සබඳතාවට පමුණුවාලීම : 4:9-12
a. චර්මඡේදනය පිළිබඳ ප්‍රශ්නය : 4:9-10
b. ආබ්‍රහම්ගේ තත්වයෙන් පිළිතුරු : 4:10
c. ආබ්‍රහම්ගේ චර්මඡේදනය : 4:11-12
3. ඇදහිල්ල මගින් ලබාගත් පොරොන්දුව : 4:13-17
a. උරුමය ලබාගන්නා මාර්ගය : 4:13
b. ඇදහිල්ලේ ක්‍රමයට හේතුව : 4:14-15

c. පොරොන්දුව ලබාගන්නා තැනැත්තා : 4:16
d. ශුද්ධ ලියවිල්ල සමග සුසංගතභාවය : 4:17
4. ආබ්‍රහම්ගේ ඇදහිල්ල පිළිබඳ නිදර්ශනය : 4:17-25
a. ඔහුගේ ඇදහිල්ලේ අරමුණ : 4:17
b. ඔහුගේ ඇදහිල්ලේ ස්වභාවය : 4:18-21
c. ඔහුගේ ඇදහිල්ලේ ත්‍යාගය : 4:22
d. ඔහුගේ ඇදහිල්ලේ වැදගත්කම : 4:23-25
D. දේව-සබඳතාවේ ස්ථිරත්වය : 5:1-11
1. දේව-සබඳතාවේ වර්තමාන ප්‍රතිඵල : 5:1-2
2. මෙම බලාපොරොත්තුව විනාශ කිරීමට පරීක්ෂාවනට නොහැකි බව : 5:3-5
a. පරීක්ෂාවන්ගේ බලපෑම : 5:3-4
b. දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත්දැකීම : 5:5
3. ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ප්‍රේමය මෙම බලාපොරොත්තුව තහවුරු කරයි : 5:6-11
a. දෙවියන්වහන්සේගේ ප්‍රේමය : 5:6-10
1. නැතිවූවන් සඳහා වන උන්වහන්සේගේ ප්‍රේමය පෙන්වීම : 5:6-8
2. ගැළවීම සඳහා වන සහතිකය : 5:9-10
b. සමගි කිරීම අත්දැකීම : 5:11
E. ධර්මිෂ්ඨකමේ අත්තිවාරම : 5:12-21
1. නියෝජනය කරන මනුෂ්‍යයන් දෙදෙනෙක් : 5:12-14
a. ආදම්ගේ ක්‍රියාවේ ප්‍රතිඵලය : 5:12-14
b. ක්‍රිස්තුස්වහන්සේට සමානව ආදම්ගේ නායකත්වය : 5:14
2. ආදම් හා ක්‍රිස්තුස්වහන්සේ අතර වෙනස : 5:15-17
a. ගුණාත්මක බවේදී : 5:15
b. ක්‍රියාත්මකවීමේදී : 5:16
c. ප්‍රතිඵලයේදී : 5:17
3. ආදම් හා ක්‍රිස්තුස්වහන්සේ අතර සමානතා : 5:18-21
a. ඉඩ ප්‍රස්තාවේ සමානතාවය : 5:18
b. ක්‍රියාත්මක වීමේදී සමානතාවය : 5:19
c. මිනුමේ සමානතා : 5:20-21

**III.** පාරිශුද්ධිකරණයේදී දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම : 6:1-8:39
A. පාපය වෙත ඇදහිලිවන්තයෙකුගේ සබඳතාව : 6:1-23
1. පාපයේ මූලධර්මයට මරණය : 6:1-14
a. පාපයේ නිරතව සිටීමේ ප්‍රශ්නය : 6:1
b. යෝජනාව ප්‍රතික්ෂේප කිරීම : 6:2
c. බව්තිස්මයේදී අපගේ තත්වය : 6:3-11
(1). බව්තිස්මය පිළිබඳ නොදැනීමේ ප්‍රශ්නය : 6:3
(2). බව්තිස්මයේ වැදගත්කම : 6:4
(3). ඇදහිලිවතුන්ට අදාළ කිරීම : 6:5-10
(4) මෙම තත්වය සඳහා කැදවීම : 6:11
2. පාපයේ නියැලීම කෙරෙහි ඇදහිලිවන්තයෙකුගේ මරණය : 6:15-23
a. පාපයේ නිරතවීමේ ප්‍රශ්නය : 6:15
b. යෝජනාව ප්‍රතික්ෂේප කිරීම : 6:15
c. වහල්භාවයේ නිදර්ශනයකින් පිළිතුරක් : 6:16-23
1. සේවයන් දෙකක් පිළිබඳ ප්‍රශ්නය : 6:16

2. මේ සේවයන් දෙකම සමග ඇදහිලිවන්තයාගේ අත්දැකීම : 6:17-18
3. අලුත් තත්වයකින් සඳහා ඉල්ලීම : 6:19
4. දෙදෙනා අතර වෙනස : 6:20-22
5. සේවාවන් දෙකේ ප්‍රතිඵලය : 6:23

B. ව්‍යවස්ථාව සමග ඇදහිලිවන්තයාගේ සබඳතාව : 7:1-25
1. ව්‍යවස්ථාවට මැරී දෙවියන්වහන්සේට ජීවත්වීම : 7:1-6
a. ව්‍යවස්ථාවේ ආධිපත්‍යය : 7:1
b. විවාහ ව්‍යවස්ථාවෙන් නිදර්ශනයක් : 7:2-3
c. මෙම මූලධර්මය ඇදහිලිවන්තයෙකුට යෙදීම : 7:4-6
2. පාපයෙන් මුදවාලීමට ව්‍යවස්ථාවට නොහැකි වීම : 7:7-25
a. පාපය කෙරෙහි ව්‍යවස්ථාවේ සබඳතාව : 7:7-13
1. ව්‍යවස්ථාවේ ස්වභාවය පාපී නොවේ : 7:7
2. ව්‍යවස්ථාව තුළින් පාපය එළිදරව් වීම : 7:7-13
3. ව්‍යවස්ථාව තුළින් පාපයේ ක්‍රියාව : 7:8-11
4. පාපයේ පාපිෂ්ටභාවය ව්‍යවස්ථාවෙන් එළිදරව් වීම : 7:12-13
b. පාපය ජය ගැනීමට ව්‍යවස්ථාවට නොහැකි වීම : 7:14-25
1. පාපයෙන් පරාජය වීම ගැන පළමු පාපොච්චාරණය : 7:14-17
2. අභ්‍යන්තරයේ ඇති පාපය ගැන දෙවන පාපොච්චාරණය : 7:18-20
3. තෙවන පාපොච්චාරණය හා ජයග්‍රහණයේ මාර්ගය : 7:21-25

C. ආත්මයාණන්වහන්සේ තුළින් ඇදහිලිවන්තයෙකුගේ ජයග්‍රහණය : 8:1-39
1. ආත්මයාණන් මගින් මාංශයේ බලයෙන් මුදවාලීම : 8:1-11
a. සිත දොස් තැබීමෙන් ඇදහිලිවන්තයෙකු නිදහස් කිරීම : 8:1-2
b. මිදීම සඳහා : 8:3
c. මිදීම සඳහා පරමාර්ථය : 8:4
d. මිදීම් ක්‍රමය : 8:5-10
1. මිනිස් වර්ගයේ කණ්ඩායම් දෙක : 8:5
2. මිනිසාගේ මනස් දෙක : 8:6-7
3. ක්ෂේත්‍ර දෙක:මාංශය හා ආත්මය : 8:8-11
e. ශාරීරික මරණයෙන් මිදීම : 8:11
2. ආත්මයාණන්වහන්සේ තුළින් පුත්‍රත්වයේ ජීවිතය : 8:12-17
a. ආත්මයාණන් තුළ ජීවත්වීමට බැඳී සිටීම : 8:12-13
b. ආත්මයාණන් තුළ ජීවිතය පිළිබඳ සාක්ෂි : 8:14-17
1. ආත්මයාණන්ගේ මගපෙන්වීම : 8:14
2. ආත්මයාණන්ගේ ස්වභාවය : 8:15
3. ආත්මයාණන්ගේ සාක්ෂිය : 8:16
4. ඇදහිලිවන්තයාගේ උරුමය : 8:17
3. වර්තමාන දුක්විඳීමේ මහිමශ්‍රීය : 8:18-30
a. වර්තමාන දුක්විඳීම ඇගයීම : 8:18
b. මහිමශ්‍රීය සහතික කිරීම : 8:19-30
1. මැවීම මගින් සහතික කිරීම : 8:19-22
2. වර්තමාන බලාපොරොත්තුව මගින් සහතික කිරීම : 8:23-25
3. ආත්මයාණන් මගින් සහතික කිරීම : 8:26-27
4. ජීවිතයේ අවස්ථාවන් තුළ ක්‍රියාකරන දෙවියන්වහන්සේ මගින් සහතික කිරීම : 8:28
5. අප තුළ දෙවියන්වහන්සේගේ අඛණ්ඩ ක්‍රියාවන් මගින් සහතික කිරීම : 8:29-30
4. ඇදහිලිවන්තයෙකුගේ ජයග්‍රහණය සහතික කිරීම : 8:31-39

a. දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිලිවන්තයාගේ සබඳතාව : 8:31-33
b. ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිලිවන්තයාගේ සබඳතාව : 8:34
c. නපුරු අවස්ථාවන් කෙරෙහි ඇදහිලිවන්තයාගේ සබඳතාව : 8:35-39
1. ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් කිරීමට දෘශ්‍යමාන ලෝකයේ ඇති නපුරුකම්වලට නොහැකි වීම : 8:35-37
2. ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් කිරීමට අදෘශ්‍යමාන ලෝකයේ ඇති නපුරුකම්වලට නොහැකි වීම : 8:38-39

**දෙවැනි කොටස: ඓතිහාසික**
**ඉශ්‍රායෙලය හා සියලුම මනුෂ්‍ය වර්ගයා සමග දෙවියන්වහන්සේගේ කටයුතුවලදී උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම. 9:1-11:36**

I. ඉශ්‍රායෙල්හි ප්‍රතික්ෂේප කිරීම නිසා පාවුලුතුමාගේ ශෝකය : 9:1-5
A. ඔහුගේ හැඟීම : 9:1
B. ඔහුගේ හැඟීමේ තිව්‍රතාව : 9:2-3
C. ඔහුගේ හැඟීමේ පදනම : 9:3-5

II. ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීම හා දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය : 9:6-29
A. ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීම හා දෙවියන්වහන්සේගේ පොරොන්දුව : 9:6-13
1. දෙවියන්වහන්සේගේ වචනය නිරර්ථක වීම ප්‍රතික්ෂේප කිරීම : 9:6
2. දෙවියන්වහන්සේගේ පොරොන්දුව භෞතික පෙළපත මත පදනම් නොවූ බවට ඔප්පු කිරීම : 9:6-13
a. ආබ්‍රහම්ගේ පවුලෙන් ඔප්පු කිරීම : 9:6-9
b. ඊසාක්ගේ පවුලෙන් ඔප්පු කිරීම : 9:10-13
B. ඉශ්‍රායෙලය හා දෙවියන්වහන්සේගේ සාධාරණත්වය ප්‍රතික්ෂේප කිරීම : 9:14-29
1. සිය කැමැත්ත විදාමාන කිරීමේදී දෙවියන්වහන්සේගේ සාධාරණත්වය : 9:14-18
a. දෙවියන්වහන්සේගේ සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්නය : 9:14
b. දෙවියන්වහන්සේගේ කැමැත්ත එළිදරව් වීම : 9:15-17
1. උන්වහන්සේගේ දයාව උන්වහන්සේගේ කැමැත්ත අනුව එළිදරව් වීම : 9:15-16
2. උන්වහන්සේගේ විනිශ්චය උන්වහන්සේගේ කැමැත්ත අනුව යෙදීම : 9:17
c. දෙවියන්වහන්සේගේ ක්‍රියාව උන්වහන්සේගේ කැමැත්ත අනුවය : 9:18
2. දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍ය බලය : 9:19-29
a. ප්‍රශ්නය හා තරවටු කිරීම : 9:19-20
b. ක්‍රියාකිරීම සඳහා දෙවියන්වහන්සේට ඇති අයිතිය : 9:20-21
c. දෙවියන්වහන්සේගේ බලය ක්‍රියාත්මක කිරීම : 9:22-24
1. නපුරු අය කෙරෙහි උන්වහන්සේගේ ඉවසීම : 9:22
2. උන්වහන්සේගේ මහිමය එළිදරව් වීම : 9:22-24
d. යුදෙව්වාගේ හා විජාතිකයාගේ කැඳවීම බලාපොරොත්තුවෙන් සිටීම : 9:25-29
1. විජාතිකයාට කැඳවීම : 9:25-26
2. ඉශ්‍රායෙල්හි ඉරණම පිළිබඳ දැන්වීම : 9:27-29

III. ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීම : 9:30-10:21
A. ධර්මිෂ්ඨකම ලබාගැනීමට ඉශ්‍රායෙලයට නොහැකි වීම : 9:30-33

1. ඉශ්‍රායෙලයට නොහැකිවීම යන කරුණ : 9:30-31
2. ඉශ්‍රයෙලයට නොහැකිවීමට හේතුව : 9:32
3. ඉශ්‍රායෙලයට නොහැකිවීම පැහැදිලි කිරීම : 9:32
4. ප්‍රතිඵල සනාථ කිරීම : 9:32

B. දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පිළිගැනීම ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීම : 10:1-11
1. ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීමට හේතුව : 10:1-4
2. ඇදහිල්ලෙන් ඇතිවන ධර්මිෂ්ඨකමේ ස්වභාවය : 10:5-11
   a. ධර්මිෂ්ඨකම සඳහා වන ක්‍රම දෙක සංසන්දනය කිරීම : 10:5-8
      1. ව්‍යවස්ථාව පිළිපැදීම තුළින් ධර්මිෂ්ඨකම : 10:5
      2. ඇදහිල්ල තුළින් ධර්මිෂ්ඨකම : 10:6-8

   b. ඇදහිල්ල තුළින් ධර්මිෂ්ඨකම සාක්ෂාත් කිරීම : 10:9-10
   c. ඇදහිල්ල තුළින් ධර්මිෂ්ඨකම ලැබීම පිළිබඳ ශුද්ධ ලියවිලි සහතිකය : 10:11

C. විශ්වීය ශුභාරංචිය ඉශ්‍රායෙලය විසින් නොසලකා හැරීම : 10:12-21
1. විශ්වීය ශුභාරංචියක් පිළිබඳ කරුණ : 10:12-13
2. විශ්වීය ශුභාරංචියක් ප්‍රකාශ කිරීම : 10:14-15
3. මෙම විශ්වීය ශුභාරංචිය කෙරෙහි ඉශ්‍රායෙල්හි ප්‍රතිචාරය : 10:16-21
   a. නොසලකාහැරීම : 10:16-17
   b. ප්‍රතික්ෂේප කරයි : 10:18-21

IV. ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් ඉශ්‍රායෙලය හා දෙවියන්වහන්සේගේ පරමාර්ථය ප්‍රතික්ෂේප කිරීම : 11:1-32

A. ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප කිරීමෙන් ශේෂයක් ඉතිරි විය : 11:1-10
1. දෙවියන්වහන්සේ සිය සෙනඟ අත්හැර දැමූ බව ප්‍රතික්ෂේප කිරීම : 11:1-2
2. ඉතිරිව සිටින ශේෂය ගැන ඔප්පුවක් : 11:2-6
   a. ශුද්ධලියවිල්ලෙන් ඔප්පු වූ දේ : 11:2-4
   b. ඉතිරිවූ අයගෙන් ඔප්පු වූ දේ : 11:5-6
3. ජාතිය හා ඉතිරිවූ අයගේ වෙනස : 11:7-10

B. ඉශ්‍රායෙලය ප්‍රතික්ෂේප වීම ස්ථිර දෙයක් නොවේ : 11:11-32
1. ඉශ්‍රායෙලයේ තත්වය : 11:11-16
   a. ඉශ්‍රායෙල්හි වැටීම ස්ථිර නොවේ : 11:11
   b. ඉශ්‍රායෙල්හි වැටීම විජාතීන්ගේ ගැළවීම උදෙසා නිෂ්ප්‍රභ කර ඇත : 11:11
   c. ඉශ්‍රායෙල්හි ප්‍රතිසංස්කරණය විශ්වීය ආශිර්වාද ගෙන එනු ඇත : 11:12-15
   d. ඉශ්‍රායෙල්හි අනාගතය අතීතයෙන් දැක්වේ : 11:16
2. විජාතීන්ට අනතුරු ඇඟවීම් : 11:17-24
   a. පුරසාරම්වලට විරුද්ධව : 11:17-18
   b. උඩඟුකමට විරුද්ධව : 11:19-21
   c. අනුමානයන්ට විරුද්ධව : 11:22-24
3. ඉශ්‍රායෙල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තර්කය : 11:23-24
4. ඉශ්‍රායෙල්හි අනාගත ප්‍රතිසංස්කරණය පිළිබඳ අනාවැකි : 11:25-32
   a. ඉශ්‍රායෙල්හි ප්‍රතිසංස්කරණය පිළිබඳ එළිදරව්ව : 11:25-26
   b. ප්‍රතිසංස්කරණය අනාවැකි සමග සුසංගත වීම : 11:26-27

c. ඉශ්‍රායෙල්හි දිව්‍යමය කැඳවීම සමග සුසංගත වීම : 11:28-29
d. දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් සමග සුසංගත වීම : 11:30-32

V. දෙවියන්වහන්සේට ප්‍රශංසා කෙරෙන ආශිර්වාද වාක්‍යය : 11:33-36
A. දෙවියන්වහන්සේ පිළිබඳ ප්‍රකාශය : 11:33
B. දෙවියන්වහන්සේ පිළිබඳ ප්‍රශ්නය : 11:34-35
C. දෙවියන්වහන්සේට ප්‍රශංසාව : 11:36

**තෙවන කොටස: ප්‍රායෝගික**
**ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම අදාළ කරගැනීම**
**12:1-15:13**

I. ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේට සම්බන්ධ : 12:1-2
A. දෙවියන්වහන්සේ වෙත ස්වයං-ඉදිරිපත්වීම : 12:1
B. විපර්යාසයේ අඛණ්ඩ අත්දැකීම : 12:2

II. ඇදහිලිවන්තයා සභාවට සම්බන්ධව : 12:3-13
A. ආත්මික දීමනා නිහතමානිව භාවිත කිරීම : 12:3-8
1. නිහතමානිකමේ අවශ්‍යතාව : 12:3
2. ශරීරයේ සාමාජිකයන් එකිනෙකා අතර සබඳතාව : 12:4-5
3. සේවයේදී නිහතමානිකම ප්‍රදර්ශනය කිරීම : 12:6-8
a. දී ඇති දීමනාවල විවිධත්වය : 12:6
b. සේවයේ දීමනා : 12:6-8
B. සභාවේ සාමාජිකයන් වෙත ප්‍රේමය දැක්වීම : 12:9-13
1. මෙම ප්‍රේමයේ ස්වභාවය : 12:9
2. මෙවැනි ප්‍රේමයක් විද්‍යමාන වීම : 12:9-13
a. අවංක වන්න : 12:9
b. නපුරු දේ පිළිකුල් කරන්න : 12:9
c. යහපතට ඇලුම් වන්න : 12:9
d. එකිනෙකාට සුහද වන්න : 12:10
e. සහෝදර ප්‍රේමය දක්වන්න : 12:10
f. ගෞරවයෙන් තමාට වඩා අනෙක් අය උතුම්කොට සලකන්න : 12:10
g. සේවයේදී මැළි නොවන්න : 12:11
h. ආත්මයෙන් ජ්වලිතවන්න : 12:11
i. ස්වාමින්වහන්සේට සේවය කරන්න : 12:12
j. බලාපොරොත්තුවෙහි ප්‍රීතිවන්න : 12:12
k. විපතේදී ඉවසිලිමත්වන්න : 12:12
l. යාච්ඥාවෙහි නොකඩවා යෙදෙන්න : 12:12
m. ශුද්ධවන්තයන්ගේ අවශ්‍යතාවයන්හිදී උපකාර කරන්න : 12:13
n. ආගන්තුක සත්කාරයට ලැදිවන්න : 12:13
o. ඔබට පීඩා කරන්නන්ට ආශිර්වාද කරන්න : 12:14
p. ප්‍රීතිවන්නන් සමග ප්‍රීතිවන්න : 12:15
q. ශෝක වන්නන් සමග ශෝක වන්න : 12:15
r. හැමදෙනා සමග එක්සිත් වන්න : 12:16
s. අහංකාර නොවී, යටහත් පහත් අය ආශ්‍රය කරන්න : 12:16
t. ඔබ ප්‍රඥාවන්තයයි සිතා උඩඟු නොවන්න : 12:16

u. කිසිවෙකුට නපුරට නපුර නොකරන්න : 12:17
v. සියල්ලන් ඉදිරියෙහි උසස් යයි සම්මත දේ කිරීමට සිතට ගන්න : 12:17
w. සියලු දෙනා සමග සමාදානයෙන් සිටින්න : 12:18
x. පළිගැනීමෙන් තොරවන්න : 12:19
y. ප්‍රේමයෙන් හා දයාවෙන් සතුරාට ප්‍රතිචාර දක්වන්න : 12:20
z. නපුරෙන් පරාජය නොවී, යහපතින් නපුර පරාජය කරන්න : 12:21

III. මනුෂ්‍යවර්ගයා සම්බන්ධව ඇදහිලිවන්තයා : 12:14-21
A. සතුරන් වෙත ප්‍රේමය : 12:14
B. අන් අයගේ ආගාවන් කෙරෙහි ප්‍රේමය : 12:15
C. ඇසුරු කරන්නන් කෙරෙහි ප්‍රේමය : 12:16
D. පාපී ලෝකයා කෙරෙහි ප්‍රේමය : 12:17-21
1. නපුර අක්‍රියව දරාගැනීම : 12:17-19
2. නපුර කෙරෙහි ක්‍රියාකාරීව ප්‍රතිචාර දැක්වීම : 12:20-21

IV. රජය හා සම්බන්ධව ඇදහිලිවන්තයා : 13:1-14
A. රජය කෙරෙහි ඇදහිලිවන්තයාගේ යුතුකම් : 13:1-7
1. රජය කෙරෙහි කීකරුවීමේ යුතුකම : 13:1
2. රජයට කීකරුවීමට හේතුව : 13:1
3. රජයට කීකරුවීම ප්‍රතික්ෂේප කිරීම : 13:2
4. රජයට කීකරුවීම සඳහා චේතනාව : 13:3-5
a. රජයේ ක්‍රියාවන් අතින් : 13:3-4
b. කිතුනු හෘදය සාක්ෂිය අතින් : 13:5
5. රජයට කීකරුවීම පිළිබඳ නිදර්ශනයක් : 13:6
6. රජයට කීකරුවීම සඳහා අයැදීම : 13:7
B. සහෝදර පුරවැසියන් වෙත ඇදහිලිවන්තයාගේ යුතුකම : 13:8-10
C. යේසුස්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ බලාපොරොත්තුවේ ඇදහිලිවන්තයාගේ පෙලඹවීම : 13:11-14
1. අවදිව සිටීමට අයැදීම : 13:11
2. අවදිව සිටීමට හේතුව : 13:11-12
3. අවදිව සිටීමට උපදෙස් : 13:12-13
4. අවදිව සිටීම සඳහා කළ යුතු දේ : 13:14

V. දුර්වල සහෝදරයෙකු හා සම්බන්ධව ඇදහිලිවන්තයා : 14:1-15:13
A. සහෝදරයෙකු විනිශ්චය කිරීමට එරෙහිව අනතුරු ඇඟවීම් : 14:1-12
1. දුර්වල සහෝදරයෙකු කෙරෙහි නිවැරදි ආකල්පය : 14:1
2. අසිරුතාවයේ ක්ෂේත්‍ර : 14:2-5
a. පළමු ගැටලුව හා එය සැකසීම : 14:2-4
b. දෙවන ගැටලුව හා එය සැකසීම : 14:5
3. සකස්කිරීම : 14:6
4. පෙලඹවීම : 14:7-9
5. සහෝදරයෙකු විනිශ්චය කිරීම වෙනුවෙන් තරවටුව : 14:10-12
a. තරවටුව පිළිබඳ ප්‍රශ්නය : 14:10
b. තරවටුව සඳහා පදනම : 14:10-12

c. සහෝදරයෙකුගේ හෘදය සාක්ෂිය කඩකිරීමට එරෙහි තහනම : 14:13-23
    1. එකිනෙකා විනිශ්චය නොකිරීමට අවවාදය : 14:13
    2. කෑම පිළිබඳව ප්‍රේරිතවරයාගේ විශ්වාසය : 14:14
    3. මෙම විශ්වාස ක්‍රියාවට යෙදවීම : 14:15-20
    4. ප්‍රබල සහෝදරයෙකු සඳහා මගපෙන්වීමේ මූලධර්ම : 14:21
    5. ප්‍රබල හා දුර්වල දෙදෙනාටම ආයාචනයක් : 14:22-23

B. ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කිරීම මගින් ඒකත්වය සඳහා ප්‍රයත්නය : 15:1-13
  1. ප්‍රබල සහෝදරයෙකුගේ බැඳීම් : 15:1
  2. ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශයෙන් ඒකත්වය සඳහා ආයාචනයක් : 15:2-4
    a. ඉල්ලීමේ ප්‍රකාශය : 15:2
    b. ඉල්ලීම සඳහා තර්ක විතර්ක : 15:3
      1. ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය : 15:3
      2. ශුද්ධ ලියවිල්ලේ පරමාර්ථය : 15:4
  3. ප්‍රේරිතවරයාගේ ඉල්ලීම : 15:5-6
  4. එකිනෙකා පිළිගැනීමට ආඥාව : 15:7
  5. යුදෙව්වන් හා විජාතීන් සමග ක්‍රිස්තුස්වහන්සේගේ සබඳතාවෙන් පැහැදිලි කිරීමක් : 15:8-12
    a. ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය : 15:8-9
    b. ශුද්ධලියවිල්ලෙන් ඔප්පු කිරීම : 15:9-12
    c. ප්‍රේරිතවරයාගේ යාච්ඤාව : 15:13

## සමාප්තිය
## 15:14-16:20

I. පෞද්ගලික කරුණු : 15:14-33
  A. මෙය ලිවීමට හේතුව පාවුලුතුමා පැහැදිලි කිරීම : 15:14-21
    1. මෙය ලිවීමේදී පාවුලුතුමාගේ ආකල්පය : 15:14-16
      a. ඔහු ඒවා හැඳිනගැනීම : 15:14
      b. ඒවා ලිවීමේ නිර්භීතකම : 15:15
      c. ඔහුට බලය පැවරීම පිළිබඳ ප්‍රකාශය : 15:16
    2. ලිවීම සඳහා පාවුලුතුමාගේ ආධිපත්‍යය : 15:17-21
      a. ඔහුගේ පෞද්ගලික පුරසාරම : 15:17
      b. ඔහුගේ වැඩ ගැන කතා කිරීමේදී ඔහු දැක්වූ නිහතමානිකම : 15:18
      c. විජාතීන් වෙත ඔහුගේ සේවය : 15:18-19
      d. වැඩ කිරීමේ ක්ෂේත්‍රය තෝරා ගැනීමේ ඔහුගේ අරමුණ : 15:20-21
  B. මෙය ලියන අවස්ථාවේ ඔහුගේ පෞද්ගලික සැලැස්ම : 15:22-29
    1. ඉටුනොවූ සැලසුම් : 15:22-24
      a. රෝමයට යෑමේ ඔහුගේ සැලැස්ම : 15:22-23
      b. ස්පාඤ්ඤයට යෑමේ ඔහුගේ සැලැස්ම : 15:24
    2. වහා සිදුවිය යුතු ඔහුගේ සැලසුම් : 15:25-27
      a. ඔහුගේ වර්තමාන සැලසුම් : 15:25
      b. ඔහුගේ වර්තමාන සැලසුමේ වැදගත්කම : 15:26-27

3. අනාගතය සඳහා ඔහුගේ සැලසුම් : 15:28-29

C. ඔවුන්ගේ යාච්ඤාවන් සඳහා ඔහුගේ ඉල්ලීම් : 15:30-32

1. යාච්ඤාව සඳහා ඉල්ලීම : 15:30-32
2. ආශිර්වාදය : 15:33

II. මිත්‍රත්ව කරුණු : 16:1-23

A. ෆීබීට ප්‍රශංසා කිරීම : 16:1-2

B. රෝමයේ මිතුරන්ට ශුභ පැතිම් : 16:3-16

1. රෝමයේ සිටිනවුන්ට ශුභපැතුම් : 16:3-15
2. රෝමයේ ඇදහිලිවතුන් අතර ශුභපැතුම් : 16:16
3. රෝම ඇදහිලිවතුන්ට සභාවන්ගෙන් ශුභ පැතුම් : 16:16

C. රෝමයේ සිටින ඇදහිලිවතුන්ට අනතුරු ඇඟවීම් : 16:17-20

1. අනතුරු ඇඟවීමේ අන්තර්ගතය : 16:17
2. ඔහු අනතුරු අඟවන අය ගැන විස්තරය : 16:18
3. ලිවීමට හේතුව : 16:19
4. ජයග්‍රහණය සඳහා පොරොන්දුව : 16:20
5. ආශිර්වාදය : 16:20

D. ඔහුගේ සගයන්ගෙන් ශුභපැතුම් : 16:21-24

III. සමාප්ත කෙරෙන ආශිර්වාද වාක්‍යය : 16:25-27

A. ප්‍රශංසාව ලබන අය : 16:25-27

1. ඔවුන් ඇදහිල්ලෙහි පිහිටුවීමට සමත් තැනැන්වහන්සේ : 16:25-29
2. ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන එකම ප්‍රඥාවන්තවූ දෙවියන්වහන්සේට : 16:27

B. ප්‍රශංසාව : 16:27

## ස්වයං පරීක්ෂණය

1. රෝම පොතේ කතුවරයා කවුරුන්ද?

2. රෝම පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. රෝම පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. රෝම පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. රෝම පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ලිංගික විකෘතීන් කෙරෙහි දෙවියන්වහන්සේගේ පිළිකුල පිළිබඳ වඩාත්ම විස්තරාත්මක වාර්තාව රෝම පොත සපයයි. 1:18-32

2. ඉශ්‍රායෙල් ජාතිය සමග දෙවියන්වහන්සේගේ අතීතයේ, වර්තමානයේ හා අනාගතයේ කටයුතු පිළිබඳව වඩාත්ම විස්තරාත්මක පැහැදිලි කිරීම රෝම පොත සපයයි. 9-11 පරිච්ඡේද බලන්න.

3. රෝම පොතෙහි, කොටස් අවසන් කරන ආශිර්වාද වාක්‍ය හෝ ආශිර්වාද හෝ පහක් අන්තර්ගතය. 11:33-36, 15:30-33, 16:20, 16:24-27 බලන්න.

4. රෝම 5:1-11 හි ඇදහිල්ලෙන් දේව සබඳතාවට පමුණුවනු ලැබීමේ ප්‍රතිඵල හතක් සඳහන් වේ. ඇදහිල්ලෙන් දේව සබඳතාවට පැමිණවීම යනුවෙන් අදහස් වන්නේ,

    - දෙවියන්වහන්සේ සමග සමාදානය තිබීම
    - ඇදහිල්ලෙන් පිවිසීම තිබීම
    - මහිමයේ බලාපොරොත්තුවෙන් ප්‍රීතිවීම
    - පීඩාවන්හිදී මහිමය
    - අපගේ සිත් තුළ වගුරවනු ලබන දෙවියන්වහන්සේගේ ප්‍රේමය තිබීම
    - දෙවියන්වහන්සේගේ උදහසින් ගළවනු ලැබීම
    - දෙවියන්වහන්සේ තුළ ප්‍රීතිය තිබීම

5. රෝම පොතේ සඳහන් මරණ තුනක් ඇත.

    - පාපයට මැරී සිටීම හා දෙවියන්වහන්සේට ජීවත්ව සිටීම 6:11
    - ව්‍යවස්ථාවට මියයාම හා ක්‍රිස්තුස්වහන්සේ හා විවාහවීම 7:4
    - ආත්මයාණන් මගපෙන්වීම මාංශයට මරණය 8:13

# හත්වන පරිච්ඡේදය

# 1 හා 2 කොරින්ති

**අරමුණු**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- 1 හා 2 කොරින්ති පොත්වල කර්තෘ නම් කිරීමට
- පොත් ලියා ඇත්තේ කවුරුන් වෙතද යන්න හැඳිනගැනීමට
- 1 හා 2 කොරින්ති සඳහා පරමාර්ථයන් සඳහන් කිරීමට
- 1 හා 2 කොරින්ති පොත්වල ප්‍රධාන පදයන් මතකයෙන් ලිවීමට
- මෙම පොත්වල ජීවිතයේ හා සේවයේ මූලධර්මයන් සඳහන් කිරීමට හැකිවනු ඇත.

## 1 කොරින්ති

## හැඳින්වීම

**කර්තෘ** : පාවුලුතුමා

**කවුරුන් වෙතද** : කොරින්තියේ ඇදහිලිවතුන් වෙත

**පරමාර්ථය** : පාවුලුතුමා, තමාගේ අවධානයට යොමු කළ ගැටලු හා කොරින්තියේ ඇදහිලිවතුන් විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**ප්‍රධාන පදය** : 13:13

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය** : ඵලදායි කිතුනු ජීවිතයට හා සේවයට ශ්‍රේෂ්ඨතම ආත්මික යතුර ප්‍රේමය වේ.

**ප්‍රධාන චරිත** : පාවුලු, තිමෝතියස්. අපොල්ලොස්, ස්තේපන්ස් (16 පරිච්ඡේදයේ අවසාන ශුභ පැතුම්හි ඇති නම්ද බලන්න)

## සැකිල්ල

**I.** හැඳින්වීම 1:1-9

A. ලේඛකයෝ: පාවුලු හා සොස්තේනස් : 1:1
B. පාඨකයෝ : 1:2
    1. කොරින්තියේ දෙවියන්වහන්සේගේ සභාවට
    2. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පාරිශුද්ධිකරණය කරන ලද්දවුන්.
    3. ශුද්ධවන්තයන් වීමට කැඳවුවෝ
    4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සෑම තැන්හිම සිටින සියලු දෙනාට
C. ශුභ පැතුම්: දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් අනුග්‍රහය : 1:3

D. තුති දීම : 1:4-8
   1. තුති දීමේ ස්වභාවය : 1:4
   2. තුති දීමේ පදනම : 1:4
   3. ඔවුන්ගේ අතීත සමෘද්ධිය සඳහා තුති දීම : 1:5-6
   4. ඔවුන්ගේ වර්තමාන තත්වය ගැන තුති දීම : 1:7-8

E. ඇදහිල්ල තහවුරු කිරීම : 1:9

**II.** සභාවේ බෙදීම් : 1:10-4:21

A. ඔවුන්ගේ බෙදීම් පිළිබඳ වාර්තාවට ප්‍රතිචාර : 1:10-17
   1. එක්සත්කම සඳහා ආයාචනය : 1:10
   2. ඔවුන්ගේ බෙදීම් පිළිබඳව ඔහුට තොරතුරු ලැබුණු ප්‍රභවය : 1:11
   3. ඔවුන්ගේ බෙදීම්වල ස්වභාවය : 1:12
   4. බෙදීම් ගැන ප්‍රශ්න කිරීම : 1:13
   5. ඔවුන්ගේ බෙදීම් ඔහුගේ සේවය නිසා නොවේ : 1:14-17

B. සභාවේ බෙදීම්වලට විරුද්ධව තර්ක : 1:18-4:5
   1. බෙදීම් ශුභාරංචිය හා නොගැළපේ : 1:18-3:4
      a. ශුභාරංචිය ලෞකික ප්‍රඥාවක් නොවේ : 1:18-2:5
         (1). ශුභාරංචියට දැක්වූ ප්‍රතිචාරවලින් ඔප්පු කිරීම් : 1:18-25
         (2). සභාවේ සංයුතියෙන් ඔප්පු කිරීම් : 1:26-31
         (3). පාවුලුතුමාගේ වැඩවලින් ඔප්පු කිරීම් : 2:1-5
      b. ශුභාරංචිය ස්වර්ගීය ප්‍රඥාවක් වේ : 2:6-3:4
         (1). මෙම ප්‍රඥාව ලබන්නවුන් : 2:6
         (2). ප්‍රඥාවේ ස්වභාවය : 2:6-12
         (3). මෙම ප්‍රඥාව අත්පත් කරගැනීම : 2:13-3:4
   2. සැබෑ සේවකයන් පිළිබඳ විස්තරය : 3:5-4:5
      a. සේවකයන් දෙවියන්වහන්සේගේ කෙතෙහි සේවකයෝ වෙති : 3:5-9
         (1). සේවකයන්ගේ කාර්යයන් : 3:5
         (2). සේවකයන්ගේ කාර්යයන් හා විපාක : 3:6-8
         (3). ඉගැන්වීමේ සාරාංශය : 3:9
      b. සේවකයන් දෙවියන්වහන්සේගේ ශුද්ධස්ථානය ගොඩනගන්නෝ වෙති : 3:10-23
         (1). ගොඩනගන්නාගේ වැඩ පරීක්ෂා කරනු ලැබේ : 3:10-15
         (2). දෙවියන්වහන්සේගේ ශුද්ධස්ථානය විනාශ කිරීම සඳහා දඬුවම් ලැබේ : 3:16-17
         (3). සේවකයන් පිළිබඳ ඔවුන්ගේ මතය ගැන අවවාදය : 3:18-23
      c. සේවකයෝ දෙවියන්වහන්සේගේ අබිරහස් දේ පිළිබඳ ගබඩාකරුවෝ වෙති : 4:1-5
         (1). සේවකයන් පිළිබඳ ගත යුතු මතය : 4:1
         (2). ගබඩාකරුවන්ගේ විශ්වාසවන්තකම ගැන බලකිරීම : 4:2
         (3). දෙවියන්වහන්සේ ගබඩාකරුවන්ගේ විනිශ්චයකරුවා ලෙස : 4:3-4
         (4). ස්වාමින්වහන්සේ පැමිණෙන තුරු විනිශ්චය නොකරන ලෙසට අයැදීම : 4:5

C. කොරින්තිවරුන්ට කෙරෙන ඉල්ලීම් : 4:6-21
   1. ඔවුන්ගේ බෙදීම්වලට තර්කය අදාළ කිරීම : 4:6-21
      a. අදාළ කිරීමේ පරමාර්ථය : 4:6

b. තලෙන්ත දීමනා ලෙස හඳුනාගැනීමට අසමත් වීම : 4:7
c. ප්‍රතිඵල : 4:8
d. ප්‍රේරිතවරුන්ගේ අත්දැකීම : 4:9-13
(1). ප්‍රේරිතවරුන්ගේ පහත් තත්වය : 4:9
(2). කොරින්තිවරුන් හා ඔවුන් අතර වෙනස : 4:10
(3). ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ විස්තරය : 4:11-13
2. ඔහුගේ ආදර්ශය අනුගමනය කිරීමට ඉල්ලීම : 4:14-17
a. මෙය ලිවීමේ ඔහුගේ අරමුණ : 4:14
b. ඔවුන්ගේ ආත්මික පියා ලෙස ඔහුගේ සබඳතාව : 4:15-16
c. තිමෝති ඔවුන් වෙත එවීමට හේතුව : 4:17
3. ඔවුන්ගේ ආකල්පය ඔවුන්ගේ ක්‍රියාවන් නිර්ණය කරන බවට අනතුරු ඇඟවීම : 4:18-21
a. ඇතැම් ඇදහිලිවතුන්ගේ උඩඟු ආකල්පය : 4:18
b. පාවුලුතුමා කොරින්තියට පැමිණීම : 4:19-21

III. සභාවේ සදාචාරාත්මක ගැටලු : 5:1-6:20

A. අනාචාරය : 5:1-13
1. ව්‍යභිචාරී පුද්ගලයෙකුගේ විනය : 5:1-8
a. පාපයේ ස්වභාවය : 5:1
b. ඒ පිළිබඳව ක්‍රියා කිරීමට සභාව අසමත් වීම : 5:2
c. වරදකරු පිළිබඳ විනිශ්චය : 5:3-5
d. ක්‍රියාකිරීමට සභාවෙන් ඉල්ලා සිටීම : 5:6-8
2. මෙවැනි දේ පිළිබඳ කටයුතු කිරීමේ පොදු ප්‍රතිපත්තිය : 5:9-13
a. ඔහුගේ පෙර උපදෙස් : 5:9-11
b. මෙම ප්‍රතිපත්ති මත ක්‍රියා කිරීමට කැඳවීම : 5:12-13
B. ලෞකික නඩුශාලාවල නඩුකීමේ නපුර : 6:1-11
1. එවැනි නඩුකීම පිළිබඳ ප්‍රශ්නය : 6:1
2. සභාවේදී නඩු විසඳීමට හේතු : 6:2-6
a. විනිශ්චය කිරීම පිළිබඳ සභාවේ අනාගත කාර්යය නිසා : 6:2-3
b. ඔවුන්ගේ නඩුශාලා සුදුසුකම් නැති විනිශ්චයකරුවන් පත්කරන නිසා :6:4-5
c. විනිශ්චය කිරීමට සභාව අසමත් බව ඉන් පෙන්වන නිසා : 6:5-6
3. ප්‍රතිඵල : 6:7-8
4. අධර්මිෂ්ඨකමට විරුද්ධව අනතුරු ඇඟවීම : 6:9-11
C. ශරීරයේ ශුද්ධවන්තකම : 6:12-20
1. කිතුනු නිදහස සීමාකිරීම : 6:12
2. මෙම මූලධර්මය ක්ෂේත්‍ර දෙකකට අදාළ කර ගැනීම : 6:13-14
a. ආහාර වෙත : 6:13
b. ලිංගික කටයුතු වෙත : 6:13-14
3. ඇදහිලිවන්තයාගේ ශරීරයේ ස්වභාවය වේශ්‍යාකම්වලට ඉඩ නොදෙයි : 6:15
4. එකතුවීම් දෙකක් අතර වෙනස : 6:16-17
5. වේශ්‍යාකමින් පලායන ලෙසට අනතුරු ඇඟවීම් : 6:18
6. වේශ්‍යාකමේ පාපයේ ස්වභාවය : 6:18
7. ශරීරයේ නිවැරදි භාවිතය : 6:19-20

IV. විවාහය : 7:1-40

A. විවාහයේ හා අවිවාහකව සිටීමේ (ආත්මික පරමාර්ථයන් සඳහා තනිකඩව සිටීම) ගැටලුව : 7:1-9
   1. අවිවාහකව සිටීමේ (බ්‍රහ්මචාරී) ජීවිතය සඳහා අනුමැතිය : 7:1
   2. විවාහ ජීවිතය සඳහා උපදෙස් : 7:2-6
      a. විවාහයට වඩාත් කැමති වීමට හේතුව : 7:2
      b. විවාහ සබඳතාවේ ස්වභාවය : 7:2
      c. විවාහ සබඳතාවේ යුතුකම් : 7:3-4
      d. ලිංගික සබඳතාවන් සඳහා නියමයන් : 7:5-6
   3. විවාහකව හා අවිවාහකව සිටීමේ ජීවිතයන් දෙකම සුදුසු ලෙස පිළිගැනීම : 7:7
   4. අවිවාහකයන්ට අවවාද : 7:8-9
B. විවාහය හා වෙන්වීම පිළිබඳ ගැටලුව : 7:10-16
   1. කිතුනු යුවළයන්ට ආඥාවක් : 7:10-11
      a. ආඥාව සඳහා අධිකාරි බලය : 7:10
      b. ආඥාවේ අන්තර්ගතය : 7:10-11
   2. මිශ්‍ර විවාහකයන්ට ආඥාවක් : 7:12-16
      a. ආඥාවේ ස්වභාවය : 7:12
      b. ආඥාවේ අන්තර්ගතය : 7:12-16
         (1). වෙන්වීම ඇදහිලිවන්තයා විසින් නොකළ යුතුය : 7:12-14
         (2). වෙන්වීම නොඇදහිලිවන්තයා නිසා සිදුවූ විට : 7:15-16
C. ඇදහිලිවන්තයාගේ ජීවිතය හා භූමික තත්වය : 7:17-24
   1. ඇදහිලිවන්තයා උදෙසා ජීවිතයේ මූලික ප්‍රතිපත්තිය : 7:17
   2. මෙම ප්‍රතිපත්තිය ජීවිතයට යෙදීම : 7:18-24
      a. මෙම ප්‍රතිපත්තිය ආගමික සුවිශේෂිතා සැකසීම සඳහා යෙදීම : 7:18-20
      b. මෙම ප්‍රතිපත්තිය ඇදහිලිවන්තයාගේ සමාජ තත්වය සඳහා යෙදීම : 7:21-24
D. අවිවාහකයන් සඳහා උපදෙස් : 7:25-40
   1. කන්‍යාවන් සඳහා උපදෙස් : 7:25-35
      a. උපදෙස්වල ස්වභාවය : 7:25-27
      b. උපදෙස් සඳහා හේතුව : 7:28-31
      c. ඔහුගේ උපදෙස්වල ප්‍රතිඵලයක් වශයෙන් ලද නිදහස : 7:33-35
   2. විවාහයට සුදුසු දියණියන් සිටින මව්පියන්ට උපදෙස් : 7:36-38
      a. විවාහයට ඉඩදිය යුතු විට කොන්දේසි : 7:36
      b. විවාහයට ඉඩ නොදිය යුතු විට කොන්දේසි : 7:37
      c. මේ දෙකම සුදුසුය : 7:38
   3. වැන්දඹුවන්ට උපදෙස් : 7:39-40

V. ප්‍රතිමාවලට පුදන ආහාර : 8:1-11:1

A. ප්‍රේමය, දැනගැන්මට දක්වන සබඳතාව : 8:1-13
   1. දැනුම සමග ප්‍රේමයේ අවශ්‍යතාව : 8:1-3
   2. දැනුම තුළින් නිදහසට කෙරෙන ඉල්ලීම : 8:4-8
      a. කැමට ඇති නිදහස : 8:4-6
      b. දුර්වල සහෝදරයෙකුට ඇති අනතුර : 8:7

c. දෙවියන්වහන්සේ සමග සබඳතාව ආහාර නිර්ණය කරන්නේ නැත : 8:8

3. දුර්වල සහෝදරයෙකුට පව් කිරීමට හේතුව වීමට විරුද්ධව අනතුරු ඇඟවීම : 8:9-12

a. දැනුම ඇති අයට අනතුරු ඇඟවීම : 8:9

b. මෙම දැනුමේ බලපෑම : 8:10

c. දැනුම මත ක්‍රියා කිරීමේ ප්‍රතිඵල : 8:11-12

d. නිදහස ස්වේච්ඡාවෙන්ම සීමා කරගැනීම : 8:13

B. නිදහස ස්වේච්ඡාවෙන්ම සීමා කරගැනීම පිළිබඳ පාවුලුතුමාගේ ආදර්ශය : 9:1-27

1. ප්‍රේරිතයෙකු ලෙස ඔහුගේ අධිකාරී බලය : 9:1-3

2. ප්‍රේරිතයෙකු ලෙස ඔහුගේ අයිතිවාසිකම් : 9:4-12

a. ඉල්ලන ලද අයිතිවාසිකම් : 9:4-7

b. ඔහුගේ ඉල්ලීමේ සාධාරණත්වය : 9:8-12

3. මෙම අයිතිවාසිකම් අත්හැරීමට හේතු : 9:12-23

a. ඔහු ශුභාරංචියට බාධා කරන්නේ නැත : 9:12-14

b. එය ඔහුට පාරට්ටු කරගැනීමට අඩිතාලමක් දෙයි : 9:15-18

c. ක්‍රිස්තුස්වහන්සේ වෙතට වැඩි දෙනෙක් දිනාගැනීමට එය හැකියාව ලබා දෙයි : 9:19-23

4. සිය ආදර්ශය අනුගමනය කරන ලෙසට ඔවුන්ගෙන් ඉල්ලීම : 9:24-27

C. නිදහස අයුතු ලෙස භාවිත කිරීමට එරෙහිව ඉශ්‍රායෙලිය ඉතිහාසයෙන් අනතුරු ඇඟවීමක් : 10:1-13

1. ඉශ්‍රායෙලිය ඉතිහාසය මතක්කර දීම : 10:1-5

a. ඉශ්‍රායෙල්හි වරප්‍රසාද : 10:1-4

b. ඉශ්‍රායෙල්හි ඉරණම : 10:5

2. ඉශ්‍රායෙලිය ඉතිහාසයෙන් අනතුරු ඇඟවීම් : 10:6-10

a. ඉශ්‍රායෙලිය ඉතිහාසයෙන් පාඩමක් : 10:6-10

(1). තෘෂ්ණාවට විරුද්ධව පොදු අනතුරු ඇඟවීම් : 10:6

(2). සුවිශේෂී උදාහරණ : 10:7-10

b. ඉශ්‍රායෙලිය අත්දැකීමේ වැදගත්කම : 10:11

3. පරීක්ෂාවන් යටතේ සිටින අයට අවවාද : 10:12-13

a. වැටීමේ අනතුර හඳුනාගන්න : 10:12

b. පරීක්ෂා කෙරෙන අය දිරිගැන්වීම : 10:13

4. රූප නමස්කාරය මගහරින ලෙසට අයැදීම : 10:14-22

a. රූප නමස්කාරය වෙතින් පලායන්න : 10:14

b. සහභාගිවීමට විරුද්ධව තර්කය : 10:15-22

(1). තර්කය අසන්නා : 10:15

(2). සහභාගිවීමේ සුවිශේෂත්වය : 10:16-22

D. හැසිරීම පාලනය කෙරෙන පොදු ප්‍රතිපත්තිවල සාරාංශය : 10:23-11:1

1. කිතුනු නිදහස කෙරෙහි සීමාවන් : 10:23

2. අන් අය ගැන සිතා බැලීම : 10:24

3. ආහාර සඳහා විකුණන මස් වර්ග පිළිබඳ උපදෙස් : 10:25

a. නිවෙසේදී ආහාර ගන්නා අයට උපදෙස් : 10:25-26

b. නොඇදහිලිවතුන් සමග ආහාර ගන්නා අයට උපදෙස් : 10:27-30

E. අවසාන උපදෙස් : 10:31-11:1

1. සියල්ල දෙවියන්වහන්සේගේ මහිමය පිණිස කරන්න : 10:31

2. සියලු දෙනා සමග යහපත් සබඳතා පවත්වන්න : 10:32-33
3. ප්‍රේරිතවරයාගේ ආදර්ශය අනුගමනය කරන්න : 11:1

VI. ප්‍රසිද්ධ නමස්කාරය : 11:2-14:40

A. ස්ත්‍රීන් හිස වැසීම : 11:2-16
1. ඔවුන්ගේ කීකරුකමට ප්‍රශංසා කිරීම : 11:2
2. යටත්වීමේ ප්‍රතිපත්තිය : 11:3-6
3. යටත්වීමේ පිළිවෙත තහවුරු කිරීම : 11:7-15
a. මැවීමේ සබඳතාව මගින් : 11:7-12
b. ආත්මික සබඳතාව මගින් : 11:13-15
c. සාකච්ඡාව අවසන් කිරීම : 11:16

B. ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනය හා සම්බන්ධ වියවුල : 11:17-34
1. ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනයේදී කොරින්තිවරුන්ගේ වියවුල : 11:17-22
a. ඔවුන්ගේ වියවුලේ ස්වභාවය : 11:18-21
(1). ඔවුන්ගේ භේද පිළිබඳ වාර්තාව : 11:18-19
(2). ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනයේදී ඇති වියවුලේ විස්තරය : 11:20-21
b. වියවුල පිළිබඳ තරවටුව : 11:22
2. ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනය : 11:23-28
a. ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනය පිළිබඳ එළිදරව්ව : 11:23
b. ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනයේ අනුපිළිවෙළ : 11:23-25
c. ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනයේ තේරුම : 11:26
d. නුසුදුසු ලෙස සහභාගි වීම : 11:27
e. නිසි පිළිවෙළට සහභාගි වීම : 11:28
3. අක්‍රමවත් ලෙස සහභාගිවීමේ ප්‍රතිඵල : 11:27-34

C. සභාවේ ආත්මික දීමනා පිළිබඳ ගැටලුව : 12:1-14:40
1. දීමනා ප්‍රදානය : 12:1-31
a. ආත්මය පරීක්ෂා කිරීම : 12:1-3
1. ඔවුන් දැනුවත් කිරීමට ඇති ආශාව : 12:1
2. ඔවුන්ගේ අතීත තත්වය මතක්කර දීම : 12:2
3. ශුද්ධාත්මයාණන් කරණකොටගෙන කතා කරන පුද්ගලයාට පරීක්ෂණය : 12:3
b. දීමනාවල විවිධත්වය : 12:4-11
1. පොදු ප්‍රභවය : 12:4-6
2. දීමනාවල පරමාර්ථය : 12:7
3. දීමනා : 12:8-10
4. සියලු දීමනාවල ප්‍රභවය : 12:11
c. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ ස්වභාවය : 12:12-31
1. ශරීරයේ ඒකත්වය : 12:12
2. ශරීරයට ඇතුළු වීම : 12:13
3. ශරීරයේ සුසංගතතාවය : 12:14-26
4. ශරීරය හඳුනාගැනීම : 12:27
5. අවයවයන්වල විවිධ කාර්යයන් : 12:28-31
2. දීමනා භාවිතය : 13:1-13
a. දීමනා භාවිතයේදී ප්‍රේමයේ අවශ්‍යතාව : 13:1-3
1. භාෂාවලින් කතාකිරීමේ දීමනාව සමග ප්‍රේමයේ අවශ්‍යතාව : 13:1

2. ප්‍රේමය හා උත්තරීතර දීමනා : 13:2
3. ප්‍රේමය හා දීම : 13:3

b. ප්‍රේමයේ ලක්ෂණ : 13:4-7
1. ප්‍රේමයේ ඍණාත්මක ලක්ෂණ : 13:4-6
2. ප්‍රේමයේ ධනාත්මක ලක්ෂණ : 13:6-7

c. ප්‍රේමයේ උත්තරීතර භාවය : 13:8-13
1. ප්‍රේමය, පහව යන දේ සමග සංසන්දනය කිරීම : 13:8-12
2. ස්ථිර දේ අතර ප්‍රේමයේ උත්තරීතරභාවය : 13:13

3. අධ්‍යාත්මික දීමනාවල නිවැරදි භාවිතය : 14:1-40

a. භාෂාවන් හා දිවැසිවැකි අතර වටිනාකම සංසන්දනය කිරීම : 14:1-25
1. ඒවායේ වටිනාකම සහාවේදී සංසන්දනය කිරීම : 14:1-19
2. නොඇදහිලිවතුන්ට ඒවායේ කාර්යය සංසන්දනය කිරීම : 14:20-25

b. භාෂාවන් හා දිවැසිවැකි ක්‍රමවත්ව භාවිත කිරීම : 14:26-36
1. නමස්කාරයේ ක්‍රමවත්බව : 14:26
2. නමස්කාර සේවය පිළිබඳ උපදෙස් : 14:27-36

c. අවසාන ප්‍රකාශන : 14:37-40

VII. නැවත නැගිටීම : 15:1-58

A. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ ශුභාරංචිය : 15:1-11
1. ශුභාරංචිය ප්‍රකාශකිරීම හා පිළිගැනීම : 15:1-2
2. ශුභාරංචියේ ස්වභාවය : 15:3-4
3. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමට සාක්ෂිකරුවෝ : 15:5-10
4. සාරාංශය : 15:11

B. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ අවශ්‍යතාව : 15:12-34
1. ගැළවීම උදෙසා උන්වහන්සේගේ නැවත නැගිටීමේ අවශ්‍යතාව : 15:12-19
a. සමහරු නැවත නැගිටීම නොපිළිගැනීම : 15:12
b. ඔවුන්ගේ නොපිළිගැනීමේ ඵල විපාක : 15:13-19

2. නැවත නැගිටීමේ ඓතිහාසික අවශ්‍යතාව : 15:20-28
a. ඓතිහාසික අවශ්‍යතාව : 15:20
b. දිව්‍යමය සැපයීම : 15:21-22
c. නැවත නැගිටීමේ වැඩසටහනෙහි දිව්‍යමය අනුපිළිවෙළ : 15:23-28
1. නාඹුල් ඵල ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීම : 15:23
2. ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටිනවුන් උන්වහන්සේගේ ආපසු පැමිණීමේදී නැවත නැගිටීම : 15:23
3. දෙවියන්වහන්සේගේ වැඩ සටහනේ අවසානය : 15:24-28

3. වර්තමාන කිතුනු ජිවිතය සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ අවශ්‍යතාව : 15:29-34
a. මියගිය අය උදෙසා බව්තිස්මය පිළිබඳ ප්‍රශ්නය : 15:29
b. අපගේ ජිවිත අනතුරුවලට භාජනය කිරීම පිළිබඳ ප්‍රශ්නය : 15:30-34
(1). එවැනි හැසිරීමක මෝඩකම : 15:30-32
(2). තරවටුව : 15:33-34

4. කිතුනුවන්ගේ නැවත නැගිටීම පිළිබඳ බලාපොරොත්තුව : 15:35-58
a. නැවත නැගිටුනු ශරීරයේ ස්වභාවය : 15:35-49

(1). නැවත නැගිටුණු ශරීරය පිළිබඳ ප්‍රශ්නය : 15:35
(2). නැවත නැගිටුණු ශරීරය පිළිබඳ පිළිතුරු : 15:36-49

b. නැවත නැගිටුණු ශරීරය නිපදවන වෙනස : 15:50-58
(1). වෙනස සඳහා අවශ්‍ය තත්වය : 15:50
(2). වෙනසේ ස්වභාවය : 15:51-52
(3). වෙනස සඳහා අවශ්‍යතාව : 15:53
(4). වෙනසේ ජයග්‍රහණය : 15:54-57
(5). ස්ථිරව සිටීම සඳහා කෙරෙන අවසාන ඉල්ලීම : 15:58

VIII. ප්‍රායෝගික හා පුද්ගලික කරුණු : 16:1-24

A. සම්මාදම එකතු කිරීම සඳහා උපදෙස් : 16:1-4
1. ගලාතියේ සභාවලටද උපදෙස් දිය යුතුය : 16:1
2. මුදල් එකතු කිරීමේදී ගත යුතු ක්‍රියා මාර්ග : 16:2
3. මුදල් යවන ක්‍රමය : 16:3-4

B. කොරින්තියට සැලසුම් කළ චාරිකා : 16:5-12
1. පාවුලුතුමාගේ චාරිකාව : 16:5-9
2. තිමෝතියස්ගේ චාරිකාව : 16:10-11
3. අපොල්ලොස්ගේ චාරිකාව : 16:12

C. කොරින්ති සභාවට අවසාන අවවාද : 16:13-14

D. කොරින්තියේ නියෝජිතයන් පිළිගැනීම : 16:15-18
1. ස්තේපනස්ගේ ගෘහවාසීන් පිළිබඳ ඉල්ලීම : 16:15-16
2. නියෝජිතයන් තිදෙනෙකුගේ පැමිණීම පිළිබඳ ප්‍රකාශයක් : 16:17-18

E. අවසාන ආචාර : 16:19-24
1. අන් අයගෙන් ආචාර : 16:19-20
2. පාවුලුතුමාගෙන්ම ආචාරය : 16:21-24
a. ඔහුගේ අත්සන : 16:21
b. අවසාන අනතුරු ඇඟවීම : 16:22
c. ආශිර්වාදය : 16:23
d. ප්‍රේමය ප්‍රකාශ කිරීම : 16:24

# 2 කොරින්ති

## හැඳින්වීම

**කර්තෘ:** පාවුලුතුමා

**කවුරුන් වෙතද? :** කොරින්තියේ ඇදහිලිවතුන්ට

**පරමාර්ථය :** ප්‍රධාන පරමාර්ථය වුයේ සිය අපෝස්තලික ආධිපත්‍යය නැවත පිහිටුවීම වුවද, ඊට අතිරේකව වෙනත් වැදගත් කරුණු පිළිබඳවද කටයුතු කරයි. (8:10 බලන්න)

**ප්‍රධාන පදය :** 12:9

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** දෙවියන්වහන්සේගේ බලය විදූමාන වීමට මනුෂ්‍ය දුර්වලකම් අවස්ථාව සලසයි.

**ප්‍රධාන චරිත :** පාවුලු, තිමෝතියස්, තිතස්

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-11

A. ශුභ පැතුම් : 1:1-2
  1. පාවුලු හා තිමෝතියස්ගෙන් : 1:1
  2. කොරින්තියේ සභාවට හා අකායේ ශුද්ධවන්තයන්ට : 1:1
  3. දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් කරුණාව හා සමාදානය : 1:2

B. පීඩාවන් : 1:3-11
  1. පීඩාවන් නිසා දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා : 1:3
    a. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියාණන්
    b. කාරුණික පියාණන්
    c. සැනසීමේ පියාණන්
  2. පීඩාවන්ගේ වටිනාකම : 1:4-7
    a. අප ලබන සැනසීම කරණකොටගෙන අන් අය සැනසීමට ලැබෙන හැකියාව : 1:4
    b. ක්‍රිස්තුස්වහන්සේ තුළ පෞද්ගලික සැනසිල්ල : 1:5
    c. අන් අය වෙනුවෙන් ගැළවීම හා සැනසිල්ල : 1:6-7
  3. පීඩා විඳීම සඳහා නිදසුනක්, පාවුල් තුමා ආසියාවේ : 1:8-11

## පළමුවන කොටස
## දේව සේවය පිළිබඳ අවවාද
## 1:12-7:16

I. පාවුලුතුමාගේ හැසිරීම : 1:12-14

A. ඔහුගේ සාක්ෂිය : 1:12
   1. සරල බව
   2. භක්තිවන්ත අවංකකම
   3. මාංසික ප්‍රඥාවෙන් නොවේ
   4. දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙනි
B. ඔහුගේ ලිපි : 1:13
C. ඔහුගේ සබඳතාව : 1:14
D. ඔහුගේ සැලසුම් : 1:15-2:4
   1. මුල් සැලැස්ම : 1:15-16
   2. සැලසුම වෙනස් කිරීම : 1:17-22
   3. වෙනස් කිරීමට හේතුව : 1:22-2:4
E. පසුතැවිලිවන වරදකරු පිළිබඳ උපදෙස් : 2:5-11
   1. වරද : 2:5
   2. ගත යුතු ක්‍රියා මාර්ග : 2:6-8
   3. ක්‍රියාව සඳහා චේතනාව : 2:9-11

II. සේවයේ ස්වභාවය : 2:12-6:10

A. සේවයේ ජයග්‍රහණය : 2:12-17
   1.ත්‍රෝවසයේ තිබූ කනස්සල්ල : 2:12-13
   2. ක්‍රිස්තුස්වහන්සේ තුළ ජයග්‍රහණය : 2:14-17
B. සේවය සඳහා අනුමැතිය : 3:1-3
   1. ඔවුන්ගේ අනුමැතිය පිළිබඳ ප්‍රශ්න : 3:1
   2. අධිකාරී බලයේ පදනම : 3:2-3
C. සේවයේ මහිමය : 3:4-18
   1. එයට දෙවියන්වහන්සේ විසින් බලය දෙන ලදී : 3:4-6
   2. එය මහිමාන්විත සේවයකි : 3:7-11
   3. එය සරල සේවයකි : 3:12
   4. එය විවෘත, එළිදරව්වූ සේවයකි : 3:13-16
   5. එය නිදහස පිළිබඳ සේවයකි : 3:17
   6. එය ස්වාමින්වහන්සේගේ ස්වරූපයට ජීවිත වෙනස් කරන සේවයකි : 3:18
D. සේවයේ නොපසුබට උත්සාහය : 4:1-5:10
   1. ශුභාරංචි පණිවුඩයට අන්ධව සිටියදීත් දෘඪ උත්සාහය : 4:1-7
      a. සේවකයන්ගේ අවංකකම : 4:1-2
      b. විනාශයට යන්නන්ගේ ආත්මික අන්ධකම : 4:3-4
      c. සේවය සඳහා සාතනික විරෝධතා : 4:4
      d. ශුභාරංචියේ ආලෝකය, අන්ධකාරය විනිවිද යයි : 4:5-6
      e. මෙම සේවයේ වස්තුව මැටි බඳුන්වල වේ : 4:7
   2. පීඩාවන් තුළ දෘඪ උත්සාහය : 4:7-15
      a. පීඩාවන් පිළිබඳ විස්තරය : 4:8-9
      b. පීඩා විඳීමේ පරමාර්ථය : 4:10-12

c. පීඩා විඳීම තුළ ජයග්‍රහණය : 4:13-15

3. බලාපොරොත්තුවෙන් පොලඹවනු ලැබූ දෘඪ උත්සාහය : 4:16-5:10

a. මෙම ජීවිතය තුළ බලාපොරොත්තුව : 4:16-18

b. අනාගත ජීවිතය තුළ බලාපොරොත්තුව : 5:1-10

4. මෙම බලාපොරොත්තුව නිසා වර්තමානයේ ආකල්පය : 5:6-8

a. සැක නැති බව : 5:6

b. ඇදහිල්ල : 5:7

c. මරණය ගැන බිය නොවීම : 5:8

d. පිළිගත හැකි ලෙස ජීවිත්වීම : 5:9

5. මෙම බලාපොරොත්තුවේ අවසානය : 5:10

E. සේවය සඳහා පෙලඹවීම : 5:11-17

1. ස්වාමින්වහන්සේට බියවීම නිසා පෙලඹවීම : 5:11

2. අන් අය ගැන හැඟීම නිසා පෙලඹවීම : 5:12-13

3. ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇති ප්‍රේමය නිසා පෙලඹවීම : 5:14-15

4. ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති නව ජීවනය නිසා පෙලඹවීම : 5:16-17

F. සේවයේ පණිවුඩය : 5:18-21

1. සේවකයන්ගේ තත්වය: සමගි කෙරේ : 5:18

2. සේවකයන්ගේ සේවය : සමගි කිරීම : 5:18-19

3. සේවකයන්ගේ ආයාචනය : සමගි කිරීම : 5:20

4. පණිවුඩය සඳහා පදනම : 5:21

III. සේවය පිළිබඳ සාරාංශය : 6:1-10

A. සේවකයන්ගේ තත්වය, උන්වහන්සේ සමග සේවය කරන්නෝ : 6:1

B. සේවකයන්ගේ ආයාචනය : 6:1-2

C. සේවකයන්ගේ හැසිරීම : 6:3-10

1. සෘණාත්මකව : කිසිවකින් දෝෂයට ලක් නොවීම : 6:3

2. ධනාත්මකව: සියලු දෙයෙහිම දෙවියන්වහන්සේගේ සේවකයන් ලෙස අනුමත කිරීම : 6:4-10

a. ඉවසීමෙන් : 6:4

b. පීඩාවලින් : 6:4

c. අඟහිඟකමින් : 6:4

d. විපත්තිවලින් : 6:4

e. පහරකෑම්වලින් : 6:5

f. සිරගතවීමෙන් : 6:5

g. අඩන්තේට්ටම්වලින් : 6:5

h. වෙහෙසවීමෙන් : 6:5

i. නිදිමැරීමෙන් : 6:5

j. නිරාහාරව සිටීමෙන් : 6:5

k. පිරිසිදුකමින් : 6:6

l. දැනගැන්මෙන් : 6:6

m. ඉවසීමෙන් : 6:6

n. කරුණාවෙන් : 6:6

o. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් : 6:6

p. අවංක ප්‍රේමයෙන් : 6:6

q. සත්‍යතාවේ වචනයෙන් : 6:7

r. දෙවියන්වහන්සේගේ බලයෙන් : 6:7
s. ධර්මිෂ්ඨකම නමැති සන්නාහයෙන් : 6:7
t. ගෞරවය හා අගෞරවය : 6:8
u. කීර්තිය හා අපකීර්තිය : 6:8
v. වංචාකාරයන් මෙන් සැලකුවත් සත්‍යවාදී වීම : 6:8
w. නාඳුනන්නන් වුවද, අඳුනන්නන් වීම : 6:9
x. මළාවූ අය මෙන් පෙනුනද, ජීවත්වීම : 6:9
y. දඬුවම් ලැබුවද, මරනු නොලැබීම : 6:9
z. ශෝකවුවද, ප්‍රීතියෙන් සිටීම : 6:10
aa. දිළිඳුවුවද, බොහෝ අය පොහොසත් කිරීම : 6:10
bb. කිසිත් නැති වුවද, සියල්ල තිබීම : 6:10

IV. මෙම සේවාව වෙනුවෙන් කෙරෙන ආයාචනා : 6:11-7:4

A. පියෙකු වැනි ආයාචනය : 6:11-13
B. වෙන්වීම සඳහා ආයාචනය : 6:14-7:1
1. වෙන්වීමට අණ කිරීම : 6:14
2. වෙන්වීම සඳහා තර්ක : 6:14-16
3. වෙන්වීමේ ප්‍රතිඵල : 6:17-6:18
a. වෙන්වීම : 6:17
b. පිළිගැනීම : 6:17
c. සබඳතාව : 6:18
C. ශුද්ධවන්තකම සඳහා ආයාචනය : 7:1
D. හිතවත්කම සඳහා ආයාචනය : 7:2-4

V. සේවාව පිළිගැනීම : 7:5-16

A. මසිදෝනියාවේ කරදර : 7:5
B. තීතස්ගේ පැමිණීම : 7:6-7
1. තීතස් තුළින් සැනසිල්ල : 7:6
2. ඔහුගේ පණිවුඩය : 7:7
C. පාවුලුතුමාගේ පෙර ලිපිය : 7:8-12
1. ලිපිය : 7:8
2. ලිපියේ ප්‍රතිඵල : 7:8-11
a. භක්තිමත් කණගාටුව : 7:8-9
b. මනස්ස්ථාපනය : 7:9-10
c. ගැළවීම : 7:10
d. පරෙස්සම්වීම : 7:11
e. තමා පවිත්‍රවීම : 7:11
f. කෝපය : 7:11
g. බිය : 7:11
h. ආශාව : 7:11
i. උද්යෝගය : 7:11
j. පළිගැනීම : 7:11
k. සියල්ල අනුමත කිරීම : 7:11

3. පෙර ලිපියේ පරමාර්ථය : 7:12

D. තිතස්ගේ ප්‍රීතිය නිසා සහනය : 7:13-15

E. කොරින්තියේ ඇදහිලිවතුන් කෙරෙහි විශ්වාසය ප්‍රකාශ කිරීම : 7:16

## දෙවන කොටස
## සම්මාදම් පිළිබඳ ආයාචනය
## 8:1-9:15

I. නිදර්ශනය : මසිදෝනියවරුන්ගේ පරිත්‍යාගශීලී දීමනා : 8:1-6

A. ඔවුන්ගේ ත්‍යාගශීලිවන්තකම පිළිබඳ පැහැදිලි කිරීම : 8:1

B. ඔවුන් දෙන අවස්ථාව : 8:2

1. බොහෝ දුක් පීඩා මැද
2. අධික ප්‍රීතිය තිබියදී
3. ඉතා දිළිඳු වුවද
4. ත්‍යාගශීලිවන්තකමින් පොහොසත්වීම

C. ඔවුන් දෙන ආකාරය : 8:3-5

D. ඔවුන්ගේ ත්‍යාගශීලිවන්තකමේ ප්‍රතිඵල : 8:6

II. අවවාද : කිතුනු පරිත්‍යාග සඳහා ඉල්ලීම : 8:7-15

A. ඉල්ලීම : 8:7

B. එවැනි පරිත්‍යාගවල චේතනාව : 8:8-12

1. ප්‍රේමය : 8:8
2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය : 8:9
3. කැමැත්තෙන් කිරීම : 8:9-12

C. දීමේදී සමකමේ මූලධර්මය : 8:13-15

III. කොරින්තියට යැවූ පණිවුඩකරුවෝ : 8:16-9:5

A. පණිවුඩකරුවන් අනුමත කිරීම : 8:16-24

1. තිතස් කොරින්තියට පැමිණීම : 8:16-17
2. තිතස් සමග කොරින්තියට ගිය සහකාරයෝ : 8:18-22
3. පණිවුඩකරුවන්ගේ නිර්දේශය : 8:23
4. ඔවුන් නිසියාකාරව පිළිගන්නා ලෙස ඉල්ලීම : 8:24

B. පණිවුඩකරුවන් යැවීමට හේතු පැහැදිලි කිරීම : 9:1-5

1. සම්මාදම් පිළිබඳ අකායාවේ තත්වය : 9:1-2
2. සම්මාදම් පිළිබඳ සහෝදරයන් යැවීමේ පරමාර්ථය : 9:3-4
3. සම්මාදම් පිළිබඳ සහෝදරයන්ගේ පැවරුම : 9:5

IV. ත්‍යාගශීලිභාවයේ ආශිර්වාද : 9:6-15

A. දීම පිළිබඳව මූලික මූලධර්ම : 9:6

B. දීම සඳහා නිවැරදි ආකල්ප : 9:7

C. ත්‍යාගශීලිභාවයේ ප්‍රතිඵල : 9:8-14

1. සියලු අනුග්‍රහය දෙවියන්වහන්සේගෙන් : 9:8

2. සියලු දෙයින් ප්‍රමාණවත්ව සිටීම : 9:8
3. සියලු යහපත් ක්‍රියාවන්ගෙන් පූර්ණව සිටීම : 9:8
4. දිළිඳුන්ට ආශිර්වාදයක් වීම : 9:9
5. ද්‍රව්‍යමය ආශිර්වාද : 9:10
6. ආත්මික ආශිර්වාද : 9:10
7. ධර්මිෂ්ඨකමේ ඵල වැඩිවීම : 9:10
8. සියලු දෙයින් පොහොසත්වීම : 9:11

D. ත්‍යාග ලැබෙන අයගේ ප්‍රතිචාර : 9:11-14
1. දෙවියන්වහන්සේට ස්තූතිවන්ත වීම : 9:11-13
2. දෙන අය සඳහා සැලකිල්ල : 9:14

E. ත්‍යාගශිලිබවේ ආශිර්වාද පිළිබඳ පදනම : 9:15

V. නිදොස් බව පෙන්වීම : පාවුලුතුමා සිය සේවය නිවැරදි බව දැක්වීම : 10:1-13:10

A. බලය : ප්‍රේරිතවරයාගේ අධිකාරි බලය : 10:1-18
1. සභාව වෙත ඔහුගේ ආයාචනය : 10:1-6
   a. ඔහුගේ ආයාචනයට පදනම : 10:1
   b. ඔහුගේ ආයාචනයේ අන්තර්ගතය : 10:2
   c. ඔහුගේ සටන් පිළිබඳ විස්තරයක් : 10:3-6
      (1). ඔහුගේ සටන්වල ආත්මික ස්වභාවය : 10:3
      (2). ඔහුගේ සටනේ ආත්මික ආයුධ : 10:4
      (3). ඔහුගේ සටනේ යුද්ධය : 10:5-6

B. නොමග ගිය සාමාජිකයෙකුට පිළිතුර : 10:7-11
1. කරුණු ඇති සැටි සිතා බැලීමට කරන ඉල්ලීමක් : 10:7
2. ඔහුගේ අධිකාරී බලය විමසා බැලීම : 10:8-9
3. විවේචනය : 10:10
4. "එවැනි කෙනෙකුට" අනතුරු ඇඟවීමක් : 10:11

C. ව්‍යාජ ගුරුවරුන්ගේ ඉල්ලීම් : 10:12-18
1. ව්‍යාජ ගුරුවරුන්ගේ පාරට්ටුව : 10:12
2. පාරට්ටුව සාධාරණීකරණය කිරීම : 10:13-18
   a. මිනුමේ සම්මතය : 10:13
   b. මිණිය යුතු සාධනය : 10:14-18

VI. ප්‍රේරිතභාවය: පාවුලුතුමාගේ පාරට්ටුව : 11:1-12:13

A. පාරට්ටු කිරීමට අවසර දෙන ලෙසට ඔහුගේ ඉල්ලීම : 11:1-4
1. ඉල්ලීමේ ප්‍රකාශය : 11:1
2. ඉල්ලීමට හේතුව : 11:2-4
   a. ඔවුන් වෙනුවෙන් ඔහුගේ පෞද්ගලික සැලකිල්ල : 11:2
   b. ඔවුන් පිළිබඳ ඔහුගේ කනස්සල්ල : 11:3-4

B. පෞද්ගලික හීනතාව නිෂ්ප්‍රභ කිරීම : 11:5-15
1. ඔහුගේ තත්වය : 11:5
2. ඔහුගේ දේශනා කිරීම : 11:6
3. ඔහුගේ සේවය : 11:7-15

C. පාරට්ටු කිරීම සඳහා පාවුලුතුමාගේ හේතුව : 11:16-12:10
1. පාරට්ටු කිරීමට සූදානම් වීම : 11:16-21
   a. පාරට්ටු කිරීමට පසුබට වීම : 11:16-17

b. පාරට්ටු කිරීමේ අවශ්‍යතාව : 11:18
c. ඔහුගේ පාරට්ටු කිරීමේ අස්වැසිල්ල : 11:19-21

2. පළමු පාරට්ටුව : 11:22-33
   a. මාංසය සඳහා පාරට්ටුව : 11:22
   b. සේවය පිළිබඳ පාරට්ටුව : 11:23-29
   c. දුර්වලතාවලදී පාරට්ටුව : 11:30-33
3. දෙවන පාරට්ටුව : 12:1-10
   a. පාරට්ටු කිරීම පිළිබඳ ඔහුගේ හැඟීම : 12:1
   b. දර්ශන පිළිබඳ පාරට්ටු කිරීම : 12:2-5
   c. දුර්වලකමේදී පාරට්ටු කිරීම : 12:6-10

D. ඔහුගේ පාරට්ටු කිරීම පිළිබඳව සමාලෝචනය : 12:11-13
1. පාරට්ටු කිරීම පිළිබඳ හැඟීම : 12:11
2. පාරට්ටු කිරීමට හේතුව : 12:11-13
   a. ඔහුට ප්‍රශංසා නොකිරීම : 12:11
   b. ඔහුට ප්‍රශංසා කිරීමට ඔවුන් බැඳී සිටීම : 12:11-13

VII. ප්‍රේරිතවරයාගේ යෝජිත කොරින්ති ගමන : 12:14-13:10

A. ඔවුන්ට ඔහුගේ සේවය : 12:14-18
1. එහි පැමිණි පසු ඔහුගේ නොමිලේ සේවය : 12:14
2. ඔහුගේ ආකල්පයට හේතුව : 12:14
3. ඔවුන් වෙනුවෙන් වැය වීමට ඔහුගේ ඇති කැමැත්ත : 12:15
4. ඔහුට විරුද්ධ නින්දාව වැරදි බව පෙන්වීම : 12:16-18

B. ඔහු පැමිණි පසු ඇතිවන තත්වය පිළිබඳ ඔහුගේ සැලකිල්ල : 12:19-21
1. වැරදි සිතිවිලි නිවැරදි කිරීම : 12:19
2. ඔවුන් පිළිබඳ ඔහුගේ සැලකිල්ල : 12:20-21

C. ඔහු පැමිණි පසු ඔහුගේ සැලැස්ම : 13:1-4
1. ඔහු කරන සොයා බැලීම් : 13:1-2
2. ඔවුන්ට දෙන සහතිකය : 13:3-4

D. කොරින්තියේ ඇදහිලිවතුන් වෙත කෙරෙන අවසාන ආයාචනය : 13:5-10
1. ස්වයං පරීක්ෂණ සඳහා ආයාචනය : 13:5-10
2. ඔවුන් සඳහා යාච්ඤාව : 13:7-9
3. ඔවුන් වෙත යැවූ ලිපියේ පරමාර්ථය : 13:10

## සමාප්තිය
## 13:11-14

I. අවවාදයක් : 13:11

A. ආඥාව : 13:11
   1. පරිපූර්ණවන්න
   2. සැනසී සිටින්න
   3. එක්සිත්වන්න
   4. සමාදානයෙන් සිටින්න
B. ප්‍රතිඵලය : 13:11

II. සමාප්තික ගැන ශුභ පැතිම : 13:12-13

III. ආශිර්වාදය : 13:14

A. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව
B. දෙවියන්වහන්සේගේ ප්‍රේමය
C. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහභාගිකම

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 කොරින්ති පොත්වල කර්තෘ කවුරුන්ද?

2. 1 කොරින්ති පොතේ පරමාර්ථය ලියන්න.

3. 1 කොරින්ති ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. 1 කොරින්ති පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. 1 කොරින්තිවල ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

6. 2 කොරින්තිවල පරමාර්ථය සඳහන් කරන්න.

7. 2 කොරින්ති පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

8. 2 කොරින්ති පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

9. 2 කොරින්ති පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. පහත දැක්වෙන දේ හඳුනාගැනීමට 1 කොරි. 3:10-15 අධ්‍යයනය කරන්න.
   - ගොඩනැගිල්ල
   - ගොඩනැගිලි ද්‍රව්‍ය
   - අයිතිකරු
   - ගොඩනැගිල්ලේ පරීක්ෂණය
   - ගොඩනගන්නා

2. පාවුලුතුමා 1 කොරින්ති ලිවීමට එක් හේතුවක් වුයේ පසුතැවිලි නොවන පාපී සාමාජිකයෙකු පහකරන ලෙස සභාවට උපදෙස් දීමටය (1 කොරින්ති 5:1-8). 2 කොරින්තියෙන් ඔහු සභාවට උපදෙස් දෙන්නේ ඔහු දැන් පසුතැවිලි වී ඇති බැවින් නැවත සභාවට බඳවාගන්නා ලෙසය (2 කොරින්ති 2:6-11)

3. සාතන්ගේ පුද්ගලභාවය හා ක්‍රියා ගැන 2 කොරින්ති බොහෝ දේ එළිදරව් කරයි. 2:10-11, 4:4, 11:3, 13-15, 12:7 බලන්න.

4. බයිබලයේ වෙනත් තැනක සඳහන් නොවන අවම වශයෙන් නම් සතරක් ඇදහිලිවතුන් සඳහා 2 කොරින්තියේ සඳහන් වේ. ඒවා නම්, ජීවමාන හසුන් 3:2-3, ක්‍රිස්තුස්වහන්සේගේ සුගන්ධයක්, 2:15, මැටි බඳුන්වල ඇති වස්තුව, 4:7, ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතිවරු, 5:20

5. ඇදහිලිවන්තයෙකුට පීඩා විඳීමට දෙවියන්වහන්සේ ඉඩ දෙන වැදගත් හේතුවක් මෙම පොතේ පැහැදිලි කර තිබේ. 1:1-6

6. පාවුලුතුමා කොරින්තියේ ඇදහිලිවතුන්ට මෙසේ පැවසීය. "මා ක්‍රිස්තුස්වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් ඔබද, මා ආදර්ශයට ගන්න" (1 කොරින්ති 11:1 හා 4:16). 1 කොරින්තිවල පෙන්වා ඇති පරිදි පාවුලුතුමාගේ ආදර්ශය අධ්‍යයනය කරන්න.
   - පණිවුඩයෙන්, ක්‍රමයෙන් හා චේතනාවෙන් පක්ෂපාතිය : 2:1-5
   - ගොඩනැගීමේදී දක්ෂය : 3:10-23
   - ශුභාරංචියේ සත්‍යය පිළිබඳ භාරකරුය : 4:1-6
   - යේසුස්වහන්සේ වෙනුවෙන් පීඩා සමය දරා සිටී : 4:9-16
   - දුර්වල සහෝදරයන් ගැන සැලකිලිමත් වේ : 6:12, 8:13
   - සිය අයිතිවාසිකම් අත්හරී : 9:12-18
   - ආත්මයන් දිනාගැනීම සඳහා තමාවම ප්‍රතික්ෂේප කරගනී : 9:19-23
   - තමාවම හික්මවා ගනී : 9:27, 10:33
   - ප්‍රසිද්ධ රැස්වීම්වලදී නිවැරදි සංවරයක් ප්‍රදර්ශනය කරයි : 14:18-20
   - නිහතමානිය : 15:9-10

7. අනාගතයේ ඇදහිලිවතුන්ගේ නැවත නැගිටීම පිළිබඳව ඇති දිගම බයිබල් කොටස 1 කොරින්ති 15 වේ. සිදුවන වෙනස්වීම් අධ්‍යයනය කරන්න.

   - ශරීරය දූෂණයෙහි වපුරයි (මියයයි, වළලනු ලැබේ), දූෂණය නොමැතිව නැගිටුවයි
   - (නැවත නැගිටීම මගින්).
   - එය අගෞරවයෙන් වපුරයි, මහිමාන්විතව නැගිටුවයි.
   - එය දුබලතාවේ වපුරයි, බලයෙන් නැගුටුවයි.
   - එය ස්වභාවික ශරීරයකින් වපුරයි ස්වර්ගීය ශරීරයකින් නැගිටුවයි.
   - එය ලේ මස් සහිත ශරීරයකින් වපුරයි. වෙනස්වූ ශරීරයකින් නැගුටුවයි.
   - එය මැරෙන සුලු ශරීරයකින් වපුරයි, අමරණීය ශරීරයකින් නැගුටුවයි.

8. 2 කොරින්ති 7:10 අධ්‍යයනය කරන්න. දේව කැමැත්ත අනුව සිතේ වේදනාව හා ලෞකික සිත් වේදනාව අතර වෙනස ලයිස්තු ගත කරන්න.

9. 2 කොරින්ති 6:8-11 අධ්‍යයනය කරන්න. මෙම කොටසේ ඇති එකිනෙකට වෙනස්කම් ලයිස්තුගත කරන්න.

10. කොරින්තියේ සභාවේ ආරම්භය හා ඉතිහාසය කියවන්න. ක්‍රියා 18:1-18, 19:1-22, 20, 3:31

11. දෙවියන්වහන්සේ තවමත්, "හසුන්" හෝ ලිපි ලියන සේක්ද? 2 කොරින්ති 3:3 කියවන්න. ඇදහිලිවන්තයා යනු, දෙවියන්වහන්සේ සිය පණිවුඩය ලෝකයාට එළිදරව් කරන ජීවමාන ලිපියකි.

12. 1 කොරින්ති 12-14 පරිච්ඡේදවල සඳහන් වන්නේ සභාවේ ආත්මික දීමනා භාවිත කිරීම සම්බන්ධව වේ. මෙම කොටස අධ්‍යයනය කිරීමට පහත සඳහන් සටහන් යොදා ගන්න.

## ආත්මික දීමනා පිළිබඳව

ශුද්ධාත්මයාණන්වහන්සේ මෙම දීමනා ඇදහිලිවතුන් අතර උන්වහන්සේගේ අභිමතය පරිදි බෙදා හරින සේක. 12 පරිච්ඡේදය

- බොහෝ දීමනා ඇතත් සිටින්නේ එකම ආත්මයාණන්ය : 4-11
- බොහෝ අවයව තිබුණත් ඇත්තේ එකම ශරීරයකි : 12-27
- සේවය කිරීමට බොහෝ මාර්ග ඇතත් ඇත්තේ එක සභාවකි : 28-31

ප්‍රේමයෙන් භාවිත නොකරන්නේ නම්, දීමනාවලට වටිනාකමක් නැත : 13 පරි.

- ප්‍රේමය නොමැතිව ආත්මික දීමනා ඵලදායි නොවේ : 1-3
- ප්‍රේමයේ ගති ලක්ෂණ : 4-8
- ප්‍රේමය සියලුම දීමනාවලින් ශ්‍රේෂ්ඨතම වේ : 9-13

විශිෂ්ටතම දීමනාව දිවැස් වැකි කීමේ දීමනාව වේ : 14 පරි.

- එය සභාව සන්නද්ධ කරයි : 1-22
- පිටස්තර අයට (ගැළවීම නොලද අය) ඒත්තුගන්වයි : 23-28
- හරියාකාරව භාවිත කළ යුතුය : 29-40

# අටවන පරිච්ඡේදය

# ගලාති

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට
- ගලාති පොතේ කර්තෘ නම් කිරීමට
- ගලාති පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- ගලාති පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- ගලාති පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ගලාති පොත සඳහා ජිවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ** : පාවුලුතුමා

**කවුරුන් වෙතද** : ගලාතියේ ඇදහිලිවතුන් වෙත

**පරමාර්ථය** : සභාවේ යුදෙව් නෛතිකවාදය පිළිබඳ ව්‍යාජ ඉගැන්වීම් නිවැරදි කිරීමට

**ප්‍රධාන පදය** : 5:1

**ජිවිතයේ හා සේවයේ මූලධර්මය** : යේසුස්වහන්සේ අප ව්‍යවස්ථාවෙන් නිදහස්කම ඇතුව සිටීමට මුදාගත්සේක.

**ප්‍රධාන චරිත** : පාවුලු, පේතෘස්, යාකොබ්, කේපස්, යොහන්, බාර්ණබස්, තිතස්, ආබ්‍රහම්

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-5

A. පාවුලුතුමාගෙන් : 1:1
1. ප්‍රේරිතවරයෙකු
2. මිනිසුන් කෙරෙන් නොවේ
3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් හා දෙවි පියාණන්වහන්සේගෙන්

B. ගලාතියේ සභාවන් වෙත : 1:2

C. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් කරුණාවත් සමාදානයත් වේවා : 1:3-5
1. අපේ පව් උදෙසා සිය දිවි පිදූ තැනැන්වහන්සේ : 1:4
2. මේ නපුරු යුගයෙන් අප ගලවාගත් තැනැන්වහන්සේ : 1:4
3. අපගේ දෙවි පියාණන්ගේ කැමැත්ත ලෙස : 1:4
4. උන්වහන්සේට සදහටම මහිමය වේවා : 1:5

**II.** තරවටු කිරීම : 1:6-10

A. ශුභාරංචිය අත්හැර යෑම ගැන පුදුම වීම : 1:6
B. ව්‍යාජ වූ "වෙනත් ශුභාරංචියකට" හැරීයාම පිළිබඳ ප්‍රකාශය : 1:6-7
C. මෙහි භයානකත්වය: වෙනත් ශුභාරංචියක් දේශනා කරන්නේ කවුරුන් වුවද ඔවුන්ට ශාප කර ඇත : 1:8-9
D. මේ දේ කෙරෙහි පාවුලුතුමාගේ ආකල්පය : 1:10

**පළමුවන කොටස : ශුභාරංචියේ නිදහස**
**පෞද්ගලික තර්කයක් 1:11-2:21**

**I.** පාවුලුතුමාට ශුභාරංචිය ලැබුණු ආකාරය : 1:11-24

A. මූලාරම්භය එළිදරව්වකිනි : 1:11-12
B. ශුභාරංචිය ලැබීමට පෙර ඔහුගේ හැසිරීම : 1:13-14
   1. යුදෙව් ආගම ඉගැන්වීම : 1:13
   2. ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට පීඩා කළේය : 1:13
   3. ඔහුගේ සමකාලීනයන් පරදවා යුදෙව් ආගම පිළිපැද්දේය : 1:14
   4. යුදෙව් සම්ප්‍රදායන් ගැන උද්‍යෝගිමත් විය : 1:14
C. ලැබුණ එළිදරව්වේ විස්තරය : 1:15-17
   1. එළිදරව්වේ ප්‍රභවය : දෙවියන්වහන්සේ : 1:15
   2. එළිදරව්වේ තැනැන්වහන්සේ : උන්වහන්සේගේ පුත්‍රයාණෝ : 1:16
   3. එළිදරව්වේ පරමාර්ථය : විජාතීන් අතර උන්වහන්සේ ප්‍රකාශ කිරීම පිණිස : 1:16
   4. එළිදරව්වට ප්‍රතිචාරය : 1:16-17
      a. ඔහු මාංසය හා රුධිරය සමග සාකච්ඡා කළේ නැත : 1:16
      b. ප්‍රේරිතයන් හමුවීමට යෙරුසලමට ගියේ නැත : 1:17
      c. ඔහු අරාබියට හා දමස්කයට ගියේය : 1:17
D. යෙරුසලමේ ප්‍රේරිතවරුන්ගෙන් පාවුලුතුමාගේ ස්වාධීනත්වය : 1:18-20
   1. යෙරුසලමට ගිය ඔහුගේ පළමු ගමන : 1:18-20
      a. එහි ගිය කාලය : 1:18
      b. ගමනේ පරමාර්ථය : 1:18
      c. ගමනේ කාල සීමාව : 1:18
      d. ගමනේදී හමුවූ අය : 1:19-20
E. ඉන්පසු පාවුලුතුමා යෙරුසලමේ නොසිටීම : 1:21-24
   1. ඔහු සිටි ස්ථානය : 1:21
   2. යුදයේ සභාව සමග සබඳතා නොතිබීම : 1:22
   3. ඔහු පිළිබඳ වාර්තාවලට සභාවන් දැක්වූ ප්‍රතිචාරය : 1:23-24

**II.** පාවුලුතුමාට ලැබුණු ශුභාරංචිය යෙරුසලමේ ප්‍රේරිතවරුන් විසින් ස්ථිර කළ ආකාරය : 2:1-10

A. එය ඔවුන්ට ඉදිරිපත් කළ පසුබිම : 2:1-2
   1. යෙරුසලමට ගිය ගමන : 2:2
   2. යෙරුසලමේදී පාවුලුතුමා කළ ඉදිරිපත් කිරීම : 2:2
B. පාවුලුතුමා ඔවුන්ට ශුභාරංචිය ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලය : 2:3-10

1. තිතස් 2:3 හි පෙන්වා ඇති ආකාරයට ඔහුගේ තත්වය : 2:3
2. ව්‍යාජ සහෝදරයන් සමග ඔහුගේ ගැටීම : 2:4-5
    a. ඔවුන් ඉදිරියේ සිටීම : 2:4
    b. ඔවුන්ගේ ඉල්ලීම්වලට ඉඩදීම පාවුලුතුමා ප්‍රතික්ෂේප කිරීම : 2:5
3. පාවුලුතුමාට ලැබුණු ශුභාරංචිය යෙරුසලමේ නායකයන් අනුමත කිරීම : 2:6-10
    a. ඔහුගේ ශුභාරංචියට කිසිවක් එක් කිරීමට ඔවුන්ට නොහැකිවීම : 2:6
    b. ඔහුගේ ශුභාරංචිය ඔවුන් අනුමත කිරීම : 2:7-10
    c. ඔවුන්ගේ අනුමත කිරීමේ පදනම : 2:7-9
    d. ඔවුන්ගේ අනුමත කිරීම ප්‍රකාශ කිරීම : 2:9
    e. ඔවුන්ගේ අනුමත කිරීමේදී ඔවුන් කළ එකම ඉල්ලීම : 2:10

III. අන්තියෝකියේදී නීතිමය පිඩනයට ඉඩදීම ගැන පාවුලුතුමා, පේතෘස්තුමාට තරවටු කිරීම : 2:11-21

A. තරවටු කිරීමට හේතුව : 2:12
B. පේතෘස්තුමාගේ අස්ථිර හැසිරීමේ බලපෑම : 2:13
C. තරවටු කිරීම සාධාරණීකරණය කිරීම : 2:14-21
1. පාවුලුතුමා, පේතෘස්තුමාගෙන් ඇසූ ප්‍රශ්නය : 2:14
2. පාවුලුතුමා සිය දේවධර්ම ස්ථාවරය පැහැදිලි කිරීම : 2:15-21
    a. නීතිය ප්‍රමාණවත් නොවීම : 2:15-18
        (1). අප ධර්මිෂ්ඨකරනු ලබන්නේ, ඇදහිල්ලෙන් මිස ව්‍යවස්ථාවෙන් හෝ ක්‍රියාවලින් හෝ නොවේ : 2:16
        (2). අප ව්‍යවස්ථාව මත විශ්වාසය තැබුවහොත් අපි එය කඩකරන්නෝ වෙමු :2:17-18
    b. ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජිවනය : 2:19-21
        (1). ව්‍යවස්ථාවේ බලපෑම් නව ජිවනයට මගපෙන්විය : 2:19
        (2). නව ජිවනයේ ස්වභාවය : 2:20
        (3). ව්‍යවස්ථාව පිළිපැදීමෙන් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිෂ්ප්‍රභ වේ : 2:21

**දෙවන කොටස: ශුභාරංචියේ නිදහස**
**දේව ධර්ම තර්කයක් 3:1-4:31**

I. ඇදහිල්ලෙන් දේව සබඳතාවයට පත් කිරීමේ දේව ධර්මය : 3:1-4:7

A. ඇදහිල්ලෙන් දේව සබඳතාවයට පත් කිරීම : 3:1-14
1. ඔවුන්ගේ හැසිරීමේ අස්ථිරභාවය : 3:1-5
    a. ක්‍රිස්තුස්වහන්සේගෙන් හැරීම : 3:1
    b. ඔවුන්ගේ කිතුනු ජිවිතයේ ආරම්භය පිළිබඳ ප්‍රශ්නය : 3:2
    c. ඔවුන් පරිපූර්ණ වීමේ ක්‍රමය ගැන ප්‍රශ්නයක් : 3:3
    d. ඇදහිලිවතුන් ලෙස ඔවුන්ගේ පිඩාවිඳීම පිළිබඳ ප්‍රශ්නයක් : 3:4
    e. ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ වැඩවල පදනම පිළිබඳ ප්‍රශ්නය : 3:5
B. ආබ්‍රහම් දේව සබඳතාවයට පත් කිරීමේ නිදර්ශනය : 3:6-9
1. ආබ්‍රහම් දේව සබඳතාවට පත්කිරීමේ ක්‍රමය : 3:6
2. ආබ්‍රහම්ගේ පුත්‍රයන්ගේ අනන්‍යතාව : 3:7

3. ඇදහිල්ල කරණකොටගෙන දේව සබඳතාවයට පත්වීම ගැන දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කළ දැන්වීම : 3:8
4. ආබ්‍රහම්ගේ ආශීර්වාදවලට උරුමක්කාරයෝ : 3:9

C. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ව්‍යවස්ථාවෙන් හා ක්‍රියාවලින් මුදාගැනීම : 3:10-14
1. ව්‍යවස්ථාව හා ක්‍රියා යටතේ සිටින අයට ශාපය : 3:10
2. ව්‍යවස්ථාවට හා ක්‍රියාවලට දේව සබඳතාවට පත් කිරීමට නොහැකි වීම : 3:11-12
3. යේසුස්වහන්සේ තුළින් ශාපයට මිදීම ලැබීම : 3:13-14
 a. ශාපයෙන් මිදීම ලැබූ ක්‍රමය : 3:13
 b. ශාපයෙන් මිදීම ලැබීමට හේතුව : 3:14

D. ව්‍යවස්ථාවේ සීමිතභාවය හා ඇදහිල්ලට ඇති එහි සබඳතාව : 3:15-14:7
1. ආබ්‍රහම් සමග ඇදහිල්ලේ ගිවිසුම : 3:15-18
 a. ගිවිසුම ස්ථිර කරනු ලැබූවකි : 3:15
 b. එය ආබ්‍රහම්ට හා ඔහුගේ වංශයටය : 3:16
 c. පොරොන්දුව ව්‍යවස්ථාවෙන් වෙනස් නොකිරිනි : 3:17
 d. උරුමය ව්‍යවස්ථාව තුළින් නොව පොරොන්දුව තුළිනි : 3:18
2. ව්‍යවස්ථාවේ සැබෑ ස්ථානය හා පරමාර්ථය : 3:19-29
 a. ව්‍යවස්ථාවේ තාවකාලික ස්වභාවය : 3:19-20
 b. ව්‍යවස්ථාවට ජීවනය දිය නොහැකි වීම : 3:21-22
 c. ව්‍යවස්ථාව, අප ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ඒම උපකරණය වේ : 3:23-29

E. ව්‍යවස්ථාව හා ඇදහිල්ල අතර ඇති වෙනස්කම් : 4:1-7
1. උරුමක්කාරයා බාල වයස්කාරයෙකු ලෙස නිදර්ශනය පැහැදිලි කිරීම : 4:1-2
2. නිදර්ශනය ඇදහිලිවතුන්ට අදාළ කිරීම : 4:3-6
 a. බාල වයස්කරුවන් ලෙස වහල්ව සිටීම : 4:3
 b. පුත්‍රයන් ලෙස නිදහස්ය : 4:4-6
3. ඇදහිලිවතුන් සඳහා නිගමනය : 4:7

II. සිය නෛතිකවාදය අත්හරින ලෙස ගලාති ඇදහිලිවතුන්ගෙන් කෙරෙන ඉල්ලීම : 4:8-31

A. යුදෙව් නෛතිකවාදය පිළිගැනීම නැවත වහල්කමට යෑමකි : 4:8-11
1. වහල්භාවයේ ඔවුන්ගේ අතීතයේ තත්වය : 4:8
2. වහල්භාවයෙන් මුදාගැනීම : 4:9
3. නෛතිකවාදය යනු නැවත වහල්බවට යෑමකි : 4:9-10
4. ඔවුන්ගේ ක්‍රියාවන් පාවුලුතුමා සැලකිල්ලට පත් කළේය : 4:11

B. ගලාතිවරුන් කෙරෙහි ඇති පාවුල්ගේ සබඳතාව තුළින් කෙරෙන ඉල්ලීම : 4:12-20
1. පාවුලුතුමාගේ තත්වය ඔවුන්ද ලබාගන්නා ලෙසට ඉල්ලීම : 4:12
2. අතීතයේදී ඔවුන් හා සමග තිබූ සබඳතාව මතක් කිරීම : 4:12-14
3. ඔහු සමග ඇති සබඳතාවයේ වෙනස : 4:15-18
4. ඔවුන් වෙනුවෙන් පාවුල් විඳින ප්‍රසව වේදනාව : 4:19-20

C. ව්‍යවස්ථා හා අනුග්‍රහය යන එකිනෙකට වෙනස් ගිවිසුම් දෙකෙන් කෙරෙන ආයාචනය : 4:21-31
1. ව්‍යවස්ථාව යටතේ සිටීමට කැමති අයගෙන් අසන ප්‍රශ්නය : 4:21
2. ආබ්‍රහම්ගේ පුත්‍රයන් දෙදෙනා පිළිබඳ කතාන්දරය : 4:22-23
3. කතාන්දරයේ අර්ථ නිරූපණය : 4:24-23
 a. ක්‍රම දෙක ගිවිසුම් දෙක නියෝජනය කරයි : 4:24

b. ගිවිසුම් දෙක පිළිබඳ විස්තරය : 4:24-28
(1). එකක් වහල්කම නියෝජනය කරයි : 4:24-25
(2). අනෙක නිවහල්කම නියෝජනය කරයි : 4:26-28
c. වහල්කමේ පුත්‍රයා පන්නා දැමීම : 4:29-30
d. කතාන්දරයේ සමාප්තිය : 4:31

**තෙවන කොටස - ශුභාරංචියේ නිදහස**
**ප්‍රායෝගික ව්‍යවහාරය 5:1-6:18**

I. කිතුනු නිදහස පවත්වාගෙන යෑමට කැඳවීම : 5:1-12

A. චර්මඡේදනයේ අනතුර : 5:2-6
1. එය ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ට නිෂ්ප්‍රයෝජන කරයි : 5:2
2. එය ඔවුන් මුළු ව්‍යවස්ථාවටම බැඳ තබයි : 5:3
3. එය ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් කරයි : 5:4
4. එය දේව අනුග්‍රහය නැතිකර ගැනීමකි : 5:4
5. නිවැරදි කිතුනු ආකල්පය : 5:5-6
B. ව්‍යාජ ගුරුවරුන් වරදකරුවන් කිරීම : 5:7-12
1. ඔවුන්ගේ දෝෂය : 5:7-8
2. ඔවුන්ගේ ඉගැන්වීමේ නිදර්ශනය : 5:9
3. ඔවුන්ට කරදර කරන අය වරදකරුවන් කිරීම : 5:10-12

II. කිතුනු නිදහස් ජීවිතය : 5:13-6:10

A. ජීවිතය මෙහෙය වන්නේ ප්‍රේමයෙන් වේ : 5:13-15
1. ඇදහිලිවන්තයා නිදහසට කැඳවනු ලබයි : 5:13
2. කිතුනු නිදහස නිවැරදිව භාවිත කිරීම : 5:13
3. ප්‍රේමය තුළින් ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීම : 5:14
4. ප්‍රේමය හිඟකමේ ප්‍රතිඵල : 5:15
B. එය මාංසයේ නොව ආත්මයේ හැසිරීමකි : 5:16-25
1. ආත්මයේ හැසිරීමට අණ කිරීම : 5:16
2. ආත්මය හා මාංසය අතර ගැටුම : 5:17-18
3. මාංසයේ හා ආත්මයේ පලවිපාක අතර වෙනස : 5:19-23
a. මාංසයේ පලවිපාක : 5:19-21
b. ආත්මයාණන්ගේ ඵල : 5:22-23
4. ආත්මයාණන් මගින් ජීවත්වන අය : 5:24-25
a. ඔවුන් මාංසය කුරුසිපත් කර ඇත : 5:24
b. ඔවුන් ජීවත්වන්නේත් හැසිරෙන්නේත් ආත්මයාණන් තුළය : 5:25
C. එය අන්‍යෝන්‍ය බර ඉසිලීමේ ජීවිතයකි : 5:26-6:10
1. වැරදි ඉසිලීම : 5:26-6:5
a. අන් අය කෙරෙහි වැරදි ආකල්ප පිළිබඳ අනතුරු ඇඟවීම් : 5:26
b. වැටුණු අය පුනරුත්ථාපනය කිරීමේ නිහතමානී ආකල්පය : 6:1
c. අන්‍යෝන්‍යය බර ඉසිලීමේ යුතුකම : 6:2
d. තමා කෙරෙහි නිවැරදි ආකල්පය : 6:3-5
D. එය මූලික මූලධර්මවලින් පාලනය කෙරෙන ජීවිතයකි : 6:6-10

1. සන්නිවේදනය කිරීමේ මූලධර්මය : 6:6
2. ආත්මික අස්වැන්න නෙළීමේ මූලධර්මය : 6:7-8
3. යහපත කිරීමේ මූලධර්මය : 6:9-10

III. සමාප්තිය

A. ලොකු අකුරු පිළිබඳ සටහන : 6:11
B. ඔහුගේ විරුද්ධකාරයන්ගේ තර්ජන : 6:12-13
C. කුරුසිය කෙරෙහි ඇති ඔහුගේ විශ්වාසය : 6:14-16
1. කුරුසිය තුළ මහිමය : 6:14
2. කුරුසිය මගින් කුරුසියෙහි ඇණ ගසනු ලැබීම : 6:15
3. මෙම ප්‍රතිපත්තිය පිළිගන්නා අයට ආශිර්වාද : 6:16
4. ඔහු සිය ශරීරයේ ස්වාමින්වහන්සේගේ ලකුණු දරන්නේය : 6:17

IV. ආශිර්වාදය 6:18

## ස්වයං පරීක්ෂණය

1. ගලාති පොතේ කර්තෘ කවුරුන්ද?

2. ගලාති පොතේ පරමාර්ථය ලියන්න.

3. ගලාති පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. ගලාති පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. ගලාති පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. හබක්කුක් 2:4 බලන්න. මෙම පදය ගලාති 3:11 හි උපුටා දක්වා ඇත.

2. ආත්මයාණන්ගේ ඵල හා මාංසයේ ක්‍රියා අතර වෙනස අධ්‍යයනය කරන්න. ගලාති 5:19-23

3. ගලාති පොතේ ප්‍රධාන වචනය නිදහස වේ. එය 11 වතාවක් භාවිත කර ඇත. මෙම පද සොයාගෙන නිදහස පිළිබඳව උගන්වා ඇති දෙය සාරාංශ කරන්න.

4. පාවුලුතුමා දෙවියන්වහන්සේ වෙතට හැරීමට පෙර හා පසු සංසන්දනය කරන්න. ගලාති 1:13-17

5. ගලාතියේ සභාවේ දේවධාර්මික වරද පාවුලුතුමා සඳහන් කරන්නේ "තවත් ශුභාරංචියක්" ලෙසය. ඇදහිලිවතුන් ව්‍යවස්ථාව මගින් දේව සබඳතාවයට පත් විම බලාපොරොත්තු වූහ (5:4). ඔවුන්ට විශේෂ ශුද්ධ දවස් පිළිපැදීම ද (4:10) ගැළවීම සඳහා චර්මඡේදනය අවශ්‍ය විය (5:2, 6:12-13). ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාවන් ව්‍යවස්ථාවෙන් හා තමාගේම ධර්මිෂ්ඨ ක්‍රියාවලින් සපිරීමට ඔව්හු බලාපොරොත්තු වූහ (3:3). මෝසෙස්ගේ ව්‍යවස්ථාවට අනුකූල විය යුතු බවට ඔව්හු බල කළහ (4:21). ඔව්හු ශුභාරංචිය ප්‍රතික්ෂේප කළා නොව අලුතින් නෛතිමය හා පිළිවෙත් පිළිබඳ අදහස් එක් කළහ.

6. ගලාති පොතේ අසමානතා අධ්‍යයනය කරන්න. ඇදහිල්ලට එරෙහි ක්‍රියාවන් , ආත්මයට එරෙහි මාංසය, අනුග්‍රහයට එරෙහි ව්‍යවස්ථාව, චර්මඡේදනයට එරෙහි අලුත් මැවිල්ල, කුරුසියට එරෙහි ලෝකය, නිදහසට එරෙහි වහල්කම, ස්වභාවය (ඉෂ්මායෙල්) එරෙහි ආත්මික (ඊසාක්) යන ඒවා මීට අන්තර්ගතය.

7. දැරිය යුතු දේ
   - ඵල දැරීම : ගලාති 5:22-23
   - බර ඉසිලීම ගලාති 6:2
   - වංශය දැරීම, ගලාති 4:7,9
     චර්ගය දැරීම, ගලාති 6:17 (යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලකුණු)

# නවවන පරිච්ඡේදය

## එපීස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- එපීස පොතේ කර්තෘ නම් කිරීමට
- එපීස පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනා ගැනීමට
- එපීස පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- එපීස පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- එපීස පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** එපීසයේ පිහිටි සභාව වෙත

**පරමාර්ථය :** ඇදහිලිවතුන්ට ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔවුන්ගේ ධනවත්කම දැන්වීමට හා ක්‍රිස්තුස්වහන්සේ සමග ඔවුන්ගේ හැසිරීම පිළිබඳව උපදෙස් දීමට.

**ප්‍රධාන පදය :** 1:3

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** ඇදහිලිවන්තයෝ ආශිර්වාදවලටත් (ධනය) ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔවුන්ගේ කැඳවීමේ වගකීම්වලටත් (හැසිරීම) උරුමක්කාරයෝ වෙති.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, තුතිකස්

**සැකිල්ල**

**පළමුවන කොටස: ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ ධනය 1:1-3:21**

I. හැඳින්වීම : 1:1-2

A. පාවුලුතුමාගෙන් : 1:1
B. එපීසයේ සිටින ශුද්ධවන්තයන්ට : 1:1
C. දෙවියන්වහන්සේගෙන්ද යේසුස්වහන්සේගෙන්ද කරුණාව හා සමාදානය : 1:2

II. ආත්මික අයිතීන් ගැන ප්‍රශංසා කිරීම : 1:3-14

A. උන්වහන්සේ අප තෝරාගෙන ඇත : 1:4
B. උන්වහන්සේ අප පෙර නියම කර ඇත : 1:5-6
C. අපට උන්වහන්සේ තුළ මිදීම ඇත : 1:7
D. උන්වහන්සේ අපට ප්‍රඥාව පෙන්වා ඇත : 1:8

E. උන්වහන්සේගේ කැමැත්තේ අබිරහස එළිදරව් කරන සේක : 1:9-10
F. උන්වහන්සේ තුළ අප උරුමයක් ලැබ ඇත : 1:11-12
G. ආත්මයාණන්වහන්සේගෙන් අප මුද්‍රා කොට ඇත : 1:13-14

III. ක්‍රිස්තුස්වහන්සේ තුළින් ආත්මික අවබෝධය සඳහා යාච්ඤාව : 1:15-23

A. යාච්ඤාවේ පදනම : 1:15
B. යාච්ඤාවේ ස්වභාවය : 1:16
C. යාච්ඤාව මගින් දෙවියන්වහන්සේ ආමන්ත්‍රණය කිරීම : 1:17
D. යාච්ඤාව තුළින් ඉල්ලා ඇති දීමනා : 1:17
 1. ප්‍රඥාව
 2. උන්වහන්සේ පිළිබඳ දැනුම එළිදරව්ව
E. එම යාච්ඤාවේ පරමාර්ථය : 1:18-23
 1. උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව ඔවුන් දැනගන්නා ලෙස : 1:18
 2. උන්වහන්සේගේ උරුමයේ ධන සම්භාරය ඔවුන්ට ලැබෙන ලෙස : 1:18
 3. උන්වහන්සේගේ බලය දැනගන්නා ලෙස : 1:19-23
  a. උන්වහන්සේගේ බලයේ ස්වභාවය : 1:19
  b. ක්‍රිස්තුස්වහන්සේ තුළ උන්වහන්සේගේ බලය විද්‍යමාන වීම : 1:20-23

IV. ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ තත්වය 2:1-10

A. ක්‍රිස්තුස්වහන්සේට පෙර : 2:1-3
 1. ආත්මික මරණය : 2:1
 2. ලෝකයේ ක්‍රමය අනුව හැසිරීම : 2:2
 3. සාතන්ට යටත්වීම : 2:2
 4. අකීකරු ආත්මය : 2:2
 5. දුෂ්ට සංවාදය : 2:3
 6. උදහසේ දරුවෝ : 2:3
 7. මාසයට වහල්වූ ලැදිකම් : 2:3
  a. මාංශයේ ආශාව : ලෞකික රුචිය
  b. සිතේ ආශාවන් : ලෞකික තෘෂ්ණාවන්
B. ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ අලුත් තත්වය : 2:4-10
 1. ජීවත් කෙරේ : 2:5
 2. දේව වරප්‍රසාදයෙන් ගැළවීම : 2:5
 3. ස්වර්ගීය ස්ථානවලට ඔසවයි : 2:6
 4. දෙවියන්වහන්සේ සමග අනුග්‍රහයෙන් : 2:7
C. අලුත් තත්වයට හේතුව : 2:8-10
 1. ගැළවීම එනම් : 2:8
  a. ඇදහිල්ලෙන් : 2:8
  b. දෙවියන්වහන්සේගේ දීමනාව : 2:8
 2. ගැළවීම, නොවන්නේ : 2:8-9
  a. අප කළ දෙයක් නොවේ : 2:8
  b. අපගේ ක්‍රියාවක් නොවේ : 2:9
 3. අපගේ ජීවිත තුළ ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ නොනැවතෙන ක්‍රියාවන් : 2:10

V. අපගේ පැරණි සබඳතාව : 2:11-12
"ඒ කාලයේදී ඔබ . . . සිටියේ"

A. ක්‍රිස්තුස්වහන්සේ නැතිව : 2:12
B. විජාතිකව : 2:12
C. අන්‍යයන්ව : 2:12
D. බලාපොරොත්තු රහිතව : 2:12
E. දෙවියන්වහන්සේත් නැතිව : 2:12

VI. අලුත් සබඳතාව : 2:19-22
"එහෙත් ඔබ . . . දැන් සිටින්නේ"

A. එක නුවර වැසියෝව : 2:19
B. එක පවුලක සාමාජිකයෝව : 2:19
C. එක අත්තිවාරමක ඉදිකරනු ලැබ : 2:20
D. එක ගොඩනැගිල්ලක කොටස් වශයෙන් : 2:21
E. එකම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන : 2:22 වෙති.

VII. වෙනස්වීම සිදුවූ ආකාරය : 2:13-18
"එහෙත් දැන් ක්‍රිස්තුස්වහන්සේ තුළින් . . .

A. දුර නැතිකර : ළං කරනු ලැබ : 2:13
B. අසමගිය නැතිකර : දෙගොල්ලම එක්කර : 2:14
C. බෙදීම නැතිකර : මැද බිත්තිය කඩා දමා : 2:14
D. භේද නැතිකර : සතුරුකම අවලංගුකර : 2:15
E. වෙනස්කම් නැති කර : 2:15-18
   1. අලුත් මනුෂ්‍යයෙක් : 2:15
   2. දෙවියන්වහන්සේට සමගි කර : 2:16
   3. දෙවියන්වහන්සේ සමග සමාදානය ඇති කර : 2:17
   4. දෙවියන්වහන්සේ වෙතට පිවිසීම ලැබ : 2:18
   5. තවදුරටත් විදේශිකයෝවත් ආගන්තුකයෝවත් නොව : 2:19-22
      a. එක නුවර වැසියෝව : 2:19
      b. නිවැරදි අත්තිවාරම මත ඉදිකරනු ලැබ : 2:20
      c. ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන සෑදූ : 2:21
      d. ස්වාමින්වහන්සේ තුළ ශුද්ධ මන්දිරයක් සේ : 2:21
      e. ආත්මයාණන්වහන්සේ මගින් දෙවියන්වහන්සේගේ වාසස්ථානයක්ව : 2:22

VIII. දිව්‍යමය අභිරහස එළිදරව් කෙරේ : 3:1-12

A. පාවුලුතුමා එම අබිරහස් පණිවුඩකරුවෙකු ලෙස : 3:1-13
   1. අබිරහසට ඔහුගේ ඇති සම්බන්ධකම : 3:1-5
      a. විජාතීන්ගේ හිරකාරයෙකු ලෙස ඔහුගේ තත්වය : 3:1
      b. විජාතීන් කෙරෙහි දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ ඔහුගේ ගබඩාකාරිත්වය : 3:2

c. එළිදරව් වීමකින් එම අබිරහස පිළිබඳ දැනුම ලැබීම : 3:3-5

2. අබිරහසේ ප්‍රකාශනය : 3:6

3. මේ අබිරහස හා සම්බන්ධ පාවුලුතුමාගේ සේවය : 3:7-12

a. ඔහුගේ සේවයේ මූලය : 3:7

b. මෙම සේවය දෙන ලද තැනැත්තාගේ ආකල්පය : 3:8

c. මෙම සේවයේ අන්තර්ගතය : 3:8-9

d. මෙම සේවයේ පරමාර්ථය : 3:10-11

e. මෙම සේවයේ ආශිර්වාදය : 3:12

f. මෙම සේවයේ දුක්පීඩා : 3:13

IX. දිව්‍යමය අභිරහස අයත් කරගැනීම : 3:14-21

A. අයත්කරගැනීමේ යාච්ඤාවට හැඳින්වීම : 3:14-15

B. ඉල්ලීම : 3:16-17

1. අභ්‍යන්තර මිනිසා ආත්මයාණන්වහන්සේ මගින් ශක්ති සම්පන්න වීමට බලය දෙන ලෙසට : 3:16

2. ක්‍රිස්තුස්වහන්සේගේ වැඩ සිටීම ඔවුන් අත්දකින ලෙසට : 3:17

3. ප්‍රේමය මුල් බැස ස්ථිරව සිටින පිණිස : 3:17

4. ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයේ ආත්මික අවබෝධය ඔවුන්ට ලැබෙන පිණිස : 3:18-19

a. එහි සීමාවන් : 3:18

b. එහි දිව්‍යමය ස්වභාවය : 3:19

5. දෙවියන්වහන්සේගේ පරිපූර්ණත්වයෙන් ඔවුන් පූර්ණ වන පිණිස : 3:19

C. යාච්ඤාවේ සමාප්තිය : 3:20-21

1. ආමන්ත්‍රණය කරන තැනැන්වහන්සේගේ හැකියාව : 3:20

2. ආමන්ත්‍රණය කරන තැනැන්වහන්සේට ප්‍රශංසා කිරීම : 3:21

**දෙවන කොටස : ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ හැසිරීම 4:1-6:24**

I. සභාවේ සාමූහික හැසිරීම : ඔබින ලෙස හැසිරීම : 4:1-16

A. නිවැරදි ආකල්ප මගින් : 4:2

1. නිහතමානිව

2. විනීතව

3. ඉවසිලිවන්තව

4. එකිනෙකා සමග ප්‍රේමයෙන් යුක්තව

B. එක්සත්කම තුළින් : 4:3-6

1. සමාදානයෙන් : 4:3

2. එක ශරීරයක් මෙන් : 4:4

3. එකම ආත්මයෙන් : 4:4

4. ඔබ කැඳවනු ලැබූ එකම බලාපොරොත්තුවෙන් : 4:4

5. එකම ස්වාමින්වහන්සේ තුළ : 4:5

6. එකම ඇදහිල්ලෙන් : 4:5

7. එකම බව්තිස්මයෙන් : 4:5

8. එකම දෙවියන්වහන්සේ තුළින් : 4:6

a. සියල්ලන්ගේ පියාණන්වහන්සේ

b. සියල්ලන්ට ඉහළින්

c. සියල්ලන් තුළින්
d. සියල්ලන් තුළ වැඩ වසන

C. ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින් : 4:7-10

D. නිවැරදි ව්‍යුහය තුළින් : 4:11-13

1. ආත්මික දීමනා : 4:11
   a. ප්‍රේරිතයන්
   b. දිවැසිවරුන්
   c. ඉවැන්ජලිස්තවරුන්
   d. සභා පාලකයන්
   e. ගුරුවරුන්
2. ඔවුන්ගේ පරමාර්ථ : 4:12-16
   a. ශුද්ධවන්තයන් පරිපූර්ණ කිරීමට : 4:12
   b. සේවයේ කාර්යයන් : 4:12
   c. ක්‍රිස්තු ශරීරය වර්ධනය කිරීමට : 4:12
   d. ඇදහිල්ලේ එකමුතුකම : 4:13
   e. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් දැනගැනීම : 4:13
   f. ක්‍රිස්තුස්වහන්සේගේ පරිපූර්ණත්වය : 4:14
   g. ආත්මික පරිණතභාවය : 4:14-15

E. ශරීරයේ කොටසක් වීමෙන් : 4:16

1. එකට සන්ධිකරනු ලැබේ.
2. එක එක අවයව ඊට යුතු ලෙස ක්‍රියා කරයි.
3. ප්‍රේමයෙන් වැඩි වර්ධනය වේ.

II. ඇදහිලිවතුන්ගේ පෞද්ගලික හැසිරීම : 4:17-5:2

A. නොහැසිරිය යුතු ආකාරය : 4:17-25

1. සිත්වල නිෂ්ඵලකම : 4:17
2. තේරුම්ගැනීම අඳුරුව : 4:18
3. අඥානකම හා සිත් දැඩිවීම නිසා දෙවියන්වහන්සේගේ ජීවනයෙන් වෙන්වීම : 4:18
4. විළිබිය නැතිවීමට, අපවිත්‍රකමට හා තෘෂ්ණාවට ඇලී ගැලී සිටීම : 4:19

B. හැසිරිය යුතු ආකාරය : 4:20-5:2

1. ක්‍රිස්තුස්වහන්සේ තුළ : 4:20-21
2. පරණ ස්වභාවය අහක දමා : 4:22
3. මනස ආත්මිකව අලුත් කිරීමක් ඇති කර ගැනීම : 4:23
4. අලුත් ස්වභාවයක් පැළඳගෙන : 4:24
5. පාපී හැසිරීම අහක දමා : 4:25-30
   a. බොරුකීම : 4:25
   b. කෝපවීම : 4:26-27,31
   c. සොරකම් කිරීම : 4:28
   d. දූෂිත කථාවන් : 4:29
   e. ශුද්ධාත්මයාණන්වහන්සේට දුක්දීම : 4:30
   f. තිත්තකම් : 4:31
   g. කෝපය : 4:31
   h. උදහස : 4:31
   i. අපහාස : 4:31

j. ද්වේෂය : 4:31

6. ධර්මිෂ්ට හැසිරීම අනුගමනය කරන්න : 4:32-5:1

a. කරුණාව : 4:32

b. දයානුකම්පාව : 4:32

c. කමාවීම : 4:32

d. කීකරු දරුවන් මෙන් : 5:1

III. ලෝකයාට සම්බන්ධ අපගේ හැසිරීම : 5:2-21

A. ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින් ප්‍රේමයෙන් හැසිරෙන්න : 5:2

B. ශුද්ධවන්තකමින් හැසිරෙන්න : 5:3-5

1. කාමමිථ්‍යාචාරය නොමැතිව : 5:3
2. අපවිත්‍රකම් නොමැතිව : 5:3
3. තණ්හාව නොමැතිව : 5:3
4. අශික්ෂිතකම් නොමැතිව : 5:4
5. මෝඩ කතා නොමැතිව : 5:4
6. කවටකම් නොමැතිව : 5:4
7. ස්තුති දීමේ ආකල්පයක් ඇතිව : 5:4

C. සදාතනය සිත්හි තබාගෙන හැසිරෙන්න : 5:5

D. හිස් වචනවලින් රැවටෙන්න ඉඩ නොදෙන්න : 5:6

E. දුෂ්ට සබඳතා ඇතිකර නොගන්න : 5:7

F. ආලෝකයේ හැසිරෙන්න : 5:8

G. ආත්මයාණන්ගේ ඵල වර්ධනය කරගන්න : 5:9

1. යහපත්කම
2. දමිටුකම
3. සැබෑකම

H. ස්වාමින්වහන්සේට ප්‍රිය මනාප දේ පෙන්වන්න : 5:10

I. අන්ධකාරයේ නොහැසිරෙන්න : 5:11-14

1. අන්ධකාරය සමග සහභාගිකත්වයක් නොපවත්වන්න : 5:11
2. නිෂ්ඵල ක්‍රියාවලට හවුල් නොවන්න : 5:11
3. රහසිගතව කරන දේ ගැන කතා නොකරන්න : 5:12
4. අන්ධකාරයේ ආලෝකය පතුරුවන්න : 5:13
5. ආත්මික අන්ධකාරයේ නිදා සිටින අය අවදි කරන්න : 5:14

J. අඥානයන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ජීවත් වෙන්න : 5:15

K. කාලය බේරාගන්න : 5:16

L. දෙවියන්වහන්සේගේ කැමැත්ත තේරුම්ගන්න : 5:17

M. මුද්‍රිකපානයෙන් මත් නොවෙන්න : 5:18

N. ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න : 5:18

1. ගීතිකා, තුති ගී හා ශුද්ධ ගීවලින් එකිනෙකාට කතා කරන්න : 5:19
2. ඔබගේ සිත් තුළ තුති නද දෙන්න : 5:19
3. යේසුස්වහන්සේගේ නාමයෙන් දෙවියන්වහන්සේට සැමවිටම සෑම දේ ගැනම ස්තුති කරන්න : 5:20

IV. විශේෂ සබඳතා හා සම්බන්ධ අපගේ හැසිරීම : 5:21-6:9

A. අනෙකුත් ඇදහිලිවතුන් : දෙවියන්වහන්සේ කෙරෙහි බිය ඇතිව එකිනෙකාට යටත්වන්න : 5:21
B. භාර්යාවන් : 5:22-24
   1. ස්වාමින්වහන්සේට මෙන් තම ස්වාමි පුරුෂයාට යටත්ව සිටින්න : 5:22
   2. ක්‍රිස්තුස්වහන්සේ සභාවේ හිස වන්නාක් මෙන් පුරුෂයා භාර්යාවගේ හිසය : 5:23
   3. සභාව ක්‍රිස්තුස්වහන්සේට යටත්වන්නාක් මෙන් භාර්යාවන්ද සියලු දේවලද පුරුෂයන්ට යටත් විය යුතුය : 5:24
C. ස්වාමි පුරුෂයන් : 5:25-33
   1. ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේම කළාක් මෙන් ඔබත් භාර්යාවන්ට ප්‍රේම කරන්න : 5:25-29
   2. සභාව ක්‍රිස්තුස්වහන්සේට බැඳී සිටින්නාක් මෙන් ඔබත් ඔබගේ භාර්යාව හා බැඳෙන්න : 5:30-33
      a. එකම ශරීරයකින් : 5:30
      b. අන් සියල්ල අත්හරින්න : 5:31-32
D. ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාටම : 5:33
   1. සෑම පුරුෂයෙකුම තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම කරන්න : 5:33
   2. භාර්යාව, තම ස්වාමි පුරුෂයාට ගෞරව දක්වන්න : 5:33
E. දරුවන් ඔබේ දෙමව්පියන්ට ගෞරව කරන්න : 6:1-3
F. පියවරුන් : 6:4
   1. ඔබේ දරුවන් කෝප නොකරන්න.
   2. ස්වාමින්වහන්සේ තුළ විනයෙන්ද අවවාදයෙන්ද ඇතිදැඩි කරන්න.
G. දාසයන් : 6:5-8
   1. ඔබගේ ස්වාමිවරුන්ට කීකරුවන්න : 6:5
   2. ගෞරව කිරීමේ ආකල්පයක් ඇතිව සිටින්න : 6:5
   3. පක්ෂපාතීවන්න (අවංක සිතින්) : 6:5
   4. ක්‍රිස්තුස්වහන්සේට සේවය කරන්නාක් මෙන් සේවය කරන්න : 6:6-7
   5. ඔබගේ විපාක ලැබෙන්නේ ස්වාමින්වහන්සේගෙන් බව මතක තබාගන්න : 6:8
H. ස්වාමිවරුන් : 6:9
   1. දාසයන්ටත් එලෙසම සලකන්න : 6:9
   2. ඔබද ස්වාමියෙකුට සේවය කරන බව මතක තබාගන්න : 6:9
   3. ස්වාමින්වහන්සේ මිනිසුන්ගේ තරාතිරම නොබලන සේක : 6:9

V. සාතන්ගේ බලයන් සැලකිල්ලට ගනිමින් අපගේ හැසිරීම : 6:10-20

A. ස්වාමින්වහන්සේ තුළද උන්වහන්සේගේ ශක්තියෙන් ද බලවත් වන්න : 6:10
B. දෙවියන්වහන්සේගේ සන්නාහයෙන් සන්නද්ධ වන්න : 6:11-20
   1. පරමාර්ථය : සාතන්ට හා ඔහුගේ නපුරුකම්වලට එරෙහිව සිටීමට ඔබට හැකිවීම පිණිසය : 6:11,13
   2. සතුරා : 6:12
      a. අධිපතිකම්
      b. පරාක්‍රමධාරීන්
      c. අන්ධකාරයේ ලෝක මුලාදෑනින්ට
      d. ස්වර්ගීය ස්ථානවල සිටින සකල දුෂ්ට බලවේගයන්ට
   3. සන්නාහය : 6:14-20

a. ඉගටිය, සත්‍යය නමැති පටියෙන් බැඳගන්න : 6:14
b. ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම පැළඳගන්න : 6:14
c. සාම සුබ අස්න නමැති වහන් පයලාගන්න : 6:15
d. ඇදහිල්ල නමැති පලිහ : 6:16
e. ගැළවීම නමැති හිස් වැස්ම : 6:16
f. ආත්මයාණන්වහන්සේගේ කඩුව : 6:17
g. යාච්ඤාව : :18-20

VI. සමාප්තිය : 6:21-24

A. පෞද්ගලික කරුණු : 6:21-22
1. තුකිකස් පණිවුඩකරු ලෙස පත් කිරීම : 6:21
2. තුකිකස් ඔවුන් වෙත යැවීමේ පරමාර්ථය : 6:21-22
a. පණිවුඩය දැනගැනීමට සැලසීම : 6:21-22
b. පාවුලුතුමාගේ කටයුතු දැන්වීම : 6:22
c. ඔවුන්ව සැනසීමට : 6:22
B. සමාප්තිය : 6:23-24
1. සහෝදරත්වයට ආශාව : 6:23
a. සාමය
b. ප්‍රේමය
c. ඇදහිල්ල
2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකරන සියලු දෙනාට ආශිර්වාදය : 6:24

## ස්වයං පරීක්ෂණය

1. එපිස පොතේ කර්තෘ කවුරුන්ද?

2. එපිස පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. එපිස පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. එපිස පොතේ ජීවතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. එපිස පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. එපිස පොත ඇදහිලිවතුන්ව බොහෝ දේ හා සංසන්දනය කරයි.
   - පුරවැසියන් : 2:19
   - ශරීරයක් : 1:22-23, 4:4,12,16
   - සභාවක් : 5:22-23
   - දාසයන් : 6:6-9
   - ගොඩනැගිල්ලක් : 2:20-22
   - හමුදා භටයන් : 6:10-17

2. දෙවියන්වහන්සේ සමග අපගේ සබඳතාව පවුලක් වැනිය (3:15) අපි, දරුකමට හදාගත්ත අය (1:5-6), පවුලේ අය (2:19) හා ප්‍රේමණීය දරුවෝ (5:1) වෙමු.

3. එපීසවරුන් සඳහා වූ පාවුලුතුමාගේ යාච්ඤාවන් අධ්‍යයනය කරන්න. ඔවුන් ඇතැම් දේවල් දැනගත යුතු බවට යාච්ඤා කළේය (1:16-19). එමෙන්ම ඔවුන්ට ඇතැම් දේවල් ලැබෙන ලෙසට යාච්ඤා කරන්න (3:14-19). අපගේ ආත්මික උරුමය ලබාගැනීමට මේ දෙකම අවශ්‍ය වේ. අප ඒ ගැන දැනගත යුතු අතර අප එයට හිමිකම් කිව යුතුය. අප යාච්ඤා කළ යුතු අන්දම පිළිබඳව එපිස පොතේ දී ඇති මාර්ග නිර්දේශ අනුගමනය කරන්න. 5:18-20, 6:18.

4. සභාව පිළිබඳව බොහෝ කොටස් එපිස පොතේ ඇත. සෑම පදයක්ම ලියා එය උගන්වන දේ සඳහන් කරන්න.

5. එපිස පොතේ ප්‍රධාන පද අධ්‍යයනය කරන්න. එනම් අබිරහස, හැසිරීම, ප්‍රේමය, අනුග්‍රහය, මහිමය, බලය, තුළ ක්‍රියා කිරීමේදී, සාමය, ධනය, එක්ව සිටීම, ස්වර්ගීය ස්ථානවල"

6. එපිස 4:22-23 හා 6:11-18 අධ්‍යයනය කරන්න. අප අහක දැමිය යුතු දේ හා පැළඳ ගත යුතු දේ ලයිස්තුගත කරන්න. මෙම ලයිස්තුව කොලොස්සි 3 පරිච්ඡේදයේ සඳහන් මේ හා සමාන ලයිස්තුව හා සසඳන්න.

7. එපිස පොතේ සඳහන් එකිනෙකට වෙනස් දේවල ලයිස්තුවක් සකසන්න. ඔබගේ අධ්‍යයනය ආරම්භ කිරීම සඳහා නිදර්ශන සමහරක් මෙසේ වේ.

   | | |
   |---|---|
   | ක්‍රියාවලින් ගැළවීම : 2:9 | දේව අනුග්‍රහය මගින් ගැළවීම : 2:8 |
   | නොදන්නා එළිදරව්ව : 3:5 | අබිරහස එළිදරව්වීම : 3:3 |
   | අකීකරු දරුවෝ : 5:6 | ආලෝකයේ දරුවෝ : 5:8 |

   පෙර කාලයේ අප වරද හා පාපය තුළ මියගොස් සිටි ආකාරය හා ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින ආකාරය පිළිබඳව එපිස පොත උගන්වන සියලු දේ අතර වෙනස සොයන්න.

8. එපිස 6:21-22 හි තුඛිකස් නම් මනුෂ්‍යයෙකු ගැන සඳහන් වේ.
   ක්‍රියා 20:4, 2 තිමෝති 4:12, තිතස් 3:12, කොලො. 4:7 හි ඔහු පිළිබඳව සඳහන් දේ සොයන්න.

9. එපිස පොතේ ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන දී ඇති යොමුවීම් දොළොස සොයන්න. 1-3 පරි. වල සඳහන් වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ කවුරුන්ද හා ඇදහිලිවන්තයා වෙත කරන දෙය පිළිබඳවය. 4-6 පරි. වල සඳහන් වන්නේ අප කවුරුන්ද හා උන්වහන්සේ වෙත කරන දෙය පිළිබඳවය.

# දහවන පරිච්ඡේදය

# පිලිප්පි

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- පිලිප්පි පොතේ කර්තෘ නම් කිරීමට
- පිලිප්පි පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- පිලිප්පි පොතේ පරමාර්ථය සඳහන් කිරීමට
- පිලිප්පි පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පිලිප්පි පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** පාවුලු තුමා

**කවුරුන් වෙතද :** පිලිප්පියේ සභාව වෙත

**පරමාර්ථය :** කිතුනු එක්සත්කම සඳහා ආයාචනයක් ඉදිරිපත් කිරීමට

**ප්‍රධාන පදය :** 2:2

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** යේසුස්වහන්සේ තුළ එක්සිත්කම ප්‍රීතිය ගෙන දෙයි.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, තිමෝතියස්, එපප්‍රොදිතස්, සීසර්

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-26

A. සුභ පැතුම් : 1:1-2
1. පාවුලුතුමාගෙන් හා තිමෝතියස්ගෙන් : 1:1
2. පිලිප්පියෙහි සිටින සියලු ශුද්ධවන්තයන්, නායකයන් හා උපස්ථායකයන් වෙත : 1:1
3. කරුණාවත් සමාදානයත් වේවා : 1:2

B. පිලිප්පිවරුන් වෙත යාච්ඤාව : 1:3-11
1. ඔවුන් වෙනුවෙන් ඔහුගේ ස්තුති කිරීම : 1:3-5
   a. ස්තුති කිරීමේ චේතනාව : 1:3
   b. ස්තුති කිරීමේ ප්‍රකාශය : 1:4
   c. ස්තුති කිරීම සඳහා හේතුව : 1:5
2. ඔවුන් වෙත ඇති ඔහුගේ විශ්වාසය : 1:6-7
   a. විශ්වාසයේ ස්වභාවය : 1:6
   b. මෙම විශ්වාසය සාධාරණය කිරීම : 1:7

3. ඔහුගේ ආශාව : 1:8
4. ඔවුන් වෙනුවෙන් ඔහුගේ යාච්ඤාව : 1:9-11
a. ප්‍රේමය දැනගැන්මෙන් හා විමසීමෙන් බොහෝ සේ වර්ධනය : 1:9
b. විශිෂ්ටතම දේවල් වටහාගැනීමට හැකිවන පිණිස : 1:10
c. අවංකව හා නිදොස්ව සිටීමට : 1:10
d. දැහැමි ජීවිතයක ඵලවලින් පූර්ණ වීමට : 1:11
C. පෞද්ගලික කරුණු : 1:12-26
1. ශුභාරංචිය පැතිරවීමට මූලිකවූ සිද්ධීන් : 1:12-18
a. සිරගත වීම : 1:12-14
b. දේශනා : 1:15-18
c. යාච්ඤාව : 1:19
2. වඩාත් හොඳ ජීවත්වීමද මරණයද යන්න ප්‍රශ්න කිරීම : 1:19-26
a. ජීවිතය හා මරණය අතර වෙනස : 1:20-21
b. ජීවිතයේ ආයාචනය : 1:22
c. මරණය සඳහා තරඟකාරී ආශාව : 1:23-24
d. දිගු ජීවිතයක් සඳහා සහතිකය : 1:25-26

II. එක්සත්වීම සඳහා අවවාද : 1:27-2:18

A. දුක්විඳීමේදී එක්සත්ව සිටීමට ඉල්ලීම : 1:27-30
1. නිවැරදි සාකච්ඡාව : 1:27
2. එකම ආත්මයකින් හා එක සිතකින් ස්ථිරව සිටීම : 1:27
3. ශුභාරංචියේ ඇදහිල්ල සඳහා එක්ව වීර්ය කිරීම : 1:27
4. ඔබගේ විරුද්ධවාදීන්ට අභීතව මුහුණ දීම : 1:28-30
B. ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්සත්කම : 2:1-11
1. නිවැරදි හැසිරීම තුළින් : 2:1-4
a. ප්‍රේමය : 2:1-2
b. සහභාගිකත්වය : 2:1
c. දයාබරකම : 2:1
d. එකම අරමුණකින් : 2:2
e. එකම සිතකින් : 2:2
f. පක්ෂවාදීකමින්වත් පුහු මාන්නයෙන්වත් කිසිවක් නොකරන්න. එකිනෙකා තම තමාට වඩා අන් අය උතුම්යයි යටහත්කමින් සිතන්න : 2:3
g. සැමදෙන තම තමාගේම යහපත පමණක් නොසොයා අනුන්ගේ යහපත ගැනද සලකන්න : 2:4
2. ක්‍රිස්තුස්වහන්සේගේ අවමානය : උන්වහන්සේ කළාක් මෙන් ඔබගේ සිත් එක්සත් කරන්න : 2:6-8
a. කීර්තියක් නැත : 2:7
b. සේවකයෙකුගේ ස්වරූපය : 2:7
c. මිනිසෙකු හා සමානය : 2:7
d. තමාම නිහතමානී වීම : 2:8
e. කුරුසියේ මරණය දක්වා කීකරුවීම : 2:8
3. ක්‍රිස්තුස්වහන්සේගේ මහිමාන්විත වීම : 2:9-11
a. අති උසස් තැනට නැංවීම : 2:9
b. සියලු නම්වලට වඩා උසස් නාමය : 2:9
c. සියලු දණ නමනු ඇත : 2:10

d. සෑම දිවකින්ම ප්‍රකාශ කරනු ඇත : 2:11

C. ආත්මික වර්ධනය එක්සත්කම ගෙන එයි : 2:12-18
1. ඔබගේ ගැළවීම බියෙන් සලසා ගන්න. ඒ දෙවියන්වහන්සේය : 2:12-13
2. කුමක් කළත් මැසිවිලි නොකියන්න. එවිට ඔබ නිදොස් වේ : 2:14-15
3. ජීවන පණිවුඩය අල්ලාගන්න. එවිට මට ප්‍රීතිවිය හැකිය : 2:16-18

III. පාවුලුතුමාගේ සැලසුම් : 2:19-30

A. තිමෝතියස් සඳහා ඔහුගේ සැලසුම් : 2:19-23
1. සැලැස්ම : 2:19
2. සැලැස්ම සඳහා චේතනාව : 2:19
3. තිමෝතියස් තෝරාගැනීමට හේතුව : 2:20-21
4. තිමෝතියස් හා පාවුලුතුමාගේ සබඳතාව : 2:22
5. තිමෝතියස්ගේ ගමනේ වේලාව සැකසීම : 2:23

B. තමා සඳහා සැලසුම් : 2:24

C. එපප්‍රොදිතස් සඳහා සැලසුම් : 2:25-30
1. සැලැස්මේ විස්තරය : 2:25
2. එපප්‍රොදිතස්ගේ සාක්ෂිය : 2:25
3. එපප්‍රොදිතස් යැවීමට හේතුව : 2:26-27
4. ඔහු පිළිගත යුතු ආකාරය : 2:28-30

IV. අනතුරු ඇඟවීම් : 3:1-4:1

A. යුදෙව්කාරකවාදී ගුරුවරුන්ට විරුද්ධව : 3:1-16
1. ඔවුන්ගෙන් ආරක්ෂාවීමට ස්වාමින්වහන්සේ තුළ ප්‍රීතියෙන් පැවතීම : 3:1
2. ඔවුන්ගෙන් පරෙස්සම්වීමට අවවාද : 3:2
3. සැබෑ ඉශ්රායෙල්වරුන් හඳුනාගැනීම : 3:3
4. මේ කරුණ හා සම්බන්ධ පාවුලුතුමාගේ අත්දැකීම : 3:4-11
    a. නීතිමය පාරට්ටුව සඳහා ඔහුගේ පදනම : 3:4-6
        (1) චර්මඡේදනය කර ඇත : 3:5
        (2) ඉශ්රායෙල් වංශයේ කෙනෙකි : 3:5
        (3) බෙන්ජමින් ගෝත්‍රයේ කෙනෙකි : 3:5
        (4) පරිසියෙකි : 3:5
        (5) උද්යෝගිමත් කෙනෙකි (සභාවට පීඩා කර ඇත) : 3:6
        (6) ව්‍යවස්ථාව යටතේ ධර්මිෂ්ඨ තැනැත්තෙකි : 3:6
    b. ඔහුගේ වටිනාකම් වෙනස් වීම : 3:7-11
        (1) වෙනස්වීමේ ස්වභාවය : 3:7
        (2) වෙනස්වීමට හේතු : 3:8
        (3) වෙනස්වීම සඳහා චේතනාවන් : 3:8-11
5. නීතියෙන් ආරක්ෂා වීමක් ලෙස පරිපූර්ණත්වය : 3:12-16
    a. පරිපූර්ණත්වය කෙරෙහි ආකල්ප : 3:12
    b. අරමුණට ළඟාවීමේ ප්‍රයත්නය : 3:13-14
    c. පරිපූර්ණත්වයට ළඟා වීමට අවවාද : 3:15-16

B. ව්‍යාජ ගුරුවරුන්ට විරුද්ධව : 3:17-21
1. ඔවුන්ගේ චරිතය : 3:18
2. ඔවුන්ගේ ඉරණම : 3:19
3. ඇදහිලිවතුන්ගේ ප්‍රතිචාර : 3:20-21

V. අවවාදානුශාසනා : 4:1-9

A. එවෝදියා හා සින්තකී අතර එක්සත්බව : 4:1-3
B. ප්‍රීතිය තුළ එක්සත් බව : 4:4
C. මැදහත් පැවතුම් තුළ එක්සත්බව : 4:5
D. යාච්ඤාවේදී එක්සත් බව : 4:6
E. සමාදානය තුළ එක්සත් බව : 4:17
F. සිත තුළ එක්සත් බව: නිවැරදි සිතිවිලි ක්‍රියාවලියක් : 4:8
   1. සත්‍යතාව
   2. අවංකකම
   3. සාධාරණත්වය
   4. පවිත්‍රතාව
   5. මනහර බව
   6. හොඳ වාර්තාවක් ලැබෙන
   7. සදාචාරාත්මක
   8. ප්‍රශංසනීය
G. දැනුම හා ක්‍රියාවන් අතර එක්සත් බව : 4:9

VI. තුති පඬුරු සඳහා ස්තුතිය : 4:10-20

A. ඇති දෙයින් සතුටු වීමේ රහස : 4:10-13
   1. ඔවුන්ගේ තුති පඬුරු ගැන ඔහුගේ ස්තුතිය : 4:10
   2. ද්‍රව්‍යමය අවශ්‍යතා ගැන ඔහුගේ ස්තුතිය : 4:11
   3. ඔහුගේ රහස පැහැදිලි කිරීම : 4:11-12
   4. ඔහුගේ ශක්තියේ මූලය : 4:13
B. සැපයීමේ රහස : 4:14-20
   1. එම තුති පඬුරු ඔහු අගය කිරීම : 4:14
   2. ඔවුන්ගේ අතීත ක්‍රියා ඔහු මතක් කිරීම : 4:15-16
   3. ඔවුන්ගේ තුති පඬුරු කෙරෙහි ඔහුගේ ආකල්පය : 4:17
   4. ඔහුට තුති පඬුරු ලැබීම : 4:18
   5. සැපයීමේ රහස : 4:19-20

VII. අවසාන ආචාරය 4:21-23

A. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ශුද්ධවන්තයන් සැමදෙනාට ආචාර කරන්න : 4:21
B. පාවුලුතුමා සමග සිටින සහෝදරයෝ ආචාර කරති : 4:21
C. සියලු ශුද්ධවන්තයන්ද ප්‍රධාන කොට සීසර්ගේ ගෙදර සිටින ශුද්ධවන්තයන්ද ආචාර කරති : 4:22
D. කරුණාව ඔබ සමග වේවා : 4:23

## ස්වයං පරීක්ෂණය

1. පිලිප්පි පොතේ කර්තෘ කවුරුන්ද?

2. පිලිප්පි පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. පිලිප්පි පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. පිලිප්පි පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. පිලිප්පි පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ප්‍රීතිවන්න හා ප්‍රීතිය යන ප්‍රධාන වචන අධ්‍යයනය කරන්න. එම වචන මෙම පොතේ 18 වාරයක් සඳහන් වේ.

2. පිලිප්පි පොත අධ්‍යයනය කිරීම සඳහා තවත් ක්‍රමයක් මෙසේ වේ.

| පරිච්ඡේදය | ප්‍රධාන පදය | තේමාව |
|---|---|---|
| 1 | 21 | ඇදහිලිවන්තයාගේ ජීවිතය |
| 2 | 5 | ඇදහිලිවන්තයාගේ මනස |
| 3 | 10 | ඇදහිලිවන්තයාගේ අරමුණ |
| 4 | 13 | ඇදහිලිවන්තයාගේ ශක්තිය |

3. පිලිප්පියේ සභාව පිහිටුවන ලද්දේ පාවුලුතුමා විසින් අත්දුටු දර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් වේ. මේ පිළිබඳව ක්‍රියා පොතේ 16:8-10 කියවන්න.

4. බයිබලයේ සඳහන් සමාදාන වර්ග දෙකෙන් එකක් ගැන පිලිප්පි පොතේ විස්තර කෙරේ. රෝම 5:1 හි සඳහන් වන්නේ සියලු ඇදහිලිවතුන් විසින් අත්දකින දෙවියන්වහන්සේ හා සමග සමාදානය වේ. සියලු ඇදහිලිවතුන්ට ලබා ගත හැකි සමාදානය පිලිප්පි 4:7 හි සඳහන් වේ.

5. පිලිප්පියේ පිහිටි සභාවේ සිටින පුද්ගලයන් තිදෙනෙකුගේ ජීවිත තුළ දෙවියන්වහන්සේ පුදුමාකාර ලෙස ක්‍රියා කළ සේක.
   - ග්‍රීක් ජේන කියන්නෙක් : ක්‍රියා 16:16-18
   - වෙළඳ ස්ත්‍රියක් ක්‍රියා : 16:13-15
   - රෝම සිරගෙයි මුලාදෑනියෙක් : ක්‍රියා 16:19-24

6. 3 පරිච්ඡේදයේ ඇති පාවුලුතුමාගේ අරමුණු බලන්න.
   - මා ලබාගැනීම 9
   - මා දැනගැනීම 10
   - මා පැමිණවීමය 11
   - මා අත්කරගැනීමය 12

7. පාවුලුතුමාගේ ලෞකික සුදුසුකම් ලයිස්තු ගත කරන්න 3:8-12

8. පිලිප්පි 1:12-21 කියවන්න. ශුභාරංචිය ඉදිරියට ගෙන ගිය විවිධ ක්‍රම ලයිස්තුගත කරන්න.

9. පිලිප්පි 4:8-9 හි සඳහන් ගුණ යහපත්කම් ලයිස්තුගත කරන්න.

# එකළොස්වන පරිච්ඡේදය

## කොලොස්සි

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- කොලොස්සි පොතේ කර්තෘ නම් කිරීමට
- කොලොස්සි පොත ලියන ලද්දේ කවුරුන් වෙතදැයි හඳුනාගැනීමට
- කොලොස්සි පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- කොලොස්සි පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- කොලොස්සි පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්ම සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** කොලොස්සියේ සිටින ඇදහිලිවතුන් වෙත, ඔවුන් මෙම හසුන ලවෝදිසයේ සිටින ඇදහිලිවතුන් සමගද බෙදා ගත යුතුය.

**පරමාර්ථය :** සභාවේ දේවධර්ම කරුණු පිළිබඳව කටයුතු කිරීමට

**ප්‍රධාන පදය :** 3:1-3

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** සියල්ල ක්‍රිස්තුස්වහන්සේ වන අතර සියල්ලෙහි උන්වහන්සේ සිටින සේක.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, තුකිකස්, ඔනෙසිමස් අර්ස්තාර්තස්, මාක්, සීලස්, එපප්‍රස්, ලූක්, දේමස්, නිම්පා, ආර්කිපස්

### සැකිල්ල

I. හැඳින්වීම : 1:1-14

A. සුභ පැතුම් : 1:1-2
   1. පාවුලු හා තිමෝතියස්ගෙන් : 1:1
   2. කොලොස්සියේ සිටින ක්‍රිස්තියානි ඇදහිලිවන්ත සහෝදර ශුද්ධවතුන් වෙතය : 1:2
   3. දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් කරුණාවත් සමාදානයක් වේවා 1:2

B. ස්තුති දීම : 1:3-8

C. කොලොස්සියේ සිටින කිතුනුවන් සඳහා පාවුලුතුමාගේ යාච්ඤාව : 1:9-14

1. නොකඩවා යාච්ඤා කිරීම : 1:9
2. සියලු ආකාර ප්‍රඥාව ද ආත්මික ඥානයද ලබා ඔවුන් දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ ලෙස අවබෝධ කරගැනීමට : 1:9
3. ස්වාමින්වහන්සේට ඔබින ලෙසත් ප්‍රිය මනාප ලෙසත් හැසිරීමට : 1:10
4. සියලු ආකාර යහපත් ක්‍රියාවලින් ඵලදායි වීමට : 1:10
5. දෙවියන්වහන්සේ දැනගැන්මෙහි වැඩිවර්ධනය වීමට : 1:10
6. ඉවසිල්ලෙන්ද ප්‍රීතියෙන්ද සියල්ල දරාගැනීමට සියලු ආකාර බලයෙන් ඔවුන් ශක්තිමත් කිරීමට : 1:11
7. පියාණන්වහන්සේට ස්තුති කිරීමට : 1:12-13
    a. ආලෝකයේ වසන ශුද්ධවන්තයන්ගේ උරුමයට පංගුකාරයන් වීමට අප සුදුසුසන් කිරීම වෙනුවෙන් : 1:12
    b. අන්ධකාරයේ බලයෙන් මුදාහැරීම වෙනුවෙන් : 1:13
    c. උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පැමිණවීම වෙනුවෙන් : 1:13

II. යේසුස් නම් තැනැන්වහන්සේ හා උන්වහන්සේගේ ක්‍රියා : 1:15-23

A. මැවීමේ ස්වාමින්වහන්සේ : 1:15-17
   1. එහි මුලාරම්භය හා සම්බන්ධව : 1:15-16
   2. එහි අඛණ්ඩතාවය හා සම්බන්ධව : 1:17
B. සභාවේ ස්වාමින්වහන්සේ : 1:18-19
   1. ශරීරයේ හිස : 1:18
   2. ආරම්භය : 1:18
   3. මළවුන්ගේ කුළුඳුලාව : 1:18
   4. උන්වහන්සේ සියල්ලෙහි අසමසම ස්ථානය දරන සේක : 1:18
   5. සියලු පරිපූර්ණතාව උන්වහන්සේ තුළය : 1:19
C. සමගි කරන තැනැන්වහන්සේ : 1:20-23
   1. උන්වහන්සේගේ කුරුසියේ ලේ තුළින් උන්වහන්සේ සමාදානය ඇති කළ සේක. : 1:20
   2. ස්වර්ගයේත් පොළොවේත් ඇති සියලු දේ උන්වහන්සේ තමන්වහන්සේ වෙතට සමගි කළ සේක : 1:20
   3. නපුරු ක්‍රියා නිසා ඈත්ව සිටියවුන් උන්වහන්සේ සමගි කළ සේක : 1:21
   4. උන්වහන්සේගේ මරණය තුළින් අප මෙසේ පමුණුවාගත හැකිය : 1:22
      a. ශුද්ධ අය
      b. නොකැලැල් අය
      c. උන්වහන්සේ ඉදිරියෙහි නිදොස් අය
   5. අප ඇදහිල්ලෙහි නිරතව සිටිය යුතුය : 1:23
      a. ස්ථිරව : 1:23
      b. අහක් නොවී : 1:23
      c. ශුභාරංචියෙන් ඈත් නොවීය : 1:23
         (1) ඔවුන් ඇසූවාවූ
         (2) සැම දෙනාටම දේශනා කළ
         (3) පාවුලුතුමා සේවකයෙකු කළ

III. පාවුලුතුමා : සමගි කිරීමේ දෙවියන්වහන්සේගේ සේවකයා : 1:24-2:7

A. දුක්විඳින සේවකයා : 1:24
   1. ශාරීරිකව
   2. ආත්මික පරමාර්ථයක් ඇතිව
B. ක්‍රිස්තුස්වහන්සේගේ රහස පිළිබඳ සේවකයා : 1:25-29
   1. ඔහුගේ සේවයේ වාතාවරණය : 1:25
   2. ඔහුගේ සේවයේ පණිවුඩය : 1:26-27
      a. දෙවියන්වහන්සේගේ රහස : 1:26-27
      b. යේසුස්වහන්සේම : 1:27
   3. ඔහුගේ සේවයේ ක්‍රමවේදය : 1:28
      a. දේශනාකිරීම
      b. අනතුරු ඇඟවීම
      c. ඉගැන්වීම
   4. ඔහුගේ සේවයේ අරමුණ : යේසුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් පරිණත වීම පිණිසය : 1:28
   5. උන්වහන්සේගේ සේවය පිටුපස ඇති බලය : බලවත් සේ ක්‍රියා කරන උන්වහන්සේගේ බලමහිමයේ ප්‍රකාරයට දිරි දරමින් ක්‍රියා කරයි : 1:29
C. ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකත්වයට හා ස්ථාවරත්වයට ආශාව : 2:1-7
   1. ඇදහිලිවතුන් වෙනුවෙන් ඔහු වෙහෙස මහන්සි වීම : 2:1
      a. කොලොස්සියේ දී
      b. ලවෝදිසයේ දී
      c. නුදුටු සියල්ලන් උදෙසා
   2. ඔහු වෙහෙස මහන්සිවන පුද්ගලයන්. පියවූ දෙවියන්වහන්සේ හා ක්‍රිස්තුස්වහන්සේ : 2:2
   3. වෙහෙස මහන්සිවීමේ පරමාර්ථය : 2:2-7
      a. ඔවුන්ගේ සිත් සනසනු ලබන පිණිස : 2:2
      b. ඔවුන් ප්‍රේමයෙන් එකට බැඳී සිටීම පිණිස : 2:2
      c. අවබෝධයෙන් ඇතිවන සම්පූර්ණ සහතිකකමේ සම්පත උරුම කරගැනීම : 2:2
      d. ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රඥාවේත් දැනගැන්මේත් සකල ධනසම්භාරය නිදන්වී ඇති බව අවබෝධ කරගැනීම : 2:3
      e. කිසිවෙකුගේ බොරු වාටුවලින් මුළා නොවන පිණිස : 2:4
      f. ඔවුන් ඇදහිල්ලෙහි ස්ථිරව පිහිටා සිටින පිණිස : 2:5
      g. ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ හා ඒකාබද්ධ වී ජීවත්වන පිණිස : 2:6
      h. උන්වහන්සේ තුළ මුල් ඇදගෙන සිටීම පිණිස : 2:7
      i. උන්වහන්සේ මත ඔවුන්ගේ ජීවිත ගොඩනගාගන්නා පිණිස : 2:7
      j. ඔවුන්ට උගන්වා ඇති ඇදහිල්ලේ පිහිටා සිටීම පිණිස : 2:7
      k. ඔවුන් බෙහෙවින් තුති පුදමින් සිටීම පිණිස : 2:7

IV. ව්‍යාජ ගුරුවරුන් කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිත්වය : 2:8-3:4

A. සැම බලයකම ස්වාමින්වහන්සේය : 2:8-10
   1. දර්ශනවාද : 2:8
   2. හිස්වූ රැවටිලිකාරකම් : 2:8
   3. මිනිසුන්ගේ සම්ප්‍රදායන් : 2:8

4. ක්‍රිස්තුස්වහන්සේගෙන් නොවන මිනිස් සම්ප්‍රදායන් : 2:8
    a. දේවත්වයේ පරිපූර්ණතාව, ක්‍රිස්තුස්වහන්සේගේ මිනිස් බවෙහිම වැඩ වාසය කරයි : 2:9
    b. උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටිති : 2:10
    c. සියලු අධිපතිකමේද බලයේද ප්‍රධානියා උන්වහන්සේවේ : 2:10

B. අලුත් ජිවිතය : 2:11-14
1. සිතෙහි චර්මඡේදනය : 2:11
2. බව්තිස්මයේදී උන්වහන්සේ සමග වළලනු ලැබිය : 2:12
3. ඇදහිල්ල තුළින් උන්වහන්සේ සමග නැවත නැගිටුවනු ලැබිය : 2:12
4. උන්වහන්සේ සමග ජිවත්කරනු ලැබීම : 2:13
5. සියලු පව්වලට කමාව දෙනු ලැබීම : 2:13
6. අපට විරුද්ධ අණපනත් අවලංගු කෙරේ : 2:14

C. අධිපතීන්ද බලධාරීන්ද ජයග්‍රහණය කෙරේ : 2:15
1. ඔවුන් නිරායුධ කෙරේ : 2:15
2. ප්‍රසිද්ධියේ ඔවුන් ප්‍රදර්ශනය කෙරේ : 2:15
3. ඔවුන් පරාජය කරනු ලැබේ : 2:15

D. ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිත්වය ප්‍රතික්ෂේප කෙරෙන පුරුදු : 2:16-3:4
1. ආගමික පිළිවෙත් : 2:16-17
    a. කෑම : 2:16
    b. බීම : 2:16
    c. ශුද්ධවූ දවස් : 2:16
    d. අමාවක : 2:16
    e. සබත් දවස් : 2:16
2. දේවදූත වෝදනාව : මෙහි නිරතවන තැනැත්තා : 2:18-19
    a. ඔහු නුදුටු දේවලට බලෙන් ඇතුළු වීම : 2:18
    b. ඔහුගේ මාංශික මනසින් නිරර්ථක ලෙස උඩඟු වීම : 2:18
    c. ක්‍රිස්තුස්වහන්සේ හිස ලෙස තබා නොගැනීම : 2:19
        (1) ශරීරයට පෝෂණය ලැබෙන්නේ ක්‍රිස්තුස්වහන්සේ හිස ලෙස තබා ගැනීමෙනි.
        (2) අප ප්‍රේමයෙන් එකට බැඳතබන්නේ ක්‍රිස්තුස්වහන්සේ හිස ලෙස තබා තබා ගැනීමෙනි.
        (3) දෙවියන්වහන්සේගේ වර්ධනයෙන් අප වර්ධනය වන්නේ ක්‍රිස්තුස්වහන්සේ හිස ලෙස තබා තබා ගැනීමෙනි.
3. ලෝකයේ කරුණුවලට යටත්වීම : 2:20-23
    a. අප ඒවාට යටත් නොවිය යුතුය : 2:20
    b. ඔවුන් සැලකිලිමත් වන දේ : 2:21
    c. මනුෂ්‍යයන්ගේ නියෝග හා ධර්මයන් : 2:22
    d. ඒවා බාහිර පෙනුමක් ඇති දේ වේ : 2:23
        (1) කැමති ලෙස නමස්කාර කිරීම
        (2) පහත්වීම
        (3) ශරීරයට හිංසා කර ගැනීමෙන්
        (4) මාංසයේ තෘෂ්ණා වැලැක්වීමට වටිනාකමක් නැති
4. ලෞකික, තාවකාලික ආශාවන් : 3:1-4
    a. උසස්තැන්හි දේ සොයන්න : 3:1
    b. ලෞකික දේ කෙරෙහි නොව උසස්තැන්හි දේ කෙරෙහි ඇලුම්වන්න : 3:2

c. යේසුස්වහන්සේ සමග ඔබේ ඇති සබඳතාව නිසා මෙය කළ හැකිය : 3:3
   (1) අතීතය : ඔබ ක්‍රිස්තුස්වහන්සේ සමග නැගිටුවනු ලැබීය : 3:3
   (2) වර්තමානය : ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේ සමග ක්‍රිස්තුස්වහන්සේ තුළ සැඟවී පවතී : 3:3
   (3) අනාගතය : ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ වන විට, ඔබත් උන්වහන්සේ සමග තේජසින් ප්‍රකාශ වනු ඇත : 3:4

V. ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමිත්වය හා කිතුනු ජීවිතය : 3:5-4:6

A. අපගේ මාංශික තෘෂ්ණාවන් නසා දැමීම අපගේ වගකීම වේ : 3:5
B. අකීකරුවන හා මේ ආශාවන් තුළ හැසිරෙන අය කෙරෙහි දෙවියන්වහන්සේගේ උදහස පැමිණෙනු ඇත : 3:6
C. අතීතයේදී අපි මේ පාපී දේවල හැසුරුනෙමු, එහෙත් දැන් ඒවා අහක දමා ඇත : 3:7-8
D. අහක දැමිය යුතු පරණ ජීවිතය : 3:5-9
   1. කාමමිථ්‍යාචාරය : 3:5
   2. අපිරිසිදුකම : 3:5
   3. කාමරාගය : 3:5
   4. නපුරු තෘෂ්ණාවන් : 3:5
   5. රූපවැඳීම වැනි තෘෂ්ණාවන් : 3:5-7
   6. උදහස : 3:8
   7. කෝපය : 3:8
   8. ද්වේශය : 3:8
   9. දේවාපහාසය : 3:8
   10. මුඛයෙන් නික්මෙන් අසභ්‍ය කතා : 3:8
   11. බොරුකීම : 3:9
E. පැළඳගත යුතු අලුත් ජීවිතය : 3:10-17
   1. අලුත් මනුෂ්‍යයා : 3:10
      a. ඔහුගේ මැවුම්කාරයාණන්ගේ ස්වරූපය අනුව උන්වහන්සේ දැනගැනීම සඳහා ඔහු අලුත් කරන සේක : 3:10
      b. ඔහු තුළ භේදයක් නැත : 3:11
   2. දයාවේ කොටස් : 3:12
   3. කරුණාව : 3:12
   4. නිහතමානිකම : 3:12
   5. මෘදුකම : 3:12
   6. ඉවසිලිවන්තකම : 3:12
   7. එකිනෙකා ගැන ඉවසීම : 3:13
   8. කමාව : 3:13
   9. ප්‍රේමය : 3:14
   10. දෙවියන්වහන්සේගේ සමාදානය : 3:15
   11. ශරීරයේ ඒකත්වය : 3:15
   12. කෘතඥතාව : 3:15
   13. දෙවියන්වහන්සේගේ වචනය ඔබ තුළ සමෘද්ධව පවතීවා : 3:16
      a. සියලු ප්‍රඥාවෙන්
      b. ඉගැන්වීමෙන්
      c. ගීතිකාවලින්, කවිවලින් හා ආත්මික ගීවලින් අවවාදානුශාසනා කරන්න.
   14. යහපත් ක්‍රියා : 3:17

a. වචනයෙන් හා ක්‍රියාවෙන්
b. කළ යුත්තේ යේසුස්වහන්සේගේ නාමයෙන්
c. දෙවිඳුන්ට ස්තුති දෙමින්

F. විශේෂ අවස්ථා : 3:18-4:6

1. නිවෙස : 3:18-21
   a. භාර්යාවෝ : 3:18
   b. ස්වාමි පුරුෂයෝ : 3:19
   c. දරුවෝ : 3:20
   d. පියවරු : 3:21
2. කාර්යය සබඳතා : 3:22, 4:1
   a. ඔබේ ස්වාමිවරුන්ට කීකරුවන්න : 3:22
   b. ක්‍රිස්තුස්වහන්සේට මෙන් සේවය කරන්න : 3:22
   c. ස්වාමිවරුන් දාසයන්ට යුතු ලෙස හා සාධාරණ ලෙස සැලකිය යුතුය. : 4:1
3. පොදු මාර්ග නිර්දේශ : 3:23-25
   a. කරන සියලු දෙයම මනුෂ්‍යයන් උදෙසා නොව ස්වාමින්වහන්සේ උදෙසා කරන දෙයක් මෙන් කරන්න : 3:23
   b. ඔබ ස්වාමින්වහන්සේට සේවය කරන බව මතක තබාගන්න. ඔබට විපාකය පැමිණෙන්නේ උන්වහන්සේගෙන්ය : 3:24
   c. වැරදි කරන්නාට තමා කරන වැරදිවලට ඵලවිපාක දෙවියන්වහන්සේගෙන් ලැබෙන බව තේරුම්ගන්න : 3:25

VI. අවසාන උපදෙස් : 4:2-6

A. යාච්ඤාවේ යුතුකම් : 4:2-4

1. නොකඩවා යාච්ඤා කිරීමේ වගකිම : 4:2
2. ස්තුතිවන්තව සිටින්න : 4:2
3. ශුභාරංචිය පතුරුවන අයට දොරවල් විවෘත කර දෙන ලෙසට යාච්ඤා කරන්න : 4:3-4

B. සාක්ෂිදීමේ යුතුකම : 4:5-6

1. නිසි ලෙස ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම : 4:5
2. නිසිලෙස කාලය ප්‍රයෝජනයට ගැනීම : 4:5
3. නිසිලෙස කතා කිරීම : 4:6
   a. කරුණාවෙන් යුක්තවීම
   b. ලුණු වලින් රසවත්වීම
   c. සෑම කෙනෙකුටම පිළිතුරු දිය යුත්තේ කෙසේදැයි දැනගැනීම

VII. අවසානය : 4:7-18

A. පෞද්ගලික සුභ පැතුම් : 4:7-17

1. ලිපිය ගෙනයන අය : 4:7-9
   a. තුකිකස් : 4:7-8
   b. ඔනේසිමස් : 4:9
2. ඔහු සමග සිටින අයගෙන් සුභ පැතුම් : 4:10-14
3. ලවෝදිසියන්ට ආචාර කිරීම හා ඔවුන්ටත් හසුන කියවන ලෙසට නියෝගය : 4:15-16

4. ආර්කිපස්ට විශේෂ පණිවුඩයක් : 4:17

B. අවස්ථාවන් : 4:18

1. පාවුලුතුමාගේම අතින්
2. බැඳීම් මතක තබාගැනීමට කරන ඉල්ලීම
3. ඔබට කරුණාව වේවා!

## ස්වයං පරීක්ෂණය

1. කොලොස්සි පොතේ කර්තෘ කවුරුන්ද?

2. කොලොස්සි පොතේ පරමාර්ථය සඳහන් කරන්න.

3. කොලොස්සි පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. කොලොස්සි පොතේ ජිවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. කොලොස්සි පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. කොලොස්සි 3:2-17 අධ්‍යයනය කරන්න. ඇදහිලිවතුන් සිය ආත්මික ජීවිතයේ "අහක් කළ යුතු දේ" හා "ලබාගත යුතු දේ" පිළිබඳ ලයිස්තුවක් සකස් කරන්න.

2. කොලොස්සි 3:18-25 අධ්‍යයනය කරන්න. මෙම කොටස් සභාවේ විවිධ සමාජිකයන් අමතයි. භාර්යාවන්ට, ස්වාමි පුරුෂයන්ට, දරුවන්ට, පියවරුන්ට හා සේවකයන්ට දී ඇති නියෝග ලයිස්තුගත කරන්න.

3. කොලොස්සි පොත යේසුස්වහන්සේ ගැන බොහෝ දේ උගන්වයි. මෙම පොත කියවා යේසුස්වහන්සේ හා සම්බන්ධ සෑම පදයක්ම ලියන්න. ඉන්පසු සෑම පදයකින්ම ඔබ උන්වහන්සේ පිළිබඳව උගත් දේ සාරාංශ කරන්න.

4. හසුන කියවා ඉන්පසු විවිධ ප්‍රාදේශිය රැස්වීම්වලද එය කියවන ලෙසට අණ කරන නව ගිවිසුමේ ඇති හසුන් දෙකෙන් එකක් කොලොස්සි හසුන වේ. කොලො. 4:16, 1 තෙස. 5:27 සමග සසඳන්න.

5. කොලොස්සි හා එපීස එකිනෙකට සම්බන්ධය. එපීස පොතේ පාවුලුතුමා සාකච්ජා කරන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන සභාව ගැනය. කොලොස්සි පොතෙහි ඔහු ශරීරයේ හිස වන යේසුස්වහන්සේ ගැන ලියයි. කොලොස්සි පොතේ පද 59 කින් 78 ක්ම එපීස පොතේ පද හා බොහෝ දුරට සමානය. මෙම පොතේ දෙක අධ්‍යයනය කර සසඳන්න.

6. කොලො. 1:12-22 කියවන්න. මේ ගැළවීමේ වැදගත් අංග හතක් සඳහන් වේ.
   - උරුමය: ආලෝකයේ වසන ශුද්ධවන්තයන්ගේ උරුමයට පංගුකාරයෝ 12
   - මුදාගැනීම : අන්ධකාරයේ බලයෙන් අප මුදාගත් තැනැන්වහන්සේ 13
   - පරිවර්තනය : තම ප්‍රේමාන්විත පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පැමිණවූ සේක. 13
   - විමුක්තිය : සිය ලේවලින් අපට විමුක්තිය ප්‍රදානය කළ තැනැන්වහන්සේ 14
   - කමාව : පව් කමාවද ප්‍රදානය කර ඇත. 14
   - සමගි කිරීම : උන්වහන්සේ ඔබ සමගි කර ඇත. 21
   - රූප විපර්යාසය : උන්වහන්සේ අභිමුවෙහි ඔබ ශුද්ධ, නොකළැල් නිදොස් අය ලෙස ඉදිරිපත් කිරීමට :22

# දොළොස්වන පරිච්ඡේදය

## 1 හා 2 තෙසලෝනික

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- 1 හා 2 තෙසලෝනික පොත්වල කර්තෘ නම් කිරීමට
- මෙම පොත් ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- 1 හා 2 තෙසලෝනික පොත්වල පරමාර්ථයන් සඳහන් කිරීමට
- 1 හා 2 තෙසලෝනික පොත්වල ප්‍රධාන පද මතකයෙන් ලිවීමට
- මෙම පොත්වල ජීවිතයේ හා සේවයේ මූලධර්ම සඳහන් කිරීමට හැකිවනු ඇත.

### 1 තෙසලෝනික

### හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** තෙසලෝනිකයේ ඇදහිලිවතුන් වෙත

**පරමාර්ථය :** ස්වාමින්වහන්සේ ආපසු පැමිණෙන බව සහතික කිරීමට, ඇදහිල්ල සඳහා ප්‍රශංසා කිරීමට හා අවවාද කිරීමට හා වැරදි ධර්මය නිවැරදි කිරීමට, එමෙන්ම පාවුලුතුමා සිය සේවය පිළිබඳ බොරු චෝදනාවලටද පිළිතුරු දෙයි.

**ප්‍රධාන පද :** 4:16-18

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** සැනසිල්ලේ අවධානය යොමු කළ යුත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආපසු පැමිණීමේ මහිමාන්විත බලාපොරොත්තුව දෙස වේ.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, සිල්වානස්, තිමෝතියස්

# සැකිල්ල

I. හැඳින්වීම : 1:1

A. පාවුලු, සිල්වානස් හා තිමෝතියස්ගෙනි
B. තෙසලෝනිකයේ ඇදහිලිවතුන් වෙත
C. දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් කරුණාව හා සමාදානය වේවා! : 1:1

II. ආපසු බැලීම : 1:2-3:13

A. ක්‍රිස්තුස්වහන්සේ වෙතට අනර්ඝ ලෙස හැරීම : 1:2-10
1. ශුභාරංචියේ බලය : 1:2-5
2. ශුභාරංචියේ නිදර්ශන : 1:5-6
a. තෙසලෝනිකයේ ඇදහිලිවත්හු පාවුලුතුමාගේ ආදර්ශය අනුගමනය කළහ : 1:5
b. ඔව්හු අනෙකුත් ඇදහිලිවතුන්ට ආදර්ශයක් වූහ : 1:7
3. ශුභාරංචියේ සාක්ෂිකරුවෝ : 1:8-10
a. තෙසලෝනික ඇදහිලිවතුන්ගේ ඇදහිල්ල සෑම තැනකටම පැතිරිණි : 1:8
b. ඔවුන්ගේ සාක්ෂිය ශුභාරංචියේ සත්‍යයට සාක්ෂියක් විය : 1:9-10

B. අනර්ඝ ධර්මප්‍රචාරය : 2:1-20
1. චේතනාවෙන් : 2:1-6
a. නිෂ්ඵල නොවේ : 2:1
b. නිර්භයව වේ : 2:2
c. මුළාවෙන් හෝ අපවිත්‍රකමෙන් හෝ වංචාවෙන් හෝ නොවේ : 2:3
d. මිනිසුන් නොව දෙවියන්වහන්සේ සතුටු කිරීමට වේ : 2:4
e. ඉච්ඡා වචන ව්‍යවහාරයක් නොමැතිවය : 2:5
f. තණ්හාවක් නොමැතිවය : 2:5
g. මනුෂ්‍ය ප්‍රශංසාව සෙවීම නොවේ : 2:6
2. හැසිරීමෙන් : 2:7-11
a. මෘදු ලෙසය : 2:7
b. කිරිමවක් ළදරුවන්ට සලකන්නාක් මෙනි : 2:7
c. ප්‍රේමාන්විතවය : 2:8
d. වීර්යයෙන් හා වෙහෙස මහන්සියෙනි : 2:9
e. නිවැරදි හැසිරීමක් ඇතිවය : 2:10
f. පියෙකු දරුවන්ට සලකන පරිදිය : 2:11
3. පණිවුඩයෙන් : 2:12-13
a. දෙවියන්වහන්සේට ඔබින පරිදි ජීවත් වන ලෙස : 2:12
b. එය දෙවියන්වහන්සේගේ වචනය මත පදනම් වී තිබිණි : 2:13
4. පිළිගැනීමෙන් : 2:13-16
a. දේව වචනය ඔවුන් පිළිගත් ආකාරය : 2:13
b. ඔවුන් දේව වචනය පිළිගැනීමේ ප්‍රතිඵල : 2:14-16
(1) ඔව්හු යුදයේ සභාවන් අනුකරණය කරන්නන් වූහ : 2:14

(2) දේව වචනය වෙනුවෙන් පීඩා විඳීමේ සහභාගිකත්වයට ඔව්හු ඇතුළු වූහ : 2:14-16

C. දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නන් වෙනුවෙන් අනර්ඝ ලෙස සැලකිලිමත් වීම : 3:1-13

1. ඔවුන්ගේ සැලකිල්ල : 3:1-5
   a. ඔවුන්ගේ චේතනාව : 3:1
   b. තිමෝතියස් යැවීම : 3:2
   c. යැවූ තැනැත්තා පිළිබඳ විස්තරය : 3:2
      (1) අපගේ සහෝදරයා
      (2) සේවකයා
      (3) ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ හවුල්කරු
   d. තිමෝතියස් යැවීමේ පරමාර්ථය : 3:2-4
      (1) ඔබ ස්ථිරව සිටීමට : 3:2
      (2) ඔබ සැනසීමට : 3:2
      (3) පීඩාවන් තිබියදීත් දිරිගැන්වීමට : 3:3-4
      (4) පරීක්ෂාකාරයාගෙන් ආරක්ෂා කිරීමට : 3:5
      (5) ඔවුන්ගේ වෙහෙස රැකගැනීමට : 3:5
2. පසු කටයුතු ක්‍රියාවලිය : 3:6-8
   a. තිමෝතියස්ගේ වාර්තාවේ අන්තර්ගතය : 3:6
   b. තිමෝතියස්ගේ වාර්තාවට දැක්වූ ප්‍රතිචාර : 3:7-10
      (1) සැනසිල්ල හා දිරිගැන්වීම : 3:7-8
      (2) ස්තුතිදීම හා යාච්ඤා කිරීම : 3:9-13

III. ඉදිරිය බැලීම: ස්වාමින්වහන්සේගේ ආපසු පැමිණීම ඇසුරෙන් තිබිය යුතු හැසිරීම : 4:1-5:24

A. දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීමේ හැසිරීම : 4:1-2

B. පාරිශුද්ධිකරණය : 4:3-8

1. පාරිශුද්ධිකරණයේ පදනම, එය දෙවියන්වහන්සේගේ කැමැත්ත වේ : 4:3
2. පාරිශුද්ධිකරණය ව්‍යවහාර කිරීම : 4:3-8
   a. කාමයේ වරදවා හැසිරීමෙන් වැළකී සිටීම : 4:3-5
   b. සහෝදරයෙකු රැවටීමෙන් වැළකී සිටීම : 4:6

C. නිවැරදි හැසිරීම සඳහා හේතු : 4:6-8

1. පාපය දෙවියන්වහන්සේගේ විපාක ගෙනදෙයි : 4:6
2. නිවැරදි හැසිරීම දෙවියන්වහන්සේගේ කැඳවීමට අනුකූලය : 4:7
3. නිවැරදි හැසිරීම ප්‍රතික්ෂේප කිරීම, දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීමකි : 4:8

D. සහෝදර ප්‍රේමය : 4:9-10

1. ඔවුන්ගේ ප්‍රේමයට ප්‍රශංසා කිරීම : 4:9
2. තවදුරටත් ප්‍රේම කරන ලෙසට අවවාද කිරීම : 4:10

E. වෙහෙස වී වැඩකරන ලෙසට අවවාද කිරීම : 4:11-12

1. නිශ්ශබ්දව සිටීමට ඉගෙනගන්න : 4:11
2. තම තමාගේ කාරණ බලාගන්න : 4:11
3. ඔබගේම අත්වලින් වැඩකරන්න : 4:11
4. නොඇදහිලිවතුන් වෙත අවංකව වැඩකරන්න : 4:12

F. ක්‍රිස්තුස්වහන්සේ තුළ මියගිය අය වෙනුවෙන් සැලකිලිමත් වීමට උපදෙස් : 4:12-18

1. නිවැරදි උපදෙස්වල අවශ්‍යතාව : 4:12-13

2. නැවත පැමිණෙන ක්‍රිස්තුස්වහන්සේ හා මියගියවුන් අතර සබඳතාව : 4:14-15
    a. ක්‍රිස්තුස්වහන්සේ තුළ මියගිය අය උන්වහන්සේ සමග ගෙන එනු ඇත : 4:14
    b. ජීවත්ව සිටින අය මියගිය අයට වඩා ඉස්සර වන්නේ නැත : 4:15
3. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේ ආකාරය හා ප්‍රතිඵල : 4:16-17
    a. උන්වහන්සේ පැමිණෙන ආකාරය : 4:16
    b. උන්වහන්සේගේ පැමිණීමේ ප්‍රතිඵල : 4:16-17
        (1) මියගිය අය පළමුව නැගිටවනු ලැබේ : 4:16
        (2) ජීවත්වන අය ඔවුන් හමුවෙති : 4:17
        (3) ඇදහිලිවතුන් සදහටම ස්වාමින්වහන්සේ සමග වේ : 4:17
4. ඇදහිලිවතුන් මෙම වචන සැනසීම පිණිස යොදාගත යුතුය : 4:18

G. ස්වාමින්වහන්සේගේ පැමිණීම වෙනුවෙන් සූදානම්ව සිටීම : 5:1-11
1. උන්වහන්සේගේ පැමිණීමේ වේලාවේ අස්ථිරතාවය : 5:1-2
    a. උපදෙස් දීම අවශ්‍ය නැත : 5:1
    b. උන්වහන්සේ පැමිණෙන ආකාරය පිළිබඳ ඔවුන්ගේ දැනුම : 5:2
2. සූදානම් නොමැති අයට මෙම අස්ථිරතාවේ ප්‍රතිඵල : 5:3
3. ඇදහිලිවතුන් කෙරෙහි අස්ථිරතාවේ බලපෑම : 5:4-11
    a. සූදානම්ව සිටින්න : 5:4
    b. ආලෝකයේ හැසිරෙන්න : 5:5
    c. ආත්මිකව නොනිදන්න : 5:6
    d. අවදිව සිටින්න : 5:6
    e. සිහිකල්පනාව ඇතිව සිටින්න : 5:6-8
    f. ඇදහිල්ලත් ප්‍රේමයත් නමැති ළයවැස්ම පැළඳගන්න : 5:8
4. ඇදහිලිවතුන්ගේ සහතිකය : 5:9-11
    a. උදහස පිණිස නොව ගැළවීම පිණිස පත්කර ඇත : 5:9-10
    b. මෙම බලාපොරොත්තුව නිසා සැනසිල්ල හා ගොඩනැංවීම : 5:11

H. සභා සබඳතා : 5:12-15
1. ඔබ අතර වෙහෙස මහන්සිවන හා ඔබට ඉහළින් සිටින අය හඳුනාගන්න : 5:12
2. ඔබ වෙනුවෙන් ඔවුන් වෙහෙස මහන්සිවන නිසා ඔවුන්ට උසස්ම ගෞරවාදරය පිරිනමන්න : 5:13
3. අනියම් ලෙස හැසිරෙන්නන්ට අනතුරු අඟවන්න : 5:14
4. දුබලයන්ට සහායවන්න : 5:14
5. දුබල සිත් ඇත්තන් සනසන්න : 5:14
6. සියල්ලන් ගැන ඉවසිලිවන්තවන්න : 5:14
7. නපුරට නපුර නොකරන්න : 5:15
8. යහපත් දේ අනුගමනය කරන්න : 5:15

I. පෞද්ගලික හැසිරීම : 5:16-22
1. නිතරම ප්‍රීතිවන්න : 5:16
2. නොකඩව යාච්ඤා කරන්න : 5:17
3. සියල්ලෙහිදී ස්තුති දෙන්න : 5:18
4. ආත්මයාණන්වහන්සේ නොනිවන්න : 5:19
5. දිවැස්වැකි සුළු කොට නොතකන්න : 5:20
6. සියල්ල විමසා බලන්න : 5:21
7. යහපත් දේ තදින් අල්ලාගන්න : 5:21
8. සියලු ආකාර නපුරෙන් වළකින්න : 5:22

IV. සමාප්තිය : 5:23-28

A. ඔවුන් වෙත ආශිර්වාදයක් : 5:23-24
B. යාච්ඤා කිරීමට ඉල්ලීමකි : 5:25
C. ශුභපැතුම් : 5:26
D. අණ කිරීම : 5:27
E. ස්වාමින්වහන්සේගේ කරුණාව පැතිම : 5:28

## 2 තෙසලෝනික

## හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද:** තෙසලෝනිකයෙහි සභාව වෙත

**පරමාර්ථය :** ස්වාමින්වහන්සේ ආපසු පැමිණෙන තුරු බලා සිටින ඇදහිලිවතුන්ට උපදෙස් දීම

**ප්‍රධාන පදය :** 2:3

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** ස්වාමින්වහන්සේගේ දවසට පෙර මහා වැටියාමක් සිදුවන බැවින්, නිවැරදි ධර්මය ඉගැන්වීම හා ඒ අනුව ජීවත් වීම වැදගත්ය.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, සිල්වානස් හා තිමෝතියස්

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-2

A. පාවුලුද, සිල්වානස්ද, තිමෝතියස් ද ගෙනි : 1:1
B. තෙසලෝනිකවරුන්ගේ සභාවටය : 1:1
C. දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් කරුණාව හා සමාදානය වේවා : 1:2

II. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේ බලාපොරොත්තුවෙන් සැනසිල්ල : 1:3-12

A. ඔවුන්ගේ කිතුනු ආදර්ශය ගැන තුති පිදීම : 1:3-4
   1. තුති පිදීමට හේතුව : 1:3
      a. ඔවුන්ගේ ඇදහිල්ල පුදුමාකාර ලෙස වර්ධනය වීම : 1:3
      b. අන්‍යෝන්‍ය ප්‍රේමය තිබීම : 1:3
   2. ඔවුන්ගේ හැසිරීම මගින් ලේඛකයන් කෙරෙහි ඇති කෙරෙන බලපෑම : 1:4
B. දෙවියන්වහන්සේගේ දැහැමි විනිශ්චය තුළ සැනසිල්ල : 1:5-10
   1. දෙවියන්වහන්සේගේ දැහැමි විනිශ්චය ගැන ඇගවීම : 1:5
   2. දෙවියන්වහන්සේගේ දැහැමි විනිශ්චයේ එළිදරව්ව : 1:6-8
      a. උන්වහන්සේගේ විනිශ්චයේ ප්‍රතිඵල : 1:6-7

(1). දුක් දෙන්නන්ට දෙවියන්වහන්සේ පීඩාවන් එවන සේක : 1:6
(2). සමිඳාණන්වහන්සේ පැමිණි විට දුක්විඳින්නන්ට සහනය ලැබෙනු ඇත : 1:7

b. විනිශ්චයේ වේලාව: ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ දේව දූතයන් සමග ස්වර්ගයෙන් ප්‍රකාශවන කල්හිය : 1:7
c. විනිශ්චයට භාජනය වන්නෝ : 1:8
(1) දෙවියන්වහන්සේ අඳුනන්නේ නැති අය
(2) ස්වාමිවූ යේසුස්වහන්සේගේ ශුභාරංචියට කීකරු නොවන අය

3. දෙවියන්වහන්සේගේ දැහැමි විනිශ්චයේ පල-විපාක : 1:9-10
a. දෙවියන්වහන්සේ අඳුනන්නේ නැති අයට සදාතන දඬුවම : 1:9
b. ශුද්ධවන්තයන් මහිමයට පත්කිරීම : 1:10

C. ඇදහිලිවතුන්ට යාච්ඤාව : 1:11-12
1. යාච්ඤාවේ අන්තර්ගතය : 1:11
a. මෙම කැඳවීමට සුදුස්සන් ලෙස දෙවියන්වහන්සේ ඔබ ගණන් ගනී : 1:11
b. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ යහපත්කමේ සියලු ප්‍රීතිය සම්පූර්ණ කරනු ඇත : 1:11
c. දෙවියන්වහන්සේ ඇදහිල්ලේ ක්‍රියාවන් මහත් බලයකින් සම්පූර්ණ කරනු ඇත : 1:11

2. යාච්ඤාවේ පරමාර්ථය : යේසුස්වහන්සේගේ නාමය ඔබ අතර ගෞරවයට පැමිණීම හා ඔබ උන්වහන්සේගේ ගෞරවය ලබන පිණිස වේ : 1:12

III. ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනයේ කාලය පිළිබඳව අවධානය : 2:1-17

A. පාවුලුතුමාගේ සැලකිල්ල : 2:1-2
1. ඔහු සැලකිලිමත් වන්නේ ස්වාමින්වහන්සේගේ ආගමනයේ දවස ගැනය : 2:1
2. තහනම් කළ ආකල්ප : 2:2
a. සිත චංචල වීම
b. ආත්මයෙන් වචනයෙන් හෝ හසුනින් කැළඹීම
c. එය දැනටමත් සිදුවී ඇති බව විශ්වාස කිරීම

B. අවසානයේ සලකුණු : 2:3-12
1. මහා වැටියාම : 2:3
2. පාපයේ මනුෂ්‍යයා (අන්ත ක්‍රිස්තු ) එළිදරව් වේ : 2:3-6
a. දෙවියන්වහන්සේ ලෙස හැඳින්වෙන සියල්ලට ඔහු විරුද්ධවන අතර ඒ හැමට වඩා තමා උසස් කර ගනී : 2:4
b. ඔහු දේවමාලිගාවේ වැඩහිඳී : 2:4
c. ඔහු තමා දෙවියන්වහන්සේ යයි ප්‍රකාශ කරයි : 2:4
d. ඔහු නියම කාලයේදී එළිදරව් වේ : 2:5-6

3. ඔහු දැනටමත් ලෝකයේ රහසිගතව ක්‍රියා කරයි. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඉවත් කෙරෙන තුරු ඔහු එළිදරව් නොවේ : 2:7-8
4. ඔහුගේ ඉරණම : 2:8
a. ස්වාමින්වහන්සේ ස්වකීය මුඛයේ හුස්මෙන් ඔහු නගනු ඇත : 2:8
b. ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ නැවත පැමිණීමේ තේජසින් ඔහු විනාශ කරනු ඇත : 2:8

5. අන්ත ක්‍රිස්තු හැඳිනගැනීමේ ලකුණු : 2:9-12
a. ඔහු සාතන්ගේ ක්‍රියා සමග පැමිණෙනු ඇත : 2:9
b. ඔහුට බලය, ලකුණු හා බොරු පුදුම ක්‍රියා ඇත : 2:9

c. විනාශයට නියම වූ අය, ගැළවීම අත්කර දෙන සත්‍යය, ප්‍රේමයෙන් නොපිළිගත් බැවින් අධර්මිෂ්ඨකමින් රවටනු ලබති : 2:10

d. ඔහු ප්‍රබල මුළාවන් ඇති කරයි : 2:11

e. ඔහු විසින්,

(1) සත්‍යය විශ්වාස නොකරන අයට

(2) අධර්මිෂ්ඨකම ප්‍රිය කරන අයට විනාශය ගෙන එනු ලබයි : 2:12

C. තෙසලෝනිකයේ ඇදහිලිවතුන්ට යාච්ඤාවක් : 2:13-17

1. දෙවියන්වහන්සේ ඔවුන් තෝරාගත් නිසා ස්තුති කිරීම : 2:13-14

a. ආත්මයාණන් විසින් පිරිසිදු කරනු ලැබීමත්, සත්‍යය විශ්වාස කිරීමත් නිසා උන්වහන්සේ ඔවුන් ගැළවෙන පිණිස තෝරාගත් සේක : 2:13

b. යේසුස්වහන්සේගේ මහිමය ලබාගන්නා පිණිස උන්වහන්සේගේ ශුභාරංචිය මගින් ඔවුන් කැඳවූ සේක : 2:14

2. ස්ථිරව සිටීමට අවවාද කිරීම : ඔබට ඉගැන්වූ දෙය තදින් අල්ලාගන්න : 2:15

3. ඔවුන්ගේ සැනසිල්ල හා ස්ථාවරත්වය වෙනුවෙන් යාච්ඤාවක් : 2:16-17

a. යාච්ඤාව යොමු කර ඇත්තේ කවුරුන් වෙතද : 2:16

b. යාච්ඤාවේ අන්තර්ගතය : 2:17

(1) ඔබ සැනසීමට

(2) සියලු යහපත් ක්‍රියාවලද වචනයේද ඔබ ස්ථාවර කිරීම

IV. ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම ඇසුරෙන් නියෝගයන් : 3:1-15

A. යාච්ඤා කිරීමට නියෝගයක් : 3:1-2

1. ශුභාරංචිය පැතිරවීමට නිදහස වෙනුවෙන් : 3:1

2. පණිවුඩකරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් : 3:2

a. අසාධාරණ මිනිසුන්ගෙන් ආරක්ෂාව

b. නපුරු මිනිසුන්ගෙන් ආරක්ෂාව

c. ඇදහිල්ල නොමැති සියල්ලන්ගෙන් ආරක්ෂාව

B. ආත්මිකව වර්ධනයවීමට නියෝගයක් : 3:3-5

1. ස්වාමින්වහන්සේ තුළ ශක්තිමත් වන්න : 3:3

2. ස්වාමින්වහන්සේ තුළ නපුරාගෙන් ඉවත්ව සිටින්න : 3:3

3. අණ කළ දේ කරන්න : 3:4

4. ඔබගේ සිත් දෙවියන්වහන්සේගේ ප්‍රේමයට යොමු කරන්න : 3:5

5. ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙන තුරු ඉවසීමෙන් බලා සිටින්න : 3:5

C. හැසිරීම හා සබඳතා පිළිබඳ නියෝග : 3:6-12

1. දේව වචනය අනුව නොව අක්‍රමවත්ව හැසිරෙන අයගෙන් ඉවත්වන්න : 3:6

2. ආත්මික නායකත්වය පිළිබඳ නිවැරදි ආදර්ශ අනුගමනය කරන්න : 3:7-10

3. සෑම ඇදහිලිවන්තයෙක්ම පලදායි විය යුතුය : 3:10-12

4. යහපත කිරීමට මැළි නොවන්න : 3:13

5. දේව වචනයට කීකරු නොවන අය සමග සහභාගිකම් නොපවත්වන්න : 3:14

6. අක්‍රමවත්ව වැඩ කරන අය සතුරන් මෙන් නොලසකන්න. ඔවුන්ට සහෝදරයන්ට මෙන් දැනමුතුකම් දෙන්න : 3:15

V. සමාප්තිය : 3:16-18

A. යැදීම් : 3:16
    1. ස්වාමින්වහන්සේ ඔබට සමාදානය දෙන සේක්වා!
    2. ස්වාමින්වහන්සේ ඔබ සියල්ලන් සමග වන සේක්වා!
B. සහතික කිරීම : පාවුලුතුමාගේ අතින් අත්සන් තැබීම : 3:17
C. ආශිර්වාදය : 3:18

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 තෙසලෝනික පොත්වල කතුවරයා කවුරුන්ද?

2. 1 තෙසලෝනික පොත සඳහා පරමාර්ථය ලියන්න.

3. 1 තෙසලෝනික පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. 1 තෙසලෝනික පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. 1 තෙසලෝනිකයෙහි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

6. 2 තෙසලෝනික පොත සඳහා පරමාර්ථය ලියන්න.

7. 2 තෙසලෝනික පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

8. 2 තෙසෙලෝනික පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

9. 2 තෙසලෝනිකයෙහි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. නව ගිවිසුමේ, අන්ත ක්‍රිස්තුස්ගේ පැමිණීම පිළිබඳව දිගු කොටස් දෙකෙන් එකක් තෙසලෝනික හසුනේ අන්තර්ගත වේ (2 තෙසලෝනික 2:1-12 හා එළිදරව් 13:1-8 බලන්න)

2. තෙසලෝනිකයේ සභාව ආරම්භ කළේ, සිය දෙවන ධර්මදූත ගමනේදී පාවුලුතුමා විසින් වේ. (ක්‍රියා 17:1-10 බලන්න)

3. සභාවේ ඔසවාගැනීම ගැන 1 තෙසලෝනික තරම් අවධානයක් බයිබලයේ වෙනත් කිසිදු පොතක් නොදක්වයි. එහි පරිච්ඡේද පහේ සෑම එකක්ම මෙම සිද්ධිය ගැන සඳහන් කරයි (1:10, 2:19, 3:13, 4:13-18, 5:1-11,23 බලන්න). ස්වාමින්වහන්සේගේ පැමිණීම පිළිබඳව ඔබ උගත් දේ ගැන සාරාංශ සටහනක් ලියන්න.

4. ක්‍රිස්තුස්වහන්සේගේ අවසාන පැමිණීමට පෙර සිදුවිය යුතු දේ සඳහන් කරන්න.
   - ඇදහිලිවතුන්ගේ වැටී යාම - 2 තෙසලෝනික 2:3
   - පාපයේ මිනිසා (අන්ත ක්‍රිස්තුස්) එළිදරව් වේ - 2 තෙසලෝනික 2:3
   - ශුද්ධාත්මයාණන්වහන්සේ ලෝකයෙන් ඉවත් කෙරේ - 2 තෙසලෝනික 2:7
   - ප්‍රබල මුළාවීමක් (රැවටිල්ලක්) - 2 තෙසලෝනික 2:11

5. 1 තෙසලෝනික 4 හා 5 පරිච්ඡේදවල "නින්දගිය අය" හා "නොමැරී ඉතිරිව සිටින අය" පිළිබඳව සත්‍යයන් බොහොමයක් සඳහන් වේ. මේ සෑම එකක් පිළිබඳවම ඔබගේ නිරීක්ෂණ සඳහන් කරන්න.

6. 2 තෙසලෝනිකයෙහි පාවුලුතුමා නිවැරදි කළ යුතු ගැටලු කිහිපයක් සඳහන් කර ඇත. මේවායේ ලයිස්තුවක් සාදා එහි සඳහන් සෑම ගැටලුවකටම අදාළ උපදෙස් හෝ නියෝග හෝ සඳහන් කරන්න.

7. 2 තෙසලෝනිකයෙහි පාවුලුතුමා තෙසලෝනිකවරුන්ට ප්‍රශංසා කරමින් ඔවුන් කරන යහපත් දේ දිරිගන්වයි. මෙම අවවාද ලයිස්තු ගත කරන්න.

8. 2 තෙසලෝනිකයට අනුව ශුභාරංචියට කීකරු නොවන්නන්ට කුමක් සිදුවේද?

9. 1 තෙසලෝනික පොතේ ප්‍රධාන වචන : ශුභාරංචිය, ඇදහිල්ල, ප්‍රේමය, බලාපොරොත්තුව, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, දෙවියන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ, පීඩාවන් (දුක්විඳීම් ආදිය), ස්වාමින්වහන්සේගේ දවස

10. 2 තෙසලෝනික පොතේ ප්‍රධාන වචන : පීඩාවන්, දුක්විඳීම්, ස්වාමින්වහන්සේගේ ඊම, දෙවියන්වහන්සේ, ආත්මයාණන්, මහිමය, නොපනත්කම් කරන්නා, අනියම් ලෙස හැසිරෙන මිනිසා, ස්වාමින්වහන්සේගේ දවස, සැබෑව.

# දහතුන්වන පරිච්ඡේදය

# 1 හා 2 තිමෝති

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- 1 හා 2 තිමෝති පොත්වල කර්තෘ නම් කිරීමට
- මෙම පොත් ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- 1 හා 2 තිමෝති සඳහා පරමාර්ථයන් සඳහන් කිරීමට
- 1 හා 2 තිමෝති පොත්වල ප්‍රධාන පදයයන් මතකයෙන් ලිවීමට
- මෙම පොත්වල ජීවිතයේ හා සේවයේ මුලධර්ම සඳහන් කිරීමට හැකිවනු ඇත.

## 1 තිමෝති

## හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** තිමෝතියස්

**පරමාර්ථය :** පාවුලුතුමා මෙය ලියන ලද්දේ තිමෝතියස් නමැති සහකාර සේවකයා වෙතය. ඔහු එපීස සභාවේ තාවකාලික පාලකවරයෙකු ලෙස සේවය කළේය. මෙම පොතේ දැක්වෙන්නේ එහි පැවති අවධානය යොමු කළ යුතු ඇතැම් ගැටලු සහ අවශ්‍යතාවයන් සමහරක්ය.

**ප්‍රධාන පදය :** 4:12

**ජීවිතයේ හා සේවයේ මුලධර්මය :** අප කැඳවා ඇති සේවය වෙනුවෙන් අප ආදර්ශවත්, ජීවිතයක් ගතකළ යුතුය.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, තිමෝතියස්, හිමේනියස්, අලෙක්ෂන්දර්

## සැකිල්ල

1. හැඳින්වීම : 1:1-3

   A. දෙවියන්වහන්සේගේද ක්‍රිස්තුස්වහන්සේගේද අණ පරිදි යේසුස්වහන්සේගේ ප්‍රේරිතයෙකු වන පාවුලුතුමා විසිනි : 1:1
   B. ඇදහිල්ලෙහි සැබෑ දරුවකු වන තිමෝතියස් වෙතය : 1:2
   C. දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් කරුණාව, දයාව හා සාමය : 1:2
   D. එපීසයේ සිටින ලෙසට පෞද්ගලික උපදෙස් : 1:3

**පළමුවන කොටස: තිමෝතියස්ට නියෝගයක්**
**නිවැරදි ධර්මය රැකගන්න.**
**1:3-20**

I. ශුභාරංචියේ පවිත්‍රතාව රැකගන්න : 1:3-11

A. නියෝගය : 1:3-4
1. වෙනත් කිසිදු ධර්මයක් නුගන්වන්න : 1:3
2. මිථ්‍යා කතාවලට සවන් නොදෙන්න : 1:4
3. පෙළපත් කතාවලටද සවන් නොදෙන්න : 1:4

B. නියෝගයේ අරමුණ: ප්‍රේමය : 1:5
1. පිරිසිදු සිතකින්
2. යහපත් හෘදය සාක්ෂියකින්
3. අවංක ඇදහිල්ලෙන්

C. නියෝගයට හේතුව : 1:6-11
1. සමහරු මේවායින් අහක්වී නිරර්ථක විවාදවලට වැටී ඇත්තාහ : 1:6
2. ඔවුන් ගුරුවරුන් වීමට කැමති නුමුත් උගන්වන දේ ගැන අවබෝධයක් නැත : 1:6
3. ඔව්හු ව්‍යවස්ථාව අනිසි ලෙස භාවිත කරති : 1:8-11
   a. ව්‍යවස්ථාව නියම ලෙස භාවිත කරන්නේ නම් එය යහපත්ය : 1:8
   b. ව්‍යවස්ථාව ධර්මිෂ්ඨයන් වෙනුවෙන් පනවා නැත : 1:9
   c. ව්‍යවස්ථාව පනවා ඇත්තේ නීතිය නොසලකන අයටය : 1:9-10
      (1) අකීකරු අයට : 1:9
      (2) අභක්තිකයන් : 1:9
      (3) පව්කරුවන් : 1:9
      (4) අපිරිසිදුවූවන් : 1:9
      (5) ශුද්ධ දේ කෙලෙසන්නන් : 1:9
      (6) මිනීමරුවන් : 1:9
      (7) වේශ්‍යාකම්කරන්නන් : 1:10
      (8) පුරුෂයන් සමග අනාචාරයේ හැසිරෙන්නන් : 1:10
      (9) මිනිසුන් පැහැරගෙන යන්නන් : 1:10
      (10) බොරුකාරයන් : 1:10
      (11) බොරුවට දිවුරන්නන් : 1:10
      (12) සත්‍යවූ ධර්මයට විරුද්ධවූ සියලුම දේ : 1:10
4. ව්‍යවස්ථාව ශුභාරංචිය සමග සුසංගත විය යුතුය : 1:11

II. ශුභාරංචිය සමග පාවුලුතුමාගේ ඇති සබඳතාව : 1:12-17

A. දෙවියන්වහන්සේගේ සේවයට ඔහුගේ කැඳවීම ගැන ස්තුති කිරීම : 1:12
1. ඔහුගේ කැඳවීම යේසුස්වහන්සේගෙන් : 1:12
2. ඔහු ශක්තිමත් කළේ යේසුස්වහන්සේය : 1:12
3. ඔහු විශ්වාස ලෙස සැලකිණි : 1:12
4. ඔහු සේවයට පත් කරන ලදී : 1:12

B. කැඳවනු ලැබූ තැනැත්තා පිළිබඳ විස්තරය : 1:13
1. ඔහු උන්වහන්සේගේට අපහාස කළ කෙනෙකි : 1:13
2. ඔහු පීඩාකරන්නෙකුව සිටියේය : 1:13

3. ඔහු නින්දාකරන්නෙකුව සිටියේය : 1:13

4. එහෙත් නොදන්නාකමින් හා ඇදහිලි නැතිකමින් එසේ කළ නිසා ඔහු දයාව ලැබුවේය : 1:13

C. ඔහුගේ පත්වීම පිළිබඳ පැහැදිලි කිරීම : 1:13-26

1. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා : 1:13-14

2. ඔහු අන් අයට ආදර්ශයක් කිරීමට : 1:15-16

D. ශුභාරංචිය සමග ඔහුගේ ඇති සබඳතාවන් ගැන පාවුලුතුමාගේ ප්‍රශංසාව : 1:17

III. තිමෝතියස්ට දුන් නියෝගයේ පුනරීක්ෂණය : 1:18-20

A. නියෝගය භාරදීම : 1:18

B. තිමෝතියස්ගේ කාර්යය : 1:18-19

1. යහපත් යුද්ධයක් කරන්න : 1:19

2. ඇදහිල්ලෙහි සිටින්න : 1:19

3. නිදොස් හෘදයසාක්ෂියක් ඇතිව සිටින්න : 1:19-20

a. ඇදහිල්ල හා නිදොස් හෘදයසාක්ෂිය නැතිකර ගත් ඇතැම් අය පිළිබඳ අනතුරු ඇඟවීම : 1:19

b. හිමේනියස් හා අලෙක්ෂන්දර් සාතන්ට පාවා දී ඇත : 1:20

## දෙවන කොටස
## සභාවේ සංවිධානය හා කළමනාකරණය
## 2:1-3:13

I. යාච්ඤාව : 2:1-8

A. යාච්ඤාවේ යුතුකම : 2:1

B. යාච්ඤාවේ ස්වභාවය : 2:1

1. යැදීම

2. යාච්ඤාවන්

3. මැදිහත්වීම්

4. ස්තුතිදීම්

C. යාච්ඤාවේ විෂය පථය : 2:1-2

1. සියලු මනුෂ්‍යයන් සඳහා : 2:1

2. රජවරුන් සඳහා : 2:2

3. උසස් තනතුරු දරන සියල්ලන් සඳහා : 2:2

D. යාච්ඤාවේ ප්‍රතිඵල : 2:2-3

1. භක්තියෙන් හා ගෞරවයෙන් යුක්ත සාමකාමී තැන්පත් ජීවිතයක් ගත කිරීමට හැකි වීම : 2:2

2. දෙවියන්වහන්සේ ඉදිරියෙහි අනුමත වීම : 2:3

E. යාච්ඤාවේ මැදහත්කරු : 2:5-7

1. ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ : 2:5-6

2. මෙම මැදහත්කරු නිසා පාවුලුතුමා දේශනාකරුවෙකු, ප්‍රේරිතවරයෙකු හා ගුරුවරයෙකු ලෙස පත් කෙරිනි : 2:7

F. යාච්ඤාවේ විශ්වීයතාව : 2:8

1. සෑම තැන්වලම සියලුම පුරුෂයන් යාච්ඤා කළ යුතුය : 2:8

2. ඔවුන් අත් ඔසවා යාච්ඤා කළ යුතුය : 2:8

3. කෝපයෙන් හා අවිශ්වාසයෙන් තොරව යාච්ඤා කළ යුතුය : 2:8

II. සභාවේ සිටින ස්ත්‍රීන් : 2:9-15

A. ඔවුන්ගේ පෙනුම : 2:9-10
   1. විනීත වස්ත්‍ර : 2:9
   2. පෙනුමට වඩා යහපත් වැඩ හා ආකල්ප ගැන අවධානය : 2:9-10
B. ඔවුන්ගේ නමස්කාරය : 2:11-12
   1. නිහතමානී ආකල්පයකින් ඉගෙනීම : 2:11
   2. තමාගේම ආධිපත්‍යයෙන් නූගන්වන්න. (අප සියලූ දෙනම ඉගැන්විය යුත්තේ දෙවියන්වහන්සේගේ ආධිපත්‍යයෙන් මිස අපගේම ආධිපත්‍යයෙන් නොවේ) : 2:12
C. ඔවුන්ගේ ගැළවීම : පළමුව රචටනු ලැබුවේ ස්ත්‍රිය වුවද මෙසියස්වහන්සේ පැමිණියේ ස්ත්‍රියකගෙනි (දරුවන් ලැබීම තුළිනි) : 2:13-15

III. සභා නායකයන්ට තිබිය යුතු සුදුසුකම් : 3:1-7

A. දෝෂාරෝපණ නොතිබීම : 3:2
B. එක් භාර්යාවක් ඇති : 3:2
C. තැන්පත් : 3:2
D. සන්සුන් : 3:2
E. ආචාර සම්පන්න : 3:2
F. ආගන්තුක සත්කාරයට කැමති : 3:2
G. උගන්වන්නට සමර්ථ : 3:2
H. බීමත්කමින් තොර : 3:3
I. නොකිපෙන සුලු : 3:3
J. ඉවසිලිවන්ත : 3:3
K. සාමකාමී -: 3:3
L. මුදල් තණ්හාව නොමැති : 3:3
M. තෘෂ්ණාව නැති : 3:3
N. සිය පවුල මැනවින් පාලනය කරන : 3:4-5
O. නවකයෙකු (නව කිතුනුවකු) නොවන : 3:6
P. ගැළවීම නොලද අය විසින් ගරු කොට සලකනු ලබු අය : 3:7

IV. උපස්ථායකවරුන්ගේ සුදුසුකම් : 3:8-13

A. සන්සුන් (ගරුත්වයක් ඇති) : 3:8
B. දෙයාකාර කතා නැති : 3:8
C. මත්පැන්වලට ලොල් නොවූ : 3:8
D. මුදල් තණ්හාව නොමැති : 3:8
E. පිරිසිදු හෘදය සාක්ෂියක් සහිතව නිවැරදි ධර්මය පිළිපදින : 3:9
F. නවකයෙක් (නව කිතුනුවකු) නොවන : 3:10
G. සෝදිසිකර බලා, කිසි වරදක් නොමැති : 3:10
H. විවාහක නම්, භක්තිමත් බිරිඳකගේ ස්වාමිපුරුෂයා වන අය වෙති. (භාර්යාවන් උපස්ථායිකාවන් බව හැඳනගෙන තිබේ) භාර්යාවෝද : 3:11
   1. සන්සුන්
   2. ඕපාදූප නොකියන
   3. තැන්පත්

4. සියල්ලෙහි විශ්වාස කටයුතු අය වෙති.

I. එක් භාර්යාවක් ඇති පුරුෂයෙකු වේ : 3:12

J. සිය පවුල හොඳින් පාලනය කිරීමට හැකිය : 3:12

V. මෙය ලිවීමට හේතුව : සභාවෙහි නියමාකාර හැසිරීමක් තිබිය යුතු බැවිනි : 3:14-16

## තෙවන කොටස
## පාලකවරයා හා ඔහුගේ හැසිරීම
## 4:1-6:12

I. පාලකවරයා හා ව්‍යාජ ගුරුවරු : 4:1-5

A. අවසාන කාලයේදී සමහරු ඇදහිල්ලෙන් ඉවත් වෙනු ඇත : 4:1

B. ඔවුන්ගේ වරදවල් : 4:1-5
   1. මුළාකරවන ආත්මයන්ට සවන් දීම : 4:1
   2. යක්ෂයන්ගේ ධර්මයන්ට සවන්දීම : 4:1
   3. කුහකකම නිසා බොරු කියති : 4:2
   4. හෘදය සාක්ෂිය හංවඩු ගසා ඇත : 4:2
   5. විවාහය තහනම් කරති : 4:3
   6. මස් නොකන ලෙසට අණ කරති : 4:3-5

II. යහපත් පාලකවරයෙකු වීම සඳහා විවිධාකාර උපදෙස් : 4:6-16

A. සහෝදරයන්ට ස්ථිර ධර්මයෙන් උපදෙස් දෙන්න : 4:6

B. මිථ්‍යා කතා ප්‍රතික්ෂේප කරන්න : 4:6

C. ආගම භක්තිය සඳහා ව්‍යායාම කරන්න : 4:7-8

D. විශ්වාස කටයුතු කියමන් පිළිගන්න : 4:9

E. දෙවියන්වහන්සේ වෙනුවෙන් වෙහෙසවන්න. දුක්විඳින්න : 4:10

F. ස්ථිර ධර්මය උගන්වන්න අණ කරන්න : 4:11

G. ඔබේ තරුණකම සුළු කොට තැකීමට ඉඩ නොදෙන්න, ඇදහිලිවතුන්ට ආදර්ශයක් වන්න : 4:12
   1. වචනයෙන්
   2. කතාවෙන්
   3. ප්‍රේමයෙන්
   4. ආත්මයෙන්
   5. ඇදහිල්ලෙන්
   6. පවිත්‍රතාවයෙන්

H. පහත දැක්වෙන දෙයට අවධානය යොමු කරන්න : 4:13
   1. කියවීමට.
   2. අවවාද කිරීමට
   3. ධර්මයට

I. ඔබ තුළ ඇති දීමනා නොසලකා නොහරින්න : 4:14

J. මේ දේවලට සම්පූර්ණයෙන්ම සිත් යොමු කරන්න : 4:15

K. ඔබ ගැනත් ඔබේ ඉගැන්වීම ගැනත් සැලකිලිමත් වන්න : 4:16
   1. සැබෑවේ ධර්මයෙහි නොකඩවා පවතින්න.
   2. ඔබ ගැළවීම ලබන්නෙහිය
   3. ඔබට සවන් දෙන්නන්ද ඔබ ගළවා ගන්නෙහිය.

## III. පාලකවරයා හා සභාවේ විවිධ කණ්ඩායම් කෙරෙහි ඔහුගේ හැසිරීම : 5:1-6:10

A. වැඩිහිටි අය හා තරුණ අය : 5:1-2
   1. වැඩිහිටි අයට පියෙකුට මෙන් සලකන්න : 5:1
   2. තරුණ අයට සහෝදරයන්ට මෙන් සලකන්න : 5:1
   3. වැඩිහිටි ස්ත්‍රීන්ට මවට මෙන් සලකන්න : 5:2
   4. තරුණියන් සහෝදරියන් මෙන් පිරිසිදු සිතින් සලකන්න : 5:2

B. වැන්දඹුවන් : 5:3-16
   1. සැබවින්ම වැන්දඹුවන්ට ගරු කරන්න : 5:3
   2. වැන්දඹුවන්ගේ ඥාතීන්ගේ යුතුකම් : 5:4
   3. "සැබවින්ම වැන්දඹුවක්" යන්නෙහි නිර්වචනය : 5:5-6
      a. අසරණය : 5:5
      b. දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය : 5:5
      c. අයැදීම්වලද යාච්ඤාවලද නිරන්තරයෙන්ම යෙදෙයි : 5:5
      d. ලෞකික ආශාවල ජීවත් නොවෙයි : 5:6
   4. වැන්දඹුවන්ගේ ඥාතීන්ගේ වගකීම් තවදුරටත් : 5:7-8
   5. "සැබවින්ම වැන්දඹුවක්" විමට සුදුසුකම් : 5:9-13
      a. දෙවියන්වහන්සේට සිය ජීවිත කැපකරන්නේ තෝරාගත් කිප දෙනෙකි : 5:9
      b. වයස අවුරුදු හැටකට අඩු අය නොවෙති : 5:9
      c. එක් පුරුෂයෙකුගේ භාර්යාවකි : 5:9
      d. ඇගේ යහපත් ක්‍රියා ගැන හොඳින් වාර්තාකර තිබේ : 5:9-10
         (1) දරුවන් හොඳින් ඇති දැඩි කරයි.
         (2) ආගන්තුක සත්කාර කරයි.
         (3) ශුද්ධවන්තයන්ගේ පා සෝදයි.
         (4) පීඩා විඳින්නන්ට උපකාර කරයි.
         (5) සියලු යහපත් ක්‍රියා උනන්දුවෙන් අනුගමනය කරයි.
   6. සුදුසුකම් නොලැබූවෝ: තරුණ වැන්දඹුවෝ : 5:11-15
      a. ඔව්හු නැවත විවාහ වෙති : 5:11
      b. දෙවියන්වහන්සේට කැපවෙන බවට ඔවුන් දුන් පොරොන්දුව මෙමගින් උල්ලංඝනය වනු ඇත : 5:12
      c. ඔවුන් නුසුදුසු හැසිරීමෙහි නිරතවනු ඇත : 5:13
         (1) කම්මැලිකමින් සිටීම.
         (2) ගෙයින් ගෙට යෑම.
         (3) චාචාලියන් වීම.
         (4) කාර්ය බහුල අය විම.
         (5) කතා නොකළ යුතු දේ කතා කිරීම.
   7. කැපවුනු වැඩිමහල් ස්ත්‍රීන් සිටින මෙම කණ්ඩායමේ නොමැති යෞවන ස්ත්‍රීන්ට උපදෙස්, : 5:14-17
      a. විවාහවන්න : 5:14
      b. දරුවන් ලබන්න : 5:14
      c. ගේදොර රැකබලාගන්න : 5:14
      d. නින්දිත කතාවලට ඉඩ නොදෙන්න : 5:14
      e. සමහරු අභක්ති සාතන් අනුව යමින් සිටින බවට අනතුරු ඇඟවීම් : 5:16

C. වැඩිමහල්ලෝ : 5:17-25
   1. හොඳින් පාලනය කරන අයට ගරු කරන්න : 5:17
   2. මෙම තත්වයේ පූර්ණ කාලීනව යෙදෙන අයට හොඳින් සලකන්න : 5:17-18
   3. හොඳින් පාලනය නොකළ අය : 5:19-20
      a. චෝදනාවන් සඳහා සාක්ෂිකරුවන් එක්කෙනෙකුට වඩා සිටිය යුතුය. : 5:19
      b. ඔවුන්ට සියල්ලන් ඉදිරියෙහි තරවටු කළ යුතුය : 5:20
D. විවිධ දේ : 5:21-25
   1. අත් තැබීමට ඉක්මන් නොවන්න : 5:21
   2. පක්ෂපාතකමින් කිසිවක් නොකරන්න : 5:21
   3. අන් අයගේ වැරදිවලට පංගුකාරයන් නොවන්න : 5:22
   4. පිරිසිදුව සිටින්න : 5:22-23
   5. විනිශ්වය දෙවියන්වහන්සේට අයත් බව පිළිගන්න : 25:24-25
      a. ඇතැම් පව් දැන් විනිශ්වය කෙරෙන අතර සමහර ඒවා පසුව විනිශ්වය කෙරේ : 5:24
      b. ඇතැම් යහපත් ක්‍රියා පෙනෙන්නේ දැන් වන අතර ඇතැම් ඒවා පසුව වේ : 5:25
E. දාසයෝ : 6:1-8
   1. ස්වාමිවරුන්ට නිසි ගෞරවය දක්වන්න : 6:1
   2. ඇදහිලිවතුන් වන ස්වාමිවරුන්ගෙන් අයුතු ප්‍රයෝජන නොගන්න : 6:2
F. සියලුම දෙනා
   1. ඔව්හු යේසුස්වහන්සේගේ වැඩදායක ධර්මයට පටහැනිව උගන්වන්නහු නම් ඔව්හු (3)
      a. උඩගු අය වෙති : 6:4
      b. කිසිවක් නොදනිති : 6:4
      c. ප්‍රශ්න හා වචන පිළිබඳ ගැටලු හා මතභේදවලින් ඇතිවන්නේ
         1. ඊර්ෂ්‍යාව : 6:4-5
         2. කලහය : 6:4
         3. අපහාසය : 6:4
         4. කුට අවිශ්වාසය : 6:4
         5. මිථ්‍යා අදහස් ඇති, සත්‍ය නොදන්නා ආගම ලාභයට මගකැයි සිතන මිනිසුන්ගේ කෙළවරක් නැති වාද විවාද : 6:5
   2. මෙවැනි ආකාරයේ අයගෙන් ඔබ ඉවත්වන්න : 6:5
   3. ලත් පමණින් සතුටුවීම සමග භක්තිමත්කම මහත් ලාභයකි : 6:6-7
      a. අප මෙලොවට පැමිණියේ කිසිත් නොමැතිවය : 6:7
      b. අප මෙලොව හැර යන්නේද කිසිත් නොමැතිවය : 6:7
      c. අපගේ මූලික අවශ්‍යතාවන් සපුරාලීම ප්‍රමාණවත්ව : 6:8
G. ධනවත් වීම : 6:9-19
   1. ධනවතාගේ ගැටලු : 6:9
      a. ඔව්හු පරීක්ෂාවලට අසුවෙති.
      b. ඔව්හු උගුල්වලට අසුවෙති.
      c. ඔව්හු මෝඩ, වේදනාකාරී තෘෂ්ණාවල නිරත වෙති.
      d. ඔව්හු නාස්තියේත්, විනාශයේත් ගිල්වෙති.
   2. ධනවතාගේ වැරදි චේතනාවන් : 6:10
      a. මුදල් තෘෂ්ණාව
      b. ඇදහිල්ලෙන් වැටී බොහෝ වේදනාවන් ඇති කරගන්නා තෘෂ්ණාව
   3. ධනවත්කම කෙරෙහි පාලකවරයාගේ ප්‍රතිචාරය : 6:11-19

a. මේවායින් පලායන්න : 6:11
b. පහත දැක්වෙන ඒවා අනුව යන්න : 6:11
   (1) ධර්මිෂ්ඨකම
   (2) භක්තිවන්තකම
   (3) ඇදහිල්ල
   (4) ප්‍රේමය
   (5) ඉවසිලිවන්තකම
   (6) මොළොක් ගුණය
c. ඇදහිල්ල නමැති යහපත් සටනෙහි නිරතවන්න : 6:12
d. සදාතන ජීවනය අත්කරගන්න : 6:12
   (1) ඔබ එයට කැඳවනු ලැබ ඇත.
   (2) අන් අය ඉදිරියේ ඔබට යහපත් සාක්ෂියක් ඇත.
e. මෙම ආඥා පිළිපදින්න : 6:13-16
   (1) කිසිම කැලලක් නොමැතිව : 6:14
   (2) කිසිම දෝෂයක් නොමැතිව : 6:14
   (3) යේසුස්වහන්සේ නැවත ප්‍රකාශවන තෙක් : 6:14-16
f. මේ ලෝකයේ ධනවත්ව සිටින අයට මෙසේ අණ කරන්න : 6:17-19
   (1) උඩඟු නොවන ලෙස : 6:17
   (2) අස්ථිර ධනය කෙරෙහි නොව දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන ලෙස : 6:17
   (3) යහපත කරන්න : 6:17
   (4) යහපත් වැඩවලින් පොහොසත්වන්න : 6:18
   (5) සියල්ල අනුන් හා සමග ත්‍යාගශීලිව බෙදාගන්න සූදානම්ව ඉන්න : 6:18
   (6) සන්නිවේදනය කිරීමට කැමතිවන්න : 6:18
   (7) ස්ථිර අත්තිවාරමක් දමන්න : 6:19
   (8) සදාතන ජීවනය අල්ලාගන්න : 6:19

IV. සමාප්තිය : 6:20-21

A. ඔබට භාරදුන් දෙය ආරක්ෂා කරන්න : 6:20
B. අර්ථයක් නැති හිස් දෙඩවිලිවලින් වළකින්න : 6:20
C. "දැනගැන්ම" ලෙස වැරදිව හඳුන්වන වැරදි මත මගහරින්න. සමහරු ඉන් ඈදවැටී ඇත්තාහ : 6:21
D. ඔබ හැමට කරුණාව වේවා! 6:21

# 2 තිමෝති

## හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** තිමෝතියස් වෙත

**පරමාර්ථය :** පාවුලුතුමා සිරගෙයි සිට මෙය ලියන්නේ, තමා ළඟදීම මිය යන නිසා, තිමෝතියස්ට භාරදෙන සේවයේ වගකීම් භාරගන්නා ලෙද අභියෝග කිරීමටය. සිය ඇදහිල්ල නිසා තමා ඉක්මනින්ම ඝාතනය කරන බව පාවුලුතුමා දැන සිටියේය.

**ප්‍රධාන පදය :** 2:2

**ජීවිතයේ හා සේවයේ මුලධර්මය :** ශුභාරංචි පණිවුඩය, ගුණ කිරීමේ දිව්‍යමය රටාව "සෑම කෙනෙක්ම එක්කෙනෙකු බැගින් එක් කෙනෙකුටම උගන්වමින් එක් කෙනෙකු දිනා ගන්න" යන්න වේ.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, තිමෝතියස්, පිගෙලස්, හර්මොගෙනිස්, ඔනේසිපොරස්, හිමේනියස්, පිලේතස්, දේමස්, තීතස්, ලූක්, මාක්, තුඛිකස්, ඇලෙක්ෂන්දර්, ප්‍රිස්කා, අකිලා, ඇලෙක්ෂන්දර්, එරස්මස්, ත්‍රොපිමස්, යුබුලස්, පුදෙන්ස්, ලීනස්, ක්ලෞදියා, යන්නෙස්, යම්බ්‍රොස්, මෝසෙස්

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-2

A. පාවුලුතුමාගෙන් : 1:1
1. ප්‍රේරිතයෙකි
2. යේසුස්වහන්සේ තුළ ඉටුවී ඇති ජීවනයේ පොරොන්දුව ආකාරයට

B. තිමෝතියස් වෙත : 1:2
1. ඇදහිල්ලේ පුත්‍රයෙකි
2. දෙවියන්වහන්සේගෙන් හා යේසුස්වහන්සේගෙන් කරුණාව, දයාව හා සාමය වේවා.

II. ස්තුතිකිරීම : 1:3-5

A. දෙවියන්වහන්සේට කෘතඥවීම : 1:3

B. කෘතඥතාවයට හේතු : 1:3-5
1. තිමෝතියස් සිහිකිරීම : 1:3
2. තිමෝතියස් කෙරෙහි ඇති ආශාව : 1:4
3. තිමෝතියස්ගේ ස්ථිර ඇදහිල්ල ඔහුගේ මතකයට ඒම : 1:5

III. විශ්වාසවන්ත සේවයක් සඳහා අවවාදානුශාසනා : 1:6-2:13

A. ඔබගේ ආත්මික දීමනා භාවිත කරන්න : 1:6

B. ධෛර්යවත් ආකල්පයක් ඇතිව ඉන්න : 1:7-8
1. බියසුලු නොවන්න : 1:7
2. බලයේ, ප්‍රේමාන්විත හා හික්මුණු ආත්මානුභාවයක් ඇතිව ඉන්න : 1:7
3. ඔබගේ සාක්ෂි ගැන ලජ්ජා නොවන්න : 1:8

4. දෙවියන්වහන්සේගේ බලය කෙරෙහි විශ්වාසය තබා ශුභාරංචිය වෙනුවෙන් දුක්විඳීමේ පංගුකාරයෙක් වන්න : 1:8

C. ඔබගේ කැඳවීම හඳුනාගන්න : 1:9-12
   1. එය දෙවියන්වහන්සේගෙනි : 1:9
   2. එය ගැළවීම තුළින් මිස ක්‍රියාවලින් නොවේ : 1:9
   3. එය දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කිරීම සඳහා : 1:9
   4. එය දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තුළිනි : 1:9
   5. එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මත පදනම් වේ : 1:10-11
   6. එය දුක් පීඩා ගෙනෙනු ඇත : 1:12
   7. එය සදාතන අගයන් මත පදනම් වේ : 1:12

IV. සැබෑවේ ධර්මය සඳහා අවවාද : 1:13-26

A. එය තදින් අල්ලාගන්න : 1:13-14

B. අවවාද සඳහා හේතු : 1:15-18
   1. ආසියාවේ සිටින අය සැබෑවේ ධර්මය හැරයාම: පිගෙලස් හා හර්මොගෙනිස් : 1:15
   2. ඔනේසිපොරස්ගේ කරුණාව : 1:16-18

C. සැබෑවේ ධර්මය අන් අයට පවරා දීම : 2:1-2
   1. විශ්වාසවන්ත පුද්ගලයන්ට : 2:2
   2. අන් අයට ඉගැන්විය හැකි අයට : 2:2

D. විශ්වාසී භේවායෙකු සේ සැබෑවේ ධර්මය ආරක්ෂා කිරීම : 2:3-4
   1. දුක්විඳීම දරා ගනී : 2:3
   2. මෙම ජිවිතයේ කටයුතුවලට පැටලෙන්නේ නැත : 2:4
   3. භේවායෙකු ලෙස තමා බඳවාගත් තැනැත්තා සතුටු කරවයි : 2:4

E. මලල ක්‍රීඩකයෙකු මගින් සැබෑවේ ධර්මය සඳහා උත්සාහ කිරීම : 2:5

F. ගොවියෙකු මෙන් සැබෑවේ ධර්මය සඳහා වෙහෙසීම : 2:6

G. සැබෑවේ ධර්මය පිළිබඳ යුතුකම් : 2:7

H. සැබෑවේ ධර්මය සඳහා දුක්විඳීම : 2:8-13
   1. යේසුස්වහන්සේගේ ආදර්ශය මත පදනම් වේ : 2:8
   2. දුක්විඳීම සැබෑවේ ධර්මය නවත්වන්නේ නැත : 2:9
   3. අපි උන්වහන්සේ සමග මැරෙමු නම් අපි උන්වහන්සේ සමග ජිවත් වන්නෙමු : 2:10
   4. අපි දුක්විදිමු නම් උන්වහන්සේ සමග රජකම් කරන්නෙමු : 2:12
   5. අපි උන්වහන්සේ ප්‍රතික්ෂේප කරමු නම් උන්වහන්සේ අපත් ප්‍රතික්ෂේප කරන සේක : 2:12
   6. අප විශ්වාස නොකළත් උන්වහන්සේ අපට විශ්වාසවන්තව සිටින සේක : 2:13

I. වැදගත් නොවන කරුණු ගැන විවාද නොකරන්න : 2:14

J. පහත දැක්වෙන දේ සඳහා සත්‍ය ධර්මය අධ්‍යයනය කරන්න : 2:15
   1. දෙවියන්වහන්සේ විසින් අනුමත කරන ලෙසට.
   2. ලජ්ජා නොවීමට
   3. සත්‍ය වචනය ප්‍රකාශ කිරීමට.

K. තේරුමක් නැති හිස් දෙඩවිලිවලින් වැළකී සිටින්න : 2:16-18
   1. ඒවා නිසා භක්තිවන්තකම වැඩි වැඩියෙන් නැතිවේ : 2:16
   2. හිමේනියස්ද පිලේතස්ද එවැනි අය වේ : 2:17-18

L. සැබෑ අත්තිවාරම මත ස්ථිරව පවතින්න : 2:19
   1. ක්‍රිස්තුස්වහන්සේ තුළ
   2. ධර්මිෂ්ඨකම තුළ

M. ගෞරවයේ භාජනයක් වන්න : 2:20-21
N. යොවුන් වියේ ඇතිවන කාමතෘෂ්ණාවලින් අහක්වන්න : 2:22
O. මේවා පසුපස යන්න : 2:22
   1. ධර්මිෂ්ඨකම
   2. ඇදහිල්ල
   3. ප්‍රේමය
   4. සමාදානය
   5. දෙවියන්වහන්සේ හා සම්බන්ධ අය
P. මෝඩ හා නුගත් ප්‍රශ්න මගහරින්න : 2:23-26
   1. ඒවා කලහ හටගන්වයි : 2:23
   2. දෙවියන්වහන්සේගේ සේවකයා කලහ නොකළ යුතු අතර ඔහු මෙසේ විය යුතුය : 2:24-26
      a. සියලු මනුෂ්‍යයන්ට මෘදුව සිටීම : 2:24
      b. උගන්වන්ට හැකි විම : 2:24
      c. ඉවසිලිවන්ත වීම : 2:24
      d. පසුතැවිලිවීම සහ මෘදු ලෙස උපදෙස් දීම : 2:25-26

V. අන්තිම දවස් සඳහා අවවාද : 3:1-4:8

A. උවදුරු කාලයක් එන බව දැන්වීම : 3:1
B. අන්තිම දවස්වල සිටින දුෂ්ට මිනිසුන් පිළිබඳ විස්තරය : 3:2-7
   1. ආත්මාර්ථකාමි අය වෙති : 3:2
   2. මිල මුදලට ආලය කරන්නෝය : 3:2
   3. අහංකාර : 3:2
   4. ආඩම්බර : 3:2
   5. අශිෂ්ට : 3:2
   6. දෙමාපියන්ට අකීකරු : 3:2
   7. කෙලෙහිගුණ නොසලකන : 3:2
   8. ශුද්ධවන්ත නොවන : 3:2
   9. ස්වභාවික ආකර්ෂණ නොමැති : 3:3
   10. සමාදාන නොවන්නෝ : 3:3
   11. බොරු චෝදනා කරන : 3:3
   12. අසංයම : 3:3
   13. කුරිරු : 3:3
   14. හොඳ දේට අකමැති : 3:3
   15. ද්‍රෝහී : 3:4
   16. හිතුවක්කාර : 3:4
   17. හිස උදුම්මාගත් : 3:4
   18. දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලම්වලට ආශා ඇති : 3:4
   19. ආගමේ බාහිර පෙනුම ඔවුන්ට තිබුණත් එහි අභ්‍යන්තර බලය නොසලකන : 3:5
   20. ගෙවලට ඇතුළුවී ළාමක ස්ත්‍රීන් වසඟ කරගන්නා : 3:6
   21. පවින් බර : 3:6
   22. අනේක තෘෂ්ණාවලින් බැඳුනු : 3:6
   23. නිතරම ඉගෙනගන්න එහෙත් කිසි කලෙක සත්‍ය දැනගන්ට බැරි : 3:7
       අය වෙති.
C. යන්නෙස් හා යම්බ්‍රෙස් මෙවැනි දුෂ්ට අය පිළිබඳ ආදර්ශ වේ : 3:8
   1. මෝසෙස්ට විරුද්ධ වූහ.

2. සත්‍යය ප්‍රතික්ෂේප කළහ.
3. දූෂිත සිත් ඇත්තෝය.
4. ඇදහිල්ල පිළිබඳ නිෂ්ප්‍රයෝජන අයය.

D. මෙවැනි නපුරු මිනිසුන්ගේ සීමා : 3:9
1. ඔවුන්ට වැඩිදුර යන්නට නොලැබේ.
2. ඔවුන්ගේ මෝඩකම කාටත් හෙළිවේ.

E. අන්තිම දවස්වල පීඩාවන් : 3:10-12
1. පීඩා විඳි කෙනෙකු ලෙස පාවුලුතුමා ආදර්ශයකි : 3:10-11
a. ඔහුගේ ඉගැන්වීම, හැසිරීම, අරමුණ, ඇදහිල්ල, ඉවසිලිවන්තකම, ප්‍රේමය හා ඉවසීම, පීඩාවන් දරා සිටියේය : 3:10
b. අන්තියෝකියේදීත්, ලුස්ත්‍රාවේදීත්, ඉකෝනියේදීත් ඔහුට ඇතිවූ පීඩාවලින් දෙවියන්වහන්සේ ඔහු මිදූ සේක : 3:11
2. භක්තිවන්තව ජීවත්වන සියලු දෙනම පීඩා විඳින්නෝය : 3:12

F. අන්තිම දවස්වල පිරිහීම් තත්වය : 3:13
1. නපුරු මිනිසුන් හා රැවටිලිකාරයෝ තව තවත් නරක් වෙති : 3:13
2. ඔව්හු අන් අය රවටති : 3:13
3. ඔව්හු ඔවුන්වම රවටා ගනිති : 3:14

G. අන්තිම දවස්වල තත්වය පිළිබඳව පාලකවරුන්ගේ ප්‍රතිචාරය : 3:14-4:5
1. සත්‍ය ධර්මයෙහි නොකඩවා නියැලෙති : 3:14-15
2. ශුද්ධ ලියවිල්ලෙහි පවතිති : 3:15-17
a. යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් ඔවුන් ඔබ, ගැළවීම කෙරෙහි ප්‍රඥාවන්ත කරනු ඇත : 3:15
b. ඒවා දී ඇත්තේ දෙවියන්වහන්සේගේ ආනුභාවයෙනි : 3:16
c. ඒවා ප්‍රයෝජනවත්ය : 3:16
(1) ධර්මයට
(2) හික්මවීම
(3) දුර්මත දුරු කිරීමට
(4) ධර්මිෂ්ඨකම් ගැන උපදෙස් දීමට
d. දේව වචනයේ ප්‍රතිඵලය පරිපූර්ණතාවය වේ : 3:17
e. දේව වචනයේ ප්‍රතිඵලය යහපත් දේ කිරීමට සන්නද්ධ කිරීමය : 3:17

H. ශුද්ධවූ ආඥාවට කීකරුවන්න : 4:1

I. දේව වචනය දේශනා කරන්න : 4:2

J. කලටත් අකලටත් සූදානම්ව සිටින්න : 4:2

K. තරවටු කරන්න, චෝදනා කරන්න, දිරිගන්වන්න, ඉවසිලිවන්ත කමින් හා දේව ධර්මයෙන් උපදෙස් දෙන්න : 4:2-4
1. මෙය අවශ්‍ය වන්නේ, ඔවුන් සත්‍ය ධර්මය නොතකන කාලයක් පැමිණෙන බැවිනි : 4:3
2. ඔවුන්ට, ඔවුන් හට අවශ්‍ය දේ උගන්වන ගුරුවරුන් අවශ්‍ය වනු ඇත : 4:3
3. ඔවුන් සත්‍යයෙන් බැහැර වනු ඇත : 4:4
4. ඔවුන් මිථ්‍යා ප්‍රබන්ධවලට හැරෙනු ඇත : 4:4

L. සියලු දේ කෙරෙහි සූදානම්ව සිටින්න : 4:5

M. පීඩාවන් දරාගන්න : 4:5

N. ධර්මදූතයෙකුගේ වැඩ කටයුතු කරන්න : 4:5

O. ඔබගේ සේවයේ සම්පූර්ණ සාධනය කරන්න : 4:5

VI. සමාප්තිය : 4:6-22

A. පාවුලුතුමාගේ සාක්ෂිය : 4:6-8
   1. ඔහු සූදානම්ව සිටින අතර මරණයට මුහුණ දෙයි : 4:6
   2. ඔහු යහපත් සටන සටන් කර ඇත : 4:7
   3. ඔහු ඔහුගේ ජීවිතයේ සැලැස්ම අවසන් කර ඇත : 4:7
   4. ඔහු ඇදහිල්ලෙහි නිරතව සිටියේය : 4:7
   5. ඔහු වෙනුවෙන් ත්‍යාගයක් වෙන්කර ඇත : 4:8
   6. ඔහුගේ ආදර්ශය අනුව යන්නන්ට ත්‍යාග වෙන්කර ඇත : 4:8

B. තිමෝතියස්ට පැමිණෙන ලෙස කෙරෙන ඉල්ලීමක් : 4:9-13
   1. පැමිණෙන ලෙස ඉල්ලීම : 4:9
   2. ඊට හේතුව : 4:10-12
   3. ගෙන ආ යුතු දේ පිළිබඳ උපදෙස් : 4:13

VII. පාවුලුතුමාගේ නඩු විභාග : 4:14-18

A. අලෙක්ෂන්දර් කළ නපුරුකම් : 4:14-15
B. පළමු නඩු විභාගයේදී පාවුලුතුමාට තනිවම සිටීමට සිදුවිය : 4:16
C. එහෙත් දෙවියන්වහන්සේ මුළු නඩු විභාගය තුළම ඔහු සමග සිටි සේක : 4:17
D. ඉදිරි නඩු විභාගවලදීද දෙවියන්වහන්සේ ඔහු සමග සිටිනු ඇත : 4:18

VIII. සමාප්තිය : 4:19-22

A. ප්‍රිස්කාට, අකිලාට හා ඔනෙසිපොරස්ගේ පවුලේ අයට ආචාරය : 4:19
B. පාවුලුතුමාගේ සහකරුවන් පිළිබඳ ප්‍රවෘත්ති : 4:20
C. තිමෝතියස්ට පැමිණෙන ලෙසට අවසාන ඉල්ලීමක් : 4:21
D. විශේෂ ශුභපැතුම් : 4:21
E. ආශිර්වාද වාක්‍යය : 4:22

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 තිමෝති පොත්වල කතුවරයා කවුරුන්ද?

2. 1 තිමෝති පොත සඳහා පරමාර්ථය ලියන්න.

3. 1 තිමෝති පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. 1 තිමෝති පොතේ ජිවිතයේ හා සේවයේ මූලධර්මය ලියන්න.

5. 1 තිමෝති හි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

6. 2 තිමෝති පොත සඳහා පරමාර්ථය ලියන්න.

7. 2 තිමෝති පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

8. 2 තිමෝති පොතේ ජිවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

9. 2 තිමෝති හි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 1 හා 2 තිමෝතිවල "නියෝගය" යන (අර්ථය ඇති) වචනයේ භාවිතය අධ්‍යයනය කරන්න. පාවුලුතුමා තිමෝතියස්ට දෙන ලද නියෝගයන්හි ඇත්තේ කවර දේ කරන ලෙසද?

2. මෙම පොත් දෙකේ "ඇදහිල්ල" යන වචනය අධ්‍යයනය කරන්න. ඇදහිල්ල පිළිබඳව පාවුලුතුමා පවසන්නේ කුමක්ද?

3. මෙම පොත්වල ඉගැන්වීමේ සේවය පිළිබඳව බොහෝ දේ අන්තර්ගතය. ඉගැන්වීම, ගුරුවරු හා ඉගැන්වීමේ වගකීම ගැන පාවුලුතුමා ලියා ඇති සියල්ල අධ්‍යයනය කරන්න.

4. 1 හා 2 තිමෝතිවල "භක්තිවන්තකම" යන වචනය අධ්‍යයනය කරන්න. භක්තිවන්තකම ගැන උගන්වා ඇති දෙය සාරාංශ කරන්න.

5. 2 තිමෝති පොතේ ඇදහිලිවතුන් බොහෝ දේවලට සමාන කර ඇත. භේවායෙක් (2:3), ක්‍රීඩකයෙකු (2:5), ගොවියෙකු (2:6), සේවකයෙකු (2:15), භාජනයක් (2:21), දාසයෙකු (2:24).

6. පාවුලුතුමා ලියා ඇති සිය සේවයේ සාරාංශය හා ඇගයීම් කියවන්න. 2 තිමෝති 4:6-8

7. 1 තිමෝති 3:1-13 හි සභා නායකයන්ට හා උපස්ථායකයන්ට දී ඇති සුදුසුකම් අධ්‍යයනය කරන්න.

8. තිමෝතිගේ ජීවිතය අධ්‍යයනය කරන්න. 1 හා 2 තිමෝතිවල සඳහන් තොරතුරුවලට අමතරව පහත දැක්වෙන කොටස් අධ්‍යයනය කරන්න.
   - ක්‍රියා 13:5, 14:19-20, 16:1-3, 17:14, 19:22, 20:4.
   - 1 කොරින්ති 4:17, 9:20, 16:10
   - 2 කොරින්ති 1:1,19
   - 1 තෙසලෝනික 3:2,6
   - පිලිප්පි 1:1, 2: 19-23
   - කොලොස්සි 1:1
   - පිලෙමොන් 1:1
   - හෙබ්‍රෙව් 13:23

# දහහතරවන පරිච්ඡේදය

# තිතස්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- තිතස් පොතේ කර්තෘ නම් කිරීමට
- තිතස් පොත ලියන ලද්දේ කවුරුන් වෙතටදැයි හඳුනාගැනීමට
- තිතස් පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- තිතස් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- තිතස් පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට

හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** තිතස්, දෙවියන්වහන්සේ වෙතට හැරුණාවූ ග්‍රීකයෙක් හා පාවුලුතුමා සමග සේවය කරන්නෙක්.

**පරමාර්ථය :** ක්‍රිත දූපතේ පිහිටි සභාවල ගැටලු නිරාකරණය කිරීමට හා නිසි විනයක් ඇති කිරීම වේ.

**ප්‍රධාන පදය :** 1:5

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** යහපත් වැඩක් ආරම්භ කිරීම ප්‍රමාණවත් නොවේ. එම වැඩය දේව වචනයේ මූලධර්මවලට අනුකූලව ස්ථාපනය කර සංවිධානය කළ යුතු වේ.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා හා තිතස් සඳහන් කර ඇති අනෙක් අය වන්නේ අර්තිමස්, තුඛිකස්, සේනාස්, හා අපොල්ලොස් වේ.

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-4

A. පාවුලුතුමාගෙනි : 1:1-3
   1. දෙවියන්වහන්සේගේ සේවකයෙකු : 1:1
   2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතවරයෙකු : 1:1-2
   3. පත්වීමක් ලද පාලකවරයෙකු : 1:3

B. තිතස් වෙත : 1:4

II. පරමාර්ථය : "මා ඔබ ක්‍රීතයේ නතර කළේ" මේ සඳහා වේ : 1:5

A. ඉතුරු කටයුතු සම්පූර්ණ කරන පිණිස
B. පාවුලුතුමාගේ මගපෙන්වීම අනුව සභා ව්‍යුහයන් පිහිටුවීම පිණිස

III. සභාවේ නායකයෝ : 1:6-16

A. ඔවුන්ගේ සුදුසුකම් : 1:6-9
1. නිදොස් චරිතයකින් : 1:6-7
2. එක භාර්යාවක් පමණක් සිටින : 1:6
3. විශ්වාසවන්ත, කීකරු දරුවන් සිටින නිවසක් තිබිය යුතුය : 1:6
4. යහපත් ගබඩාකාරයෙකු : 1:7
5. නොකිපෙන සුලු : 1:7
6. මත්පැනට ලොල් නොවූ : 1:7
7. හිතුවක්කාර නොවූ : 1:7
8. කලහකාරී නොවූ : 1:7
9. ධනයට ලොල් නොවූ (මුදල් පිළිබඳ හොර බොරු නැති) : 1:7
10. ආගන්තුක සත්කාරයට ලැදි : 1:8
11. යහපතට ප්‍රිය කරන : 1:8
12. ශාන්තිදායක : 1:8
13. දැහැමි : 1:8
14. ශුද්ධවන්ත : 1:8
15. පමණ දැන ක්‍රියාකරන්නාවූ : 1:8
16. සැබෑවූ ධර්මය ඇති : 1:9
17. වචනය තදින් අල්ලාගත් : 1:9

B. ඔවුන්ගේ සුදුසුකම් සඳහා අවශ්‍යතාව : 1:9-16
1. වැරදි කරන ඇදහිලිවතුන්ට සාරධර්ම මගින් තරවටු කිරීමට හැකිවීම : 1:9,13
2. මෙම වැරදි කරන ඇදහිලිවතුන් විස්තර කර ඇත : 1:10-16
   a. මුරණ්ඩු : 1:10
   b. නන් දොඩන : 1:10
   c. රැවටිලිකාර : 1:10
   d. පවුල් මුළුමනින්ම අවුල් කරන : 1:11
   e. මුදල් ගැරීමේ අදහසින් උගන්වන : 1:11
   f. බොරුකාරයෝය : 1:12
   g. දරුණු තිරිසන්නුය : 1:12
   h. කම්මැලි කෑදරයෝය : 1:12
   i. සැබෑ ධර්මයක් නොමැත : 1:13
   j. සත්‍යයට පිටුපාන මිනිසුන්ගේ ආඥාවලට යටත්වෙති : 1:14
   k. සිතත් හෘදය සාක්ෂියත් දූෂණය වී තිබේ : 1:15
   l. නොඇදහිලිවන්තයෝය : 1:15
   m. දෙවියන්වහන්සේ දන්නා බව කියති. එහෙත් ක්‍රියාවලින් නාඳුනන බව පෙන්වති : 1:16
   n. පිළිකුල් කටයුතුය : 1:16
   o. අකීකරුය : 1:16
   p. සියලු යහපත් ක්‍රියා ගැන නිෂ්ප්‍රයෝජනව සිටිති : 1:16

IV. සභාවේ එකිනෙකට වෙනස් පන්ති : 2:1-3:2

ඔවුන්ට දිය යුතු ඉගැන්වීම මෙය වේ : (2:1,15)

A. වයස්ගත පුරුෂයන් : 2:2
   1. මධ්‍යස්ථ
   2. සන්සුන්
   3. පමණ දැන
   4. සිහියෙන් යුක්ත ඇදහිල්ලක් ඇති
   5. ප්‍රේමයෙන් යුක්ත
   6. ඉවසිලිවන්ත අය විය යුතුය.

B. වයස්ගත ස්ත්‍රීන් : 2:3-4
   1. "එසේම", ඔවුන්ට වයස්ගත පුරුෂයන්ට ඇති ඉහත සඳහන් ගති ලක්ෂණ තිබිය යුතුය : 2:3
   2. ශුද්ධ ජීවිතයක් ඇති : 2:3
   3. කේලාම් නොකියන : 2:3
   4. මත්පැනට ඇබ්බැහි නොවූ : 2:3
   5. යහපත් දේ උගන්වන : 2:3
   6. යෞවන ස්ත්‍රීන්ට උගන්වන : 2:4 අය විය යුතුය.

C. යෞවන ස්ත්‍රීන් : 2:4-8
   1. සන්සුන් : 2:4
   2. සිය පුරුෂයන්ට ප්‍රේම කරන : 2:4
   3. සිය දරුවන්ට ප්‍රේම කරන : 2:4
   4. විචාර පූර්වක : 2:5
   5. පතිවත රකින : 2:5
   6. ගෙදර දොර තබාගන්නා : 2:5
   7. යහපත් : 2:5
   8. දේව වචනයට අපහාසයක් නොවන පිණිස සිය ස්වාමිපුරුෂයන්ට කීකරු : 2:4-5

   අය විය යුතුය.

D. යෞවන පුරුෂයන් : 2:6
   1. "එසේම", ඔවුන් යෞවන ස්ත්‍රීන්ගේ ගති ලක්ෂණම දියුණු කරගත යුතුය : 2:6
   2. සිහියෙන් යුක්තව සිටිය යුතුය : 2:6

E. සියලුම වර්ගයේ ඇදහිලිවන්තයන් : 2:7-8
   1. යහපත් ක්‍රියා රටාවක් : 2:7
   2. සැබෑ ධර්මයක් : 2:7
   3. සන්සුන් : 2:7
   4. අවංක : 2:7
   5. දෝෂාරෝපණයට ලක් කළ නොහැකි සාරවත් කතා ඇති : 2:8
   6. නින්දාවට පත් කළ නොහැකි : 2:8

   අය විය යුතුය.

F. ස්වාමිවරුන්ට සේවය කරන අය : 2:9-10
   1. කීකරු : 2:9
   2. ස්වාමිවරුන් සතුටු කරවන : 2:9
   3. එකට එක නොකියන : 2:9
   4. සොරකම් නොකරන : 2:10
   5. සම්පූර්ණ විශ්වාසය ඇති : 2:10
   6. ධර්මයට ආදර්ශයක්වූ : 2:10 අය විය යුතුය.

G. සියලු ඇදහිලිවතුන් : 2:11-3:2
   1. අභක්තියද ලෞකික තෘෂ්ණාද හැර දැමූ : 2:12

2. සිහියෙන් යුක්තව ජීවත් වන : 2:12
3. ධර්මිෂ්ඨ ලෙස ජීවත් වන : 2:12
4. භක්තිවන්ත ලෙස ජීවත් වන : 2:12
5. යේසුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන බලා සිටින : 2:13
6. මිදුනු ජීවිතයක් ගත කරන : 2:14
7. ශුද්ධ ජීවිතයක් ගත කරන : 2:14
8. දෙවියන්වහන්සේගේ සෙනඟ සමග එකඟත්වයට පැමිණි : 2:14
9. යහපත කිරීමට උද්යෝගිමත් වූ : 2:14
10. නිලධාරීන්ට යටත් වන : 3:1
11. සියලු යහපත් වැඩවලට සූදානම් : 3:1
12. කිසිවෙකු ගැන අගුණ නොකියන : 3:2
13. කලහකාරී නොවන : 3:2
14. සෞම්‍ය : 3:2
15. මෘදු : 3:2 අය විය යුතුය.

V. සභාවේ ක්‍රමවත් බව සඳහා අතිරේක උපදෙස් : 3:3-11

A. දෙවියන්වහන්සේ ඔබ සමග කටයුතු කළ ආකාරයට ඔබද ඔබගේ සාමාජිකයන් සමග කටයුතු කරන්න : 3:3-7
   1. ඔබද වරක් : 3:3
      a. අඥානව
      b. අකීකරුව
      c. මුළාව ගොස්
      d. අනේකාකාර තෘෂ්ණාවලටත්, සැප සම්පත්වලටත් වහල්ව
      e. ක්‍රෝධයෙන් හා ඊර්ෂ්‍යාවෙන් හැසිරෙමින්
      f. වෛරයෙන් යුක්තව
      g. එකිනෙකට වෛර කරමින් සිටියෙහිය.
   2. එහෙත් මේ සියල්ල තිබියදීත් දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කළ සේක : 3:4-7
      a. ඔබ ගැළවීම ලැබුවේ උන්වහන්සේගේ දයාවෙනි : 3:5
      b. ඔබ සෝදා පවිත්‍ර කරනු ලැබිණි : 3:5
      c. ඔබ පුනරුත්පාදනය කෙරිනි : 3:5
      d. ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් අලුත් කෙරිනි : 3:5-6
      e. උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ඔබ ධර්මිෂ්ඨ කරනු ලැබිණි : 3:6
      f. ඔබ සදාතන ජීවනයේ උරුමක්කාරයන් කෙරිනි : 3:7

B. යහපත්, ඵලදායි හා අවශ්‍ය වැඩකටයුතුවල යෙදෙන්න : 3:8,14

C. එහෙත් මේවායින් වැළකී සිටින්න. මන්ද, ඒවා නිෂ්ඵලය, නිරර්ථකය : 3:9
   1. අනුවණ තර්ක
   2. පෙළපත් පිළිබඳ කතා
   3. ආරාවුල්
   4. ව්‍යවස්ථාව ගැන වාද විවාද

D. භේදකාරී මනුෂ්‍යයාට වරක් දෙවරක් අවවාද කළ පසු : 3:10-11
   1. ඔහුගෙන් අහක් වන්න : 3:10
   2. සිතින් මුළාවී ඇති බව හඳුනාගන්න : 3:11
   3. ඔහුගේ පාපය හඳුනාගන්න : 3:11
   4. ඔහු ඔහුවම වරදකරුවෙකු කොට ඇති බව දැනගන්න : 3:11

VI. සමාප්තිය: පෞද්ගලික උපදෙස් හා ශුභ පැතුම් : 3:12-15

## ස්වයං පරීක්ෂණය

1. තිතස් පොතේ කර්තෘ කවුරුන්ද?

---

2. තිතස් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

---

---

---

3. තිතස් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

---

---

4. තිතස් පොතේ ජිවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

---

---

---

5. තිතස් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

---

---

---

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යහපත් ක්‍රියා පිළිබඳ විෂය තිතස් පොතේ නිරන්තරයෙන්ම සඳහන් වේ. පහත දැක්වෙන පද කියවන්න. ඇදහිලිවන්තයා හා යහපත් ක්‍රියා පිළිබඳව උගන්වන දේ චාට් සටහනෙහි දක්වන්න.

    පද          සාරාංශය
    2:7

    2:14

    3:1

    3:4

    3:5

    3:8

    3:14

2. තිතස් පොතේ දී ඇති සභා නායකත්වය සඳහා සුදුසුකම් අධ්‍යයනය කරන්න.

3. 2:11-13 හි ගැළවීම පිළිබඳ කාල භේද තුන බලන්න.

    - අතීතය : ගැළවීම ගෙනෙන්නාවූ
    - වර්තමාන : දැනුමැති කරන්නේය
    - අනාගත : ආශිර්වාදලත් බලාපොරොත්තුව ගැන බලා සිටිමින්

4. ක්‍රීතයේ භූගෝලිය පසුබිම පිළිබඳව 1 සාමුවෙල් 30:14, එසකියෙල් 25:16, ක්‍රියා 2:11 හා 27:17 බලන්න.

5. 1 හා 2 තිමෝතිද තිතස්ද අතර සබඳතාව බලන්න.

    1 තිමෝති : ශුභාරංචිය ආරක්ෂා කරන්න.
    2 තිමෝති : ශුභාරංචිය ප්‍රකාශ කරන්න
    තීතස් : ශුභාරංචිය ක්‍රියාවට යොදවන්න.

# පහළොස්වන පරිච්ඡේදය

## පිලෙමොන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- පිලෙමොන් පොතේ කර්තෘ නම් කිරීමට
- පිලෙමොන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- පිලෙමොන් පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- පිලෙමොන් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- පිලෙමොන් පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට
  හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** කොලොස්සියේ ජීවත්වූ කිතුනුවකු වන පිලෙමොන් වෙත

**පරමාර්ථය :** පලාගිය පිලෙමොන්ගේ වහල් දාසයෙකුවූ හා පසුව ඇදහිලිවන්තයෙකු වූ ඔනේසිමස් උදෙසා ඉල්ලීමක් කිරීමට වේ. මෙම පොත කිතුනු ප්‍රතිපත්ති සමාජ සබඳතාවලට යොදන ආකාරය ගැන නිදසුනක්ද වේ. එමෙන්ම එය කමාව දීමේ මූලධර්මය හා මැදිහත්වීමේ සේවය පැහැදිලි කරයි.

**ප්‍රධාන පදය :** 1:10

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** කිතුනු ප්‍රතිපත්ති සමාජ සබඳතාවලටද යෙදවිය යුතුය.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, ඔනේසිමස්, පිලෙමොන්, මෙහි සඳහන් සුළු චරිත වන්නේ අපියා, අර්කිපස්, එපප්‍රස්, මාක්, දේමස්, ලූක්, අරිස්තාර්කස් වේ.

### සැකිල්ල

I. හැඳින්වීම : 1:1-7

  A. කරුණාවේ හා සමාදානයේ ශුභ පැතුම් : 1:1-3
    1. පාවුලුතුමාගෙන් හා තිමෝතියස්ගෙන් : 1:1
  B. වෙත : 1:1-2
    1. පිලෙමොන් : 1:1
    2. අපියා : 1:2
    3. අර්කිපස් : 1:2
    4. පිලෙමොන්ගේ ගෙදර රැස්වන සභාවට : 1:2

C. ස්තුතිදීම : 1:4-7
   1. ප්‍රේමය : 1:5
   2. ඇදහිල්ල : 1:5
   3. ඇදහිල්ල සන්නිවේදනය කිරීම : 1:6
   4. ශුද්ධවන්තයන්ගේ සිත් ප්‍රාණවත් කිරීම : 1:7

II. ඉල්ලීම : 1:8-21

A. ඔනේසිමස් පිළිබඳ පාවුලුතුමාගේ පෞද්ගලික උනන්දුව : 1:8-14
   1. ඔහු නිෂ්ප්‍රයෝජන සේවකයෙකුව සිටියේය : 1:11
   2. ඔහු දැන් ප්‍රයෝජනවත් ඇදහිලිවන්තයෙකි : 1:11,13
B. ඔනේසිමස් වෙනුවෙන් පාවුලුතුමාගේ ආයාචනය : 1:15-18
   1. ඔබ වෙනුවෙන් ඔහුට කමාවෙන්න : 1:15
   2. ඔහු වෙනුවෙන් ඔහුට කමාවන්න : 1:16
   3. මා වෙනුවෙන් ඔහුට කමාවන්න : 1:17.18
C. ඔහුගේ ඉල්ලීමේ පදනම : 1:19-20
D. පිළිතුරක් පිළිබඳ විශ්වාසය : 1:21

III. සමාප්තිය : 1:22-25

A. පාවුලුතුමාගේ බැහැදැකීමේ බලාපොරොත්තුව : 1:22
B. ශුභ පැතුම් : 1:23-25

## ස්වයං පරීක්ෂණය

1. පිලෙමොන් පොතේ කර්තෘ කවුරුන්ද?

2. පිලෙමොන් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. පිලෙමොන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. පිලෙමොන් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. පිලෙමොන් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. මෙම කෙටි පොතේ පිලෙමොන් පිළිබඳව බොහෝ දේ එළිදරව් කර තිබේ. පහත දැක්වෙන සාරාංශය අධ්‍යයනය කරන්න.

    - පිලෙමොන් මිත්‍රයෙකු විය
        පාවුලුතුමාට රෝමයේදී 1:2
        කොලොස්සියේ කිතුනුවන්ට 1:5,7
    - ඔහු ධනවතෙකි, මන්ද ඔහුට දාසයන් (1:15-16) හා අමුත්තන් සඳහා වැඩිපුර කාමරයක් (1:22) තිබූ බැවිනි.
    - ඔහුගේ ජීවිතය ගැන ඔහු පාවුලුතුමාට ණයගැති විය 1:19
    - ඔහුගේ නිවසේ සභාවක් තිබිණි 1:2
    - ඔහු පාවුල් සමග හවුල් සේවකයෙකු විය 1:1
    - ඔහුට ධනාත්මක කිතුනු ගුණාංග තිබිණි, ඒවා
        ප්‍රේමයෙන් 1:5
        ඇදහිල්ලෙන් 1:5
        ඔහුගේ ඇදහිල්ල සන්නිවේදනය කිරීම 1:6
        ශුද්ධවන්තයන්ගේ සිත් ප්‍රාණවත් කිරීමෙන් 1:7
        කීකරුකමින් 1:21
        යාච්ඤාවෙන් 1:22 පෙන්නුම් කළේය.
    - ඔහු සිරකරුවන් බලාගන්ට ගිය බව පෙනේ. හිරකාරයකු වන එපප්‍රස්ට ද පාවුලුතුමා සමග ආචාර කරන මෙන් ඉල්ලීය. 1:23

2. පාවුලුතුමා පිළිබඳ බොහෝ දේ ඉගෙන ගැනේ

    - ඔහු සිරකරුවෙකි 1:1
    - ඔහු යාච්ඤාවේ යෙදෙන්නෙකි 1:4
    - අසීරු අවස්ථා මධ්‍යයේ ඔහු ප්‍රීතියෙන් සිටියේය 1:7
    - සබඳතාවලින් ඔහුට අයුතු ප්‍රයෝජන ගත හැකිව තිබුණද ඔහු එසේ නොකළේය. 1:8-9, 13-14, 19
    - සිරගෙදරදී වුවද ඔහු අන් අයව ආත්මිකව වර්ධනය කළේය. 1:10
    - ඔහු ආත්මාර්ථකාමී නොවිය 1:13-14
    - ඔහු ප්‍රේමයෙන් ජීවත් වූවෙකි. 1:18-19
    - ඔහු ඇදහිලිවන්තයෙකි. 1:22
    - ඔහු සබඳතා ප්‍රිය කළ කෙනෙකි. මෙම පරිච්ඡේදයේ ඔහු ඔනේසිමස්ට, පිලෙමොන්ට හා අනෙකුත් අයට ආචාර කරයි.

3. මෙම පරිච්ඡේදයෙන් ඔබ ඔනේසිමස් ගැන උගත් දේ ලයිස්තුගත කරන්න.

# දහසයවන පරිච්ඡේදය

## හෙබ්‍රෙව්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට

- හෙබ්‍රෙව් පොතේ කර්තෘ නම් කිරීමට
- හෙබ්‍රෙව් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනා ගැනීමට
- හෙබ්‍රෙව් පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- හෙබ්‍රෙව් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- හෙබ්‍රෙව් පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකි වනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** පාවුලුතුමා

**කවුරුන් වෙතද :** යුදෙව් (හෙබ්‍රෙව්) ඇදහිලිවතුන් වෙත

**පරමාර්ථය :** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියල්ලටම වඩා උතුම් බව දැක්වීමට

**ප්‍රධාන පදය :** 8:6

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** යේසුස්වහන්සේ වඩාත් හොඳ පොරොන්දු මත පිහිටවූ වඩාත් හොඳ ගිවිසුමක මැදිහත්කාරයාණෝ වන සේක.

**ප්‍රධාන චරිත :** පාවුලුතුමා, ආබ්‍රහම්, මෝසෙස්, ආරොන්, මෙල්කිසදෙක් එමෙන්ම හෙබ්‍රෙව් 11 පරි. සඳහන් නම් ලයිස්තුවද බලන්න.

### සැකිල්ල

I. උත්තරීතර ප්‍රකාශනය : යේසුස්වහන්සේ දිව්‍යසිවරුන්ට වඩා උත්තරීතර වන සේක : 1:1-4

A. දිවැසිවරයන් මගින් පියවරුන්ට දෙවියන්වහන්සේ එළිදරව් වීම : 1:1
   1. විවිධ කාලවලදී
   2. විවිධාකාරයෙන්
B. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණන් මගින් එළිදරව් වීම : 1:2-4
   1. දෙවියන්වහන්සේ දැන් ක්‍රිස්තුස්වහන්සේ තුළින් කතා කළ සේක : 1:2
   2. පුත්‍රයාණන්ට විශ්වීය ආධිපත්‍යය දී ඇත : 1:2
   3. ක්‍රිස්තුස්වහන්සේගේ මිදීමේ කටයුතු සම්පූර්ණ කර ඇත : 1:3-4

II. උත්තරීතර මැදිහත්කාරයාණන් කෙනෙකි : 1:3-2:18

A. යේසුස්වහන්සේ දේවදූතයන්ට වඩා උත්තරීතරය : 1:3-4
   1. උරුමයෙන්
   2. නාමයෙන්
B. දේවදූතයන් කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේ උත්තරීතරභාවය පැරණි ගිවිසුමේ පැහැදිලිය : 1:5-14
   1. දේවදූතයන් : 1:5-7
   2. පුත්‍රයාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ : 1:8-12
   3. දේවදූතයන් : 1:13-14
C. (පළමු) අනතුරු ඇඟවීමේ කොටස : 2:1-4
   1. අවවාද කිරීම : 2:1
   2. පැරණි ගිවිසුමේ උදාහරණ : 2:2
   3. මෙම අනතුරු ඇඟවීම නිසා වර්තමානයේ කළ යුතු දේ : 2:3-4
D. දේවදූතයන් කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේ උත්තරීතරභාවය උන්වහන්සේගේ මනුෂ්‍යත්වය හා පටහැණි නොවේ : 2:5-8
   1. දේවදූතයන් : 2:5
   2. පුත්‍රයාණන් : 2:6-8
E. දේවදූතයන් කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේ උත්තරීතරභාවය උන්වහන්සේ දුක්විඳීමට පටහැණි නොවේ : 2:9-18
   1. මනුෂ්‍යවර්ගයා සමග උන්වහන්සේගේ අනන්‍යතාව සම්පූර්ණ කිරීමට දුක්විඳීම අවශ්‍ය විය : 2:9-13
   2. යක්ෂයා විනාශ කිරීම සඳහා මරණය දක්වා දුක්විඳීම අවශ්‍ය විය : 2:14
   3. ඇදහිලිවන්ත මනුෂ්‍යයන් නිදහස් කිරීමට දුක්විඳීම අවශ්‍ය විය : 2:15-16
   4. යේසුස්වහන්සේ දයාන්විත උත්තම පූජකයා වීම සඳහා සුදුසුකම් ලැබීමට දුක්විඳීම අවශ්‍ය විය : 2:17-18

III. උත්තරීතර නිර්මාතෘවරයෙකි: මෝසෙස්ට වඩා ක්‍රිස්තුස්වහන්සේ ශ්‍රේෂ්ඨය : 3:1-4:13

A. ක්‍රිස්තුස්වහන්සේ හා මෝසෙස් : සංසන්දනය කිරීමක් : 3:1-6
   1. ක්‍රිස්තුස්වහන්සේ මෙන්ම මෝසෙස්ද දෙවියන්වහන්සේට විශ්වාසවන්ත විය : 3:1-2
   2. ගෘහය තනන ලද්දේ යේසුස්වහන්සේ විසිනි. මෝසෙස් ගෘහයේ සිටියේය : 3:3-4
   3. ක්‍රිස්තුස්වහන්සේ ගෘහයේ පුත්‍රයාණන්වහන්සේ වන සේක. මෝසෙස් එම ගෘහයේ සේවකයෙකු පමණි : 3:5-6
B. (දෙවන) අනතුරු ඇඟවීමේ කොටස : 3:7-4:13
   1. අවවාදයන් : 3:7-8
   2. ඉශ්‍රායෙල්වරුන්ගේ පාළුකරයේ අත්දැකීම් : 3:8-11
      a. ඉශ්‍රායෙල්හි ආකල්පය : 3:8-9
      b. දෙවියන්වහන්සේගේ ප්‍රතිචාර : 3:10-11
   3. ඇදහිල්ලක් නොමැති කමට විරුද්ධව අනතුරු ඇඟවීම් : 3:12-19
      a. අනතුරු ඇඟවීම : 3:12
      b. අනතුරු ඇඟවීම සඳහා ඇදහිලිවතුන්ගේ ප්‍රතිචාර : 3:13
      c. ප්‍රතිචාරය සඳහා පෙලඹවීම : 3:14
      d. ඉශ්‍රායෙලයේ නිදර්ශනය : 3:15-19
   4. දෙවියන්වහන්සේගේ විශ්‍රාමය අතපසුවීම ගැන අනතුරු ඇඟවීම් : 4:1-13

a. අනතුරු ඇඟවීම : 4:1-2
b. විශ්‍රාමය : 4:3-5
c. අවිවේකය : 4:6-8
d. දෙවියන්වහන්සේගේ විශ්‍රාමය : 4:9-11
e. දෙවියන්වහන්සේගේ වචනයෙන් හා දැනුම මගින් අනතුරු ඇඟවීම සනාථ කිරීම : 4:12-13

IV. උත්තරිතර පූජකත්වයක් යේසුස්වහන්සේ ආරොන්ට වඩා ශ්‍රේෂ්ඨ වේ : 4:14-7:28

A. යේසුස්වහන්සේ ශ්‍රේෂ්ඨ උත්තම පූජකයා වන සේක : 4:14-16
B. ආරොන්ගේ පූජකත්වය : 5:1-4
C. යේසුස්වහන්සේගේ පූජකත්වය : 5:5-10
D. (තෙවන) අනතුරු ඇඟවීමේ කොටස : 5:11-6:20
  1. ආත්මිකව පරිණත නොවීම ගැන තරවටුව : 5:11-14
  2. ආත්මික පරිණතභාවය කෙරෙහි දිරිගැන්වීම : 6:1-3
     a. ආරම්භක මූලධර්මවලට ඔබ්බෙන් ප්‍රගතිය : 6:1-2
        (1) නිෂ්ඵල ක්‍රියා ගැන පසුතැවීම : 6:1
        (2) දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිම : 6:1
        (3) බව්තිස්මයේ දේවධර්මය : 6:2
        (4) අත් තැබීම : 6:2
        (5) මළවුන්ගේ උත්ථානය : 6:2
        (6) සදාතන විනිශ්චය : 6:2
     b. පරිපූර්ණත්වයට ළං වන්න : 6:1,3
  3. භක්තිය හැරයාමේ පල විපාකවලට එරෙහිව අනතුරු ඇඟවීම් : 6:4-8
     a. භක්තිය හැරයාම පැහැදිලි කෙරේ : 6:4-6
     b. භක්තිය හැරයාමේ ඵල විපාක : 6:4,6
     c. පලවිපාක සඳහා හේතු : 6:6
     d. ස්වභාවධර්මයෙන් පැහැදිලි කිරීමක් : 6:7-8
  4. දෙවියන්වහන්සේගේ පොරොන්දුවේ ස්ථිරත්වය ගැන මතක් කිරීමක් : 6:9-20
     a. පෙලඹවීම : 6:9
     b. දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම : 6:10
     c. ඇදහිලිවතුන්ගේ ප්‍රතිචාරය : 6:11-12
     d. දෙවියන්වහන්සේගේ පොරොන්දුවල ස්ථිරත්වය පිළිබඳ නිදර්ශනයක් : 6:13-20
        (1) ආබ්‍රහම් : 6:13-15
        (2) දිවුරුම : 6:16-17
        (3) දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය කෙරෙහි ඇති විශ්වාසවන්තකම තහවුරු කරන සේක : 6:18-20
E. මෙල්කිසදෙක්ගේ පූජකත්වය : 7:1-28
  1. සාමාන්‍ය විස්තරය : 7:1-3
  2. මෙල්කිසදෙක් හා ආබ්‍රහම් : 7:4-10
  3. ලෙවීගේ පූජකත්වය : 7:11-13
  4. නව පූජකත්වය : 7:14-17
  5. ව්‍යවස්ථාව යටතේ පූජකත්වය : 7:18-21
  6. අලුත් ගිවිසුම යටතේ පූජකත්වය : 7:22-27
  7. ඉගැන්වූ දෙයෙහි සාරාංශය : 7:28

V. උත්තරීතර සේවයක් : ගිවිසුම් දෙක : 8:1-10:18

A. හැඳින්වීම : 8:1-6
   1. කලින් ඉගැන්වූ දෙයෙහි සාරාංශය : 8:1-2
   2. උත්තම පූජකයාගේ සේවය : 8:3-5
   3. වඩා උතුම් සේවයක් : 8:6
B. ගිවිසුම් දෙක : 8:7-13
   1. පළමු (පැරණි) ගිවිසුම : 8:7-8
   2. දෙවන (අලුත්) ගිවිසුම : 8:8-12
      a. ගිවිසුම කරන්නා : 8:8
      b. ගිවිසුම : 8:9-12
   3. අලුත් හා පැරණි ගිවිසුම් අතර වෙනස්කම් : 8:13
C. පළමු ගිවිසුම ක්‍රියාත්මක කිරීම : 9:1-10
   1. මණ්ඩපය : 9:1-5
   2. උත්තම පූජකයාගේ සේවය : 9:6-10
D. අලුත් ගිවිසුම ක්‍රියාත්මක කිරීම : 9:11-10:18
   1. සාමාන්‍ය විස්තරය : 9:11-12
      a. මණ්ඩපය : 9:11
      b. උත්තම පූජකයාගේ සේවය : 9:11-28
         (1) පාපය සඳහා මිලය ගෙවීම : 9:12-22
         (2) ස්වර්ගයේදී : 9:23-28
   2. පැරණි හා අලුත් ගිවිසුම් අතර වෙනස : 10:1-18

VI. ඇදහිල්ල සඳහා උත්තරීතර සම්පත් : ප්‍රායෝගික අවවාද : 10:19-13:17

A. දෙවියන්වහන්සේට සමීප වීමට අලුත් පිවිසුම භාවිත කරන්න : 10:19-31
   1. ඇදහිල්ලෙන් සමීප වන්න : 10:19-22
      a. නිර්භයව : 10:19
      b. අලුත් හා ජීවන මාර්ගය තුළින් : 10:20
      c. උත්තම පූජකවරයා (යේසුස්වහන්සේ) තුළින් : 10:20-21
      d. සැබෑ හදවතකින් : 10:22
      e. ඇදහිල්ලේ සහතිකය ඇතිව : 10:22
      f. අපගේ හදවත් නපුරු හෘදය සාක්ෂියකින් පිරිසිදු කොට : 10:22
      g. අපගේ ශරීර පිරිසිදු වතුරෙන් ධෝවනය කිරීම : 10:22
   2. ඇදහිල්ල තදින් අල්ලාගන්න : 10:23
   3. ඇදහිල්ල තුළ එකිනෙකා ධෛර්යවත් කරන්න : 10:24-25
      a. ප්‍රේමයට හා යහපත් ක්‍රියාවලට පොලඹවන්න : 10:24
      b. ඔබ සියල්ල එකට රැස්වීම් අත් නොහරින්න : 10:25
      c. එකිනෙකාට උපදෙස් දෙන්න : 10:25
B. (සතරවන) අනතුරු ඇඟවීමේ කොටස : 10:26-31
   1. අනතුරු ඇඟවීම : 10:26-27
   2. පැරණි ගිවිසුමේ නිදර්ශනය : 10:28
   3. වර්තමාන තත්වය : 10:29-31
C. පැරණි අත්දැකීම් සිහි කරන්න : 10:32-34
D. ඔබගේ ආත්ම විශ්වාසය අත් නොහරින්න : 10:35
E. ඉවසන්න. : 10:36-37

F. ඇදහිල්ලෙන් ජිවත්වන්න : 10:38-11:40
   1. ඇදහිල්ලෙන් ජිවත්වීමට ආඥාව : 10:38-39
   2. ඇදහිල්ලේ නිර්වචනය : 11:1
   3. ඇදහිල්ලේ ක්‍රියාව : 11:2-3
   4. ඇදහිල්ල සඳහා නිදර්ශන : 11:4-38
      a. ආබෙල් : 11:4
      b. ඒනොක් : 11:5-6
      c. නෝවා : 11:7
      d. ආබ්‍රහම් හා සාරා : 11:8-19
      e. ඊසාක් : 11:20
      f. යාකොබ් : 11:21
      g. යෝසෙප් : 11:22
      h. මෝසෙස් : 11:23-29
      i. යොෂුවා (යෙරිකෝව) : 11:30
      j. රාහබ් : 11:31
      k. ඇදහිල්ල සඳහා අනෙකුත් නිදර්ශන : 11:32-38
   5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ලේ පොරොන්දුව ලබන්නන් : 11:39-40
G. දුක්විඳීම හා හික්මවීම දරාගන්න : 12:1-29
   1. දුක්විඳීමේ උදාහරණ : 12:1-3
      a. අපට (සාක්ෂිකරුවන්) පෙර ගිය සමූහය : 12:1
      b. යේසුස්වහන්සේ : 12:2-3
   2. දුක්විඳීම පැහැදිලි කිරීම : 12:4-11
      a. පාපයට විරුද්ධව ප්‍රතිරෝධය වැඩි කිරීම : 12:4
      b. දෙවියන්වහන්සේ තමා හික්මවන අයට ප්‍රේම කරන අතර ඔවුන්ට පුත්‍රයන්ට මෙන් සලකන සේක : 12:5-7
      c. පුත්‍රයන් නොවන අය පමණක් හික්මවන්නේ නැත : 12:8
      d. මෙලොව පියවරුන්ගේ නිදර්ශනය හා සන්සන්දනය කිරීම : 12:9-10
      e. හික්මවීමේ ප්‍රතිඵල : 12:11
         (1) සැණෙකින් හික්මවීම ප්‍රිය ජනක නැත.
         (2) පසුව දැහැමි සාමකාමී ජිවිතයක පල අත්වේ.
   3. දුක්විඳීම සඳහා ඇදහිලිවන්තයෙකුගේ ප්‍රතිචාර : 12:12-17
      a. පහතට වැටී ඇති අත්ද දුබල දණහිස් ද ශක්තිමත් කරගන්න : 12:12
      b. ඔබගේ පාදවලට ඇද නැති මාවත් සකස් කරන්න : 12:13
      c. දුක්විඳින අයට සුවය ලැබේවා : 12:14
      d. සියල්ලන් සමග සමාදානයෙන් ඉන්න : 12:14
      e. සියල්ලන් සමග ශුද්ධකම අනුගමනය කරන්න : 12:14
      f. දේව අනුග්‍රහයෙන් බැහැර නොයන ලෙසට පරෙස්සම් වන්න : 12:15
      g. තිත්තකමේ මුල්වලින් ඔබට කරදර ඇති නොවීමට හා ඔබව දූෂ්‍ය කිරීමෙන් වැළකීමට වගබලාගන්න : 12:15
      h. දුශ්ශීල අයගෙන් හා ලෞකික අයගෙන් පරෙස්සම් වන්න : 12:16-17
H. (පස්වන) අනතුරු ඇඟවීමේ කොටස : 12:18-29
   1. සීනයි කන්දෙහි ඉශ්‍රායෙල්හි තත්වය : 12:18-21
   2. සියොන් කන්දෙහි ඇදහිලිවතුන්ගේ තත්වය : 12:22-24
   3. ඇදහිලිවතුන්ගේ පසු ප්‍රතිචාර : 12:25-29
I. කිතුනු වගකීම් ඉටුකරන ලෙසට අවවාදයක් : 13:1-17
   1. සමාජ යුතුකම් : 13:1-6

a. සබඳතා සහෝදර ප්‍රේමය නොකඩවා තිබේවා : 13:1
b. ආගන්තුක සත්කාරය : 3:2
c. බැඳීම්වලින් සිටිනවුන් හා දුක්විඳිනවුන් සිහි කරන්න : 13:3
d. විවාහය : එය ගෞරවණීයය, එහෙත් අවකල් ක්‍රියා කරන්නන් හා කාමමිථ්‍යාචාරිකයන් දෙවියන්වහන්සේ විනිශ්චය කරන සේක : 13:4
e. සංවාදය : තෘෂ්ණාවෙන් යුක්තව කතා නොකරන්න : 13:5
f. අයත් දේ : ලත් පමණින් සතුටු වන්න : 13:5
g. දෙවියන්වහන්සේ ඔබට උපකාර කිරීමට සෑමවිටම ඔබ සමග සිටින බව මතකතබාගන්න : 13:5-6

2. ආගමික යුතුකම් : 13:7-17
   a. ඔබව පාලනය කරන අය සිහි කරන්න : 13:7
   b. යේසුස්වහන්සේ කිසිදා වෙනස් නොවන බව මතක තබාගන්න : 13:8
   c. අමුතු ඉගැන්වීම්වලින් මුළා නොවන්න : 13:9
   d. නීතිමය දේව ධර්මවල නොපැටලෙන්න : 13:9-12
   e. ශුභාරංචිය පිළිබඳ නින්දාව දරාගන්න : 13:13
   f. පැමිණෙන්ට තිබෙන නුවර සොයන්න : 13:14
   g. පැසසුම් පූජාවන් නොකඩවා කරන්න : 13:15
   h. යහපත කරන්න, සන්නිවේදනයේ යෙදෙන්න : 13:16
   i. ඔබේ නායකයන්ට කීකරු වී යටත් වන්න : 13:17

VII. පෞද්ගලික උපදෙස් : 13:18-25

A. යාච්ඤා කරන ලෙසට ඉල්ලීමක් : 13:18-19
   1. යහපත් හෘදය සාක්ෂියකට : 13:18
   2. අවංකව ජීවත්වීමේ කැමැත්ත සඳහා : 13:18
   3. ඉක්මනින් නිදහස්වන ලෙසට : 13:19
B. පාඨකයන් සඳහා යාච්ඤාවක් : 13:20-21
   1. අමතන තැනැත්තාට : 13:20
   2. ඉල්ලීම : 13:21
C. පණිවුඩය අසන ලෙසට අවවාදයක් : 13:22
D. තිමෝතියස්ගේ යෝජිත ගමන : 13:23
E. සමාප්තික ශුභ පැතුම් : 13:24
   1. ඔබ හා සියලු ශුද්ධවන්තයන් කෙරෙහි පාලනය ඇත්තන් වෙත
   2. ඉතාලියේ සිටින සියලුදෙනාගෙන්
F. ආශිර්වාදය : 13:25

## ස්වයං පරීක්ෂණය

1. හෙබ්‍රෙව් පොතේ කර්තෘ කවුරුන්ද?

2. හෙබ්‍රෙව් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. හෙබ්‍රෙව් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. හෙබ්‍රෙව් පොතෙහි ජිවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. හෙබ්‍රෙව් පොතෙහි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. හෙබ්‍රෙව් ඇතැම්විට පස්වන ශුභාරංචිය ලෙස හැඳින්වේ. මතෙව්, මාක්, ලූක්, යොහන් අවධාරණය කරන්නේ යේසුස්වහන්සේ මෙලොව සිටි කාලයේ සේවයත්, උන්වහන්සේගේ මරණය හා උත්ථාන වීමත් කෙරෙහිය. හෙබ්‍රෙව් පොත ස්වර්ගයෙහි උන්වහන්සේගේ වර්තමාන කටයුතු විස්තර කරයි.

2. හෙබ්‍රෙව් පොතෙහි අධ්‍යයනය කළ යුතු ප්‍රධාන වචන වඩා යහපත්, පරිපූර්ණ, සදාතන, සඳහටම, පංගුකාරයන්, ස්වර්ගය, පූජකයා, උත්තම පූජකයා.

3. පියාණන්වහන්සේ හා පුත්‍රයාණන්වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අතර ඉතා දිගු සංවාදයන් හෙබ්‍රෙව් පොතෙහි සඳහන් වේ. (1:5-13, 2:12-13, 10:5-9 බලන්න)

4. හෙබ්‍රෙව් 7-10 පරි. පැරණි ගිවිසුමේ මණ්ඩපයේ පරමාර්ථය පැහැදිලි කරයි.

5. බයිබලයේ ඇදහිල්ල පිළිබඳ ශ්‍රේෂ්ඨතම පරිච්ඡේදය හෙබ්‍රෙව් 11 වේ.

6. හෙබ්‍රෙව් 4:12 කියවන්න, මෙය බයිබලයේ සඳහන් දේව වචනය පිළිබඳ ඉතාමත් විශිෂ්ට විස්තරයකි.

7. මෙසියස්වහන්සේ (යේසුස්වහන්සේ) දේවදූතයන්ට වඩා උතුම් බව ඔප්පු කරන පහත දැක්වෙන පද අධ්‍යයනය කරන්න. ගීතා. 2:7, 104:4, 45:7-8, 102:26-28, 110:1, 2 සාමුවෙල් 7:14, ද්වි.නි. 32:43

8. හෙබ්‍රෙ. 4:14-7:28 අධ්‍යයනය කරන්න. යේසුස්වහන්සේ හා ආරොන් අතර පූජකත්වයේ වෙනස දක්වන්න.

9. හෙබ්‍රෙ. 8:1-10:18 හි විස්තර කර ඇති ගිවිසුම් දෙක අධ්‍යයනය කරන්න. පැරණි හා අලුත් ගිවිසුම් අතර වෙනස ලයිස්තුගත කරන්න.

10. මෙම පරිච්ඡේදයේ සැකිල්ලේ අනතුරු ඇඟවීම් පහක් දක්වා ඇත. මෙම අනතුරු ඇඟවීම් කොටස් අධ්‍යයනය කරන්න. සෑම එකකම විෂය හා අන්තර්ගතය සඳහන් කරන්න.

11. සීනයි කන්දෙහි ඉශ්‍රායෙල්වරුන්ගේ තත්වය හා සියොන් කන්දෙහි ඇදහිලිවතුන්ගේ තත්වය අතර වෙනස්කම් අධ්‍යයනය කරන්න. හෙබ්‍රෙව් 12:18-29

.

# දහහත්වන පරිච්ඡේදය

## යාකොබ්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- යාකොබ් පොතේ කර්තෘ නම් කිරීමට
- යාකොබ් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- යාකොබ් පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- යාකොබ් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යාකොබ් පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ :** යාකොබ්

**කවුරුන් වෙතද :** ඉශ්‍රායෙල්හි ගෝත්‍ර දොළොස අතර ඇදහිලිවතුන්ට

**පරමාර්ථය :** සිය ඇදහිල්ල වෙනුවෙන් දුෂ්කරතාවනට මුහුණ පා සිටින ඇදහිලිවතුන් සැනසීම සඳහා

**ප්‍රධාන පදය :** 2:26

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** ක්‍රියා සඳහා පදනම ඇදහිල්ල වේ.

**ප්‍රධාන චරිත :** යාකොබ්, ආබ්‍රහම්, ඊසාක්, රාහබ්, යෝබ්, එලියා

### සැකිල්ල

I. හැඳින්වීම : 1:1

  A. දෙවියන්වහන්සේගේත් යේසුස් ක්‍රිස්තුස් ස්වාමින්වහන්සේගේත් සේවකයෙකු වන යාකොබ් ගෙනි : 1:1
  B. ලොව පුරා විසිර සිටින ගෝත්‍ර දොළොස වෙතය : 1:1

II. දුක්විඳීම තුළ ඇදහිල්ල : 1:1-18

  A. දුක්විඳීම සඳහා ප්‍රතිචාරය : ප්‍රීතිය : 1:2
  B. දුක්විඳීමේ ප්‍රතිලාභ : 1:3-4
    1. ඉවසීම : 1:3
    2. පරිපූර්ණතාව : 1:4
    3. සම්පූර්ණත්වය : 1:4

C. දුක්විඳීම සඳහා නිවැරදි ප්‍රතිචාරය : 1:5
   1. දෙවියන්වහන්සේගේ ප්‍රඥාව : 1:5
      a. ප්‍රඥාවේ ප්‍රභවය : දෙවියන්වහන්සේ
      b. ප්‍රඥාව ලබාගත හැකිවීම : ඇදහිල්ලෙන් යුක්ත යාච්ඤාවෙන්
      c. ඇදහිල්ලේ අවශ්‍යතාව : සියලු මනුෂ්‍යයන් සඳහා
   2. ස්ථාවර ඇදහිල්ල : 1:6-7
      a. වැනෙන තැනැත්තා මුහුදු රැල්ලක් මෙනි : 1:6
      b. එබඳු මනුෂ්‍යයෙකුට ස්වාමින්වහන්සේගෙන් කිසිවක් නොලැබේ : 1:7
   3. සිතේ දෙගිඩියාවක් නොතිබීම : 1:8
   4. උසස් කරනු ලැබුවද පහත් කරනු ලැබුවද නිවැරදි ප්‍රතිචාරය : 1:9-11
      a. පීඩිත තත්වයක සිටින සහෝදරයා උසස් කරනු ලැබූ විට ප්‍රීති වෙයි : 1:9
      b. උසස් තත්වයක සිටින සහෝදරයා, ඔහු පහත් කළ බැවින් ප්‍රීති වන්නේය : 1:10
      c. ජීවිතයේ මෙවැනි මට්ටම් තාවකාලිකය. ඒවා තණ කොළ හා මල් මෙනි, ඒවා ප්‍රාණවත්ව තිබුණද හිරු නැගී ආ විට මැළ වේ : 1:10-11
D. දුක්විඳීමේ ආශිර්වාද : 1:12
   1. අප පරීක්ෂාවන් හා පීඩාවන් දරා සිටියහොත්, ස්වාමින්වහන්සේට ප්‍රේම කරන අයට උන්වහන්සේ පොරොන්දු වූ ජීවන කිරීටය ලැබෙනු ඇත.
E. පරීක්ෂාවන්ගේ ප්‍රභවය : 1:13-18
   1. දෙවියන්වහන්සේ නොවේ : 1:13
      a. දෙවියන්වහන්සේ නපුරෙන් පෙලඹවිය නොහැක : 1:13
      b. දෙවියන්වහන්සේ මිනිසා නපුරෙන් පොලඹවන්නේත් නැත : 1:13
   2. අප පරීක්ෂාවනට ලක් වන්නේ : 1:14-15
      a. අපගේ තෘෂ්ණාවෙන් මුළා වී පෙලඹුනු විටය : 1:14
      b. පිළිසිඳගත් තෘෂ්ණාව පාපය බිහි කරයි : 1:15
      c. පාපය මුහුකුරා ගොස් මරණය සිදු කරයි : 1:15
   3. අප තේරුම්ගත යුත්තේ : 1:16-18
      a. දෙවියන්වහන්සේ අපට දෙන්නේ යහපත් හා අගනා ත්‍යාග පමණි : 1:17
      b. දෙවියන්වහන්සේ : 1:17-18
         (1) ආලෝකයේ පියාණන්වහන්සේය : 1:17
         (2) උන්වහන්සේ තුළ වෙනස්වීමක් නැත : 1:17
         (3) උන්වහන්සේ තුළ ආපසු හැරීමක් නැත : 1:17
         (4) සත්‍ය වචනයෙන් අප ජනිත කළ තැනැන්වහන්සේ උන්වහන්සේය : 1:18
         (5) උන්වහන්සේ මැවූ සත්වයන් අතර අප ප්‍රථම ඵල වැන්නක් වීම උන්වහන්සේගේ කැමැත්ත වේ : 1:18

III. ක්‍රියාවේ යෙදෙන ඇදහිල්ල : 1:19-4:12

A. ඇදහිල්ල වෙනසක් ඇති කරයි : 1:19-21
   1. අප විය යුතු පුද්ගලයන් : 1:19-20
      a. සවන්දීමට ඉක්මන් වන්න : 1:19
      b. කතා කිරීමට පමා වන්න : 1:19
      c. කෝපවීමට පමා වන්න : 1:19-20

2. අප ඉවතලා යුතු දේ : 1:21
    a. අපවිත්‍ර දෙය
    b. දමනය කළ නොහැකි දුෂ්ටකම්
3. අපගේ ජීවිත තුළ අප පිළිගත යුතු දේ: දේව වචනය : 1:21

B. ඇදහිල්ල ඇසීම පමණක් නොවේ. කිරීමද වේ : 1:22-25
1. අප අසන්නන් පමණක් නම් අපි අපම රවටා ගනිමු : 1:22
2. කැඩපතකින් බලන මිනිසෙකු පිළිබඳ නිදසුන : 1:23-25
    a. අසන්නා සවන් දී ඒ පිළිබඳව කිසිවක් නොකරයි : 1:23-24
    b. කරන්නා වචනයට ප්‍රතිචාර දක්වයි : 1:25

C. දිව දමනය කරගැනීමෙන් ඇදහිල්ල පෙනේ : 1:26-27
1. අප භක්තිවන්ත බව පෙනුනත්, අපි දිව දමනය කර නොගනිමු නම් අප අපවම රවටාගන්නා අතර, ආගමෙන් වැඩක් නැත : 1:26
2. දෙවියන්වහන්සේ ඉදිරියේ පිරිසිදු භක්තිය : 1:27
    a. මව්පියන් නැති දරුවන් බලන්නට යෑම
    b. වැන්දඹුවන් බලන්නට යෑම
    c. ලෝකයෙන් කිලුටු නොවී ආරක්ෂා වීම වේ.

D. ඇදහිල්ල පුද්ගලයන්ගේ තරාතිරම නොබලයි : 2:1-13
1. දුප්පත්, පොහොසත් දෙගොල්ලන්ටම එක හා සමානව ගෞරව දැක්විය යුතුය : 2:1-4
2. දෙවියන්වහන්සේ තෝරාගන්නේ ලෝකයේ දුප්පතුන්ද, ඇදහිල්ලේ පොහොසතුන්ද, දේව රාජ්‍යයේ උරුමක්කාරයන්ද වේ : 2:5
3. පුද්ගලයන්ට ගෞරව කිරීම ලෝකයා ඉදිරියේ දුර්වල සාක්ෂියකි : 2:6-7
4. රාජනීතිය : ඔබට මෙන් ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න : 2:8
5. පුද්ගලයන්ගේ තරාතිරම බැලීම පාපයකි : 2:9
6. පාපය හා ව්‍යවස්ථාව : 2:10-13

E. ගැළවීම දෙනු ලබන ඇදහිල්ල : 2:14-26
1. ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි : 2:14-17
2. ඇදහිල්ල හා ක්‍රියා අතර සම්බන්ධය : 2:18
3. ඇදහිල්ල හා ක්‍රියාවන් සඳහා උදාහරණ : 2:20-25
    a. ආබ්‍රහම් : 2:21-24
    b. රාහබ් : 2:25
4. ආත්මය නොමැති ශරීරය මළ සිරුරක් වන සේම ක්‍රියා නැති ඇදහිල්ල මළ ඇදහිල්ලකි : 2:26

F. ඇදහිල්ල දිව දමනය කරයි : 3:1-13
1. දමනය කිරීමට ඉතා අසීරු දෙය දිව වේ : 3:1-2
2. ස්වභාවිකව දමනය කරන දේ පිළිබඳ නිදසුන් : 3:3-4
    a. අශ්වයාගේ කටකලියාව : 3:3
    b. නැවේ සුක්කානම : 3:4
3. දිවේ බලය : 3:5-12
    a. කුඩා වුවද දිවට මහත් බලයක් තිබේ : 3:5
    b. දිව ගින්නක් වැනිය. එය අපේ ශරීරය දල්වයි නැතහොත් දූෂණය කරයි : 3:6
    c. සියලුම සත්වයන් මිනිසාට දමනය කළ හැකිය. එහෙත් දිව දමනය කිරීමට මිනිසාට නුපුළුවන : 3:7-8
    d. සාප කරන්නට හෝ ආශිර්වාද කරන්නට හෝ දිව භාවිත කළ හැකිය : 3:9

e. සාප කිරීම හා ආශිර්වාද කිරීම එකම මුඛයෙන් නික්මවිය යුතු නැත : 3:10-12

f. දිව දමනය කිරීම මගින් ඇදහිල්ල හා යහපත් ක්‍රියා පෙන්නුම් කරයි : 3:13

G. ඇදහිලිවතුන් අතර ඇදහිල්ල හා භේද : 3:14-4:12

1. ඇදහිලිවතුන් අතර භේදයන් දෙවියන්වහන්සේගෙන් නොවේ : 3:14
2. ලෝකයේ ප්‍රඥාව : 3:15-16
   a. එහි විස්තරය : 3:15
      (1) ලෞකිකය
      (2) කාමුකය
      (3) යක්ෂයාගෙන්ය
   b. එහි ප්‍රතිඵල : 3:16
      (1) ඊර්ෂ්‍යාව
      (2) දබරය
      (3) ව්‍යාකුලය
      (4) සෑම නපුරු වැඩක්ම
3. දෙවියන්වහන්සේගෙන් ප්‍රඥාව : 3:17
   a. නිර්මලය
   b. සාමකාමීය
   c. සෞම්‍යය
   d. බැගෑපත්ය
   e. දයාවෙන් පූර්ණය
   f. යහපත් ඵලවලින් පූර්ණය
   g. පක්ෂවාදිකමක් නැත.
   h. කුහකකමක් නැත.
4. ඇදහිල්ල ධර්මිෂ්ඨකම හා සාමය ගෙන එයි : 3:18
5. බෙදීම් ඇතිවෙන්නේ තෘෂ්ණාවෙනි : 4:1-6
   a. එවැනි තෘෂ්ණාවන් යාච්ඤාවට බාධා කරයි : 4:2-3
   b. එය දෙවියන්වහන්සේ හා සමග සබඳතාවට බාධා කරයි : 4:5-6
6. බෙදීම් නිවැරදි කිරීම : 4:7-12
   a. දෙවියන්වහන්සේට යටත්වන්න : 4:7
   b. යක්ෂයාට විරුද්ධවන්න : 4:7
   c. දෙවියන්වහන්සේට ළං වන්න : 4:8
   d. ඔබවම පිරිසිදු කරගන්න, පවිත්‍ර කරගන්න : 4:8
   e. සැබෑ දුක හා පසුතැවිලි වීම පෙන්වන්න : 4:9
   f. යටහත් පහත් වන්න : 4:10
   g. අන් අය ගැන නපුර කතා නොකරන්න : 4:11
   h. අන් අය විනිශ්චය නොකරන්න : 4:11-12

IV. ඇදහිල්ල හා අනාගතය : 4:13-5:12

A. අනාගතය පිළිබඳව අපට සහතික විය නොහැකිය : 4:13-14

B. අනාගතය දන්නේ දෙවියන්වහන්සේ පමණි : 4:15

C. අනාගතය ගැන අපි පුරසාරම් දොඩමු නම් එය නපුරුය : 4:16-17

D. ධනවතුන්ගේ අනාගතය : 5:1-6

1. ඔවුන් දුක්ඛිත තත්වයන් අත්දකිනවා ඇත : 5:1

2. ධනවතුන් විනාශ වනු ඇත : 5:1-3
3. ඔවුන්ගේ වංචාවන් දෙවියන්වහන්සේ දකිනු ඇත : 5:4
4. ඔව්හු නපුරෙහි ජීවත් වූහ : 5:5-6
    a. සැප සම්පත්වල : 5:5
    b. ඔවුන්ගේ සිතේ හැටියට : 5:5
    c. සාධාරණ අයට ගරහමින් හා ඔවුන් මරාදමමින් : 5:6

E. අනාගතය සඳහා ඇදහිලිවතුන්ගේ සූදානම : 5:7-12
1. ස්වාමින්වහන්සේගේ පැමිණීම සඳහා ඉවසිල්ලෙන් සිටින්න : 5:7-8
2. ඔබගේ සිත් සනාථ කරගන්න : 5:8
3. අමනාපයන් සිත්හි තබා නොගන්න : 5:9
4. දිවැසිවරුන්ගේ පීඩාවිඳීම ඔබ අත්දකින පීඩාවන්වල ආදර්ශයක් ලෙස සිතන්න : 5:10
5. යෝබ් මෙන් ඔබත් ප්‍රීතියෙන් සිටින්න : 5:11
6. නොදිවුරන්න. එහෙත් ඔබ කියන දේ ඇත්තෙන්ම අදහස් කරන්න : 5:12

V. ඇදහිල්ල හා කිතුනු සබඳතා : 5:13-20

A. දුක්විඳි අයට ප්‍රතිචාර දක්වන්න : 5:13

B. ප්‍රීතියෙන් සිටින්නන්ට ප්‍රතිචාර දක්වන්න : 5:13

C. රෝගීන්ට ප්‍රතිචාර දක්වන්න : 5:14-15
1. සභාවේ මූලිකයන් කැඳවන්න : 5:14
2. ඔවුන් රෝගීන් තෙලින් ආලේප කොට ඔවුන්ට යාච්ඤා කෙරේවා : 5:14
3. ඇදහිල්ලෙන් පුදන යාච්ඤාවෙන් රෝගීන්ට සුවය ලැබේ : 5:15
4. ස්වාමින්වහන්සේ ඔවුන් නැගිටුවනු ඇත : 5:15
5. ඔවුන් පව්කර තිබේනම් ඒ පව් කමාකරනු ලැබේ : 5:15

D. අන් අයගේ වරද ගැන ප්‍රතිචාර දක්වන්න : 5:16-18
1. වරද ගැන එකිනෙකාට පාපොච්චාරණය කරන්න : 5:16
2. ඔබ සුවවීම ලබන පිණිස එකිනෙකාට යාච්ඤා කරන්න : 5:16
3. එලියා එවැනි ඵලදායි යාච්ඤාවන් ගැන ආදර්ශයකි : 5:16-18

E. වරදවලට ප්‍රතිචාර : 5:19-20
1. ඔහු හරවාගන්න : 5:19
2. ඔහුගේ ප්‍රාණය මරණයෙන් මුදාගන්න : 5:20
3. පව් රාශියක් සඟවන්න : 5:21

## ස්වයං පරීක්ෂණය

1. යාකොබ් පොතේ කර්තෘ කවුරුන්ද?

2. යාකොබ් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. යාකොබ් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. යාකොබ් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. යාකොබ් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ඉශ්‍රායෙල්හි ගෝත්‍ර දොළොස වෙත ලියන ලද නව ගිවිසුමේ එකම පොත යාකොබ් වේ. 1:1

2. යාකොබ්, තම පණිවුඩය පැහැදිලි කිරීමට පැරණි ගිවිසුමේ චරිත කීපයක්ම යොදා ගෙන ඇත.

    - ආබ්‍රහම් 2:21 රාහබ් 2:25 එලියා 5:17
    - ඊසාක් 2:21 යෝබ් 5:11
    -

3. යාකොබ් සිය පණිවුඩය පැහැදිලි කිරීමට ස්වභාවික නිදර්ශන කීපයක්ම භාවිත කරයි.

    - සුළඟින් කැළඹී නගින බසින මුහුදු රැල්ල 1:6
    - වියළී යන තණකොළ හා මැළවී යන මල් 1:10-11
    - ගින්දර 3:5
    - ජල උල්පතක් 3:11
    - අත්තික්කා හා ඔලීව 3:12
    - වැපිරීම හා අස්වැන්න නෙළීම 3:18
    - පළමු හා අන්තිම වර්ෂාව 5:7
    - ඉඩෝරය 5:17

4. නැවත නැවත පවසා ඇති දේ බලන්න: "ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි" 2:17,20,26. ශරීරය ප්‍රාණයෙන් වෙන් වූ විට එය දිරායයි. ඒ ආකාරයෙන්ම ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි. ඇදහිල්ල මනුෂ්‍යයා ධර්මිෂ්ට කරයි. ක්‍රියා, ඇදහිල්ල සාධාරණය කරයි.

5. යාකොබ් පොතේ පද 108 න් 60 ක්ම ප්‍රායෝගික කිතුනු ජීවිතය සඳහා ආඥාවන් වේ. මෙම ආඥා ලකුණු කර අධ්‍යයනය කරන්න.

6. යේසුස්වහන්සේගේ අර්ධ සොහොයුරෙකු වූ හා මේ ලිපියේ කර්තෘ වූ යාකොබ්ගේ ජීවිතය අධ්‍යයනය කරන්න. පහත දැක්වෙන යොමුවීම බලන්න.

    - මතෙව් 12:46-50
    - යොහන් 2:12, 7:1-9
    - ක්‍රියා 1:14, 12:17, 15:13, 21:18-26
    - 1 කොරින්ති 15:7
    - ගලාති 1:18-19, 2:1, 9-10

7. යාකොබ්ගේ ඉගැන්වීම් යේසුස්වහන්සේ විසින් දෙන ලද කන්ද උඩ දේශනාවේ අන්තර්ගතයට සමානය. පහත දැක්වෙන සටහන සම්පූර්ණ කරන්න.

| කන්ද උඩ දේශනාව | යාකොබ් | පොදු ඉගැන්වීමේ සාරාංශය |
|---|---|---|
| මතෙව් 5:48 | 1:4 | |
| මතෙව් 7:7 | 1:5 | |
| මාක්. 11:23 | 1:6 | |
| මතෙව් 7:24, 26 | 1:22 | |
| යොහනි 13:17 | 1:25 | |
| ලූක් 6:20 | 2:5 | |
| ලූක් 6:24-25 | 5:1 | |
| මතෙව් 7:1 | 4:11-12 | |
| මතෙව් 5:34-37 | 5:12 | |
| මතෙව් 7:16-20 | 3:12 | |

8. යාකොබ් 3:13-18 සාකච්ඡා කර ඇති ප්‍රඥාවන් දෙක සසඳන්න.

| ඉහළින් පැමිණෙන ප්‍රඥාව | ඉහළින් නොපැමිණෙන ප්‍රඥාව |
|---|---|

# දහඅටවන පරිච්ඡේදය

## පේතෘස් 1 හා 2

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- 1 හා 2 පේතෘස් පොත්වල කර්තෘ නම් කිරීමට
- මේ එක් එක් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- 1 හා 2 පේතෘස් පොත් සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- මේ සෑම පොතක් සඳහාම ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මේ සෑම පොතක් සඳහාම ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### 1 පේතෘස්

### හැඳින්වීම

**කර්තෘ :** පේතෘස්

**කවුරුන් වෙතද :** සිය කිතුනු ඇදහිල්ල නිසා පීඩනයට පත් විප්‍රවාසීන් වෙතය.

**පරමාර්ථය :** සභාවෙන් පිටත සිටින අයගෙන් සිදුවන පීඩනයන් ගැන අනතුරු ඇඟවීම,

**ප්‍රධාන පදය :** 1 පේතෘස් 4:12-13

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** පීඩාවනට ප්‍රතිචාරය ශුද්ධ ලියවිලි මූලධර්ම මත පදනම් විය යුතුය.

**ප්‍රධාන චරිත :** පේතෘස්, සිල්වානස්, මාක්

### සැකිල්ල

I. ශුභ පැතීම : 1:1-2

A. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයෙකු වන පේතෘස් ගෙනි : 1:1
B. විසිරී සිටින තෝරාගත් ජනතාවටය : 1:1
1. පොන්තස්
2. ගලාතිය
3. කපදෝසියාව

4. ආසියාව
5. බිතිනියාව

II. දුක් විඳීමේ සහනය හා යළි සහතික වීම : 1:3-25

A. ශුභාරංචියේ කරුණු පිළිබඳ යළි සහතික වීම : 1:3-12
  1. ගැළවීමේ ප්‍රභවය : 1:3
    a. දෙවි පියාණන්වහන්සේ විසින් තෝරාගත් අය
    b. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් මුදාගත් අය
    c. ආත්මයාණන් විසින් පාරිශුද්ධිකරණය කළ අය
  2. ගැළවීම පිළිබඳ විස්තරය : 1:3-5
    a. ජීවමාන බලාපොරොත්තුවකි : 1:3
    b. දූෂ්‍ය නොවන උරුමයකි : 1:4
    c. කිලුටු නොවූවකි : 1:4
    d. නොමැලවේ (සදාතනිකය) : 1:4
    e. ඇදහිල්ල මගින් ගැළවීම උදෙසා දෙවියන්වහන්සේගේ බලය කරණකොටගෙන ස්වර්ගයෙහි වෙන්කර සිටින අය : 1:5

B. දුක්විඳීමේ ප්‍රතිලාභ මත පදනම් වූ යළි සහතික කිරීම : 1:6-12
  1. පරීක්ෂාවන් තිබියදීත් ප්‍රීතිය : 1:6
  2. ප්‍රශංසාව, ගෞරවය හා මහිමය : 1:7
  3. යේසුස්වහන්සේ සමග සබඳතාව මත පදනම් වූ ප්‍රීතිය, ජීවිතයේ බාහිර අවස්ථාවන් මත නොවේ : 1:8
  4. ඇදහිල්ල පිළිබඳ සහතිකය : ආත්මය ගැළවීම : 1:9-12
    a. දිවැසිවරු විසින් සෙවිය : 1:9-10
    b. ඒවායේ ප්‍රභවය : ක්‍රිස්තුස්වහන්සේ : 1:11
    c. එහි සාරාංශය : 1:11-12
      (1) උන්වහන්සේගේ පළමු පැමිණීම හා දුක්විඳීම ඔව්හු කල්තියා පැවසූහ : 1:11
      (2) උන්වහන්සේගේ දෙවැනි පැමිණීම හා ඉන් පසු පැමිණිය යුතු මහිමය ඔව්හු කල්තියා පැවසූහ : 1:11
    d. මේ දේවල් දේවදූතයන්ද සෙවූහ : 1:12

C. දුක්විඳීම සඳහා කෙරෙන සුදුසු ප්‍රතිචාරය මත පදනම් වූ යළි සහතිකවීම : 1:13-17
  1. ඔබගේ සිත් නමැති කටි බැඳගන්න : 1:13
  2. අවදිව සිටින්න : 1:13
  3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීමේදී ඔබ වෙත පැමිණෙන්නට නියමිත වරප්‍රසාදය ගැන බලාපොරොත්තු වන්න : 1:13
  4. කීකරු දරුවන් මෙන් ප්‍රතිචාර දක්වන්න : 1:14
  5. පෙර තිබූ තෘෂ්ණාවලට අනුකූලව නොහැසිරෙන්න : 1:14
  6. ඔබ කැදෙව් තැනැන්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් ඔබද ශුද්ධව සිටින්න : 1:15-16
  7. ගරු කටයුතු, ඵලදායි ජීවිතයක් ගත කරන්න : 1:17

D. මිදීම මත පදනම් වූ යළි සහතික වීම : 1:18-25
  1. අප මුදනු ලැබුවේ දූෂිත වූ දේවලින් නොවේ : 1:18
  2. අප මුදනු ලැබුවේ ක්‍රිස්තුස්වහන්සේගේ අගනා ලේ වලිනි : 1:19-20
  3. දුක්විඳින කාලයේ දෙනු ලබන සහතිකය, උන්වහන්සේ සමග ඇති අපගේ මිදීමේ සබඳතාව මත පදනම් වේ : 1:21-23
  4. මිදීම පිළිබඳ මෙම සහතිකය, සදහටම පවතින උන්වහන්සේගේ වචනය මත පදනම් වන අතර එය ශුභාරංචියේ පදනම වේ : 1:24-25

III. දුක්විඳීම වෙනුවෙන් කිතුනුවන්ගේ ප්‍රතිචාරය : 2:1-3:13

A. පාපයට ප්‍රතිචාරය : 2:1
B. දෙවියන්වහන්සේගේ වචනයට ප්‍රතිචාරය : 2:2
C. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ට ප්‍රතිචාරය : 2:3-10
D. අපගේම ප්‍රතිචාරය : 2:11
E. ගැළවීම නොලැබුවන්ට ප්‍රතිචාරය : 2:12
F. සිවිල් නිලධාරීන්ට ප්‍රතිචාරය : 2:13-17
G. සේවකයන්ට ප්‍රතිචාරය : 2:18-20
H. කිතුනු ආදර්ශය මත පදනම් වූ ප්‍රතිචාරය : 2:21-25
I. පවුල සඳහා ප්‍රතිචාර : 3:1-12
   1. භාර්යාව : 3:1-6
   2. ස්වාමි පුරුෂයා : 3:7
   3. මුළු පවුලම : 3:8-12

IV. දුක්විඳීමේ හික්මවීම : 3:13-4:19

A. ධර්මිෂ්ඨකම සඳහා දුක්විඳීම ප්‍රීතිය හා නිදොස් හෘදය සාක්ෂියක් ගෙන දෙයි : 3:13-17
B. දුක්විඳීම පව්කාරයන් යුක්ති සහගත කරයි : 3:18-22
C. දුක්විඳීම ඔබ යේසුස්වහන්සේගේ ආදර්ශයට සමාන කරයි : 4:1-6
D. දුක්විඳීම යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම බලාපොරොත්තු වෙයි : 4:7
E. දුක්විඳීම ආත්මික ගුණාංග වර්ධනය කරයි : 4:8-11
   1. ප්‍රේමය : 4:8
   2. පාපය සඳහා කමාව : 4:8
   3. ආගන්තුක සත්කාරය : 4:9
   4. දීමනාවන් හා සේවාවන්හි විශ්වාසි ගබඩාකාරයන් වීම : 4:10-11
F. දුක්විඳීම අනාගත ප්‍රතිලාභ ගුණිත කරයි : 4:12-13
G. දුක්විඳීම ස්වාමින්වහන්සේ තේජාන්විත කරයි : 4:14-16
H. දුක්විඳීම ශුද්ධවන්තයන් පවිත්‍ර කරයි : 4:17-19

V. දුක්විඳීම කෙරෙහි ඇදහිලිවන්තයෙකුගේ ප්‍රතිචාර පිළිබඳ සාරාංශය : 4:19

VI. දුක්විඳීම් තිබියදීත් අඛණ්ඩව සේවය කරන්න : 5:1-9

A. එඬේරෙකු මෙන් සේවය කරන්න. සභාවේ මූලිකයෝ : 5:1-4
   1. දෙවියන්වහන්සේගේ රැළ පෝෂණය කරන්න : 5:2
   2. බලකිරීමක් නිසා නොව සතුටු සිතින් එසේ කරන්න : 5:2
   3. මූල්‍යමය ප්‍රතිලාභ නිසා සේවය නොකරන්න : 5:2
   4. සූදානම් මනසකින් සිටින්න : 5:2
   5. රැළ කෙරෙහි ආධිපත්‍යයක් නොපා ආදර්ශයක් වන්න : 5:3
   6. ප්‍රධාන එඬේරාණන්ගේ ප්‍රතිලාභ : 5:4
B. සේවකයන් මෙන් සේවය කිරීම: තරුණ හා වැඩිහිටි දෙගොල්ලන්ම : 5:5-7
   1. තරුණයෙනි, වැඩිහිටියන්ට යටත්වන්න : 5:5
   2. එකිනෙකාට යටත්වන්න : 5:5
   3. නිහතමානී වන්න : 5:5-6

a. දෙවියන්වහන්සේ උඩඟු අයට විරුද්ධ යටහත් අයට කරුණාව දක්වන සේක : 5:5

b. අප යටහත් වුවහොත් අපව උසස් කෙරේ : 5:6

4. ඔබගේ හැම කරදරයක්ම උන්වහන්සේට භාරදෙන්න: මන්ද උන්වහන්සේ ඔබ ගැන සලකන සේක : 5:7

C. හමුදා භටයෙකු මෙන් සේවය කිරීම : 5:8-9

1. සතුරා: යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලගම්දෝයි සොයයි : 5:8

2. හමුදා භටයෙකුගේ ආකල්ප : 5:8

a. අප සිහි ඇතිව සිටිය යුතුව : 5:8

b. අප අවදිව සිටිය යුතුය : 5:8

3. සතුරාට විරුද්ධ උපක්‍රම : 5:9

a. ඇදහිල්ලෙන් විරුද්ධ විය යුතුය : 5:9

b. අප තනිවම නොවන බව දැනගන්න: ලොව පුරා සිටින සහෝදරයන් අතරද එම දුක් කරදරම තිබේ : 5:9

VII. සමාප්තිය : 5:10-14

A. ආශිර්වාදනය : 5:10-11

1. යේසුස්වහන්සේ තුළ දුක්විඳීමේ ප්‍රතිලාභ : ඔබ : 5:10

a. පරිපූර්ණ වේ

b. ස්ථිර කෙරේ

c. ශක්තිමත් කෙරේ

d. තහවුරු කෙරේ

2. දෙවියන්වහන්සේට සදහටම මහිමය හා ආධිපත්‍යය වේවා : 5:11

B. පෞද්ගලික ශුභපැතුම් : 5:12-14

1. සිල්වානස් : 5:12

2. බබිලෝනියේ ඇති සභාව : 5:13

3. මාගේ පුත්‍ර මාක් : 5:13

4. සිඹීමකින් එකිනෙකාට ආචාර කරන්න : 5:14

5. යේසුස්වහන්සේ තුළ සිටින අයට සමාදානයේ අවසාන ආශිර්වාදය : 5:14

## 2 පේතෘස්

## හැඳින්වීම

**කර්තෘ :** පේතෘස්

**කවුරුන් වෙතද:** විප්‍රවාසීව සිටින කිතුනුවන්ට, ඇතැම් විට 1 පේතෘස් හි සඳහන් කණ්ඩායමටම විය හැකිය.

**පරමාර්ථය :** ඇතුළතින් එන අන්තරාවන් ගැන අනතුරු ඇඟවීමට: භක්තිය හැර යාම හා ව්‍යාජ ඉගැන්වීම්

**ප්‍රධාන පදය :** 3:1-2

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** ඇතුළතින් පැමිණෙන ප්‍රධානතම අන්තරාවන් දෙක වන්නේ භක්තිය හැරයාම හා ව්‍යාජ ඉගැන්වීම් වේ.

**ප්‍රධාන චරිත :** පේතෘස්තුමා, පාවුලුතුමා

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-2

A. සේවකයෙකු හා ප්‍රේරිතවරයෙකු වන පේතෘස්ගෙනි : 1:1
B. අනර්ඝ ඇදහිල්ලක් ලැබූ අය වෙත : 1:1
C. දෙවියන්වහන්සේ හා යේසුස්වහන්සේ දැනගැන්ම තුළින් කරුණාව හා සමාදානය වැඩිවේවා : 1:2

II. භක්තිය හැරයාම හා ව්‍යාජ ගුරුවරුන් අභිමුවෙහි දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීම : 1:3

III. දෙවියන්වහන්සේගේ පොරොන්දු : 1:4
A. ජීවිතය
B. භක්තිවන්තකම
C. දැනගැන්ම
D. මහිමය
E. යහපත්කම

IV. දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්ති : 1:5-9

A. උද්යෝගයෙන් යුක්තව වැඩි වර්ධනය වීම : 1:5
B. සඳහන් කර ඇති ප්‍රතිපත්ති : 1:5-7
1. ඇදහිල්ල : 1:5
2. යහපත්කම : 1:5
3. දැනගැන්ම : 1:5
4. ආත්ම දමනය : 1:6

5. ඉවසීම : 1:6
6. දේව භක්තිය : 1:6
7. සහෝදර ස්නේහය : 1:7
8. ප්‍රේමය : 1:7

C. මෙම ප්‍රතිපත්තිවල ඇති වටිනාකම : ඒවා ඔබ : 1:8
1. ආත්මිකව බහුල කෙරේ.
2. යේසුස්වහන්සේ දැනගැන්මෙහි ලා ඵලදායි වේ.

D. එවැනි ප්‍රතිපත්ති නොමැති වීමේ ගැටලු : 1:9
1. ආත්මික දැක්මක් නැත.
2. ආත්මික මතකයක් නැත

V. දෙවියන්වහන්සේගේ කැඳවීම : 1:10-12

A. එය තහවුරු කිරීමට උද්යෝගිමත් වන්න : 1:10
B. ඔබ මේවා කරන්නෙහි නම් ඔබ කිසිදා අසාර්ථක නොවේ : 1:10
C. සදාතන රාජ්‍යයට ඇතුළුවීම ඔබට සහතික කෙරේ : 1:11
D. ඔබ සත්‍යයේ තහවුරු කෙරෙනු ඇත : 1:12

VI. දෙවියන්වහන්සේගේ ප්‍රේරිතයාට එළිදරව් වීම: මෙම “කූඩාරමක් නැති ශරීරය”නොබෝ කලකින් ඔහු අත්හරිනු ඇත : 1:13-15

VII. දෙවියන්වහන්සේගේ වචනය : 1:16-21

A. ගෙතූ ප්‍රබන්ධ මත පදනම් වූවක් නොව, මෙය ඇස්වලින් දුටු විස්තරයකි : 1:16
B. ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යත්වය මත පදනම් වූවකි : 1:17
C. දිවැසිවරුන්ගේ ස්ථිර වචනය මත පදනම් වූවකි : 1:19
D. පෞද්ගලික අර්ථ නිරූපණ මත පදනම් වූවා නොවේ : 1:20
E. ශුද්ධාත්මයාණන්වහන්සේගේ පෙලඹවීම මත පදනම් වූවකි : 1:21

VIII. ව්‍යාජ ගුරුවරුන්ට විරුද්ධව අනතුරු ඇඟවීම : දෙවියන්වහන්සේගේ සතුරන් විසින් මෙම මූලධර්මවලින් (ඉහත II සිට VII දක්වා ඇති කරුණු ) ඈත් කිරීම : 2:1-3:4

A. සතුරන්ගේ අනන්‍යතාව : 2:1-9
1. වර්තමාන දවස්වල : ව්‍යාජ ගුරුවරුන් : 2:1-3
2. පෙර දවස්වල : 2:1-9
   a. ව්‍යාජ දිවැසිවරු : 2:1
   b. දුෂ්ට දේවදූතයෝ : 2:4
   c. නෝවාගේ කාලයේ ජීවත්වූවෝ : 2:5
   d. ලොත්ගේ කාලයේ ජීවත්වූවෝ : 2:6-9

B. දෙවියන්වහන්සේගේ සතුරන් පිළිබඳ විස්තරය (ව්‍යාජ ගුරුවරුන්) : 2:1-3, 10-19
1. විනාශකාරී අසත්‍ය ධර්ම ගෙන ඒම : 2:1
2. ස්වාමින්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම : 2:1
3. විනාශදායක මාර්ග තිබීම : 2:2
4. සත්‍ය මාර්ගය අපකීර්තියට පැමිණවීම : 2:2
5. තණ්හාව තිබීම : 2:3
6. වංචනික වචන කතා කිරීම : 2:3

7. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් වෙළඳ බඩු බවට පත් කිරීම : 2:3
8. ශාරීරික ලෙස අපිරිසිදුකමේ තෘෂ්ණාව අනුව හැසිරෙයි : 2:10
9. ආධිපත්‍යයට අපහාස කිරීම : 2:10
10. බිය සැක නැති : 2:10
11. ස්වයං-කැමැත්ත තිබීම : 2:10
12. උත්තමයන්ට විරුද්ධව නපුර කතා කිරීම : 2:10-13
    a. දේවදූතයන් වුවද එසේ නොකරන බව ඔව්හු නොසිතති : 2:11
    b. නොදන්නා දේ ගැනද ඔව්හු නපුර කතා කරති : 2:12
    c. මේ නිසා ඔව්හු ඔවුන්ගේ දූෂිත දෙයින් පිරිහී අධර්මිෂ්ඨකමේ ප්‍රතිලාභ ලබති : 2:12-13
13. කැළැල් හා පළුදු : 2:13
14. සහභාගිත්වයේ රැවටිලිකාර සාමාජිකයෝ : 2:13
15. කාමුක බැල්මෙන් පිරි ඇස් : 2:14
16. පාපාශාවන්ට තෘප්තියක් නැත : 2:14
17. දුබලයන් වරදට පෙලඹවති : 2:14
18. තණ්හාවට ඇබ්බැහි වුවන්ට : 2:14
19. ශාපලත් දරුවෝ : 2:14
20. බාලාම්ගේ වැරදි මාර්ගයේ යෑමට නිවැරදි මාර්ගය හැර දැමීම : 2:15-16
21. වතුර නැති ළිං : 2:17
22. සැඩ සුළඟින් ගසාගෙන යන වලාකුළු : 2:17
23. ඔවුන්ට සදාකාලයේ අන්ධකාරයෙහි ස්ථානයක් වෙන්කර ඇත : 2:17
24. අහංකාර නිෂ්ඵල වචන කතා කරති : 2:18
25. ඔවුන්ගේ කාමාශාවේ හා නොදැමුණුකමේ ඉලක්කය වන්නේ වරදින් ගැළවුනු අයය : 2:18
26. දූෂ්‍යකමට වහල්ව සිටින මොවුහු අන්‍යයන්ට නිදහස දීමට පොරොන්දු වෙති : 2:19

C. සතුරන්ගේ ඉරණම : 2:20-22
1. පළමු ස්වභාවට වඩා අන්තිම ස්වභාව භයානකය : 2:20
2. ඔවුන් ධර්මිෂ්ඨ මාර්ගය නොදැන සිටීම, එය දැන ඉන් හැරී යාමට වඩා යහපත්ය : 2:21
3. ඔවුන් වමනයට හැරී එන බල්ලන් වැනිය, මඩවතුරට ආපසු පැමිණෙන ඌරී වැනිය : 2:22

IX. භක්තිය හැරයාමට විරුද්ධ අනතුරු ඇඟවීම : 3:1-18

A. භක්තිය හැරයාමේ නිර්වචනය : 3:1-4
1. දිවැසිවරුන් විසින් පෙර කීම : 3:1-2
2. භක්තිය හැර යාම යනු යේසුස්වහන්සේගේ නැවත පැමිණීමේ පොරොන්දු ගැන සරදම් කිරීම වේ : 3:4

B. භක්තිය හැරයාමට පිළිතුරක් : දෙවියන්වහන්සේ අතීත, වර්තමාන, හා අනාගත ලෝකය සමග කටයුතු කිරීම වේ : 3:5-13
1. සරදම් කරන්නන් සිටියදීත් පැරණි ලෝකයේ විනාශය සිදුවිය : 3:5-6
2. වර්තමාන ලෝකයේ අනාගත විනාශය පැමිණෙනු ඇත : 3:7-8, 10
3. දෙවියන්වහන්සේට උන්වහන්සේගේ සැලැස්ම ඉටුකිරීමට උන්වහන්සේගේම කාල සටහනක් ඇත : 3:8
4. දෙවියන්වහන්සේගේ සැලැස්මේ වැදගත්ම කරුණ වන්නේ විනාශ වන්නාවූ ආත්ම ගළවාගැනීම මිස අනාගත සිද්ධීන්හි කාලය නොවේ : 3:9

5. ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ කරන "ස්වාමින්වහන්සේගේ දවස" බලාපොරොත්තු නොවූ අවස්ථාවක පැමිණෙනු ඇත : 3:10
6. අලුත් මැවීමත් සමග උන්වහන්සේගේ සැලැස්ම මුදුන්පත් වේ : 3:13

C. භක්තිය හැරයෑම ඉදිරියේ ඇදහිලිවන්තයාගේ ප්‍රතිචාරය : 3:14-18

1. උන්වහන්සේ සමග සමාදානයෙන් සිටීම : 3:14
2. නොකැළැල්ව : 3:14
3. නිදොස්ව : 3:14
4. දෙවියන්වහන්සේගේ සැලැස්ම මුදුන්පත් කිරීම පමා වන්නේ නොගැළවුනු අය කෙරෙහි උන්වහන්සේගේ ඇති දයාව නිසා බව මතක තබාගන්න : 3:15-16
5. පරෙස්සම් වන්න මන්ද ඔබ නපුරාගේ දුර්මතවලින් මුළාවී වැටෙන්නට පුළුවන : 3:17
6. කරුණාවෙහි වර්ධනය වන්න : 3:18
7. ස්වාමින්වහන්සේ ගැන දැනගැන්මෙහි වර්ධනය වන්න : 3:18

X. සමාප්තිය : 3:18

## ස්වයං පරීක්ෂණය

1. 1 හා 2 පේතෘස් පොත්වල කර්තෘ කවුරුන්ද?

2. 1 පේතෘස් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. 1 පේතෘස් පොත ලියාන ලද්දේ කවුරුන් වෙතද?

4. 1 පේතෘස් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. 1 පේතෘස් පොතේ ප්‍රධාන පදය මතකයන් ලියන්න.

6. 2 පේතෘස් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

7. 2 පේතෘස් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

8. 2 පේතෘස් පොතේ ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

9. 2 පේතෘස් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 1 හා 2 පේතෘස් පොත් කියවා අනර්ඝ ලෙස සටහන් කර ඇති සෑම දෙයකම ලයිස්තුවක් සකස් කරන්න.

2. 1 පේතෘස් පොත කියවා දුක්විඳීම හා අනුග්‍රහය යන වචන සෑම එකක්ම භාවිත කර ඇති තැන් යටින් ඉරක් අඳින්න. ඒවා ප්‍රධාන වචන වේ.

3. 1 පේතෘස් හි ඇදහිලිවතුන් විස්තර කෙරෙන නම් බොහෝමයක් ඇත. පහත දැක්වෙන පද කියවා එම නම් ලයිස්තු ගත කරන්න. 1:14, 2:2, 2:5, 2:9 (එකිනෙකට වෙනස් නම් හතරක් ඇත) 2:11, 4:16, 4:18, 1:2, 2:10, 4:11, 5:2

4. පේතෘස්තුමාගේ ජීවිතය, ශුභාරංචි පොත්වල හා ක්‍රියා පොතේ අධ්‍යයනය කරන්න.

5. කිතුනු ජීවිතයේ ජීවමාන සත්‍යතාවන් සඳහන් කරන්න.
   - ජීවමාන බලාපොරොත්තුව 1:3, - ජීවමාන වචනය 1:23, - ජීවමාන ගල 2:4

6. 1 පේතෘස් පොතේ, පැරණි ගිවිසුමේ උද්ධෘත පාඨ බොහෝමයක් භාවිත කර තිබේ. පහත දැක්වෙන ඒවා සංසන්දනය කරන්න.

| පැරණි ගිවිසුමේ සඳහන | පේතෘස්ගේ උපුටා ගැනීම |
|---|---|
| යෙසායා 28:16 | 1 පේතෘස් 1:6 |
| ගීතාවලිය 118:22 | 1 පේතෘස් 1:7 |
| යෙසායා 8:14 | 1 පේතෘස් 1:8 |

7. 1 පේතෘස් 2:9-10 අධ්‍යයනය කරන්න. ගැළවීම ලැබීමට පෙර හා පසු ඇදහිලිවතුන්ගේ ජීවිත සසඳන්න.

| ගැළවීම ලැබීමට පෙර | ගැළවීම ලැබූ පසු |
|---|---|
| ________ ඔබ කැඳවාගත් | ________ වන්නහුය |
| වරක් නුඹලා ___________ | දැන් ඔබ _________ |
| ________ නොලැබ | දැන් ලැබ |

8. 2 පේතෘස් පොතෙන්, අභක්තික මිනිසුන්ගේ හෝ ව්‍යාජ ගුරුවරුන්ගේ හෝ ගති ලක්ෂණ ලයිස්තුවක් සකස් කරන්න. යූද් පොතේ සඳහන් ලයිස්තුව හා සැසඳීමට මෙය තබාගන්න.

9. 2 පේතෘස් 1:5 10 ත්, ඇදහිලිවතුන් සිය ජීවිතවලට එක් කරගත යුතු ගුණාංග ලයිස්තුගත කරන්න.

10. ස්වාමින්වහන්සේගේ දවස (2 පේතෘස් 3:10) විනිශ්චයේ දවස (2 පේතෘස් 3:7) හා සසඳන්න.

# දහනවවන පරිච්ඡේදය

## 1,2 හා 3 යොහන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- 1,2 හා 3 යොහන් පොත්වල කර්තෘ නම් කිරීමට
- මේ සෑම පොතක්ම ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- සෑම පොතක් සඳහාම පරමාර්ථය සඳහන් කිරීමට
- සෑම පොතකම ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සෑම පොතක් සඳහාම ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

### සමස්ත විග්‍රහය

මෙම පරිච්ඡේදය තුළ ඔබ පොත් තුනක් අධ්‍යයනය කරනු ඇත. එම පොත් 1,2 හා 3 යොහන් වේ. මෙම සියලුම පොත් ලියා ඇත්තේ සෙබදීගේ පුත් යොහන් වේ (මතෙව් 4:21). ඔහු යේසුස්වහන්සේගේ ප්‍රේරිතවරයෙකි (මතෙව් 10:2). යොහන් ශුභාරංචියද එළිදරව් පොතද ලියන ලද්දේ යොහන් විසිනි. ඔබ දැනටමත් යොහන් ශුභාරංචිය අධ්‍යයනය කර ඇත. එළිදරව් පොත මෙම පාඨමාලාවේ අවසාන අධ්‍යයනය වේ. යොහන් විසින් ලියන ලද පොත් එළිදරව්වීම වැඩි වන වර්ධන සැලසුමකට එකිනෙකට සම්බන්ධ වේ.

### යොහන් විසින් ලියන ලද පොත්

**යොහන් ශුභාරංචිය**

ගැළවීම ගැන කතා කරයි
අතීතය ගැන කටයුතු කරයි
යේසුස්වහන්සේ දිවැසිවරයෙකු ලෙස ඉදිරිපත් කරයි
ඇදහිලිවතුන්ගේ ජීවිත තුළ ඇති කුරුසිය පිළිබඳව වේ.

**යොහන්ගේ හසුන් (1,2 හා 3 යොහන්)**

පාරිශුද්ධිකරණය පිළිබඳ කතා කරයි
වර්තමානය ගැන කටයුතු කරයි
යේසුස්වහන්සේ අපගේ පූජකවරයා ලෙස ඉදිරිපත් කරයි
ඇදහිලිවතුන්ගේ සහභාගිත්වය පිළිබඳව වේ.

**එළිදරව්ව**

මහිමවත් කිරීම ගැන කතා කරයි
අනාගතය ගැන කටයුතු කරයි
යේසුස්වහන්සේ රජතුමෙකු ලෙස ඉදිරිපත් කරයි.
ඇදහිලිවතුන් බලා සිටින කිරුළ පිළිබඳව වේ.

# 1 යොහන්

## හැඳින්වීම

**කර්තෘ :** යොහන්

**කවුරුන් වෙතද :** සාතනික රැවටිලිවලට අසුවන කිතුනුවන් වෙතය. එමගින් දෙවියන්වහන්සේ සමගත් අන් අය සමගත් ඇති ඔවුන්ගේ සහභාගිකම බිඳ වැටේ.

**පරමාර්ථය :** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සැබෑ සහභාගිකත්වයේ ප්‍රමිතීන් පැහැදිලි කිරීම.

**ප්‍රධාන පදය :** 1 යොහන් 1:8-9

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** දෙවියන්වහන්සේ සමග හා සහෝදර ඇදහිලිවතුන් සමග සැබෑ සහභාගිකත්වය පදනම් වන්නේ දෙවියන්වහන්සේගේ වචනයේ ප්‍රමිතීන් මත වන අතර එය පවත්වාගෙන යනු ලබන්නේ පව් පාපොච්චාරණය කිරීමේ මූලධර්මය මත වේ.

**ප්‍රධාන චරිත :** කර්තෘ යොහන් මිස වෙන කිසිවෙකු නමින් සඳහන් නොවේ.

## සැකිල්ල

I. හැඳින්වීම : 1:1-4

A. යොහන් ලියන්නේ ඔහුගේ ඇස්වලින් ඔහු දුටු, ඔහු බලන ලද හා අත්වලින් ස්පර්ශ කළ ජීවනයේ වාක්‍යාණන් ගැනය. ඔහු පළමු පෙළේ අත්දැකීම්වලින් ලියයි : 1:1

B. ඔහු ලියන සහභාගිකම, දෙවියන්වහන්සේ සමගත් එකිනෙකා සමගත් ඇදහිලිවතුන්ගේ ඇති සැබෑ සහභාගිකම වේ : 1:2-3

C. මෙම විෂය පිළිබඳව ඔහු ලියන පරමාර්ථය, මෙම සහභාගිකම තුළ තහවුරු වීම මගින් ඔවුන්ගේ ප්‍රීතිය සම්පූර්ණ වීම වේ : 1:4

II. යේසුස්වහන්සේ තුළ සැබෑ සහභාගිකම් සඳහා කොන්දේසි : 1:5-10

A. දෙවියන්වහන්සේගේ වචනයේ ප්‍රමිතියට අනුකූලතාව : 1:5-7

B. පව් පාපොච්චාරණය කිරීම : 1:8-10

III. ඇදහිලිවතුන් සමග සැබෑ සහභාගිකමක් ඇති අයගේ නිවැරදි හැසිරීම : 2:1-29

A. නිවැරදි හැසිරීමේ ගති ලක්ෂණය වන්නේ යේසුස්වහන්සේ විසින් දෙන ලද ආත්මික ආදර්ශය අනුකරණය කිරීම වේ : 2:1-11

1. අනුකරණය කිරීමේ මූලධර්මය : 2:1-2
2. අනුකරණය කිරීම සඳහා රටාව : 2:3-6
3. නිවැරදි අනුකරණයේ සාක්ෂිය : 2:7-11

B. හැසිරීම පදනම් වී ඇති ආඥාව වන්නේ වෙන්වීම වේ : 2:12-17

1. ආඥාව දෙනු ලබන ඇදහිලිවතුන් අතර ආත්මික පරිණතභාවයේ සියලුම මට්ටම්වල සිටින අය අන්තර්ගතය : 2:12-24
2. ආඥාව ලෞකික බවින් වෙන්වීම වේ : 2:15-17

C. අපගේ හැසිරීම සඳහා ඇදහිලි ප්‍රකාශය : 2:18-29
  1. ඇදහිලි ප්‍රකාශයක අවශ්‍යතාව : 2:18-21
  2. ඇදහිලි ප්‍රකාශයේ ස්වභාවය : 2:22-29

IV. සැබෑ කිතුනු සහභාගිකමේ ගති ලක්ෂණ : 3:1-24

A. පවිත්‍රතාව : 3:1-3
B. ධර්මිෂ්ඨකම හා ප්‍රේමය : 3:4-18
C. විශ්වාසය : 3:19-21
D. කීකරුකම : 3:22-24

V. ඇදහිලිවතුන්ගේ සැබෑ සහභාගිකමේ සතුරෝ : 4:1-21

A. ව්‍යාජ දිවැසිවරු : 4:1-6
  1. ඔවුන් හඳුනාගන්නේ කෙසේද? : 4:2-3
  2. ඔවුන් ජයගන්නේ කෙසේද? : 4:4
  3. ඔවුන් මේ ලෝකයට අයිතිය : 4:5
  4. අප දෙවියන්වහන්සේට අයිතිය : 4:6
B. ප්‍රේමයේ ආත්මයක් පිළිබඳ ව්‍යාජ ප්‍රකාශය : 4:7-21
  1. පරිපූර්ණ ප්‍රේමය විස්තර කෙරේ : 4:7-17
  2. පරිපූර්ණ ප්‍රේමය හා ප්‍රේමයේ ආත්මයක් පිළිබඳ ව්‍යාජ ප්‍රකාශය අතර වෙනස දක්වයි : 4:18-21

VI. සැබෑ සහභාගිකම පවත්වාගෙන යෑමට හේතුව : 5:1-21

A. යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඔප්පු කෙරෙන්නේ අප ප්‍රදර්ශනය කරන හැසිරීම මගිනි : 5:1-5
B. යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඔප්පු කෙරෙන්නේ අප ප්‍රදර්ශනය කරන සාක්ෂි මගිනි : 5:6-12
  1. සාක්ෂි සඳහා සාධක : 5:6-8
  2. සාක්ෂිවල බලපෑම : 5:9-12
C. යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඔප්පු කෙරෙන්නේ අප ප්‍රදර්ශනය කරන විශ්වාසය මගිනි : 5:13-15
D. යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඔප්පු කෙරෙන්නේ පාපය පරාජය කිරීමෙනි : 5:16-21

# 2 යොහන්

## හැඳින්වීම

**කර්තෘ :** යොහන්

**කවුරුන් වෙතද:** "දෙවියන්වහන්සේ තෝරාගත් මාතාවත් ඇගේ දරුවනුත් වෙත"වේ. ඉන් අදහස් වන්නේ සභාව හා එහි සාමාජිකයන් වේ. (සැමවිටම සභාව අමතන්නේ ස්ත්‍රී ලිංගයෙනි, මන්ද ඇය ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය ලෙස හැඳින්වේ)

**පරමාර්ථය :** සත්‍ය ධර්මයට විශ්වාසීවන්ත වන ලෙස ඇදහිලිවතුන්ට අවවාද කිරීමට හා ව්‍යාජ ගුරුවරුන් ගැන අනතුරු ඇඟවීමට වේ.

**ප්‍රධාන පදය :** 2 යොහන් 1:9
**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** අප වර්ධනය කරගත්තාවූ ආත්මික ගුණාංග නැති කරගැනීමට හා ඔවුන්ගේ නපුරෙහි පංගුකාරයන් වීමට අප පොලඹවන ව්‍යාජ ගුරුවරුන්ගෙන් අප ආරක්ෂා විය යුතුය.

**ප්‍රධාන චරිත :** යොහන්

## සැකිල්ල

I. හැඳින්වීම : ශුභ පැතුම් : 1-3

A. වැඩිහිටියෙකු වූ යොහන්ගෙනි : 1
B. සැබෑවෙහි ප්‍රේම කරන්නාවූ තෝරාගත් ස්වාමිදුවත් ඇගේ දරුවනුත් වෙතය : 1-2
C. ඔහු දෙවි පියාණන්වහන්සේගෙන් හා පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් එවන්නේ
   1. කරුණාව
   2. දයාව
   3. සාමය වේ

II. ප්‍රේම කිරිමට අවවාද : 4-6

A. සත්‍යයෙහි හැසිරෙන්න : 4
B. ප්‍රේමයෙහි හැසිරෙන්න : 5
C. උන්වහන්සේගේ ආඥාවන්හි හැසිරෙන්න : 6

III. ව්‍යාජ ධර්මයට හා ව්‍යාජ ඉගැන්වීම්වලට විරුද්ධව අනතුරු ඇඟවීම : 7-11

A. ව්‍යාජ ගුරුවරුන්ගේ ප්‍රකාශනයන් : 7
B. ව්‍යාජ ගුරුවරුන් විශ්වාස කිරීමේ ඵලවිපාක : 8-9
   1. ඔවුන්ගේ ජීවිත තුළ කලින් ලබාගත් ආත්මික දේ නැතිවීම : 8
   2. ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මය තුළ ජීවත් නොවීමෙන් පව් කිරීම : 9
   3. ඔවුන්ගේ ක්‍රියාවල පංගුකාරයන් වීම : 10-11

IV. සමාප්තිය : 12-13

A. යොහන් ඔවුන් වෙත ලිවීමට බොහෝ දේ ඇත. ඒ වෙනුවට ඔවුන් හමුවීමට පැමිණීමට බලාපොරොත්තු වේ : 12
B. යොහන් සහෝදර සභාවක සාමාජිකයන්ගේ ශුභ පැතුම් යවයි : 13

## 3 යොහන්

## හැඳින්වීම

**කර්තෘ :** යොහන්

**කවුරුන් වෙතද :** මෙම පොත යොමු කර ඇත්තේ ගායස් නමැති කෙනෙකුට වේ. මෙය ඔහුටත් ඔහු හා සම්බන්ධ සභාවටත් ලියා ඇත. බයිබලය ඔහු පිළිබඳව තවත් තොරතුරු සපයා නැති බැවින් ඔහු කව්දැයි හැඳිනගැනීමට මගක් නොමැත. මෙම ලිපියේ සත්‍යය සියලුම ඇදහිලිවතුන්ට අදාළ වේ.

**පරමාර්ථය :** ගායස්ට හා දෙමෙත්‍රියස්ට ඔවුන්ගේ කිතුනු සාක්ෂිය ගැන ප්‍රශංසා කිරීමටත් දියෝත්‍රෙපස්ගේ කිතුනු නොවන හැසිරීම ගැන තරවටු කිරීමටත් වේ.

**ප්‍රධාන පදය :** 1:11

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** අපගේ ජීවිත අප වටා සිටින අයට හොඳ හෝ නරක හෝ ආදර්ශ වේ.

**ප්‍රධාන චරිත :** යොහන්, ගායස්, දියෝත්‍රෙපස්, දෙමෙත්‍රියස්

## සැකිල්ල

I. හැඳින්වීම : 1-2

A. සභා මූලිකයෙකු වන යොහන්ගෙනි : 1
B. සැබෑ ලෙස ප්‍රේම කරන ප්‍රියාදර ගායස්ට : 1
C. ඔහු වෙනුවෙන් යොහන්ගේ පැතුම : ආත්මය සපල වන ලෙසම සුවසේ සිටින ලෙස :2

II. සත්‍යයට ඇදහිලිවතුන්ගේ සබඳතාව : 3-4
A. එය ඔවුන් තුළ විය යුතුය : 3
B. ඔවුන් සත්‍යයෙහි හැසිරිය යුතුය : 3
C. අප සත්‍යයෙහි හැසිරෙන විට, අපගේ ආත්මික නායකයන්ට ප්‍රීතිය ගෙන දෙන්නේය : 4

III. අනෙකුත් සහෝදර කිතුනුවන් සමග ඇදහිලිවතුන්ගේ සබඳතාව : 5-8

A. ඔවුන් සහෝදරයන්ට හා අමුත්තන්ට සේවය කළ යුතු වේ : 5
B. සභාව ඔවුන් ගැන දැනගත යුත්තේ ඔවුන්ගේ ප්‍රේමය නිසාය : 6
C. ඔවුන් සත්‍යය සඳහා සහෝදර උපකාරකරන්නන් විය යුතුය : 8

IV. යහපත හා නපුර වෙත ඇදහිලිවතුන්ගේ සබඳතාව : 9-12

A. දියෝත්‍රෙපස් නපුරෙහි ආදර්ශයක් ලෙස : 9
   1. සභාවේ නායකත්වය පතයි
   2. දෙවියන්වහන්සේ විසින් පත්කරන ලද නායකයකු වන යොහන් පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි.
   3. ප්‍රේරිතයන්ට (නායකත්වය) දුෂ්ට චෝදනා නගයි
   4. සෑහීමට පත් නොවෙයි
   5. අනෙකුත් සහෝදරයන් පිළිනොගනියි (කල්ලි සෑදේ)
   6. දෙවියන්වහන්සේ විසින් සභාවෙහි පිහිටුවන ලද නායකත්වය පිළිගැනීමට අකමැති වූ ඇදහිලිවතුන් සභාවෙන් නෙරපා දැමීමට උත්සාහ කරයි.
B. එවැනි නපුර සඳහා නිවැරදි ප්‍රතිචාරය : 11
   1. නපුර අනුගමනය නොකරන්න, මන්ද නපුර කරන්නා දෙවියන්වහන්සේ දැක නැත : 11
   2. යහපත අනුගමනය කරන්න, මන්ද යහපත කරන්නා දෙවියන්වහන්සේගෙනි : 11
C. දෙමෙත්‍රියස් : යහපත සඳහා නිදසුනකි : 12
   1. සියල්ලෝම ඔහු ගැන හොඳ කියති.
   2. දෙවියන්වහන්සේගේ වචනයේ සත්‍යය සමග අනුකූලය
   3. දෙවියන්වහන්සේ විසින් පත්කරන ලද නායකත්වය සමග හොඳ පිළිගැනීමක් ඇත.

V. සමාප්තිය : 13-14

A. යොහන්ට බොහෝ දේ ලියන්නට තිබිණි. එහෙත් ඔවුන් හමුවීමට පැමිණීමට බලාපොරොත්තු වේ : 13-14
B. ඔහු : 14
   1. සාමය පතයි
   2. ගායස්ට හා සභාවට ඔහුගේ මිතුරෝ ආචාර කරති.
C. සිය මිතුරන්ට නම් කියා ආචාර කරන ලෙස ඔහු ගායස්ට පවසයි : 14

## ස්වයං පරීක්ෂණය

1. 1,2 හා 3 යොහන් පොත්වල කර්තෘ කවරෙක්ද?

2. 1 යොහන් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. 1 යොහන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. 1 යොහන් පොතෙහි ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. 1 යොහන් හි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

6. 2 යොහන් පොත සඳහා පරමාර්ථය ලියන්න.

7. 2 යොහන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

8. 2 යොහන් පොතෙහි ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

9. 2 යොහන් හි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

10. 3 යොහන් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

______________________________________________

______________________________________________

11. 3 යොහන් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

______________________________________________

12. 3 යොහන් පොතෙහි ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

______________________________________________

______________________________________________

13. 3 යොහන් හි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

______________________________________________

______________________________________________

______________________________________________

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. 1 යොහන්ට අනුව දතයුතු සියල්ල අධ්‍යයනය කරන්න. මෙම අධ්‍යයනය සඳහා පළමුව 1 යොහන් මුළුමණින්ම කියවමින් "දන්නා" හෝ "දැන ගන්නේ" හෝ යන වචන යටින් ඉරක් අඳින්න. ඉන්පසු ඔබ යටින් ඉරක් ඇඳි ඒවා ඇසුරෙන් අප දත යුතු ඒවායේ ලයිස්තුවක් සකස් කරන්න.

2. 1 යොහන් 2:12-14 හි සඳහන් පහත දැක්වෙන අයට ලියන ලද දේවල් ලයිස්තුවක් සකස් කරන්න.

   - දරුවන්
   - පියවරුන්
   - තරුණයන්
   - (මේවා ආත්මික පරිණතභාවෙහි මට්ටම් වේ)

3. 1 යොහන් මුළුමනින්ම කියවා ප්‍රේමය හා සත්‍ය යන වචන භාවිත කර ඇති තැන් ලකුණු කරන්න. මෙම විෂයයන් දෙක පිළිබඳව උගන්වා ඇති දේ සාරාංශ කරන්න.

4. 3 යොහන් 9-10 හි සඳහන් දියොත්‍රෙපස්ගේ නපුරු ගතිලක්ෂණවල ලයිස්තුවක් සකස් කරන්න.

5. නැවත උපන් ඇදහිලිවන්තයකුගේ ලක්ෂණ අධ්‍යයනය කරන්න. 1 යොහන් 2:29, 3:9, 4:7, 5:1, 4:18

6. අවංක කිතුනු අත්දැකීම්වල පරීක්ෂණ හත අධ්‍යයනය කරන්න. 1 යොහන් 1:6, 8, 10, 2:4, 6,9, 4:20

7. 1 යොහන් හි සරල සංක්ෂිප්තයක්

   - 1-2 පරිච්ඡේද දෙවියන්වහන්සේ ආලෝකයය
   - 3-4 පරිච්ඡේද දෙවියන්වහන්සේ ප්‍රේමයය
   - 5 පරිච්ඡේදය දෙවියන්වහන්සේ ජීවනයය

8. 1 යොහන්හි පහත දැක්වෙන වෙනස්කම් අධ්‍යයනය කරන්න.

   - ආලෝකයට එරෙහිව අන්ධකාරය 1:5-2:11
   - පියාණන්වහන්සේට එරෙහි ලෝකයා 2:12-17
   - ක්‍රිස්තුස්වහන්සේට එරෙහි අන්ත ක්‍රිස්තු 2:18-28
   - යහපත් ක්‍රියාවලට එරෙහි නපුර 2:29 - 3:24
   - ශුද්ධාත්මයාණන්ට එරෙහි වැරදි දේ 4:1-6
   - ප්‍රේමයට එරෙහි ව්‍යාජය 4:7-21
   - දෙවියන්වහන්සේගෙන් උපන් අයට එරෙහි අනෙක් අය 5:1-21

# විසිවන පරිච්ඡේදය

## යුද්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යනයෙන් පසු ඔබට:

- යුද් පොතෙහි කර්තෘ නම් කිරීමට
- යුද් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- යුද් පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- යුද් පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- යුද් පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්ම සඳහන් කිරීමට හැකිවනු ඇත.

### හැඳින්වීම

**කර්තෘ** : යුද් (යේසුස්වහන්සේගේ අනෙක් සහෝදරයා)

**කවුරුන් වෙතද** : ඒ අවදියේ සුවිශේෂි පාඨකයන් වූයේ පලස්තීනයේ හා/හෝ ආසියාවේ සභාවල සාමාජිකයන් වෙත වුවද, සියලූ කිතුනුවන් වෙතය.

**පරමාර්ථය** : ව්‍යාජ ගුරුවරුන්ට එරෙහිව අනතුරු ඇඟවීම

**ප්‍රධාන පදය** : යුද් 1:3

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය** : ව්‍යාජ ගුරුවරුන් පිළිබඳව අප අවදියෙන් සිටිය යුතුය. ඔව්හු නොදැනුවත්ම ඇතුළට රිංගා ඇදහිලිවතුන්ව දෙවියන්වහන්සේගේ වචනයේ සත්‍යයෙන් වෙනත් අතකට හරවති.

**ප්‍රධාන චරිත** : යුද්, අග්‍ර දේවදූත මිකායෙල්, කායින්, බාලම්, තෝරා, ඒනොක්

### සැකිල්ල

යුද් පොතෙහි පරිච්ඡේද නොමැත. එබැවින් සඳහන් කර ඇත්තේ පද වලින්ය.

1. හැඳින්වීම : ශුභ පැතුම් : 1-2

   A. යුද්ගෙනි : 1
      1. යාකොබ්ගේ සහෝදරයාය
      2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයෙකි

   B. 1. දෙවියන්වහන්සේ විසින් පාරිශුද්ධිකරණය කරන ලද
      2. ක්‍රිස්තුස්වහන්සේ තුළ ආරක්ෂාවී සිටින
      3. කැඳවනු ලැබූ අය වෙතය

II. පරමාර්ථය : 3

A. මුල් පරමාර්ථය : පොදු ගැළවීම
B. සංශෝධිත පරමාර්ථය: ඔවුන් ඇදහිල්ල වෙනුවෙන් ඕනෑකමින්ම සටන් කරන ලෙස
අවවාද කිරීම, මක්නිසාද සභාව තුළට රිංගන අය විවිධාකාර බැවිනි.

III. “සමහර දෙනෙකුගේ” (ව්‍යජ ගුරුවරුන්ගේ) ගති ලක්ෂණ : 4

A. නොදැනුවත්වම රිංගා ගෙන සිටීම
B. වැරදිකරුවන් ලෙස තීරණය කර තිබීම
C. අභක්තික අය
D. දෙවියන්වහන්සේගේ කරුණාව අවකල් ක්‍රියාවලට හැරවීම
E. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම.

IV. ඓතිහාසික වාර්තා තුනක් : 5-7

A. ඉශ්‍රායෙලය : වරක් ගැළවිණි, පසුව විනාශ විය : 5 (ගණන් 13-14 හා 1 කොරින්ති 10:5-10)
B. දේවදූතයෝ : පළමුව වාස භවනය අත්හැරියහ, පසුව යදම්වලින් බැඳ තැබූහ : 6 (2 පේතෘස් 2:4)
C. සොදොම් හා ගොමෝරා : කාමය හා වේශ්‍යාකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ගින්නෙන් දඬුවම් ලැබූහ : 7 (උත්පත්ති 18-19)

V. ව්‍යාජ ගුරුවරුන් පිළිබඳ විස්තරය : 8-10 (4 පදයේ සිට අඛණ්ඩ විස්තරය)

A. නිස්සාර හීන දැක්වීම් : 8
B. කිලුටු ශරීර : 8
C. අධිපතිකම් සුළු කිරීම : 8
D. උත්තමයන්ට නින්දාකිරීම : 8-10
   1. අග්‍ර දේවදූත මිකායෙල් වුවද යක්ෂයාට විරුද්ධව නපුර කතා කිරීමට බිය විය : 9
   2. මෙම මනුෂ්‍යයෝ ඔවුන් නොදන්නා දේ පිළිබඳව නපුර කතා කරති : 10
E. ස්වභාවික දේ දූෂ්‍ය කරති : 10

VI. මෙම නපුරු මිනිසුන් ගැන නිදර්ශන මගින් විස්තරය : 11

A. ගමන් කළහ: කායින් ගිය මාර්ගයෙහි : පව් කමාව සඳහා රුධිරය අවශ්‍යය යන්න ප්‍රතික්ෂේප කළේය : (උත්පත්ති 4)
B. දිව ගියහ : බාලම් කළ වරද මෙනි. මුල්‍යයම ලැබීම් සඳහා සේවය කිරීම : (ගණන්කථාව 22-24)
C. විනාශ වූහ : කෝරාගේ විරුද්ධ කතාවලින් : දෙවියන්වහන්සේගේ නියම කරන ලද නායකත්වය ප්‍රතික්ෂේප කිරීමෙන් : (ගණන් 16)

VII. මෙම නපුරු මිනිසුන් රූපකයක් මගින් විස්තර කිරීම (ස්වාභාවික නිදර්ශන හා සංසන්දනය කිරීම) : 12-13

A. ලප : මෙහි සැබෑ තේරුම මංගල්‍යවල "ගල්" වේ: ආහාරවල ගල්ය : 12
B. වතුර නැති වලාකුළු : බොහෝ දේ පොරොන්දු වුවද කිසිවක් දෙන්නේ නැත. ඒ අතටත් මේ අතටත් පහසුවෙන් ගහගන ගිය හැකිය : 12
C. මැරී ගිය ගස්: ඵල නොමැත මුල් හෝ ස්ථාවරත්වයක් හෝ නොමැත. දෙවරක් මැරී ගොස් ඇත. පළමුව පාපයේ හා දෙවනුව කුහකකමෙහිය : 12
D. රෞද්‍ර තරංග : කලහකාරීය, කෑගසයි, එහෙත් කිසිවක් ඉෂ්ට කර නොගනී : 13
E. ඒ අත මේ අත දුවන තාරකා : දීප්තිමත්ව පෙනේ, එහෙත් ඔවුන්ට වෙන්කර ඇත්තේ අන්ධකාරය වේ : 13

VIII. අනාගත විනිශ්චය : 14-15 (උත්පත්ති 5:18-24)

A. පණිවුඩකරු : ඒනොක් : 14
B. පණිවුඩය : 15
   1. ස්වාමින්වහන්සේ විසින් ශුද්ධවන්තයන් 10,000 ක් සමග විනිශ්චය කරන සේක : 14
      a. ඔවුන් කරන ලද සියලුම අභක්තික ක්‍රියා ගැන : 15
      b. උන්වහන්සේට විරුද්ධව කියන ලද තද පරුෂ වචන ගැන : 15

IX. නපුරු මිනිසුන් පිළිබඳ විස්තරය තවදුරටත් : 16

A. මැසිවිලි කියන්නෝ
B. කොඳුරන්නෝ
C. සිය තෘෂ්ණා අනුව හැසිරෙන්නන්
D. ඔවුන්ගේ මුඛයෙන් අහංකාර වචන ගලා එයි
E. ධනය, තත්වය නිසා අන් අයට වඩා යහපත් යයි සිතමින් පුද්ගලයන්ට ගරු කරයි.

X. මේ මිනිසුන් ගැන යේසුස්වහන්සේ අනතුරු ඇඟවූ බව සිහි කරගන්න : 17-19

A. අන්තිම දවස්වල සරදම් කරන්නන් පැමිණෙනු ඇත : 18
B. තමන්ගේම අභක්තික තෘෂ්ණා අනුව ඔවුන් හැසිරෙනු ඇත : 18
C. ඔවුන් අන් අයගෙන් වෙන්ව සිටිනු ඇත : 19 (කණ්ඩායම් සෑදේ කල්ලි ගැසේ)
D. ඔවුන් ඉන්ද්‍රියයන් පිනවීමට යොමු වනු ඇත : 19
E. ඔවුන්ට දෙවියන්වහන්සේගේ ආත්මයාණන් නොසිටිනු ඇත : 19

XI. මේ නපුර මිනිසුන්ගේ රැවටීම මගහැරීමට කරුණු හතර සැලැස්මක් : 20-25

A. ඔබ ඇදහිල්ලෙන් ශක්තිමත් වන්න : 20
B. ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ යාච්ඤා කරන්න : 20
C. දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙහි පවතින්න : 21
D. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීම ගැන බලාසිටින්න : 21

XII. මෙම නපුරු මිනිසුන්ට අප දක්වන ප්‍රතිචාරය : 22-23

A. ඇතැමුන් වෙත දයාව පෙන්වන්න : 22
    1. දුර්වල අය හා ඕනෑකමින්ම නපුරු වන අය අතර වෙනස දක්වන්න : (23 පදය බලන්න.)

B. භයෙන් යුක්තව අනෙක් අය ගළවාගන්න : 23
    1. ඔවුන්ව පාපය/නිරය නමැති ගින්නෙන් ඉවතට ඇදගන්නඃ ඔවුන්ව ඉවතට අදින්න. ඔවුන්ගේ පාපය හා එක් නොවන්න
    2. මාංසය කාරණකොටගෙන කැළැල් වූ වස්ත්‍රවලට පවා ද්වේශ කරන්න.

XIII. සමාප්තික ආශිර්වාදනය : 24-25

A. උන්වහන්සේ අපට දැන් කරන දෙය: අප නොවැටෙන ලෙස ආරක්ෂා කිරීමට උන්වහන්සේට පුළුවන : 24

B. උන්වහන්සේ පසුව අපට කරන දෙය : අප දෝෂ රහිතව පිළිගන්වනු ඇත : 24
    1. උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි
    2. ඉමහත් ප්‍රීතියෙන්

C. අපගේ එකම ගැළවුම්කාර දෙවියන්වහන්සේට, දැනටත් සදාකාලයටත්
    1. මහිමය
    2. තේජස
    3. පරාක්‍රමය
    4. බලය වේවා

## ස්වයං පරීක්ෂණය

1. යුද් පොතෙහි කර්තෘ කවුරුන්ද?

2. යුද් පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. යුද් පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. යුද් පොතෙහි ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. යුද් පොතෙහි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යුද් පොතෙහි හැඳිනගෙන ඇති ව්‍යාජ ගුරුවරුන්ගේ ගති ලක්ෂණ ලයිස්තුවක් සකස් කරන්න.

2. යුද් පොතෙහි දී ඇති පැරණි ගිවිසුමේ නිදර්ශන අධ්‍යයනය කරන්න.

    - මිසරයෙන් මුදාගත් එහෙත් පසුව විනාශ කරන ලද සෙනග (ඉශ්‍රායෙල්) ගණන් 13-14; 1 කොරින්ති 10:5-10; හෙබ්‍රෙ 3:17
    - පව් කළ දේවදූතයන් : 2 පේතෘස් 2:4
    - සොදොම් හා ගොමෝරා : උත්. 18:1-19:24
    - කායින් : උත්. 4
    - බාලාම් : ගණන් 22-24
    - කෝරා : ගණන් 16
    - ඒනොක් (ආදම්ගෙන් පැවත එන හත්වැන්නා) උත්. 5:18

3. යුද් 20-23 අධ්‍යයනය කරන්න. යුද් පොතේ විස්තර කර ඇති ඒවා මෙන් ව්‍යාජ ගුරුවරුන්ගෙන් ඔබව ගලවා ගැනීමට දී ඇති ප්‍රධාන කරුණු ලයිස්තුගත කරන්න.

4. යුද් පොතෙහි ආඥා අධ්‍යයනය කරන්න.

    - ඇදහිල්ල උදෙසා උද්‍යෝගීමත්ව සටන් කරන්න : 3
    - ප්‍රේරිතයන් පැවසූ වචන සිහි කරන්න : 17
    - ඇදහිල්ලෙහි ශක්ති සම්පන්න වන්න : 20
    - යේසුස්වහන්සේගේ දයාව සොයන්න : 21
    - දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙහි පවතින්න : 21
    - වෙනසක් කරන්න : 2:2
    - සමහරුන් කෙරෙහි අනුකම්පා කරන්න : 2:2
    - බියෙන් යුක්ත වුවන් ගලවාගන්න : 23
    - ඔවුන් ගින්නෙන් ඉවතට ඇදගන්න : 23
    - මාංසය කරණකොටගෙන කැළැල් වූ වස්ත්‍රවලට පවා ද්වේෂ කරන්න : 23

5. යුද් පොතේ එක් ප්‍රධාන වචනයක් වන්නේ “අභක්තික” යන්නය ඔහු එය මිනිසුන් තෘෂ්ණාවන්, ක්‍රියාවන්, කැපවීම්, පව්කරුවන්, කතා විස්තර කිරීමට භාවිත කර ඇත.

6. යුද් හා 2 පේතෘස් අතර සමනතා බලන්න.

| **යුද්** | **2 පේතෘස්** |
|---|---|
| 4 | 2:1-3 |
| 6 | 2:4 |
| 7-10 | 2:6-12 |
| 11 | 2:15 |
| 12-13 | 2:13-17 |
| 16 | 2:18 |
| 17-18 | 3:1-3 |

# දිවැස්වැකි පොත සඳහා හැඳින්වීම

නව ගිවිසුමේ ඇති එකම දිවැස්වැකි පොත එළිදරව් වේ. එය අප දැන් දන්නා පරිදි අවසාන කාලයද ඇතුළත්ව දෙවියන්වහන්සේගේ අනාගත සැලැස්ම, අලුත් අහස හා පොළොවෙහි මැවීම, විනිශ්චය හා සදාතනයේ ආරම්භය පිළිබඳ ජායා මාත්‍රයක් සපයයි. එළිදරව්වේ සිද්ධීන් සිදුවන අවස්ථාවන් හඳුනාගැනීමට උපකාරී වීම සඳහා, ඔබගේ බයිබලයේ දාරයේ පහත දැක්වෙන සංකේත අඳින්න.

⇧ සභාවේ ඔසවා ගැනීමට අදාළ පද දැක්වීමට මෙම සංකේතය යොදන්න.

C ලෝකයේ වර්තමාන අවස්ථාවන් ගැන දැක්වෙන පද අසලින් මෙම සංකේතය යොදන්න.

♥ බැටළු පැටියාගේ විවාහ භෝජන සංග්‍රහය දැක්වෙන පද සඳහා හෘදය සලකුණ තබන්න.

T. පීඩාවන් පිළිබඳ පද දැක්වීමට මෙම සංකේතය යොදන්න.

J. මිනිසා, සාතන් හා උන්වහන්සේගේ දේවදූතයන් පිළිබඳ විනිශ්චය දැක්වෙන පද අසලින් මෙම සංකේතය යොදන්න.

M. වසර 100 ක සහස්‍ර යුගය පිළිබඳ පද අසලින් මෙම සංකේතය යොදන්න

❁ මුද්‍රා සතේ විනිශ්චය පිළිබඳ පද අසලින් මුද්‍රාවක් අඳින්න.

Ụ භාජන හතේ විනිශ්චය පිළිබඳ පදවලට මෙම සංකේතය යොදන්න.

♪ හොරණෑ හත පිළිබඳ පද අසල සංගීත සංකේතය යොදන්න.

NH අලුත් අහස හා අලුත් පොළොව විස්තර කෙරෙන පද දැක්වීමට මෙම

NE සංකේත යොදන්න.

# විසිඑක්වන පරිච්ඡේදය

# එළිදරව්ව

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- එළිදරව්ව පොතේ කර්තෘ නම් කිරීමට
- එළිදරව්ව පොත ලියන ලද්දේ කවුරුන් වෙතද යන්න හඳුනාගැනීමට
- එළිදරව්ව පොත සඳහා පරමාර්ථය සඳහන් කිරීමට
- එළිදරව්ව පොතේ ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- එළිදරව්ව පොත සඳහා ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කිරීමට හැකිවනු ඇත.

## හැඳින්වීම

**කර්තෘ :** යොහන්

**කවුරුන් වෙතද :** ආසියාවේ සභා සත හා පොදුවේ ඇදහිලිවතුන් වෙත

**පරමාර්ථය :** ලෝකයා සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කිරීමට

**ප්‍රධාන පදය :** 1:19

**ජීවිතයේ හා සේවයේ මූලධර්මය :** අවසානයේ, සෑම විටම යහපත විසින් නපුර පරාජය කරනු ඇත. දෙවියන්වහන්සේ සෑම විටම උන්වහන්සේගේ සැලසුම හා පරමාර්ථය සාක්ෂාත් කරන සේක.

**ප්‍රධාන චරිත :** යොහන්, අන්ත ක්‍රිස්තුස්, ව්‍යාජ දිව්‍යසිවරු, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

## සැකිල්ල

### පළමුවන කොටස : අතීතය : ඔබ දුටු දේ

I. හැඳින්වීම : 1:1-3

II. ආචාරය : 1:4-6

III. එළිදරව්වේ තේමාව : 1:7-8

IV. කර්තෘ යොහන් : 1:9-10

V. ස්වාමින්වහන්සේ පිළිබඳ යොහන්ගේ දර්ශනය : 1:10-18

A. උන්වහන්සේ පුද්ගලයා : ඇල්ෆා හා ඔමෙගා, ස්වාමින්වහන්සේ : 1:11
B. උන්වහන්සේගේ ස්ථානය : සභාවන් මධ්‍යයේ (පහන් රුක්) : 1:12-13
C. උන්වහන්සේගේ ලක්ෂණ : 1:13-16
D. උන්වහන්සේගේ පණිවුඩය : 1:17-20

**දෙවන කොටස : වර්තමානය : දැන් ඇති දේ**

I. සභාවනට පණිවුඩ : 2:1-3:22

A. එපීසය : 2:1-7
B. ස්මර්ණය : 2:8-11
C. පර්ගමම් : 2:12-17
D. තියාතිරා : 2:18-29
E. සර්දිස් : 3:1-6
F. පිලදෙල්පියාව : 3:7-13
G. ලවෝදිසය : 3:14-22

**තෙවන කොටස : අනාගතය : "මින්පසු ඇති දේ"**

I. අවසාන කාලයේ සිද්ධීන් පාලනය කිරීම : 4:1-5:14

A. දෙවියන්වහන්සේගේ සිංහාසනය : 4:1-11
B. හැකුළුම් පොත : 5:1-5
C. බැටළු පෝතකයාණෝ : 5:6-14

II. බැටළු පෝතකයාණන්ගේ උදහස : 6:1-19-21

A. මුද්‍රා සතේ විනිශ්චය : 6:1-11:19
1. පළමු මුද්‍රාව : 6:1-2
2. දෙවන මුද්‍රාව : 6:3-4
3. තෙවන මුද්‍රාව : 6:5-6
4. සිවුවන මුද්‍රාව : 6:7-8
5. පස්වන මුද්‍රාව : 6:9-11
6. හයවන මුද්‍රාව : 6:12-17
7. අතරතුර කාලය : 7:1-17
   a. පොළොව මත : දෙවියන්වහන්සේගේ සේවකයන්ට මුද්‍රා තැබීම : 7:1-8
   b. ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ සේවකයන්ගේ ගී ගැයීම : 7:9-17
8. සත්වන මුද්‍රාව 8:1-11:19 මෙම මුද්‍රාව හොරණෑ සතකින් සමන්විතය
   a. පළමු හොරණෑව : 8:7
   b. දෙවන හොරණෑව : 8:8-9
   c. තෙවන හොරණෑව : 8:10-11
   d. සිවුවන හොරණෑව : 8:12-13
   e. පස්වන හොරණෑව : 9:1-12
   f. හයවන හොරණෑව : 9:13-21
   g. අතරතුර කාලය : 10:1-11:14

හයවන හා සත්වන හොරණෑ අතර සිද්ධීන් සතක් සිදුවේ.

h. සත්වන හොරණෑව : 11:15-19

III. පොළොව මත සාතන්ගේ පාලනය : 12:1-13:18

A. සාතන් හා ඉශ්රායෙලය : 12:1-17
B. සාතන් හා ලෝකය : 13:1-18

IV. භාජන සතේ විනිශ්චය : 14:1-16:21

A. භාජනවල විනිශ්චයට පෙර සිදුවීම් : 14:1-15:8
B. භාජනවල විනිශ්චය : 16:1-21
1. පළමු භාජනයේ විනිශ්චය : 16:2
2. දෙවන භාජනයේ විනිශ්චය : 16:3
3. තෙවන භාජනයේ විනිශ්චය : 16:4-7
4. සිව්වන භාජනයේ විනිශ්චය : 16:8-9
5. පස්වන භාජනයේ විනිශ්චය : 16:10-11
6. හයවන භාජනයේ විනිශ්චය : 16:12-16
7. සත්වන භාජනයේ විනිශ්චය : 16:17-21

V. ලෝකයේ ආගමික පද්ධතියේ විනාශය : 17:1-18

A. ඉතිහාසය : 17:1-6
B. අනාගතය : 17:7-18

VI. ලෝකයේ දේශපාලනික හා ආර්ථික පද්ධතිවල විනාශය : 18:1-24

VI. දෙවියන්වහන්සේගේ සතුරන් ආර්මගිදොන්හිදී පරාජය කරනු ලැබීම : 19:1-21

A. ස්වර්ගයෙහි උත්සව පැවැත්වීම : 19:1-10
B. පොළොවෙහිදී මුහුණ දෙන ඝට්ටනය : 19:11-21

VII. මනුෂ්‍යා වර්ගයාගේ විනිශ්චය : 20:4-15

A. ජීවනය වෙතට : 20:4-10
B. මරණය වෙතට : 20:11-15

VIII. අලුත් අහස හා අලුත් පොළොව : 21:1-22:5

A. ප්‍රාරම්භය : 21:1-8
B. නව යෙරුසලම විස්තරාත්මකව : 21:9-22:5

X. අවසාන අවවාද : 22:6-21

## ස්වයං පරීක්ෂණය

1. එළිදරව්ව පොතේ කර්තෘ කවුරුන්ද?

2. එළිදරව්ව පොත සඳහා පරමාර්ථය සඳහන් කරන්න.

3. එළිදරව්ව පොත ලියන ලද්දේ කවුරුන් වෙතද?

4. එළිදරව්ව පොතෙහි ජීවිතයේ හා සේවයේ මූලධර්මය සඳහන් කරන්න.

5. එළිදරව්ව පොතෙහි ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

(මෙම පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයෙන් පසු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. එළිදරව්ව පොතෙහි ආශිර්වාද හතක් ප්‍රකාශ කර ඇත.

   - මෙම අනාගතවාක්‍ය කියවන්නා ආශිර්වාද ලද්දේය : 1:3
   - ස්වාමින්වහන්සේ තුළ නසින්නාවූ මළවුන් ආශිර්වාද ලද්දෝය : 14:13
   - බලා සිටිමින් සිටින තැනැත්තා ආශිර්වාද ලද්දෝය. (මන්ද ස්වාමින්වහන්සේ පැමිණෙන සේක) : 16:15
   - බැටළු පැටවාණන්ගේ සරණ මංගල්‍ය කෑමට කැඳවන ලද්දේ ආශිර්වාද ලද්දෝය. : 19:9
   - පළමුවන නැවත නැගිටීම පංගුකාරකම ඇති තැනැත්තා ආශිර්වාද ලද්දෝය : 20:6
   - මෙම පොතේ වචන ආරක්ෂා කරන්නා ආශිර්වාද ලද්දේය : 22:7
   - තමන්ගේ සළු සෝදාගන්නාවූ තැනැත්තෝ ආශිර්වාද ලද්දෝය : 22:14

2. 9 පරිච්ඡේදයේ සඳහන් යක්ෂයන් පිළිබඳ විස්තරය අධ්‍යයනය කරන්න.

3. ඉතිහාසයේ සඳහන් ගැළවීම නොලද මිනිසුන්ගේ ශ්‍රේෂ්ඨතම යාච්ඤා රැස්වීම ගැන කියවන්න. 6:15-17

4. සභාවට යේසුස්වහන්සේ ප්‍රකාශ කළ අවසාන වචන 2 හා 3 පරිච්ඡේදවල සඳහන් වේ.

5. එළිදරව්ව පොතේ කර්තෘ වන යොහන්, යොහන් ශුභාරංචියද, 1,2 හා 3 යොහන් පොත්ද ලියන ලදි. ඔහුගේ අනෙකුත් පෙලඹවීමෙන් ලියන ලද ඒවා කියවන්න. යොහන් යේසුස්වහන්සේගේ ශ්‍රාවකයෙක් විය. ඔහුගේ ජීවිත කතාව ශුභාරංචිවල සඳහන් වේ.

6. ඔබ එළිදරව්ව පොත අධ්‍යයනය කරන අතරතුර දානියෙල් පොතද බලන්න.
   පහත දැක්වෙන යොමුවීම් සටහන් කරගන්න.
   - ඉශ්‍රායෙල් පිළිබඳව : දානියෙල් 3 හා 6, හා එළිදරව් 12
   - අන්ත ක්‍රිස්තුස් පිළිබඳ දානි. 3:1-7, 7:7, 8,24,25, 8:9-12, 23-25, 9:27, 11:36-45, එළිදරව් 13
   - පීඩාසමයන් පිළිබඳව : දානි. 9:24-27, එළිදරව් 11:2,12:6,14,13:5
   - දානියෙල් මුද්‍රා තබන ලද පොතකි. දානි. 12:9, මින් අදහස් වන්නේ අනාගතය පිළිබඳ සියලුම දේ ඒ කාලයේ එළිදරව් නොකරන බවය.
   - එළිදරව්ව මුද්‍රා නොතබන ලද පොතකි. (එළි. 22:10) එය ලියන ලද්දේ දෙවියන්වහන්සේගේ සැලැස්ම මිනිසාට එළිදරව්ව කිරීම සම්පූර්ණ කරන පිණිසය.

7. ඇදහිලිවතුන්ට දෙනු ලබන විවිධ කිරුළු හතක් පිළිබඳව බයිබලයේ සඳහන් වේ.

| | | |
|---|---|---|
| - | පරවී නොයන මල් ඔටුන්න | 1 කොරින්ති 9:25 |
| - | ප්‍රීතියේ කිරීටය | 1 තෙසලෝනික 2:19-20 |
| - | දැහැමි ජීවිතයක කිරීටය | 2 තිමෝති 4:8 |
| - | මහිමාන්විත කිරුළ | 1 පේතෘස් 5:2-4 |
| - | ජීවන කිරුළ | එළිදරව් 2:10 |

8. එළිදරව් පරිච්ඡේද 2-3 හි සභා හතට දෙන ලද පණිවුඩ අධ්‍යයනය කරන්න. චාට් සටහනක් පිළියෙල කර, ආමන්ත්‍රණය කරන ලද සෑම සභාවක්ම ගැනම පහත දැක්වෙන තොරතුරු සටහන් කරන්න.

සභාවේ නම: පණිවුඩය යොමු කර ඇත්තේ කවුරුන් වෙතද, සෑම සභාවක්ම පැහැදිලිව නම් කර ඇත.

විස්තරය: සෑම පණිවුඩයකම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව විස්තරයක් අන්තර්ගතය.

ප්‍රශංසාවන් : ස්වාමින්වහන්සේ ප්‍රශංසා කර ඇති යහපත් ගුණාංග ලියන්න.

දොස් තැබීම් : ස්වාමින්වහන්සේ විසින් දොස් තබන ලද වැරදි ලියන්න.

ආඥාවන්: සෑම පණිවුඩයකම ස්වාමින්වහන්සේ ආඥාවක් දී ඇති අතර සභාවේ ගැටලුවලට විසඳුමක්ද ලබාදෙන සේක.

පොරොන්දුව : සෑම සභාවකටම, එහි ප්‍රතිසංස්කරණය දිරිමත් කිරීම සඳහා පොරොන්දුවක් දී ඇත.

9. බයිබලයේ ඇති වෙනත් කිසිදු පොතකට වඩා එළිදරව්ව පොත යේසුස් ක්‍රිස්තුස්වහන්සේට විවිධ නම් දී ඇත. මේවායින් සමහරක් පහත දැක්වේ. ඔබට තවත් ඒවා සෙවිය හැකිද?

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ : 1:1
- විශ්වාසවන්ත සාක්ෂිකරු : 1:4
- මළවුන්ගෙන් නැගිටි කුළුදුලා : 1:5
- මිහිපිට රජුන්ගේ අධිපති : 1:5
- ඇල්ෆා සහ ඔමෙගා : 1:8
- පළමුවැන්නා සහ අන්තිමයා : 1:17
- මනුෂ්‍ය පුත්‍රයා : 1:13
- දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ : 2:18
- දාවිත්ගේ යතුර ඇත්තාවූ තැනැන්වහන්සේ : 3:7
- මරණයේද පාතාල ලෝකයේද යතුර ඇති තැනන්වහන්සේ : 1:18
- යුදා ගෝත්‍රයේ සිංහයාණෝ : 5:5
- දාවිත්ගේ මුල : 5:5
- මරනු ලැබුවාක් මෙන් පෙණුන බැටළු පෝතකයාණෝ : 5:6
- උදහසේ බැටළු පෝතකයාණෝ : 6:16-17
- මෘදු බැටළු පෝතකයාණෝ : 7:17
- අපගේ ස්වාමින්වහන්සේ : 11:8
- පිරිමි දරුවා : 12:5
- ශුද්ධවරයන්ගේ රජු : 15:3
- විශ්වාසය හා සත්‍යය : 19:11
- දෙවියන්වහන්සේගේ වාක්‍යාණෝ : 19:13
- රජවරුන්ගේ රජ : 19:16
- ස්වාමිවරුන්ගේ ස්වාමින් : 19:16
- ආරම්භය සහ අවසානය : 22:13
- සුදිළෙන පහන් තරුව : 22:16

10. බයිබලයේ සඳහන් අවසාන හා තීරණාත්මක යුද්ධයන් තුනක් අවබෝධ කරගැනීමට පහත දැක්වෙන සටහන ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

| යුද්ධයේ සහභාගිකයෝ | සිදුවීම | ප්‍රතිඵලය | යොමුව |
|---|---|---|---|
| 1. රුසියාව හා මිත්‍ර රටවල් | පීඩාසමය හෝ ඊට පෙර ඕනෑම වේලාවක සිදුවිය හැකිය | දෙවියන්වහන්සේ මැදිහත්වී රුසියානු හමුදාව විනාශ කෙරේ. | එසකියෙල් 38:1-39:16 |
| 2. දෙවියන්වහන්සේට විරුද්ධව සියලු ජාතීන්ගේ හමුදාව | යෙරුසලමෙහි 7 අවුරුදු පීඩා සමය අවසානයේ | යේසුස්වහන්සේ ස්වර්ගයෙන් බැසවිත් සතුරන් විනාශ කරන සේක. | ජෝවෙල් 3:9,12<br>සෙකරියා 14:1-4<br>එළිදරව් 16:13-16<br>19:11-21 |
| 3. සාතන් සහ දෙවියන්වහන්සේ | සහස්‍රය අවසානයේ | සාතන් හා ඔහුගේ මිත්‍ර පාක්ෂිකයන් සදාතන ගිනිවිලට දමනු ලැබේ | එළිදරව් 20:7-10 |

11. ලෝකයේ පටන්ගැන්ම හා අවසානය අතර වෙනස්කම් අධ්‍යයනය කරන්න.

| **පටන්ගැන්ම (ඇල්ෆා) උත්පත්ති පරිච්ඡේදය 1-3** | **අවසානය (ඔමෙගා) එළිදරව් පරිච්ඡේදය 20-22** |
|---|---|
| -දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. 1:2 | මම අලුත් අහසක්ද අලුත් පොළොවක්ද දිටිමි. 21:1 |
| -ආලෝකය වේවා 1:3-5 | නගරයට ආලෝකයක් අවශ්‍ය නැත. 21:23, 22:5 |
| -ජලයට සාගරය කියා නම් තැබූ සේක. 1:10 | මුහුද ද තවත් නොවිය 21:1 |
| -ජීවන වෘක්ෂය 2:8-9 | ජීවන වෘක්ෂය 22:2 |
| -ඒදනයෙන් ගංගාව: 2:10 | ජීවනදායක වතුර 22:1 |
| -වෘක්ෂයකින් මරණය 2:17 | වෘක්ෂයෙන් ජීවනය 22:2 |
| -සාපය ස්ථාපනය කිරීම 3:17 | සාපයක් තවත් නැත 22:3 |
| -වේදනාව 3:17 | වේදනාවක් තවත් නැත. 21:4 |
| -ඇතුළු වීම වසා දැමේ 3:24 | දොරටු විවෘත කෙරේ. 21:25 |
| -උන්වහන්සේ ඔවුන් සමග සක්මන් කළ සේක. 3:8 | උන්වහන්සේ ඔවුන් සමග වාසය කරන සේක. 21:23 |
| -මරණය ස්ථාපිත කෙරිනි 2:17 | මරණය නැති කෙරේ. 20:14 |
| -යක්ෂයා රවටයි 3:4-6 | යක්ෂයාට රැවටිය නොහැකිය 20:3 |
| -යක්ෂයා නිදහස්ය. 3:4 | යක්ෂයා බැඳ තැබේ 20:2 |
| -දුක 3:17 | තවත් දුකක් නැත. 21:4 |
| -පොළොව හා අහස සාදයි 1:1 | අහසත් පොළවත් පලා ගියේය 20:11 |
| -දෙවියන්වහන්සේගේ මැවීමේ බලය 1:1 | දෙවියන්වහන්සේගේ විනාශ කිරීමේ බලය 20:9 |
| -දෙවියන්වහන්සේගෙන් සැඟවේ 3:8 | දෙවියන්වහන්සේ ඉදිරියේ සිටි 20:12, |
| -එය ආරම්භ වේ 1:1 | එය අවසන්ය 21:6 |

# සමාප්තිය

දෙවියන්වහන්සේගේ සදාතන පූර්ණ සැලැස්ම බයිබලය එළිදරව් කරයි. පැරණි ගිවිසුම සැලැස්මේ සූදානම වේ. ශුභාරංචි සැලැස්ම විද්‍යාමාන කළ අතර ක්‍රියා පොත හා හසුන් සැලැස්ම අත්පත් කරගනී. දෙවියන්වහන්සේගේ සැලැස්මේ අවසානය එළිදරව්ව පොත ඉදිරිපත් කරයි.

# ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය

1. මතෙව්

2. යේසුස්වහන්සේගේ සේවය, යුදෙව්වන්ගේ රජු ලෙස, උන්වහන්සේගේ භූමිකාව අවධාරණය කරමින්, හඳුන්වා දීම වේ.

3. යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ, හා දාවිත්ගේ පුත්‍රයාණන් ලෙස, හඳුන්වාදුන් යුදෙව්වන් වෙත ඔහුගේ පළමු බලාපොරොත්තුව වුවද, සියලුම ඇදහිලිවතුන් වෙතට වේ.

4. යේසුස්වහන්සේ සිය අනුගාමිකයන්ට දුන් අවසාන ආඥාව වන්නේ ශුභාරංචිය රැගෙන සියලුම ජාතීන් වෙත යන ලෙසය.

5. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තිස්ම කරන්න. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:19-20)

## දෙවන පරිච්ඡේදය

1. මාක්

2. යේසුස්වහන්සේගේ සේවය, උන්වහන්සේගේ භූමිකාව සේවකයෙකු හා මනුෂ්‍ය පුත්‍රයා ලෙස අවධාරණය කරමින් හඳුන්වා දීම.

3. සියලුම ඇදහිලිවතුන්ට වුවද පළමුවෙන් අදහස් කළේ, ඔහු යේසුස්වහන්සේ සේවකයෙකු ලෙස හඳුන්වාදුන් රෝමවරුන්ට වේ.

4. අප සෙවිය යුත්තේ සේවය කිරීමට මිස සේවය ලැබීමට නොවේ.

5. මක්නිසාද සැබවින් මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවය කරන්ටද බොහෝ දෙනෙකු උදෙසා මිදීමේ මිලයක් කොට තමාගේ ජීවිතය දෙන්ටද ආයේයයි කීසේක. (මාක් 10:45)

## තුන්වන පරිච්ඡේදය

1. ලූක්

2. මෙය ලූක් 1:1-4 හි සඳහන් වේ. මෙහි පරමාර්ථය වන්නේ යේසුස්වහන්සේගේ සේවය පිළිබඳ විධිමත් විස්තරයක් සැපයීම වේ.

3. සියලුම ඇදහිලිවතුන් වෙත වුවද පළමුවෙන් අදහස් කළේ, ඔහු යේසුස්වහන්සේ පරිපූර්ණ මනුෂ්‍යයා ලෙස ඉදිරිපත් කළ ග්‍රීක්වරුන් වේ. එමෙන්ම ඔහු එක් විශේෂිත ඇදහිලිවන්තයෙකු ද අමතයි. ඒ තියෝපිලස්ය.

4. අපගේ මෙහෙය යේසුස්වහන්සේගේ මෙහෙයට සර්වසම වේ. එනම් ශුභ ආරංචිය විනාශවන සෙනඟ වෙත ගෙන යෑමය.

5. මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයා නැතිවූ දේ සොයන්ටද ගළවාගන්ටද ආයේයයි කීසේක. (ලූක් 19:10)

## හතරවන පරිච්ඡේදය

1. යොහන්

2. යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ බව, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව ඒත්තුගැන්වීම හා ඒ තුළින් මිනිසුන් සදාතන ජීවනය වෙත ගෙන ඒම.

3. යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව යොහන් පෙන්වන, සියලුම ඇදහිලිවතුන් වෙත,

4. යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේය, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය, ගැළවීමේ ප්‍රභවය හා සදාතන ජීවනයට මාර්ගයය.

5. නමුත් මේවා ලියන ලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාසකරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය. (යොහන් 20:31)

## පස්වන පරිච්ඡේදය

1. ලූක්

2. මෙය ක්‍රියා 1:1-2 හි සඳහන් වේ. මෙම පොත සැලකිලිමත් වන්නේ යේසුස්වහන්සේ සිය ස්වර්ගාරෝහණයෙන් පසු තම ආත්මික ශරීරය, එනම් සභාව තුළින් තවදුරටත් කළාවූද ඉගැන්වූවාවූද දේ පිළිබඳව වේ.

3. විශේෂයෙන්ම තියෝපිලස් වෙත යයි සඳහන් වුවද සියලුම ඇදහිලිවතුන් වෙත වේ.

4. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සැබෑ සාක්ෂිය වන්නේ යොමු කළ බලය වේ. එම බලය ලෝකය මුළුල්ලේම ශුභාරංචිය පැතිරවීම සඳහා සාක්ෂිකාරයන් වීම සඳහා වේ.

5. නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)

## හයවන පරිච්ඡේදය

1. පාවුලුතුමා

2. ශුභාරංචියේ අදහස - ව්‍යවස්ථාව, අනාවැකි හා මිනිසා ඇදහිල්ල මගින් දේව සබඳතාවට පැමිණවීමේ විශ්වීය අවශ්‍යතාව - යන්නට අදාළව ඉදිරිපත් කිරීම

3. රෝමයේ ඇදහිලිවතුන්ට

4. ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වෙයි

5. මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි, අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාට ද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය. කුමක්හෙයින්ද ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත්වේයයි ලියා තිබෙන ලෙස, ඇදහීමෙන් පැමිණෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඇදහීම පිණිස එහි එළිදරව් වී තිබේ. (රෝම 1:16-17)

**හත්වන පරිච්ඡේදය**

1. පාවුලුතුමා

2. පාවුලුතුමා තමාගේ අවධානය යොමු කළ ගැටලු හා කොරින්තියේ ඇදහිලිවතුන් ඇසූ ප්‍රශ්න ගැන කටයුතු කරයි.

3. කොරින්තියේ ඇදහිලිවතුන් වෙත

4. ඵලදායි කිතුනු ජීවිතයට හා සේවයට ප්‍රධානතම ආත්මික කරුණ වන්නේ ප්‍රේමය වේ.

5. දැන් පවතින්නේ ඇදහිල්ල, බලාපොරොත්තුව, ප්‍රේමය යන මේ තුනය. මෙයින් ඉතා උතුම් එක නම් ප්‍රේමයය. (1 කොරින්ති 13:13)

6. ප්‍රධාන පරමාර්ථය වූයේ සිය අපෝස්තලික ආධිපත්‍යය නැවත පිහිටුවීම වුවද ඊට අතිරේකව වෙනත් වැදගත් කරුණු පිළිබඳවද කටයුතු කරයි.

7. කොරින්තියේ ඇදහිලිවතුන්ට

8. දෙවියන්වහන්සේගේ බලය විදූමාන වීමට මනුෂ්‍ය දුර්වලකම් අවස්ථාව සලසයි.

9. උන්වහන්සේද මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවෙන්නේ යයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. (2 කොරින්ති 12:9)

**අටවන පරිච්ඡේදය**

1. පාවුලුතුමා

2. සභාවේ යුදෙව් නෛතිකවාදය පිළිබඳ ව්‍යාජ ඉගැන්වීම් නිවැරදි කිරීම

3. ගලාතියේ ඇදහිලිවතුන් වෙත

4. යේසුස්වහන්සේ අප ව්‍යවස්ථාවෙන් නිදහස්කම ඇතිව සිටීමට මුදාගත් සේක.

5. ක්‍රිස්තුස්වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටීමටය. එබැවින් දාසකම නමැති වියගහකට නැවත අසු නොවී ස්ථිරව සිටපල්ලා. (ගලාති 5:1)

## නවවන පරිච්ඡේදය

1. පාවුලුතුමා

2. ඇදහිලිවතුන්ට ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔවුන්ගේ ධනවත්කම දැන්වීමට හා ක්‍රිස්තුස්වහන්සේ සමග ඔවුන්ගේ හැසිරීම පිළිබඳව උපදෙස් දීමට.

3. එපීසයේ පිහිටි සභාව වෙත

4. ඇදහිලිවන්තයෝ ආශිර්වාදවලටත් (ධනය) ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔවුන්ගේ කැඳවීමේ වගකීම්වලටත් (හැසිරීමට) උරුමක්කාරයෝ වෙති.

5. අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. මක්නිසාද උන්වහන්සේ ඉදිරිපිට ප්‍රේමයෙන් ශුද්ධව, නොකැලැල්ව සිටින පිණිස. (එපීස 1:3)

## දහවන පරිච්ඡේදය

1. පාවුලුතුමා

2. කිතුනු එක්සත්කම සඳහා ආයාචනයක් ඉදිරිපත් කිරීම

3. පිලිප්පියේ සභාව වෙත

4. යේසුස්වහන්සේ තුළ එක්සත්භාවය ප්‍රීතිය ගෙන දෙයි.

5. “නුඹලා එක ප්‍රේමය ඇතුව, එකඟව සිට, එක කාරණයම අභිප්‍රායකරගෙන එක්සිත්ව සිටීමෙන් මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න”. (පිලිප්පි 2:2)

## එකළොස්වන පරිච්ඡේදය

1. පාවුලුතුමා

2. සභාවේ දේව ධර්ම කරුණු පිළිබඳව කටයුතු කිරීම

3. කොලොස්සියේ සිටින ඇදහිලිවතුන් වෙත ඔවුන් මෙම හසුන ලවෝදිසයේ සිටින ඇදහිලිවතුන් සමගද බෙදාගත යුතුය.

4. සියල්ල ක්‍රිස්තුස්වහන්සේ වන අතර සියල්ලෙහි උන්වහන්සේ සිටින සේක.

5. “ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ සමග නැගුටුවනලද්දහු නම් උසස්තැන්හි තිබෙන දේවල් සොයන්න, එහි ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ වැඩහිඳින සේක. පොළොවේ තිබෙන දේ නොව උසස්තැන්හි තිබෙන දේම සලකන්න. මක්නිසාද නුඹලා මළහුය. නුඹලාගේ ජීවනය ක්‍රිස්තුස්වහන්සේ සමග දෙවියන්වහන්සේ තුළ සඟවා තිබේ” (කොලොස්සි 3:1-3)

**දොළොස්වන පරිච්ඡේදය**

1. පාවුලුතුමා

2. ස්වාමින්වහන්සේ නැවත පැමිණෙන බව සහතික කිරීම. ඇදහිල්ල සඳහා ප්‍රශංසා කිරීමට, අවවාද කිරීමට හා වැරදි ධර්මය නිවැරදි කිරීමට මෙන්ම පාවුලුතුමා සිය සේවය පිළිබඳ බොරු චෝදනාවලට ද පිළිතුරු දෙයි.

3. තෙසලෝනිකයෙහි සභාවට

4. සැනසිල්ලේ අවධානය යොමු කළ යුත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමේ මහිමාන්විත බලාපොරොත්තුව දෙස වේ.

5. "මක්නිසාද ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්මුඛවන පිණිස වලාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමග සිටින්නෙමුව. ඉන්නිසා මේ වචනවලින් එකිනෙකා සනසාගන්න. (1 තෙසලෝනික 4:16-18)

6. ස්වාමින්වහන්සේගේ නැවත පැමිණීම බලාපොරොත්තුවෙන් සිටින ඇදහිලිවතුන්ට උපදෙස් දීම

7. තෙසලෝනිකයේ සභාවට

8. ස්වාමින්වහන්සේගේ දවසට පෙර මහා වැටීයාමක් සිදුවන බැවින්, නිවැරදි ධර්මය ඉගැන්වීම හා ඒ අනුව ජීවත්වීම වැදගත්ය.

9. "කිසිවෙකුට කිසිසේත් නුඹලා රවටන්ට ඉඩ නාරින්න. මක්නිසාද ඇදහිල්ලෙන් වැටීයාමත් විනාශයේ පුත්‍රයා වන පාපයේ මනුෂ්‍යයා එළිදරව්වීමත් පළමුවෙන් වුණොත් මිස ඒක නොපැමිණෙන්නේය. (2 තෙසලෝනික 2:3)

**දහතුන්වන පරිච්ඡේදය**

1. පාවුලුතුමා

2. පාවුලුතුමා මෙය ලියන ලද්දේ තිමෝතියස් නමැති සහකාර සේවකයා වෙතය. ඔහු එපීස සභාවේ තාවකාලික පාලකවරයෙකු ලෙස සේවය කළේය. මෙම පොතේ දැක්වෙන්නේ එහි පැවති, අවධානය යොමු කළ යුතු ඇතැම් ගැටලු සහ අවශ්‍යතාවයක් සමහරකි.

3. තිමෝතියස්

4. අප කැඳවා ඇති සේවය වෙනුවෙන් අප ආදර්ශවත් ජීවිතයක් ගත කළ යුතුයි.

5. නුඹේ යෞවනකම සුළුකරන්ට කිසිවෙකුට ඉඩ නැර, කතාවෙනුත් හැසිරීමෙනුත් ප්‍රේමයෙනුත් ඇදහිල්ලෙනුත් පිරිසිදුකමිනුත් අදහන්නන්ට නුඹම ආදර්ශයක් වෙන්න. (1 තිමෝති 4:12)

6. පාවුලුතුමා සිරගෙයි සිට මෙය ලියන්නේ, තමා ළඟදීම මියයන නිසා තිමෝතියස්ට භාරදෙන සේවයේ වගකීම් භාරගන්නා ලෙස අභියෝග කිරීමටය. සිය ඇදහිල්ල නිසා තමා ඉක්මනින්ම ඝාතනය කරන බව පාවුලුතුමා දැන සිටියේය.

7. තිමෝතියස්

8. ශුභාරංචි පණිවුඩය ගුණ කිරීමේ දිව්‍යමය රටාව "සෑම කෙනෙක්ම එක්කෙනෙකු බැගින් එක් කෙනෙකුටම උගන්වමින් එක් කෙනෙකු දිනා ගන්න"

9. බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම, වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදෙන්න. (2 තිමෝති 2:2)

## දහහතරවන පරිච්ඡේදය

1. පාවුලුතුමා

2. ක්‍රීත දූපතේ පිහිටි සභාවල ගැටලු නිරාකරණය කිරීමට හා නිසි විනයක් ඇති කිරීම වේ.

3. තීතස්, දෙවියන්වහන්සේ වෙත හැරුණාවූ ග්‍රීකයෙකු හා පාවුලුතුමාගේ සහකාරයෙකි,

4. යහපත් වැඩක් ආරම්භ කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. එම වැඩය දේව වචනයේ මූලධර්මවලට අනුකූලව ස්ථාපනය කර සංවිධානය කළ යුතුවේ.

5. මා එන විට නුඹ ක්‍රීතෙහි නැවැත්වූ කාරණය නම්, අඩුව තිබුණු දේවල් නුඹ විසින් පිළිවෙළට යොදන පිණිසත් මා නුඹට ආඥා කළ ලෙස නුවරක් පාසා වැඩිමහල්ලන් පත්කරන පිණිසත්ය. (තීතස් 1:5)

## පහළොස්වන පරිච්ඡේදය

1. පාවුලුතුමා

2. පලාගිය පිලෙමොන්ගේ වහල් දාසයෙකුවූ හා පසුව ඇදහිලිවන්තයෙකු වූ ඔනේසිමස් උදෙසා ඉල්ලීමක් කිරීමට වේ. මෙම පොත කිතුනු ප්‍රතිපත්ති සමාජ සබඳතාවලට යොදන ආකාරය ගැන නිදසුනක්ද වේ. එමෙන්ම එය කමාව දීමේ මූලධර්මය හා මැදිහත්වීමේ සේවය පැහැදිලි කරයි.

3. කොලොස්සියේ ජීවත්වූ කිතුනුවකු වන පිලෙමොන් වෙත

4. කිතුනු ප්‍රතිපත්ති සමාජ සබඳතාවලටද ව්‍යවහාර කළ යුතුය

5. "එසේ මා නුඹෙන් උදක්ම ඉල්ලන්නේ මා බැඳුම්වල සිටියදී ජාතක කළ මාගේ දරුවෙක්වූ ඔනේසිමස් ගැනය" (පිලෙමොන් 1:10)

**දහසයවන පරිච්ඡේදය**

1. පාවුලුතුමා

2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියල්ලන්ටම වඩා උතුම් බව දැක්වීමට

3. යුදෙව් (හෙබ්‍රෙව්) ඇදහිලිවතුන් වෙත

4. යේසුස්වහන්සේ වඩාත් හොඳ පොරොන්දු මත පිහිටවූ වඩාත් හොඳ ගිවිසුමක මැදහත්කාරයාණෝ වන සේක.

5. නුමුත් දැන් උන්වහන්සේ වඩා උතුම් පොරොන්දු පිට පිහිටුවනු ලද්දාවූ වඩා හොඳ ගිවිසුමක මැදහත්කාර කෙනෙක්ව සිටින්නාසේම උන්වහන්සේ වඩා උතුම් සේවයක් ලැබූ සේක. (හෙබ්‍රෙව් 8:6)

**දහහත්වන පරිච්ඡේදය**

1. යාකොබ්

2. සිය ඇදහිල්ල වෙනුවෙන් දුෂ්කරතාවනට මුහුණ පා සිටින ඇදහිලිවතුන් සැනසීම සඳහා

3. ඉශ්‍රායෙල්හි ගෝත්‍ර දොළොස අතර ඇදහිලිවතුන්ට

4. ක්‍රියා සඳහා පදනම ඇදහිල්ල වේ

5. මක්නිසාද ආත්මය නැති ශරීරය මැරී තිබෙන්නාක් මෙන්ම ක්‍රියාවලින් වෙන්වූ ඇදහිල්ලද මැරී තිබේ. (යාකොබ් 2:16)

**දහඅටවන පරිච්ඡේදය**

1. පේතෘස්

2. සභාවෙන් පිටත සිටින අයගෙන් සිදුවන පීඩනයන් ගැන අනතුරු අඟවීමට

3. සිය කිතුනු ඇදහිල්ල නිසා පීඩනයට පත් විප්‍රවාසීන් වෙතය.

4. පීඩාවලට ප්‍රතිචාරය ශුද්ධ ලියවිලි මූලධර්ම මත පදනම් විය යුතුය.

5. ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක් මෙන් පුදුම නොවෙන්න. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව්වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක්විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙන්න. (1 පේතෘස් 4:12-13)

6. ඇතුළතින් එන අන්තරාවන් ගැන අනතුරු ඇඟවීමට: භක්තිය හැර යාම හා ව්‍යාජ ඉගැන්වීම්

7. විප්‍රවාසීව සිටින කිතුනුවන්ට, ඇතැම් විට 1 පේතෘස්හි සඳහන් කණ්ඩායම විය හැකිය.

8. ඇතුළතින් පැමිණෙන ප්‍රධානතම අන්තරාවන් දෙක වන්නේ භක්තිය හැරයාම හා ව්‍යාජ ඉගැන්වීම් වේ.

9. ප්‍රේමවන්තයෙනි, දැන් මේක මා නුඹලාට ලියා එවන දෙවැනි ලියුමය. ශුද්ධවූ අනාගතවක්තෘවරුන් විසින් පළමුවෙන් කියනලද වචනය නුඹලාගේ ප්‍රේරිතයන් කරණකොටගෙන කියෙවූ ස්වාමිවූ ගැළවුම්කාරයාණන්ගේ ආඥාවද නුඹලාට මතක්වෙන පිණිස, මතක්කරවීම කරණකොටගෙන නුඹලාගේ අවංකවූ සිත් මේ ලියුම් දෙකින්ම පුබුදුකරවමි. (2 පේතෘස් 3:1-2)

## දහනවවන පරිච්ඡේදය

1. යොහන්

2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සැබෑ සහභාගිකත්වයේ ප්‍රමිතීන් පැහැදිලි කිරීම.

3. සාතනික රැවටිලිවලට අසුවන කිතුනුවන් වෙතය. එය දෙවියන්වහන්සේ සහ අන් ඇදහිලිවතුන් සමග ඇති සහභාගිකම බිඳ වැටීමට සලස්වයි.

4. දෙවියන්වහන්සේ සමග හා සහෝදර ඇදහිලිවතුන් සමග සැබෑ සහභාගිකත්වය පදනම් වන්නේ දෙවියන්වහන්සේගේ වචනයේ ප්‍රමිතීන් මත වන අතර එය පවත්වාගෙන යනු ලබන්නේ පව් පාපොච්චාරණය කිරීමේ මූලධර්මය මත වේ.

5. "අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:8-9)

6. සැබෑ ධර්මයට විශ්වාසිවන්ත වන ලෙස ඇදහිලිවතුන්ට අවවාද කිරීමට හා ව්‍යාජ ගුරුවරුන් ගැන අනතුරු ඇඟවීම වේ.

7. "දෙවියන්වහන්සේ තෝරාගත් මාතාවත් අපගේ දරුවනුත් වෙත" ඉන් අදහස් වන්නේ සභාව හා එහි සාමාජිකයන් වේ.

8. අප වර්ධනය කරගත්තාවූ ආත්මික ගුණාංග නැති කරගැනීමට හා ඔවුන්ගේ නපුරෙහි පංගුකාරයන් වීමට අප පොලඹවන ව්‍යාජ ගුරුවරුන්ගෙන් අප ආරක්ෂා විය යුතුය.

9. ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීමෙහි නොපැවතී ඉස්සරහට යන්නාවූ කිසිවෙකුට දෙවියන්වහන්සේ නැත්තේය. ඒ ඉගැන්වීමෙහි පවතින්නාටම පියාණන්වහන්සේද පුත්‍රයාණන්වහන්සේද සිටින සේක. (2 යොහන් 1:9)

10. ගායස්ට හා දෙමෙත්‍රියස්ට ඔවුන්ගේ කිතුනු සාක්ෂිය ගැන ප්‍රශංසා කිරීමටත් දියෝත්‍රෙපස්ගේ කිතුනු නොවන හැසිරීම ගැන තරවටු කිරීමටත් වේ.

11. මෙම පොත යොමු කර ඇත්තේ ගායස් නමැති කෙනෙකුට වේ. මෙය ඔහුටත් ඔහු හා සම්බන්ධ සභාවටත් ලියා ඇත. මෙම ලිපියේ සත්‍යයන් සියලුම ඇදහිලිවතුන්ට අදාළ වේ.

12. අපගේ ජීවිත. අප වටා සිටින අයට හොඳ හෝ නරක හෝ ආදර්ශ වේ.

13. ප්‍රේමවන්තය, නපුර නොව යහපත ආදර්ශකොට ගනින්න. යහපත්කම් කරන්නා දෙවියන්වහන්සේගෙන්ය. නපුර කරන්නා දෙවියන්වහන්සේ දුටුවේ නැත. (3 යොහන් 1)

**විසිවන පරිච්ජේදය**

1. යුද්

2. ව්‍යාජ ගුරුවරුන්ට එරෙහිව අනතුරු ඇඟවීම

2. ඒ අවදියේ සුවිශේෂී පාඨකයා වු පලස්තීනයේ හා/හෝ ආසියාවේ සභාවල සාමාජිකයන් වෙත වුවද, සියලු කිතුනුවන් වෙතය

4. ව්‍යාජ ගුරුවරුන් පිළිබඳව අප අවදියෙන් සිටිය යුතුය. ඔව්හු නොදැනුවත්වම ඇතුළට රිංගා ඇදහිලිවතුන්ව දෙවියන්වහන්සේගේ වචනයේ සත්‍යයෙන් වෙන අතකට හරවති.

5. ප්‍රේමවන්තයෙනි, අපේ පොදු ගැළවීම ගැන නුඹලාට ලියා එවන්ට මුළු උත්සාහය දරන විට, එක වරක්ම ශුද්ධවන්තයන්ට භාරදුන් ඇදහිල්ල උදෙසා උනන්දු ආකාරයෙන් පොරඅල්ලන ලෙස අවවාදකරමින් නුඹලාට ලියා එවන්ට මට ඕනෑවිය. (යුද් 1:3)

**විසිඑක්වන පරිච්ජේදය**

1 යොහන්

2. ලෝකයා සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්ම එළිදරව් කිරීම

3. ආසියාවේ සභා සත සහ පොදුවේ සියලුම ඇදහිලිවතුන් වෙත

4. අවසානයේ සෑම විටම යහපත විසින් නපුර පරාජය කරනු ඇත. දෙවියන්වහන්සේ සෑම විටම උන්වහන්සේගේ සැලසුම හා පරමාර්ථය සාක්ෂාත් කරන සේක.

5. එබැවින් නුඹ දුටු දේද දැන් තිබෙන දේද මින්පසු සිදුවන්ට තිබෙන දේද වන, (එළිදරව් 1:19)